
sinhalaebooks.com

**WILLIAM** By Richmal Crompton

# විලියම් 6

## සහ නිවුන් සහෝදරයා




සුදත් රොහාන්

sinhalaebooks.com

RICHMAL CROMPTON



# විලියම් සහ නිවුන් සහෝදරයෝ


6

sinhalaebooks.com



විලියම් දැන් ඔයාලා හොඳින් අඳුනනවා. නිතරම දඟ වැඩ කරන විලියම් ගේ වැඩ ගැන අහන්න ඔයාලා ගොඩාක් කැමැතියි කියලත් මට හිතෙනවා. ඔයාලගේ ප්‍රතිචාර වලින් ඒ ගැන හිතාගන්න පුළුවන්. සමහර අය ලිපිවලින් මට ඒ ගැන දන්වන්නත් අමතක කළේ නෑ. ඒ හින්දා ඔයාලට විලියම් ගේ හය වැනි පොතත් මේ සමග තිළිණ කරනවා.

ලෝකේම රසවත් කරපු දඟ ළමයා, විලියම් ගේ රසවත් දඟ වැඩ ගොඩක් ගැන මේ පොතෙනුත් ඔයාලට කියවන්න ලැබෙනවා. මේ පොත ගැන හිතෙන දේවලුත් මට දන්වන්න අමතක කරන්න එපා. එහෙනම් අපි විලියම් එක්ක ආයේමත් හිනාවෙමු.



'විහඟ ගීත්'. හේවාදිවෙල. රඹුක්කන.. **035-5680023,** 0777-642298

රිච්මල් කොම්ප්ටන් ගේ **WILLIAM AGAIN** ග්‍රන්ථයේ
සිංහල පරිවර්තනය

# විලියම් සහ නිවුන් සහෝදරයෝ

පරිවර්තනය
**සුදත් රොහාන්**

ප්‍රකාශනයක්

sinhalaebooks.com

විලියම් සහ නිවුන් සහෝදරයෝ
© සුදත් රෝහාන
පළමු මුද්‍රණය - 2006 ඔක්තෝබර්

**පරිඝණක පිටු සැකසීම**
නිර්මාණි
CREATION
**පිට කවරය**
දසුන් තරංග බණ්ඩාර, තරංග ග්‍රැෆික්ස්
**මුද්‍රණය**
එස්. ඇන්ඩ් එස්. ප්‍රින්ටර්ස්
49, ජයන්තවීරසේකර මාවත, කොළඹ 10.
**ප්‍රකාශනය**
තරංග ප්‍රකාශකයෝ
ශ්‍රී ජයවර්ධන පුර මාවත, රතුපස්වල, මුදුන්ගොඩ.
දුරකථනය 033-2258701
ක්ෂණික ඇමතුම් 0777- 980126

# 1.
# පරිච්ඡේදය

## විලියම් සහ රහසිගත සංගමය

මිනිස්සුන් ට ලෙඩ රෝග ඇති කරන ක්ෂුද්‍ර ජීවි ලෝකය තමන් ගේ දින චරියාව මොනතරම් නරක විදිහට අවුල් කරනවද කියලයි විලියම් මේ දවස්වල කල්පනා කරන්නේ. විශේෂයෙන්ම මිනිසුන් ට සෑදෙන පැපොල වගේ රෝග නිසා තමන්ට සිද්ධ වෙන කරදර ගැන එයා දිගින් දිගටම කල්පනා කරනවා. හැබැයි විලියම් ට නම් පැපොල රෝගය පෙනෙන්නේ ජේලි, ක්‍රීම සහ කුකුල් මස් වගේ කිසිම ගැලපීමක් නැති දෙයක් විදිහටයි.

පැපොල රෝගය මුලින් ම හැදුනේ විලියම් ට. එම රෝගය සනීප වෙන්න මාසයක් විතර ගතවුනත් විලියම් නම් ඒකට සෑහෙන කැමැත්තකින් තමයි හිටියේ. මොකද ඒ කාලය පුරාම ඉගෙන ගන්න දේවල් ගැන කාගෙන්වත් කරදරයක් ඇතිවුනේ නෑ. ඔන්න කොහොම

sinhalaebooks.com



හරි මාසයක් විතර ගතවෙලා විලියම් ට පැපොල රෝගය හොඳටම හොඳ වුනා. හැබැයි එයාට තවමත් මහන්සි පාටයි. ඒ නිසා පාසැලේ පොත් පත් පාඩම් වලින් ටිකක් විතර ඈත් වෙලා දවස් කිහිපයක් නිදහසේ ගත කිරීමේ අවස්ථාවක් විලියම් ට ලබාදෙන්නත් අම්මා කැමැත්ත පළ කෙරුවා. මේ වගේ අහම්බෙන් ලැබෙන විවේක කාලයකින් උපරිම ප්‍රයෝජනය ගන්න හැටි විලියම් හොඳට දන්නවා. කවුරු හරි කෙනෙක් ඒ වගේ දෙයක් වලක්වන්න හැදුවත් ඒක කොහොමටවත් සාර්ථක උත්සාහයක් නම් වෙන්නේ නෑ.

පැපොල රෝගයෙන් සුවපත් වුන විලියම් ඊට පස්සේ ලැබුන විවේක කාලය නිදහසේ ගත කරන්න හිතාගෙන හිටියත් සිද්ධ වෙලා තිබුනේ අවාසනාවන්ත දෙයක්. විලියම් ට හැදුන පැපොල රෝගය ඉන්පසුව එයාගේ අතිජාත මිත්‍රයින් තිදෙනා වන ඩග්ලස්, හෙන්රි සහ ජින්ජර් ටත් වැළඳිලා තිබුනා. පැපොල රෝගය තමන් ට එළවා එළවා පහරදෙනවා කියලා විලියම් කල්පනා කෙරුවේ ඒ නිසයි. කොහොම වුනත් යාළුවන් ට රෝගය වැළඳිලා තිබුන නිසා විලියම් ට සිද්ධ වුනේ හුදකලා ජීවිතයක් ගත කරන්නයි.

යාළුවොත් එක්ක ඇති තරම් විනෝද වෙන්න හිතාගෙන හිටියත් විලියම් ට සිද්ධ වුනේ තනියම ඇවිදින්න යන්නයි. ඒ විතරක් නෙවෙයි පාසැලේ දී විලියම් කැමැතිම ගුරුවරයාත් ඊළඟට පැපොල රෝගයට ගොදුරු වුනා. ඒ වෙලාවෙදීත් අවාසනාව තිබුනේ විලියම් සමඟමයි. එයා කැමැතිම ගුරුවරයා නිවාඩු ගෙන ගෙදර යද්දී ඔහු වෙනුවට උගන්වන්නට පැමිණියේ විලියම් අකමැතිම ගුරුවරයෙක් වන ෆ්‍රෙන්ච් මහතායි.

විලියම් ගේ පංති භාර ගුරුවරයා වුනේ ග්‍රීමර් මහතායි. ඔහු හරිම අපූරු කෙනෙක්. ළමයින් ගේ කැකෝ ගැසීම වගේම විලියම් ගේ නොමනා විහිළු වලින් වත් එයාගේ ඉවසීම බිඳෙන්නේ නෑ. දවසක් පාඩම වෙලාවෙදි විලියම් එයාගේ පාඩම් පොතේ



කුරුමිණියෙකුගේ රූපයක් අඳින හැටි ග්‍රීමර් මහතා දැක්කා. ඒ වුනත් එයා වචනයකින් වත් විලියම් ට දොස් කියන්න උත්සාහ කෙරුවේ නෑ. මෙන්න මේ හේතුව නිසයි විලියම්, ග්‍රීමර් මහතාට වැඩිපුරම කැමැත්තක් දක්වන්නේ. ඒ වුනත් ග්‍රීමර් මහතා ට පැපොල රෝගය වැළඳුන නිසා දැන් ඔහු වෙනුවට විලියම් ගේ පංතියට උගන්වන්නේ ෆ්‍රෙන්ච් මහතා යි.

ෆ්‍රෙන්ච් මහතා ගැන නම් විලියම් ගේ හිත ටිකක් වත් නැමෙන්නේ නෑ. ඔහු විලියම් ට දක්වන අකැමැත්ත වගේම අකමැත්තක් විලියම් ගේ හිතෙත් තියෙනවා. මේ නිසා හැම දවසකම පාසැලෙන් පසුව පැය ගාණක් විලියම් ට පාසැලේ නවතින්නත් සිද්ධ වුනා. ඔන්න එක දවසක් විලියම් ව හවස් වරුවේ පාසැලේ නවත්වා ගන්න ෆ්‍රෙන්ච් මහතා කල්පනා කෙරුවා. හැබැයි එදා නම් විලියම් පංති කාමරේ ජනේලයකින් එළියට පැන්නා. ඒ වුනත් ෆ්‍රෙන්ච් මහතාගෙන් ඔහුට ගැලවීමක් තිබුනේ නෑ. ඔහුත් විලියම් පසු පසින් ම පැමිණියා. ජනේලෙන් පැනලා ගෙදර ආපු විලියම් දවල් කෑම කන්න සූදානම් වෙනකොටම තමයි ෆ්‍රෙන්ච් මහතා ත් ඔහු ගේ නිවසට ගොඩවුනේ. කොහොම වුනත් ඉන්පසුව විලියම් ට සිදුවුනේ කෑම ගැනීම අමතක කරලා ෆ්‍රෙන්ච් මහතා සමඟ නැවතත් පාසැලට යන්නටයි. ඒ එක සිදුවීමක් විතරයි.

තව දවසක් ෆ්‍රෙන්ච් මහතා පංතියට උගන්වමිනුයි හිටියේ. හැබැයි විලියම් නම් මේ පාඩමට ටිකක්වත් ඇහුම් කන් දුන්නේ නෑ. එයා කෑම පෙට්ටියේ තිබුන විශාල ෆෝක් ෆයි කැබැල්ලක් අරන් ෆ්‍රෙන්ච් මහතාට හොරෙන් කන්න පටන්ගත්තා. අවාසනාවට වගේ ෆෝක් ෆයි කැබැල්ලයි විලියම් වයි ෆ්‍රෙන්ච් මහතා ගේ අත් අඩංගුවට පත් වෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ. මෙන්න මේ වගේ සිදුවීම් නිසා විලියම් සහ ෆ්‍රෙන්ච් මහතා අතර තිබුන හිතවත් කම තව තවත් දුරස් වුනා.

sinhalaebooks.com



දවල් කරපු දඟ වැඩක් නිසා එදා හැන්දෑවෙත් පාසැලේ නතර වෙලා පාඩම මුල ඉඳන් ම ලියන්න විලියම් ට සිද්ධ වුනා. හැබැයි විලියම් නම් පාඩම ගැන කල්පනා කෙරුවේ නෑ. එයා මහාකල්පිත චරිත වලින් සමන්විත වුන වීර කථාවක් තමන් ගේ සටහන් පොතේ ලියමිනුයි හිටියේ. විලියම් ට ලියන්න ලැබුනේ කථාවේ පළමුවැනි පරිච්ඡේදය විතරයි. ඉක්මනින් ම එතැනට ආපු ෆ්‍රෙන්ච් මහතා සටහන් පොත උදුරාගත්තා.

විලියම් ලියපු කථාව නිහඬවම කියවපු ෆ්‍රෙන්ච් මහතා ඉන්පසුව නිහඬවම ඒ සටහන් පොත පුළුස්සලා දැම්මා. තමන් ගේ වටිනා කථාවට සහ සටහන් පොතට සිද්ධ වුන දේ ගැන විලියම් ට හරිම දුකයි. මෙන්න මේ දවසේ තමයි ෆ්‍රෙන්ච් මහතා ගැන විලියම් ගේ හිතේ තිබුන නොකැමැත්ත තව තවත් වැඩිවුනේ.

තමන් ගොඩාක් මහන්සිවෙලා ලියපු හොඳම කථාව ඒක කියලා විලියම් තවමත් විශ්වාස කරනවා. ඒ වුනත් ෆ්‍රෙන්ච් මහතා කිසිම හිතක් පපුවක් නැති විදිහට කථාව පුළුස්සලා දැම්මා. විලියම් ට තමන් ලියපු කථාව ගැන වැඩිය මතකයකුත් නෑ. ඒ හින්දා ඔහුට ඒ කථාව ආයේමත් පාරක් ලියන්න හැකියාවක් තිබුනෙත් නෑ. ෆ්‍රෙන්ච් මහතා මොනතරම් නරක කෙනෙක් ද කියලා කල්පනා කරන ගමන් ම විලියම් එදා හැන්දෑවේ ඉස්කෝලේ ඇරිලා නිවස බලා යන්න වුනා. ඒ යන අතරේදිත් ඔහු කල්පනා කළේ ෆ්‍රෙන්ච් මහතා කළ දේ ගැනමයි.

විලියම් මොනතරම් ගැඹුරින් කල්පනා කරනව ද කියනවා නම් අවට සිදුවෙන කිසිම දෙයක් ගැන එයාට මතකයක් නෑ. වෙන එකක් තියා එයා ගෙදර යන පාර අයිනේ තියෙන මඩ වළ ගැන වුනත් විලියම් ට මතක් වුනේ නෑ. කොහොම වුනත් මඩ වළට වැටෙන්න ඔන්න මෙන්න තියා විලියම් පියවි සිහිය ආවා. එයා මඩ වළට නොවැටී බේරුනේ අන්න ඒ නිසයි.



දැන් විලියම් එයාගේ ගෙදරට ඇතුළු වෙන ගේට්ටුව ළඟටම ඇවිදගෙන ඇවිත්. නිවසේ ගේට්ටුවට පිටතින් කොළු ගැටවුන් දෙදෙනෙක් සිටගෙන ඉන්න හැටි විලියම් ට පෙනෙනවා. ඇත්තටම ඔවුන් වෙතින් පෙනෙන්නට තිබෙන්නේ කිසියම් දඩබ්බර පෙනුමක්. විලියම් ගේ අම්මා නම් මේ වගේ පිරිමි ළමයින් ට කියන්නේ 'කොළු තාත්තලා' කියලා. ඒ වුනත් විලියම් නම් මේ අමුතු පෙනුමක් තියෙන පිරිමි ළමුන් දෙදෙනා දිහා බැලුවේ හරිම උනන්දුවෙන්. තමන් ගේ අඹ යාළුවන් ට පැපොල රෝගය වැළඳීම නිසා විලියම් මේ දවස්වල සිටින්නේ තනියම මයි. ඒ නිසා මේ කොල්ලන් දෙදෙනා සමඟ හිතවත් වුනොත් කුමක් හෝ දෙයක් කළ හැකි යැයි සිතිවිල්ලක් ද විලියම් ගේ හිතේ තියෙනවා. ගේට්ටුව අසල සිටින කොළු ගැටවුන් දෙදෙනා ද අමුතු බැල්මක් ද සමඟ විලියම් දිහා බලාගෙන ඉන්නවා.

'හැලෝ... කොහොමද ?.'

විලියම් තමන් ට හුරු පුරුදු අමුතු සමච්චල් හඬින් ඇහුවා. ඇත්තටම මේ වෙනකොට ෆ්‍රෙන්ච් මහතා ගැන කිසිම දෙයක් විලියම් ට මතක නෑ.

විලියම් ගේ කථාව ඇහුනත් කොළු ගැටවුන් දෙදෙනා නම් කිසිම පිළිතුරක් දුන්නේ නෑ. තමන් ගේ ප්‍රශ්නෙට උත්තරයක් නොලැබුන නිසාම විලියම් ආයේමත් කථා කරන්න වුනා.

'මම කථා කරනවා ඔයාලට ඇහුනේ නැද්ද ?.'

විලියම් ගේ කථාව අවසන් වෙනවාත් එක්කම රතු පාට හිස කෙස් තිබුන පිරිමි ළමයා කෝපයෙන් වගේ ඔහු ළඟට දුවගෙන ඇවිත් විලියම් ට හොඳ පාරක් එල්ල කෙරුවා. හැබැයි විලියම් කියන්නේ ඕනෑම වෙලාවක ගුටි කෙළියකට සූදානම් වෙලා ඉන්න කෙනෙක්. ඒ නිසා ඔහු ත් ඉදිරියට පැන රතු පැහැති හිස කෙස් තියෙන කොල්ලාව බදාගෙන පාරෙන් එහාට පෙරලුනා. ඒ අතරම

sinhalaebooks.com



ඔහු රතු පැහැති හිසකෙස් තියෙන කොල්ලා ගේ නහයත් වේගයෙන් මිරිකුවා. ඔහුත් නිකං හිටියේ නෑ. එයා විලියම් ගේ හිස දූවිලි සහිත පොළවේ වද්දමින් තමන් ගේ ශක්තිය ප්‍රදර්ශනය කෙරුවා. වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා මේ සටන මිතුරන් අතරේ පවතින සටනක් බවට පත්වුනා. දැන් ඔවුන් සටන් කරන්නේ එකිනෙකා ට තිබෙන ශක්තිය ප්‍රදර්ශනය කිරීම සඳහා යි.

සටන මේ විදිහට කෙරීගෙන යද්දී අනිත් කොලුවා නිහඬවම වැට උඩ වාඩිවෙලා සටන දිහා බලාගෙන හිටියා. මේ සටනට සහභාගි වීමේ කිසිම අදහසක් තමන් ට නැති බවයි ඔහු ගේ මුහුණේ තිබෙන බැල්මෙන් කියන්නේ. තවත් ටික වෙලාවක් දූවිලි නාගෙන සටන් කළ විලියම සහ රතු පැහැති හිසකෙස් තිබෙන කොළුවා සටන අතහැර දැම්මා. හැබැයි මේ වෙනකොටත් ඔවුන් දෙදෙනාගේම සිරුරු දූවිලි සහ මඩවලින් වැහිලයි තිබුනේ. තවත් ටික වෙලාවක් තමන් ගේ ප්‍රතිවාදියා දිහා බලාගෙන හිටපු විලියම ඉන්පසුව මෙහෙම ඇහුවා.

'ඔයාගේ නම මොකක් ද ?.'

'මම සෑම්... ඉතින් ඔයාගේ නම මොකක් ද ?.'

'මම විලියම්... ඔයා ඉස්කෝලේ යනව ද ?.'

විලියම් ගේ ඒ පැනයට නම් රතු පැහැති හිස කෙස් සහිත කොළුවා ඒතරම් කැමැත්තක් දැක්වූවේ නෑ. ඔහු විලියම් දිහා රවා බැලුවෙත් ඒ නිසා වෙන්න ඇති. ටික වෙලාවකට පසුව රතු හිසකෙස් කොළුවා නොසැලකිලිමත් විදිහට මෙහෙම උත්තරයක් දුන්නා.

'මම ඉස්කෝලේ යනව ද කියලා නේද ඔයා ඇහුවේ ?. නෑ... ඇත්තටම මම ඉස්කෝලේ යන්න කැමැති නෑ. මම අන්න අර ගෙදර වැඩ කරනවා. ඒක ඉස්කෝලේ යනවට වඩා හොඳයි. මම වැඩ කරන ගෙදර ඉන්න උයන්පල්ලා ගේ සහායකයා නමයි හරිම



නරක. එයා ආසාවට ඇපල් ගෙඩියක්, මිදි වල්ලක් වත් කන්න ඉඩ දෙන්නේ නෑ.'

'ඔයා කවදාවත් ඉස්කෝලේ ගිහිං නැද්ද ?.'

විලියම් එහෙම ඇහුවේ හිත පුරා දුවන සන්තාපයක් ද වචනවල තවරාගෙනයි. හැබැයි සෑම් ගේ පිළිතුරේ නම් කිසිම විදිහක දුකක් ගැවිලාවත් තිබුනේ නෑ.

'මම ඉස්කෝලේ ගිහිං තියෙනවා කියලා ඔයාට හිතෙනව ද ?. ඉස්සර වෙලාම ඒ ගැන කියන්නකෝ. ඇත්තම කියනවා නම් මම ඉස්කෝලේ යන්න කැමැති නෑ. ඉස්කෝලේ ඉන්න ගුරුවරු හරිම නපුරුයි. ඒ හින්දා මම ඉස්කෝලේ යන්න කැමැති නෑ.'

සෑම් එහෙම කියද්දී විලියම් කිසිම සද්දයක් නැතිව සෑහෙන වෙලාවක් කල්පනා කෙරුවා. එයාගේ හිතේ කිසියම් අපූරු අදහසක් සෙමෙන් සෙමෙන් ඇදෙනවා. ඒ අදහස ගැන සෑහෙන වෙලාවක් කල්පනා කළාට පසුවයි විලියම් ආයේමත් කථා කරන්න වුනේ.

'ඒක නෙවෙයි සෑම්. මම ඔයාට දෙයක් කියන්න ද ?. මම රහසිගත සංගමයක් පටන්ගන්න හිතාගෙන ඉන්නවා. ඒකට බැඳෙන්න ඔයා කැමැති ද ?.'

සෑම් එයාගේ අතේ තිබුන තොප්පිය ආයේමත් ඔලුවට දමාගත්තා. ඉන්පසුව අසල තිබුන තණකොල ගහක් ගලවලා කටින් හපන ගමන් ම කථා කරන්න පටන්ගත්තා.

'මම මීට ඉස්සර නම් ඒ වගේ දෙයක් ගැන අහලා තිබුනේ නෑ. ඇත්තටම ඒ වගේ සංගමයක් ගැන මම දන්නේ නෑ.'

සෑම් ගේ කථාව අහපු ගමන් ම විලියම් ගේ හිතේ මලක් පිපුනා. එයා හරිම උනන්දුවෙන් මේ වගේ දෙයක් කිව්වේ ඒ නිසයි.

'කලින් දැනගත්තේ නැතිවට කමක් නෑ සෑම්. ඇත්තටම මම

sinhalaebooks.com



ඒ වගේ සංගමයක් පිහිටුවන්න හිතාගෙන ඉන්නවා. ඔයාටත් පුළුවන් ඒකට බැඳෙන්න. ඔයා මගේ සංගමයට බැඳෙන්නම ඕනෑ. අපි එකතු වුනාම ගොඩාක් දේවල් කරන්න පුළුවන්. මම කියන්නේ ඔයාට අරියාදු කරන උයන්පල්ලා ගේ සහායකයාට වුනත් හොඳ පාඩමක් උගන්වන්න බැරිවෙන එකක් නෑ.'

විලියම් එහෙම කියනවත් එක්කම සෑම් මුහුණේ තිබුන දෙගිඩියාව පහවෙලා ගිහිං අමුතු උද්දාමයක් මතුවුනා.

'හරි... ඔයාගේ යෝජනාවට මම කැමැතියි විලියම්. ඔයාගේ රහසිගත සංගමයට බැඳෙන්න මම මොනවද කරන්න ඕනෑ ?.'

සෑම් තමන් ගේ යෝජනාවට කැමැති වුන එක ගැන විලියම් ට හරිම සතුටුයි. ඒ සතුට හංගාගෙන එයා කිසියම් බැරෑරුම් හඬකින් මෙහෙම කිව්වා.

'අපි ඒ ගැන පස්සේ කථා කරමුකෝ. හැබැයි අපි කරන දේවල් ගොඩාක් රහසිගත විදිහට තමයි තියාගන්න ඕනෑ අපේ රහස් රකිනවා කියලා ඔයා පොරොන්දු වුනොත් හොඳටම ඇති.'

විලියම් ගේ අදහස ගැන කල්පනා කරන ගමන් ම සෑම් මෙතෙක් වෙලාවක් වැඩ උඩ වාඩිවෙලා නිහඬවම හිටපු තමන් ගේ යාළුවා දිහාට ඇඟිල්ල දිගු කරමින් මෙහෙම කිව්වා.

'අර ඉන්නේ මගේ යාළුවෙක්. එයාගේ නම ඇල්බට්. වැඩ කරන්නේ ග්‍රොසරියක. අපි එයාවත් සංගමයට බඳවා ගනිමුද ?.'

මේ කථාබහ අතරේදීම වැටෙන් බිමට බැසගත් ඇල්බට් ද ඔවුන් සිටින තැනට ඇවිදගෙන ආවා. ඔහුගේ මුහුණේ නම් තිබෙන්නේ එතරම් ප්‍රිය මනාප බැල්මක් නෙවෙයි. හිතේ තියෙන නොකැමැත්ත වචනවල තවරමින් ම ඔහු මේ වගේ උත්තරයක් දුන්නා.



'ඔය වගේ තේරුමක් නැති සංගමයකට බැඳෙන්න මම කැමැති නෑ. අනික ඔයාලා මොන වගේ නරක වැඩ කරයිද කියලා කවුද දන්නේ. මම නරක වැඩවලට කැමැති නෑ. නරක වැඩක් කරලා පොලීසියට අහුවුනොත් මට හිරේ යන්නත් වෙයි. එහෙම වුනොත් මගේ අහිංසක අම්මා බලාගන්න කෙනෙක් නැති වෙනවා.'

ඇල්බට් ගේ දෙගිඩියාව නිසා විලියම් ගේ හිත රිදුනා. හැබැයි එයා ඇල්බට් ගේ හිත හදන්න පුළුවන් තරම් මහන්සි වෙන්නත් අමතක කළේ නෑ.

'බයවෙන්න එපා ඇල්බට්. අපි නරක වැඩ කරන්නේ නෑ. අනික සෑම් ට අරියාදු කරන උයන්පල්ලාගේ සහායකයා ට වුනත් අපි ගොඩාක් දරුණු විදිහේ දඬුවමක් දෙන්නේ නෑ.'

කොහොම වුනත් ගොඩාක් බාධක මැද්දේ තමන් ගේ තමන් ගේ රහසිගත සංගමය පිහිටුවාගන්න විලියම් හැකිවුනා. පසුදින හවස්වරුවේ කඳුකරය අසල තියෙන පරණ ධාන්‍ය ගබඩාවේ දී සංගමයේ පළමු රැස්වීම පවත්වන්නත් විලියම් විසින් හැමදෙයක් ම සූදානම් කෙරුවා.

රහසිගත සංගමයට බැඳීම සඳහා ඇල්බට් විසින් එයාගේ මිතුරෙකුත් කැඳවාගෙන විත් තිබුනා. එයාගේ නම ලියෝපෝල්ඩ්. ලියෝපෝල්ඩ් දමාගෙන හිටියේ හරිම අපූරු තොප්පියක්. හැබැයි ඒක ගොඩාක් ලොකු එකක් හින්දා එයාගේ ඇස් දෙකත් වැහෙනවා. විශාල තොප්පියකින් ඇස්දෙක වසාගෙන ඉන්න හින්දා ලියෝපෝල්ඩ් වෙතින් පෙනෙන්න ට තිබෙන්නේ ටිකක් විතර තපුරු පෙනුමක්.

තමන් ගේ සංගමයට බැඳෙන්න ආපු මේ සාමාජිකයින් දිහා විලියම් බලාගෙන හිටියේ හරිම සතුටින්. තමන් ගේ උත්සාහය සාර්ථක වීම ගැන එයාගේ හිතේ තියෙන්නේ වචනයෙන් විස්තර කරන්න බැරි තරම් සතුටක්.

sinhalaebooks.com



'හරි... දැන් ඉතින් අපේ සංගමය පටන්ගන්න පුළුවන්. හැබැයි සාමාජිකයෝ හැමෝම පිළිපදින්න ඕනෑ නීති රීති ටිකක් තියෙනවා. ඇත්තම කියනවා නම් මේක රහසිගත සංගමයක්. ඒ හින්දා අපි සංගමයේ නීති රීති ආරක්ෂා කරනවා කියලා දිවුරුම් දෙන්න ඕනෑ. ඒ වගේම ලේ වලින් අත්සන් කරලා ඒක සහතික කරන්නත් ඕනෑ. ඒ විතරක් නෙවෙයි. අපේ සංගමයටම සීමාවෙන රහසිගත වචනයක්, රහසිගත ලාංඡනයක් වගේම රහසිගත භාෂාවකුත් හදාගන්න වෙනවා.'

විලියම් ගේ කථාව හමාර වෙනවාත් එක්කම ලියෝපෝල්ඩ් බයෙන් වගේ වටපිට බැලුවා. ලේ වලින් අත්සන් කරන්න ඕනෑ කියන දේට තමයි එයා වැඩියම බයවෙලා තියෙන්නේ. රහසිගත සංගමයේ ගිවිසුම ලේ වලින් අත්සන් කරන්න ඕනෑ වුනත් කවුරුවත් ඒ වැඩේ කරන්න නම් සූදානම් වුනේ නෑ. ඒ හින්දා ලියෝපෝල්ඩ් ගබඩාවේ අනිත් පැත්තට සෙමෙන් සෙමෙන් ඇවිදගෙන යන්න වුනා. මේ වෙලාවේ සිද්ධ වුනේ එයා හීනෙකින්වත් හිතපු නැති දෙයක්. කළබලයෙන් වගේ ඇවිදගෙන යද්දි ලියෝපෝල්ඩ් ගේ අතක් ගබඩාවේ බිත්තියේ තිබුන පරණ ඇණයක වැදිලා තුවාල වුනා.

නොසිතූ වෙලාවක අත තුවාල වුන හින්දා ඒ ලේ වලින් දිවුරුම සහතික කරන්න පුළුවන් කියලා කල්පනා වුන හින්දා ලියෝපෝල්ඩ් ආයේමත් විලියම් ඉන්න තැනට දුවගෙන ගියා. මේ වෙනකොටත් විලියම් සාක්කුවේ තිබුන පරණ කඩදාසි කැබැල්ලක් අරන් රහසිගත සංගමයේ දිවුරුම සකස් කරලා ඉවරයි.

'හරි... දැන් හැමෝම හොඳට අහගන්න. මේක තමයි අපේ සංගමයේ දිවුරුම. සංගමයේ කිසිම රහසක් පිටට දෙන එක සපුරා තහනම්. ඒ වගේ ම හැමෝම එකිනෙකා ගේ රහස් රකින්නත් පොරොන්දු වෙන්න ඕනෑ. මේ පොරොන්දු කඩ කරන ඕනෑම



කෙනෙක් සංගමයෙන් නෙරපා හරින බලය මට හිමිවෙනවා. මම මේ කියපු කොන්දේසි දිවි හිමියෙන් රකිනවා කියලා පොරොන්දු වෙලා ඔයාලා මේකට යටින් අත්සන් කරන්න ඕනෑ.'

දිවුරුම් සහතිකයට ලේ වලින් අත්සන් කරන එක තමයි ඊළඟට තිබුන බැරෑරුම් ම දේ. ලියෝපෝල්ඩ් ගේ ඇඟිල්ල තුවාල වෙලා තිබුන නිසා එයාට නම් කිසිම ගැටළුවක් ඇතිවුනේ නෑ. එයා, විලියම් අතේ තිබුන ලියවිල්ලට ලේ වලින් අත්සන් කෙරුවේ හරිම ආඩම්බරයෙන්. විලියම් ඊළඟට අත්සන් කෙරුවා.

අනිත් අයට අත්සන් කරන්න අවස්ථාව ලැබුනේ ඉන්පසුවයි. හැබැයි ඇල්බට් නම් තමන් ගේ ඇඟිල්ල තුවාල කරගෙන අත්සන් කරන්න කොහොමටවත් කැමැතිවුනේ නෑ, තුවාලයෙන් ලේ ගලාගෙන ගිහිං තමාව මැරුනොත් අම්මාට සලකන්න කෙනෙක් නෑ කියන කථාවයි ඇල්බට් විසින් කිව්වේ. ඒ අතර ඇල්බට් ඉක්මනින් ම ගෙදර ගියේ රතු පාට තීන්ත බඳුනක් හොයාගෙන එන්නටයි. කොහොම වුනත් වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා ඇල්බට් රතු තීන්ත භාජනයකුත් අරන් පිරිස සිටින තැනට දුවගෙන ආවා. ඒ හින්දා වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා හැමෝම රතු පාට තීන්තෙන් ගිවිසුම් පත්‍රයට අත්සන් කෙරුවා.

හැමෝම ගිවිසුම් පත්‍රයට අත්සන් කළා ට පස්සේ විලියම් ඒක හොඳින් නමලා සාක්කුවට ඔබාගත්තා. ඉන්පසුව පිරිස දිහාට හැරිලා ඔහු කිව්වේ මේ වගේ දෙයක්.

'හොඳයි... දැන් අපේ සංගමයේ අය හඳුනා ගන්න රහසිගත වචනයක් හොයාගන්න ඕනෑ. හොඳම වචනය මොකක් ද කියලා යෝජනා කරන එක සාමාජිකයින් ටම බාරයි.'

ලියෝපෝල්ඩ් 'භූතයා' කියන වචනය යෝජනා කෙරුවා. හැබැයි ඒ වචනයට නම් කවුරුවත් ම කැමැති වුනේ නෑ. ඇල්බට් ට මතක් වුනේ 'මරණයේ සහකරුවෝ' කියන වචනය. ඒකත්

sinhalaebooks.com



ප්‍රතික්ශේප වුනා. හැබැයි අන්තිමේට සෑම් විසින් යෝජනා කරපු 'භීෂණයේ උදාව' කියන වචනයට හැමෝම කැමැති වුනා.

රහසිගත සංගමයේ සභාපති වශයෙන් විලියම් තේරි පත්වුනා. (ඇත්තටම විලියම් ගේ නම යෝජනා කෙරුවෙත් ස්ථිර කෙරුවෙත් එයා විසින්මයි) ඒ වගේම අනිත් අය සංගමයේ ලේකම් වරුන් වශයෙන් ඒ අයගේ නම් යෝජනා කරලා ස්ථිර කරගත්තා.

මේ හැමදේකටම පසුව තිබුනේ අනතුරු ඇඟවීම වශයෙන් භාවිතා කරන හදිසි සංඥාව මොකක් ද කියලා තෝරාගන්න එකයි. විලියම් විසින් කිසිම තාලයක් නොමැතිව වාදනය කරපු විසිල් හඬක් තමයි හදිසි සංඥාව වශයෙන් තෝරාගත්තේ. ඒ විතරක් නෙවෙයි රහසිගත සංගමයේ සාමාජිකයෙකුට තවත් සාමාජිකයෙක් හමු වූ විට පිළිගන්නේ කොහොමද කියලත් ඔවුන් දිගින් දිගටම සාකච්ඡා කෙරුවා. එවැනි අවස්ථාවක දී මහපටඟිල්ල සහ දබරඟිල්ල එක් කොට 'රහසිගත සහෝදරයා' යනුවෙන් කථා කොට එකිනෙකා ට ආචාර කරන්න යි හැමෝම එකඟ වුනේ.

මේ වගේ දිගින් දිගටම සාකච්ඡා කිරීමෙන් පසුව විලියම් ගේ රහසිගත සංගමයේ පළමු රැස්වීම අවසන් වුනා. ඒ නිසා හැම දෙනාම අසුන් වලින් නැගිටලා 'මරණය තෙක් නොනවතින භීෂණයේ උදාව' යනුවෙන් තුන් පාරක් කියලා රැස්වීම අවසන් කෙරුවා.

.................................................................

ඊළඟ දවස උදාවුනා. විලියම් කිසිම වෙනසක් නොපෙන්වා එදින ත් පාසැල් ගියා. උදේ වරුව පුරාම මිස්ටර් ෆ්‍රෙන්ච් ගේ විමසිලිමත් ඇස විලියම් පසුපසින් තිබුනා. හැබැයි මොනතරම් විමසිල්ලෙන් හිටියත් තමන් ගේ සපත්තුව ඇතුළේ කිසියම් කටුවක් ඇනී තිබෙන හැටි දැනගන්න නම් මිස්ටර් ෆ්‍රෙන්ච් ට වැඩි වෙලාවක්



ගියේ නෑ. ඒ විතරක් නෙවෙයි. මේ වැඩේ ට වග කියන්න ඕනෑ විලියම් කියලත් මිස්ටර් ෆ්‍රෙන්ච් සැකයක් නොමැතිවම දැනගත්තා. මේ දේවල් එයින් පසුව නතර වුනේ නෑ. හවස් වරුව වෙනකොට ෆ්‍රෙන්ච් මහතා ගේ බයිසිකලයේ පිටුපස ටයරයේ කැපුම් පහරක් ඇතිවෙලා තිබුනා. ඒ විතරක් නෙවෙයි බයිසිකල් ටයරයේ තිබුන හුලං ටිකත් හොඳටම බැහැලා.

ෆ්‍රෙන්ච් මහතා ට තවත් අකැරතැබ්බයකට මුහුණ දෙන්න සිද්ධ වුනේ එදින හවස් වරුවේදියි. ෆ්‍රෙන්ච් මහතා ගේ බෑගයේ තිබුන වටිනා භාණ්ඩ කිහිපයක් හදිසියේ ම නැතිවෙලා. ඒ දේවල් මොනතරම් හෙව්වත් හම්බ වුනේ නෑ. හැබැයි හිතපු නැති වෙලාවක පාසැලේ හරිතාගාරය අස්සේ තිබිලා ෆ්‍රෙන්ච් මහතා ගේ නැතිවුන බඩු හැම එකක් ම අඩුවක් නැතිව එයාට හම්බ වුනා.

තවත් වෙලාවක දි ෆ්‍රෙන්ච් මහතා ගේ හිස් වැස්ම අස්සේ හංගලා තිබුන බැලුම් බෝලයක් මහා හයියෙන් පිපිරුවා. ෆ්‍රෙන්ච් මහතා විදුහල්පතිනියගේ දියණියට දුරකථන ඇමතුමක් ගනිමින් සිටිද්දීමයි බැලුම් බෝලය හයියෙන් පිපිරුනේ. මේ සිද්ධියෙන් එයා මොනතරම් අසරණ වුනා ද කියනවා නම් ඉක්මනින් ම දුරකථනය පැත්තකින් තිබ්බා. එකම දවසක් ඇතුළත තමන් ට අකැරතැබ්බ රැසකට මුහුණ දෙන්න සිදුවුන එක ගැන ෆ්‍රෙන්ච් මහතා ට හරිම පුදුමයි. කවුද මේ දේවල් කරන්නේ කියන පැනය එයාගේ හිතේ තිබුනත් විලියම් ගැන නම් එයා අමතක කරලම දැම්මා.

මෙන්න මේ විදිහට තමයි විලියම් ගේ රහසිගත සංගමයේ සාමාජිකයින් තමන් ගේ රහසිගත වැඩ සටහන් මුලින්ම ක්‍රියාත්මක කරන්න පටන්ගත්තේ.

දවසක් විලියම් බිල් මහතා ගේ ගෙවත්ත මැදින් ගමනක් යන්න ගියා. හැබැයි බිල් මහතා නම් විලියම් ගේ වැඩේ ට ටිකක්වත් කැමැති වුනේ නෑ. ඒ නිසා එයා දඩයම් බල්ලෙකුත් එක්ක ඇවිත්

sinhalaebooks.com



විලියම් ව ගෙවත්තෙන් එළියට පන්නා දැමුවා. සිද්ධිය එතැනින් අවසන් වුනත් පසුදින උදෑසන ම බීල් මහතාගේ ගෙවත්ත ළඟ විහිළු පෙනුමක් තියෙන පඹයෙක් හිටවලා තිබුණා. 'හිතක් පපුවක් නැති මෝඩ ගොවියා' යනුවෙන් සදහන් වුන දැන්වීමකුත් ඒ පඹයාගේ බෙල්ලේ එල්ලෙනවා. පඹයාට අන්දවලා තියෙන්නේ තමන් ගේ පරණ ඇඳුම් කට්ටලයක් බව දැකපු ගමන් තමයි බීල් මහතාට තරු විසිවුනේ.

විලියම් ගේ ගමේ පල්ලියේ පියතුමා වන කැත්බර්ට් පග් පියතුමා විලියම් ව හඳුන්වන්නේ 'කිසිම කමකට නැති අපිරිසිදු,, නරක පුංචි කොල්ලා' කියන විශේෂණයත් සමඟයි. පියතුමා තමන් ට ඒ විදිහට කථාකරනවට විලියම් ටිකක් වත් කැමැති නෑ. විලියම් මේ ප්‍රශ්නය තමන් ගේ රහසිගත සංගමයේ සාමාජිකයින් ට ඉදිරිපත් කෙරුවා. ඒ කථා බහේ ප්‍රතිඵල පසුවදා උදෑසනින් ම අත් දකින්නට කැත්බර්ට් පියතුමාට හැකිවුනා. ඇත්තටම මොකක් ද දන්නව ද සිද්ධ වෙලා තිබුනේ ?. පියතුමා ගේ නිවස ළඟ තිබෙන හැම ගසකම නපුරු පෙනුමක් තියෙන විහිළු බලි රූප මහා ගොඩාක් සුදු පාට තීන්තෙන් ඇඳලා තිබුනා. බැලූ බැල්මටම ඒ රූප වල පෙනෙන්නට තිබුනේ කැත්බර්ට් පියතුමා ගේ රූපයයි.

මේ හැම නරක වැඩක් පිටුපසම තිබුනේ විලියම් ගේ රහසිගත සංගමය කියලා කවුරුවත් දැනගෙන හිටියේ නෑ. සැම්, ඇල්බට් සහ ලියෝපෝල්ඩ් තම සංගමයේ සභාපති වරයා වන විලියම් ගේ අදහස් මනාව ක්‍රියාවට නංවනවා. ඇත්තම කියනවා නම් ඔවුන් මේ නරක දේවල් කෙරුවේ හරිම කැමැත්තෙන්. තමන් ගේ නපුරු සැලසුම් අපූරුවට ක්‍රියාත්මක වෙන එක ගැන විලියම් හිටියෙත් හරිම සතුටින්. ඒ විතරක් නෙවෙයි. හැමදාම තම සංගමයේ සාමාජිකයින් පාරෙදි හමුවෙන එකත් ඔහු ගේ දින චරියාවේ අංගයක් බවට පත්වුනා. ඒ හැමවෙලාවකම 'ආයුබෝවන්...රහසිගත සහෝදරයා' කියලා සාමාජිකයින් ට ආචාර කරන්නත් විලියම අමතක



කරන්නේ නෑ. ඇත්තටම ඔහු මේ දේවල් කෙරුවේ හරිම සතුටින්.

.....................................................................................

මෙච්චර දවසක් පැපොල රෝගයට ගොදුරු වෙලා හිටපු විලියම් ගේ අතිජාත මිත්‍රයින් තිදෙනා වන ඩග්ලස්, හෙන්රි සහ ජින්ජර් ආයේමත් ඉස්කෝලේ එන්න පටන්ගත්තා. ඒ වගේම පැපොල රෝගයෙන් සුවපත් වුන මිස්ටර් ග්‍රිමර් ආපහු පාසල් ඇවිත් විලියම් ගේ පංතිය භාරගත්තා. ඒ නිසා මෙතෙක් කාලයක් විලියම් ගේ පංතියට උගන්වපු මිස්ටර් ෆ්‍රෙන්ච් එයාගේ පංතියට මාරු වුනා. හැබැයි එයා විලියම් ගේ පංතියෙන් නික්මුනේ හරිම කැමැත්තෙන්. අදින් පස්සේ විලියම් ගේ කරදරය ඉවරයි කියලා එයාට හිතෙන්න ඇති.

මේ සිදුවීම් එක්ක විලියම් ගේ ජීවිතය ආයේමත් සුපුරුදු විදිහට ම ගලායන්න පටන්ගත්තා. ජින්ජර්, හෙන්රි සහ ඩග්ලස් එක්ක සුපුරුදු විදිහට සෙල්ලම් කරන්නත්, ඇවිදින්න යන්නත් දැන් විලියම් ට පුළුවන්. මිතුරන් ට අසනීප වුන නිසා මෙතෙක් දිනක් කරන්නට නොහැකි වෙලා තිබුන හැම දෙයක්ම විලියම් ආයේමත් ආරම්භ කෙරුවා. ඒ අතරම රහසිගත සංගමයත් විලියම් විසින් දිගින් දිගටම පවත්වාගෙන ගියා. ජින්ජර්, ඩග්ලස් සහ හෙන්රි සමඟ සිටින විටදීත් විලියම් රහසිගත සංගමයේ රහස් වචනය මුමුණනවා. මේ කිසිම දෙයක් නොදන්න මිතුරන් තිදෙනා ඔහු දිහා බලාගෙන ඉන්නේ හරිම පුදුමයෙන්. විලියම් කියන්නේ මොකක් ද කියලා දැනගන්න ඔවුන් තිදෙනා මොනතරම් උත්සාහ කෙරුවත් විලියම් ඒ ගැන කියන්න කැමැති වුනේ නෑ. බැරිම තැන ඩග්ලස් විසින් විලියම් ව පරණ ළිඳකට තල්ලු කෙරුවා. ඔහුව ළිඳෙන් ගොඩ ගන්න නම් හැමදෙයක් ම කියන්න ඕනෑ කියලා ඩග්ලස්, විලියම් ට තීරණාත්මක විදිහට කිව්වා. ළිඳෙන් ගොඩ එන්න කිසිම මඟක් නොමැති වුන

sinhalaebooks.com



නිසාම අන්තිමේදී විලියම් අකමැත්තෙන් හරි ඩග්ලස් ගේ අදහසට කැමැති වුනා. ඒ නිසා ඩග්ලස්, ජින්ජර් සහ හෙන්රි එකතු වෙලා විලියම් ව පරණ වලෙන් ගොඩට ඇදලා ගත්තා.

'හොඳයි... මම ඒ වචනය ආයේමත් කියන්නේ නෑ කියලා පොරොන්දු වෙනවා. මම ඒ වචනය කිව්වේ ඇයි කියන එක ගැන නම් ඔයාලට කොහොමටවත් කියන්න විදිහක් නෑ. මොකද ඒක රහසක්. මම ඒ රහස දිවි හිමියෙන් රකිනවා කියලා පොරොන්දු වෙලයි ඉන්නේ.'

වලෙන් ගොඩට ආපු විලියම් හිසේ තැවරිලා තිබුන කොල රොඩු ආදිය පිස දමාගන්නා ගමන් ම කිව්වා.

'ඔයා කියන්නේ අකමැති නම් කමක් නෑ විලියම්. අනික ඔය පිස්සු කථා ඇහුවේ නෑ කියලා අපිට කිසිම පාඩුවක් වෙන්නෙත් නෑ.'

ජින්ජර් අමනාපයෙන් එහෙම උත්තරයක් දුන්නා. හැබැයි ඊට පස්සේ නම් විලියම් කිසිම දෙයක් කිව්වේ නෑ.

කොහොම වුනත් ඊළඟ සතිය වෙනකොට තමන් ගේ රහසිගත සංගමය විසිරුවා හරින්න විලියම් තීරණය කරලා අවසන්. මේ වෙනකොටත් ඔහු තමන් ගේ සාමාජිකයින් ට ඒතරම් කැමැත්තක් දක්වන්නේ නෑ. විලියම් වැඩියෙන් ම අකමැති වුනේ ලියෝපෝල්ඩ් ට. එයා නිතරම ඔලුවේ දමාගෙන ඉන්න විශාල තොප්පිය ට විලියම් ටිකක්වත් කැමැති වුනේ නෑ. තමන් ගේ පරණ යාළුවෝ තුන් දෙනා නැවතත් සිටින නිසා රහසිගත සංගමයෙන් වැඩක් නෑ කියලා විලියම් ට හිතුනා. සංගමය විසිරුවා හැරීමේ අවසන් රැස්වීම ඔහු ඉක්මනට කැඳෙව්වේ ඒ නිසයි.

'මම මේ රැස්වීම කැඳෙව්වේ වැදගත් දෙයක් ගැන දැනුම් දෙන්නටයි. මම අද ඉඳන් රහසිගත සංගමය විසිරුවා හරිනවා. ඒ



මොකද කියනවා නම් රහසිගත සංගමයේ වැඩ කටයුතු කරනවාට වඩා මට වෙන වැදගත් දේවල් කරන්න තියෙනවා. අපි මේ දවස්වල ගඟ හරහා පාලමක් හදනවා. ඒ වැඩේ රහසිගත සංගමයට වඩා වැදගත්. ඒ වගේමයි මට ආයේමත් කිසිම කෙනෙකුට දඬුවම් දෙන්න ඕනෑ වෙන්නෙත් නෑ. දැන් හැමදෙයක් ම හරි. ඒ හින්දා අපි අද ඉඳන් මේ සංගමය නතර කරමු.'

විලියම් රැස්වීම ආරම්භ කරමින් දිගු දේශනයක් පැවැත්වූවා. මේ කථාව අහගෙන හිටපු ලියෝපෝල්ඩ් නොසන්සුන් විදිහට ඇහුවේ මේ වගේ පැනයක්.

'ඒත්... අපි මේ සංගමය පිහිටෙව්වේ මරණය තෙක් නොකැඩෙන සංගමයක් විදිහට නේද ?.'

'ඔව්... ඒ වුනත් දැන් හැමදෙයක් ම වෙනස් වෙලා ඉවරයි ලියෝපෝල්ඩ්.'

'හොඳයි...'

විලියම් කියපු දේ අහගෙන හිටපු ලියෝපෝල්ඩ් අමුතු හඬකින් උච්ඡාරණය කරමින් කිව්වා. ඇත්තටම ලියෝපෝල්ඩ් කථා කරන විදිහට ත් විලියම් ටිකක් වත් කැමැති නෑ. ඒ නිසාම ඔහු තරමක් උස් හඬකින් මෙහෙම කිව්වා.

'මොනව වුනත් මේ සංගමය පටන්ගත්තේ මම. ඒ හින්දා මට මේක නතර කරන්නත් පුළුවන්.'

'හොඳයි විලියම්... ඔයා මේ සංගමය නතර කෙරුවට කමක් නෑ. හැබැයි ඒ වෙනුවට ඔයා අපිට වන්දි ගෙවන්න ඕනෑ.'

සෑම් කිසිම කලබලයක් නැති විදිහට එහෙම කියද්දී විලියම පුදුමයෙන් වගේ ඒ පැනයම සෑම් ගෙන් ඇහුවා.

'මම ඔයාලට වන්දි ගෙවන්න ඕනෑ ?.'

sinhalaebooks.com



එවර විලියම් ට උත්තරයක් දෙන්න ඉදිරිපත් වුනේ ඇල්බට්ය.

'ඇත්තටම ඔව් විලියම්... ඔයා අපේ රහසිගත සංගමය හදිසියේ නතර කරනවා නම් ඒ වෙනුවට අනිවාර්යයෙන් ම වන්දි ගෙවන්න ඕනෑ.'

ලියෝපෝල්ඩුත් හිස සලා ඒ අදහස අනුමත කෙරුවා. හැබැයි ඔවුන් ගේ තර්ජන වලට විලියම් ටිකක් වත් සැලුනේ නෑ. එයා කෝපයෙන් බෙරිහන් දෙමින් මෙහෙම කිව්වේ ඒ නිසයි.

'හොඳට අහගන්න... මම ඔයාලට කිසිම වන්දියක් ගෙවන්නේ නෑ තේරුනාද ?. ඔයාලා මගේ රහසිගත සංගමයේ සාමාජිකයින් විතරයි. ඒ වෙනුවට කිසිම වන්දියක් ගෙවන්න මම බැඳිලා නෑ.'

විලියම් ගේ තර්ජනාත්මක කටහඬ නිසාම කොළු ගැටවුන් තිදෙනාගේ හිත් වලට චකිතයක් ඇතිවුනා. ඔවුන් කටහඬ බාල කරලා මේ විදිහට කථා කරන්න වුනෙත් ඒ නිසාමයි. මුලින් ම ඇහුනේ සෑම් ගේ හඬයි

'ඔව් විලියම්.... ඒ වුනත් අපි හරිම අවංක විදිහට ඔයාට සේවය කෙරුවා......'

'ඒ විතරක් ද ?. අපි ඔයා කියන අවදානම් දේවල් කෙරුවේ ජීවිතේ ගැන වුනත් හිතන්නේ නැතිව.'

ලියෝපෝල්ඩ් කලකිරුණ හඬින් කියද්දී ඇල්බට් දුක්බර විදිහට කොඳුරලා ඒ කථාව අවසන් කෙරුවා.

'එහෙම කරපු අපිට ඔයා මේ විදිහට සලකන එක හරිම අසාධාරණයි නේද ?.'

සාමාජිකයින් ගේ දුක්බර කටහඬ ඇහුනට පස්සේ රහසිගත සංගමයේ සභාපති තුමා වන විලියම්ටත් හරිම දුකයි. සාමාජිකයින් ගේ හිත සනසන්න හිතාගෙන එයා මේ විදිහේ දෙයක් කිව්වෙත් ඒ



නිසාමයි.

'මම කියන දේ අහන්නකෝ.ඔයාලට මොනවද මම දෙන්න ඕනෑ ?. ඇත්තම කියනවා නම් මේ සතියේ මගේ අතේ පැන්සයක්වත් ඉතිරිවෙලා නෑ. ඒ විතරක් නෙවෙයි ඊළඟ සති දෙකේ මට වියදමට හම්බ වෙන සල්ලිත් ඉතිරි කරගන්න වෙලා තියෙනවා. ඇයි දන්නව ද ?. මම අතින් අපේ ගෙදර තියෙන පරණ ඔර්ලෝසුවක් කැඩුනා. ඒක හදන්නයි මම සල්ලි එකතු කරන්නේ. අනිත් එක තමයි මේ වගේ සංගමයකට බැඳුනට කාටවත් ගෙවීමක් කරන්නේ නෑ. අපි මේක විනෝදෙට හදාගත්තු සංගමයක් නේ. මම මොනතරම් තේරුම් කරලා දුන්නත් ඔයාලා ඒක තේරුම් ගන්නේ නැහැනේ.'

'එතකොට විලියම්... අපි මරණය දක්වාම පවතින සංගමය කියලා මේකට කිව්වේ ඇයි ?.'

ලියෝපෝල්ඩ් දුක්බර හඬකින් අහද්දී සෑම් ඉක්මනින් ම ඒ කථාවට මැදිහත් වුනා.

'හරි... ඔයා අපි කියන දේට කැමැති වෙන්නේ නැතිනම් අපි හොඳ වැඩක් කරනවා. ඒ මොකක් ද දන්නව ද විලියම්. අපි මේ දූන්ම ම ගිහිං ඔයාගේ ඉස්කෝලේ ගුරුවරයා මිස්ටර් ෆ්‍රෙන්ච්, ඒ වගේම මිස්ටර් බීල් විතරක් නෙවෙයි පල්ලියේ පියතුමා කැත්බර්ට් පග් වත් හම්බවෙනවා. ඒ අයට කරදර කෙරුවේ ඔයා කියලා අපි විස්තර ඇතිව කියනවා. ඊට පස්සේ සිද්ධ වෙන්නේ මොකක් ද කියලා ඔයා ට අමුතුවෙන් කියන්න දෙයක් නැහැනේ. අපිට එහෙම දෙයක් කරන්න සිද්ධ වුනොත් ඔයා ගැන අපිට හරිම කනගාටුයි විලියම්.'

සෑම් නිහඬ හඬින් කරපු තර්ජනය අහපු ගමන් ම විලියම් ට පුදුමාකාර විදිහට බය හිතුනා. එයා වෙවුලන අතකින් හිස පිරි මැදගත්තේ කර කියාගන්න දෙයක් නොමැතිවයි. ඒ අතරම එයා මෙසේ කියන්නත් අමතක කෙරුවේ නෑ.

sinhalaebooks.com



'ඒ වුනත් සෑම්...ඔයාලා කරන්න හදන්නේ හොඳ දෙයක් නෙවෙයි කියලා තේරෙන්නේ නැද්ද ?. ඇත්තටම අපි ඒ දේවල් කෙරුවේ ගොඩාක් රහසිගත විදිහට. ඔයාලා මගේ සංගමයේ සාමාජිකයෝ වුන හින්දා ඒ දේවල් වලට සහභාගි වුනා. අන්න ඒ නිසා සිද්ධ වුන හැමදේටම ඔයාලත් හවුල් කාරයෝ කියන එක අමතක කරන්න එපා. එහෙම නම් ඔයාලා කොහොමද මේ දේවල් එළිකරලා නිවැදි කාරයෝ වෙන්නේ ?. මම කියන දේ ඔයාලට තේරෙන්නේ නෑ.'

'අපිට ඒකෙන් වැඩක් නෑ විලියම්... ඔයා වන්දි ගෙවන්නේ නැතිනම් මේ හැමදෙයක් ම එළිකරනවා. ඒක සහතිකයි.'

සෑම් තර්ජනාත්මක විදිහට කොඳුරද්දී ලියෝපෝල්ඩ් ගේ ජයග්‍රාහි කටහඬ ඇහුනා. මේ සංවාදයෙන් විලියම් පරාජයට පත්වෙමින් සිටීම ගැන එයාට හරිම සතුටුයි.

'විලියම්... මරණය දක්වාම පවතිනවා කියලා අපි කියපු එක ගැන ඔයාට මොනව ද හිතෙන්නේ ?.'

බිය නිසා විලියම් ග් මුහුණත් සුදුමැලි වෙලා. එයා කථා කරද්දී කටහඬත් වෙවුලනවා.

'මම එහෙම දෙයක් කිව්වා කියලා යාන්තමට මතකයි. ඒ වුනත් මේ වෙලාවේ මට කරන්න දෙයක් නෑ. මොකද මම අතේ සල්ලි නෑ. හැබැයි සල්ලි ටිකක් හොයාගන්නේ කොහොම ද කියලා කිව්වොත් මම කිසිම පරක්කුවක් නැතිව හරිම සතුටින් ඒ වැඩේ කරනවා. මොනව වුනත් ඔයාලට දෙන්න සල්ලි ටිකක් හොයාගන්න මම කොහොම හරි උත්සාහ කරනවා. ඒක නම් සහතිකයි.'

විලියම් දුක්බර හඬින් එහෙම කිව්වට පස්සේ සෑම් සමච්චලයෙන් වගේ ටික වෙලාවක් විලියම් දිහා බලාගෙන හිටියා. ඔහු කථා කරන්න වුනේ තවත් ටික වෙලාවකට පසුවයි.



'ඇත්තටම විලියම්... අපි ඔයාගෙන් ඉල්ලන්නේ සල්ලි නෙවෙයි. අපි ඔයා වෙනුවෙන් සේවය කෙරුවෙ හරිම අවදානම් විදිහට. ඒ වගේ සේවයක් කරපු අපිට කන්න මොනව හරි දුන්නොත් හොඳටම ඇති. හැබැයි අපිට ඇති තරම් කන්න තියෙන්න ඕනෑ.'

'හොඳයි... මට ඔයාලා කියනා දේ තේරෙනාවා. ඒ වුනාත් මම කොහොමද ඒක කරන්නේ ?. මට කන්න තියෙන කෑම ටික ඔයාලට ගෙනැත් දුන්නම හාමතේ මැරෙන්නයි මට සිද්ධ වෙන්නේ. ඔයාලා හදන්නේ මාට හාමතේ තියලා මරන්නද ?.'

විලියම් වේදනාත්මක හඬකින් බෙරිහන් දෙනකොට සංගමයේ සාමාජිකයින් තිදෙනා ගේ හිත් වලත් කිසියම් කම්පනයක් ඇතිවුනා. ඔවුන් ඒ ගැන ටික වෙලාවක් කල්පනා කෙරුවා. හැබැයි සෑම් ගේ හිතේ කිසිම තෙතමනයක් තිබුනේ නෑ. එයා විලියම් ගේ තර්කය ගණනකටවත් ගන්නේ නැතිව මේ වගේ දෙයක් කිව්වා.

'හරි... එහෙම නම් අපි ඔයත් එක්ක ගෙදර යන්න එනවා. අපිව ගෙදර එක්ක යන්න කැමැති නැතිනම් ඔයා අපිට ඇති තරම කන්න අරන් එන්න ඕනෑ. එහෙම නැතිවුනොත් අපි ගෙදර ඇවිත් ඔයා කරපු නරක වැඩ හැමදෙයක් ගැනම තාත්තට ක්යනවා.'

විලියම් ටික වෙලාවක් කල්පනා කෙරුවා. නොසිතූ වෙලාවක සිදුවුන දේ නිසා එයාගේ හිතත් කම්පනයට පත්වෙලා. මුහුණත් සුදුමැලි වෙලා. හැබැයි ටික වෙලාවකට පස්සේ එයා සමච්චල් සහගත විදිහට හිනාවෙලා මේ වගේ උත්තරයක් දුන්නා.

'කිසිම ප්‍රශ්නයක් නෑ. කැමැති නම් මාත් එක්ක ගෙදර යන්න එන්න. හැබැයි අපේ ගෙදර ඉන්න බල්ලා දක්ක ගමන් ඔයාලා පණ එපා ක්යලා දුවන බව මට සහත්කය්. මගේ බල්ලා අශ්වයෙක් එතර ලොකුයි. එයා හරිම නපුරුයි. ඔයාලා තුන් දෙනාම එක පාරටම හිලලා දමන්න වුනත් මගේ බල්ලට පුළුවන්.'

විලියම් එහෙම කියද්දි කොළු ගැටවුන් තුන්දෙනා මදක් පසු බා සිටියා. දැන් නම් ඒ අයගේ මුහුණු වල තිබෙන්නේ සියපත් බැල්මක්. ඒ වුනත් තමන් ගේ අදහස අමතක කරන්න නම් ඔවුන් සූදානම් නැති සෙයකි. ඒ නිසා කරන්නම දෙයක් නැති තැන විලියම් රහසිගත සංගමයේ සාමාජිකයින් තුන් දෙනා ද කැටුව විලියම් ළඟින් ම නිවස බලා ගමන් කරන්න පටන්ගත්තා. විලියම් ළඟින් ම ලියෝපෝල්ඩ් ඇවිදගෙන එනවා. එයා ගේ මුහුණ බියෙන් ඇකිලිලා තියෙන හැටි විලියම් ට යාන්තමින් පෙනෙනවා. ඔහු ට පිටුපසින් සෑම් සහ ඇල්බට් පැමිණෙනවා.

පිරිස විලියම් ගේ නිවසට ඇතුළු වෙන ගේට්ටුව ළඟට පැමිණෙත්ම ඔවුන් පිළිගන්නට දුවගෙන ආවේ විලියම් ගේ සුරතල් බල්ලා වන ජම්බල් ය. එයා හරිම පොඩි ඒ වගේම තෝංජල් බල්ලෙක්. අශ්වයෙක් තරම් ලොකු නපුරු බල්ලෙක් බලාපොරොත්තුවෙන් පැමිණි ළමුන් පිළිගන්නට ඉදිරියට දුවගෙන ආවේ හරිම කුඩා බල්ලෙක්. ජම්බල් ඉදිරියට දුවගෙන ගොස් ලියෝපෝල්ඩ්, සෑම් සහ ඇල්බට් ගොඩාක් හිතවත් විදිහට පිළිගනිද්දී විලියම් ඒ දිහා බලාගෙන හිටියේ දුක සහ කෝපය දරාගන්න බැරිවයි. මේ වෙනකොටත් කොළු ගැටවුන් තිදෙනා ගේ මුහුණුවල තිබුන බිය පහව ගොස් සමච්චල් සිනාවක් පැතිරිලා තියෙන හැටි විලියම් හොඳටම දැක්කා. දැන් ඉතින් තමන් ගේ සැළසුම් සියල්ලම වැරදුන බව විලියම් හොඳින් ම දන්නවා. ඒ නිසා එයා කිසිම කථාවක් නැතිව නිවසට ඇතුළු වෙන පැති දොර කරා ඇවිදගෙන යන්න වුනා. ඔහුත් එක්ක කොළු ගැටවුන් තුන් දෙනාත් නිවස කරා පැමිණෙනවා. තබන අඩියක් අඩියක් පාසා ම විලියම් ට තමන් ගේ හදවත කඩා වැටෙනවා වගේ දැනෙනවා.

විලියම් නිවස අසලටම පැමිණියාට පසුව සෑම් සිනින් හඬින් මුමුණලා මෙහෙම කිව්වා.



'හරි විලියම්... දැන් ඉතින් ඔයා ගෙදර ගිහිල්ලා අපිට කන්න මොනව හරි අරන් එන්න. හැබැයි රසවත් ලොකු දෙයක් ගෙනෙන්න ඕනැ. එහෙම නැතිනම් ඔයා කරපු හැමදේම ගැන ඔයාගේ තාත්තට කියනවා.'

විලියම් කිසිම කථාවක් නොමැතිව නිවසට ඇතුළු වෙලා දොර හොඳින් වැසුවා.

විලියම් මුලින් ම ඇවිදගෙන ගියේ නිවසේ මුළුතැන්ගේ දෙසටයි. කෝකියා විශාල පුඩිමක් අවන් එකෙන් එළියට ගන්න සූදානම් වෙනකොටමයි විලියම් කුස්සියට ආවේ. විලියම් මේ වෙලාවේ කුස්සියට පැමිණියාට කෝකියා කිසිම කැමැත්තක් දක්වන බවක් නම් පෙනෙන්න තිබුනේ නෑ. එයාගේ බැල්මේ වුනත් තිබුනේ ඒ ආකාරයේ දෙයක්.

'ඇත්තටම ඇයි ඔයා මේ තරම් ලොකු පුඩිමක් හැදුවේ ?.'

විලියම් ඉතාමත් ආචාරශීලි විදිහට කෝකියාගෙන් ඇහුවා. හැබැයි කෝකියා තමන් ගේ හිතේ තියෙන නොකැමැත්ත පෙන්වන්නට වගේ විලියම් ට දුන්නේ මේ වගේ පිළිතුරක්.

'අද රෑට අමුත්තෝ වගයක් එනවා. ඒ අයටයි මම මේ පුඩිම හැදුවේ. හැබැයි පුංචි මහත්තයා... ඔයාට නම් මේ වෙලාවේ කුස්සියේ කරන්න දෙයක් නෑ. ඒ නිසා දැන්ම ම මෙතැනින් ගියොත් හොඳයි.'

විලියම් කරන නොපනත්කම් නිසා කෝකියා හිටියේ එතරම් හිත හොඳින් නෙවෙයි. විශේෂයෙන් ම එයා මහන්සිවෙලා හදන කෑම බීම විලියම් හොරෙන් කන එක තමයි කෝකියාට තියෙන එකම කරදරය. අවන් එකෙන් බිමට බාපු පුඩිම කෝකියා අරන් ගිහිං ගබඩා කාමරයේ තියෙන ආකාරය දිහා විලියම් උනන්දුවෙන් බලා සිටිද්දී කෝකියා ආයේමත් නොකැමැත්තෙන් බෙරිහන් දුන්නා.

'පුංචි මහත්තයා.... කරුණාකරලා මෙතැනින් යනව ද ?. මේ

sinhalaebooks.com



කුස්සිය අයිති මට. ඔයාට මෙතැන කරන්න කිසිම දෙයක් නෑ. අන්න කෑම මේසේ උඩ තේ ලෑස්ති කරලා තියෙනවා. දැන්ම ම ගියොත් ඔයාට තේ බොන්න පුළුවන්.'

විලියම් එයාට හුරු පුරුදු සමච්චල් සහගත හිනා හඬ පතුරුවමින් ම කුස්සියෙන් පිටවෙලා කෑම කාමරය පැත්තට ඇවිදගෙන ගියා. ඒ යන අතරම එයා කෝකියා දිහාට හැරිලා මෙහෙම කියන්නත් අමතක කෙරුවේ නෑ.

'ආ... එහෙම ද ?. හැබැයි මට මොනව හරි දෙයක් කන්න හිතුනොත් මේ ගබඩාව මොන තරම් හොඳට වහලා තිබුනත් මට කමක් නෑ. මට ඒ දේ ගන්න එක සුළු දෙයක්. අන්න ඒක නම් අමතක කරන්න එපා කෝකියෝ හොඳ ද ?.'

විලියම් එහෙම කියද්දී කෝකියා ගේ හිතටත් තිගැස්මක් ඇතිවුනා. මොකද විලියම් ඒ වගේ දෙයක් කිව්වොත් අනිවාර්යයෙන් ම ගබඩා කාමරයේ තියෙන දේවල් නැතිවෙනවා කියලා එයා හොඳින් ම දන්නවා. අද රෑ අමුත්තන් ට පිළියෙල කරපු පුඩිම වඩාත් හොඳින් ආරක්ෂා කරන්න ඕනෑ කියලා කෝකියා හිතාගත්තේ ඒ නිසයි.

විලියම් ඉන්පසුව සෙමෙන් සෙමෙන් කෑම කාමරය දිහාට ඇවිදගෙන ආවා. මේ වනවිටත් හවස තේ පානයට ගැනීම සඳහා රසවත් කෑම ගොඩාක් තේ මේසය උඩ සූදානම් වෙලයි තිබුනේ. අම්මා සහ විලියම් ගේ අක්කා වන එතල් දැනටමත් තේ මේසයට වාඩිවෙලා. එක පාරටම තේ මේසයට කඩාවැදුන විලියම් දිහා ඔවුන් බලාගෙන හිටියේ කෝපයෙන්. ඒ අතරම අම්මා ගේ නොසතුටු කටහඬත් විලියම් ට ඇහුනා.

'විලියම්... පුතා. ඔයා දැනටමත් ගොඩාක් පරක්කුයි. අනික තේ මේසෙට වාඩිවෙන්න ඉස්සර වෙලා අත් දෙක හෝදන්න ඕනෑ කියලා ඔයාට අමතක වුනා ද ?.'



විලියම් කිසිම කථාවක් නැතිව මේසෙට වාඩිවුනා. ඒ අතරම එයා අපිරිසිදු හිසකෙස් අත් වලින් පිටුපසට කරන්නත් අමතක කෙරුවේ නෑ. දැන් එයාගේ අත් වල තවත් කුණු ගෑවිලා. හැබැයි එයා මේසයට යටින් අත් දමලා මේස රෙද්දෙන් අත් වල තිබුන කුණු ටික හොඳින් පිස දමන්නත් අමතක කෙරුවේ නෑ. (විලියම් මේ වැඩේ නිතරම කරනවා. ඒ නිසා මේස රෙද්ද නිතරම පිරිසිදු කරන්නත් අම්මාට සිදුවෙනවා). කෑම මේසයට වාඩිවුන ගමන් ම ඉදිරිපස තියෙන ජනේලයෙන් විලියම් ට එළිමහන හොඳින් ම පෙනෙනවා. සෑම්, ඇල්බට් සහ ලියෝපෝල්ඩ් එළිමහනට වෙලා නොඉවසිලිමත් විදිහට බලාගෙන ඉන්න හැටි තමයි විලියම් මුලින් ම දැක්කේ. ඒත් එක්කම විලියම් ගේ හිතේ තිබුන සතුට බොඳවෙලා ගියා. එයා අම්මා දිහාට හැරිලා සිහින් හඬකින් මෙහෙම කිව්වෙත් ඒ නිසාමයි.

'අම්මා...අද මට කෑම මේසේ ඉඳන් තේ බොන්න බෑ. මොකද මෙතැන හරිම කළබලකාරියි කියලා මට හිතෙනවා. ඒ හින්දා මම ගෙවත්තට ගිහිං නිදහසේ වාඩිවෙලා තේ බොන්න ද ?. මේ හිරවුන පුංචි කාමරේට වඩා එළිමහන මොනතරම් නිස්කලංක ද ?.'

විලියම් එහෙම කියද්දී බ්‍රවුන් මහත්මිය ඔහු දිහා බැලුවේ පුදුමයෙන්. ඒ අතරම ඇය විලියම්ගෙන් මෙහෙම ඇහුවා.

'විලියම්... මට ඇත්ත කියන්න. ඔයාට අද අසනීපයක්වත් හැදීගෙන එනව ද ?.'

'ඒකත් එක විදිහක අසනීපයක් තමයි අම්මා. කොහොම වුනත් මම එළිමහනට ගිහිං නිදහසේ තේ බොන්න තමයි කැමැති. අනික එළිමහනේ ඉන්නකොට මට ගොඩාක් කන්න පුළුවන්. මේ වගේ පුංචි කාමරයක් අස්සේ හිරවෙලා ඉන්නකොට හරියට බඩගිනි දැනෙන්නෙත් නෑ. අන්න ඒ නිසයි මට කෑම බීම අරන් එළියට ගිහිං තේ බොන්න දෙන්න කියලා කිව්වේ.'

sinhalaebooks.com



'පිස්සු කථාවක් නේ.'

විලියම් කියන දේ දිහා කිසිම උනන්දුවක් නැති විදිහට බලාගෙන හිටපු එතල් සමච්චල් සහගත විදිහට කිව්වා. ඒ අතර අම්මා ගේ කටහඬත් විලියම් ට ඇහුනා.

'පුතා... ඔයාට ඒ විදිහට හිතෙනවා නම් දැන්ම ම ගිහිං ටිකක් නිදාගන්න. මම ඔයාගේ තේ ලෑස්ති කරලා බන්දේසියක තියාගෙන කාමරේටම ගෙනැත් දෙන්නම් කෝ.'

අම්මා එහෙම කියද්දි විලියම් ආයේමත් ජනේලයෙන් පිටත බැලුවා. සෑම් අතක් දිගු කරලා ඉක්මන් කරන්න කියලා සංඥාකරන හැටි ඔහුට පෙනුනේ එතකොටමයි.

'අම්මා... ඔයා කියන විදිහට මගේ කාමරේ ඉඳන් තේ බොන්න වුනත් මම කැමැති නෑ. මට ඕනෑ එළිමහනේ ඉඳන් තේ බොන්න. ඒ හින්දා මම මේ කේක් ටික අරන් එළිමහනට යන්න ද ?. මෙතැන කේක් ගොඩාක් තියෙනවා තමයි. හැබැයි එළිමහනට ගියොත් මට මේ ටික ඔක්කොම වුනත් කන්න පුළුවන්.'

විලියම් එහෙම කියනවාත් සමගම බ්‍රවුන් මහත්මිය ජනේලයෙන් පිටත බැලුවා. එතකොට තමයි ගෙවත්තේ හිටගෙන ඉන්න කොළු ගැටවුන් තිදෙනා ඇයට පෙනුනේ. ඒ සමගම ඇය විලියම් දිහාට හැරිලා නොසන්සුන් හඬකින් මෙහෙම ඇහුවා.

'විලියම්... කවුද අර ගෙවත්තේ හිටගෙන ඉන්න කොල්ලෝ තුන්දෙනා ?.'

විලියම් දෙතොල දිවෙන් තෙත් කෙරුවා. එනපොට හොඳ නැති බව ඔහුට සහතිකයි. කරකියා ගන්න දෙයක් නැති තැන එයා ගොඩාක් අහිංසක විදිහට අම්මාගෙන් මෙහෙම ඇහුවා.

'කොයි කොල්ලෝ ගැනද ඔයා කියන්නේ අම්මා ?.'



'අර අතන මල් පඳුර ළඟ හිටගෙන ඉන්නේ ?. ඒ අය ඔයා දිහාමයි බලාගෙන ඉන්නේ.'

විලියම් ඉක්මනින් ම ජනේලය දිහා ට හිස හැරෙව්වා. කොළු ගැටවුන් තිදෙනා අහම්බෙන් දුටු බව අඟවන්නට වගේ ඔහු කථා කරන්න වුනේ ඉන්පසුවයි.

'අර අතන ඉන්න අය ද ?. අම්මා... ඔයා ඒ අය ගැන ද කියන්නේ ?.'

'ඔව්... කවුද ඒ කොල්ලෝ විලියම් ?.'

අම්මාට දෙන්න ඕනෑ පිළිතුර මොකක් ද කියලා හිතාගන්න වගේ විලියම් ටික වෙලාවක් කල්පනා කෙරුවා. ඔහු මෙවැනි පිළිතුරක් දුන්නේ ඉන්පසුවයි.

'ඒ ඉන්නේ මගේ යාළුවෝ වගයක්. ඒ අයට අපේ ගෙවත්ත බලන්න ඕනෑ කිව්වා. ඉතින් මම එක්ක ආවා. අනික....'

'ඇයි මේ වගේ යාළුවෝ ආශ්‍රය කරන්නේ විලියම් ?. බලන්නකෝ. ඒ අය හරිම නරක ඒ වගේම දඩබ්බර කොල්ලෝ ටිකක් වගෙයි.'

අම්මා කෝපයෙන් එහෙම කියද්දි විලියම් මහා හයියෙන් හිනාවුනා. ඔහු මෙවැනි දෙයක් කිව්වේ ඉන්පසුවයි.

'ඒ අය නරක, දඩබ්බර කොල්ලෝ නෙමෙයි අම්මා. ඇත්තටම ඒ අය නරක, දඩබ්බර අය විදිහට පෙනෙන්නේ ඒ අය ඇඳගෙන ඉන්න ඇඳුම් හින්දයි.'

'පිස්සු කථා කියන්න එපා විලියම්. ඔයා දැන්ම ම ගිහිං ඒ අයට යන්න කියන්න. අනික ඔයා තේ බීලා ඉවර ද ?.'

අම්මා කෝපයෙන් අහද්දී විලියම් සන්සුන් විදිහට උත්තර

sinhalaebooks.com



දෙන්න අමතක කෙරුවේ නෑ.

'ඔව් අම්මා... කොහොම වුනත් මම කෑම කාමරේ ඉඳන්ම තේ බොන්න හිත හදාගත්තා. ඒ හින්දා මම හොඳට කේක් කාලා තේත් බීවා. ඇත්තටම මීට ටික වෙලාවකට ඉස්සර වෙලා මට මොනව වෙලා තිබුන ද කියලා තවමත් හිතාගන්න අමාරුයි.'

'එහෙම නම් ඔයා දැන්ම ම ගිහිං අතන ඉන්න කොල්ලෝ තුන් දෙනාට යන්න කියන්න. අනිත් එක තමයි ඒ අය ආයේ කවදාවත් මෙහාට එක්ක එන්නත් එපා හොඳ ද ?.'

අම්මා ස්ථිරසාර හඬකින් කියද්දී විලියම් සෙමෙන් සෙමෙන් කෑම කාමරයෙන් පිටවෙලා ගෙවත්ත දිහාට ඇවිදගෙන ගියා. මුළු ලෝකයම තමන් වටේ කරකැවෙනවා වගෙයි ඔහුට දැනෙන්නේ.

ඉවසිල්ලක් නැතිව බලාගෙන ඉන්න කොළු ගැටවුන් තුන් දෙනා ළඟට ගිය විලියම් බොහෝම සෙමින් මේ විදිහට කිව්වා.

'ඔයාලා දැන්ම ම මෙතැනින් ගියොත් හොඳයි කියලා මට හිතෙනවා. මොකද අපේ අම්මට හොඳටම කේන්ති ගිහිං.'

'හරි... එහෙමනම් අපි ඔයාගේ තාත්තට හැමදෙයක් ගැනම කියන්නම් කෝ.'

'එපා... මම කියන දේ අහන්න. ඔයාලා ගේට්ටුව ළඟට වෙලා ඉන්නකෝ. මම මොනව හරි දෙයක් අරන් ඉක්මනින් ම එන්නම්. දෙයියනේ... මේ තරම් කරදර වෙනවා කියලා දන්නවා නම් මම කවදාවත් රහසිගත සංගමයක් හදන්නේ නෑ. සහතිකයි.'

විලියම් එහෙම කියද්දී කොළු ගැටවුන් තිදෙනා කෝපයෙන් මුමුණමින් ගේට්ටුව දිහාට ඇවිදගෙන ගියා. විලියම් නැවතත් නිවස දිහාට දුවගෙන ආවේ ඉන්පසුවයි.

මෙ වනවිටත් විලියම් ගේ නිවසේ පැවැත්වෙන සාදයට



අමුත්තන් එකා දෙන්නා බැගින් පැමිණෙමින් සිටිනවා. විලියම් සාදයට ගොඩවෙද්දි ම දුටුවේ කැත්බර්ට් පග් පියතුමා සහ බිල් මහතා විසිත්ත කාමරයේ වාඩි වී සිටින අන්දමයි. ඔවුන් දුටු විගසම කුමක්දෝ නැති ගැන්මක් විලියම් ගේ හදවත පුරාම පැතිරුනා. ඔහු ඉක්මන් ගමනින් මුළුතැන්ගේ දෙසට ඇවිදගෙන ගියේ ඒ නිසයි. මෙ වනවිටත් මුළුතැන්ගේ සේවිකාව ගජරාමෙට වැඩ. හැබැයි ඒ අතරම එයා ගබඩා කාමරය දිහා පරික්ෂාවෙන් බලන්නත් අමතක කෙරුවේ නෑ.

කොහොම වුනත් කරන දෙයක් තාත්තා නිවසට පැමිණෙන්නට පෙර කරන්න ඕනෑ කියලා විලියම් දන්නවා. ඒ හින්දා ඔහු ගබඩා කාමරය ළඟ හැංගිලා අවස්ථාව එනතෙක් ඉවසිල්ලක් නැතිව බලාගෙන ඉන්නවා. කෝකියා ගබඩා කාමරයේ දොර අරින හැමවෙලාවක දී ම එහි රාක්කයක් උඩ තබා තිබෙන විශාල පුඩිම විලියම් ට පෙනෙනවා. රන්වන් පාට වෙනතෙක් හොඳින් පිළිස්සී සුවඳ හමමින් තිබෙන මේ අපූරු පුඩිම ඩැහැගත හොත් රහසිගත සංගමයේ සාමාජිකයින් ගේ තර්ජනයෙන් ගැළවෙන්න පුළුවන් කියලා විලියම් දන්නවා. ඔහු මේ ඉවසිල්ලක් නැතිව බලාගෙන ඉන්නේ පුඩිම ඩැහැගන්න අවස්ථාව පැමිණෙන තුරුයි. ඒ අතරම විලියම් පුඩිම පැහැර ගැනීම සඳහා අපූරු සැළසුමක් සකස් කරන්නත් අමතක කෙරුවේ නෑ.

කෝකියා කුස්සියේ සිටින නිසා කුස්සියේ දොරෙන් ඇතුළු වී ගබඩා කාමරයට යන එක අවදානම් කියලා විලියම් දන්නවා. ඒ නිසා ඔහු ඉදිරිපස දොරෙන් එළියට ගොස් නිවස පිටුපසට ආවා. දැන් ඔහු සිටින්නේ ගබඩා කාමරයේ ජනේලය ළඟයි. විලියම් ගේ වාසනාවට වගේ ගබඩාවේ ජනේලයට අගුලු දමා තිබුනේ නෑ. ඒ නිසා විලියම් ඉතාම සීරුවෙන්, කිසිම හඬක් නෑසෙන විදිහට ගබඩාවේ ජනේලය විවෘත කෙරුවා. දැන් ඉතින් සැළසුමේ වැදගත් ම කොටස සිදු කරන්නයි විලියම් සූදානම් වන්නේ. ඊට පෙර ඔහු

sinhalaebooks.com



වටපිට හොඳින් විපරම් කරන්නත් අමතක කෙරුවේ නෑ. විශේෂයෙන් ම කෝකියා පිටතට පැමිණෙයි ද කියන සැකයෙන් ඔහු කුස්සියේ දොර දිහාත් ටික වෙලාවක් බලාගෙන හිටියා. නිවසේ හැමදෙනාම උත්සයට සූදානම් වෙනවා. ඒ නිසා මේ වෙලාවේ හැමෝම කාර්ය බහුලයි.

විලියම් දිග හුස්මක් අරන් ජනේලයෙන් ගබඩා කාමරයට පැන්නා. ඉන්පසුව විශාල පුඩිමත් අරන් ආපහු ජනේලයෙන් ම පිටතට පනින්නත් ඔහුට වැඩි වෙලාවක් ගියේ නෑ.

විලියම් ගේ සැලැස්ම අකුරටම හරි ගියත් සීසර් ගෙන් නම් ඔහුට ගැලවීමක් තිබුනේ නෑ. ඇත්තටම සීසර් කියන්නේ මිස්ටර් බිල් ගේ සුරතල් බල්ලා. මිස්ටර් බිල් විලියම් ගේ නිවසේ සාදයට පැමිණෙද්දී සීසරුත් ඔහු සමඟ ඇවිත් එළිමහනට වෙලා හිටියා.

සුවඳ විහිදෙන පුඩිමත් ඔසවාගෙන හොරෙක් වගේ ගෙවත්ත දිගේ ඇවිදගෙන යන විලියම් දැකපු ගමන් ම සීසර් වලිගයත් වනමින් විලියම් ළඟට දුවගෙන ආවා. සීසර් ඒ වෙලාවේ විලියම් ට හිතවත්කම පෙන්වන්න ළඟට ආවත් පුඩිමේ සුවඳ නිසා ඔහු එක්වරම උමතුවෙන් වගේ දඟලන්න වුනා.

එනපොට හොඳ නැති බව විලියම් ට තේරුනා. ඒ හින්දා ඔහු පුඩිම ඔලුවට උඩින් ඔසවාගන්නා ගමන් ම සිහින් හඬින් 'පැත්තකට දුවනවා' කියලා සීසර් ට කිව්වා. විලියම් ගේ හඬට බයවුන සීසර් මදක් පසුබා සිටියත් පුඩිමේ සුවඳ නිසා එයාට හැමදෙයක් ම අමතක වුනා. ඒ නිසා සීසර් විලියම් ගේ පැත්තකින් ආයේමත් දුවගෙන එන්න වුනා. ඒ අතරම එයා ඔලුව උඩට ඔසවාගෙන පුඩිමේ රසවත් සුවඳ ඉවකරන්නත් වුනා. අවස්ථාවක් ලැබුන විගසම පුඩිම විලියම්ගෙන් ඩැහැගන්නයි දැන් සීසර් සූදානම් වෙන්නේ.



ඒ අතරම විලියම් පුඩිමත් ඔසවාගෙන ෂ්බරි පඳුරු අස්සෙන් ගෙවත්තේ පසුපස ගේට්ටුව දිහාට දුවගෙන යනවා. ඒ වුනත් විශාල පුඩිම තනි අතින් ඔසවාගෙන උමතුවෙන් මෙන් දුවගෙන එන සීසර්ගෙනුත් බේරිලා ගේට්ටුව දිහාට යන එක ලේසි පාසු වැඩක් නෙවෙයි. ඒ අතරම ඔහු සීසර් ව පලවා හරින්නත් උත්සාහ කරනවා. ඒ වුනත් දැන් දුවැන්ත බල්ලා පුඩිමේ සුවඳින් උමතුවෙලා වගෙයි සිටින්නේ.

තවත් මොහොතකින් සීසර් තමන් ගේ ඉදිරිපස අත් දෙක විලියම් ගේ උරහිසට තිබ්බා. නොසිතූ මොහොතක සිදුවුන මේ දේ නිසා විලියම් බිමට වැටුනා. එයා වැටෙද්දී රසවත් පුඩිමෙ එයාගේ නහයත් වැදුනා.

විලියම් ඉක්මනින් ම නැගිටලා සීරුන අත පය පිස දමාගන්නා ගමන් ම වටපිට බැලුවා. සීසර් තළු මරමින් පුඩිම ගිල දමන හැටි ඔහුට පෙනෙනවා. මේ වනවිටත් පුඩිමේ භාගයක් ම අතුරුදහන් වෙලා. ඉතිරි කොටසත් වේගයෙන් නොපෙනී යන හැටි විලියම් ට පෙනෙනවා.

'විනාසයි... මේකා නම් බල්ලෙක් නෙවෙයි. මහ පෙරේත බල්ලෙක්. මිස්ටර් බිල් මාස ගාණකින් මේකාට කන්න දීලා නෑ වගෙයි.'

මේ අතර සීසර් පුඩිමේ ඉතිරි කොටසත් හනි හනික ගිල දැම්මා. විලියම් මේ දිහා බලාගෙන හිටියේ කිසිම අරමුණක් නැති විදිහටයි. රහසිගත සංගමයේ සාමාජිකයින්ගෙන් බේරෙන්න හිතාගෙන අමාරුවෙන් රැගෙන ආ පුඩිම අහම්බෙන් කඩාපාත් වුන බල්ලෙක් විසින් ඩැහැගත් බව කෙසේ නම් විශ්වාස කරන්න ද ?. මේ වනවිටත් සෑම්, ඇල්බට් සහ ලියෝපෝල්ඩ් ඉවසිල්ලක් නැතිව ගේට්ටුව ළඟ බලා සිටින බව විලියම් දන්නවා.

පුඩිම ගිල දමා අවසන් වුන සීසර් සතුටින් කන් සෙලෙව්වා.

sinhalaebooks.com



ඉන්පසුව ඔහු විලියම් දිහා බලාගෙන හිටියේ සමාවෙන්න කියන්නාක් වැනි බැල්මක් ද සමඟයි. තවත් ටික වෙලාවකින් සීසර් නැවතත් නිවස දිහා දුවගෙන යද්දී විලියම් අරමුණකින් තොරව ගෙවත්තේ කෙළවර තියෙන ගේට්ටුව දිහාට ඇවිදගෙන ගියා. ඔහු ගේට්ටුවෙන් පිටතට අඩිය තියද්දීම අඳුරු ඡායාවන් තුනක් පැමිණ ඔහුව වටකර ගත්තා.

විලියම් අසලින් ම සිටියේ සෑම් ය. ඔහු නොඉවසිලිමත් විදිහට විලියම්ගෙන් මෙහෙම ඇහුවා.

'ආ... විලියම්... ඔයා ආවද ?. ඔයා මොනව ද අපිට ගෙනාවේ?.'

මේ වනවිටත් සීසර් පුඩිම ගිල දමා අවසන්. ඒ අතර විලියම් ගේ සුරතල් බල්ලා ජම්බල් පැමිණ පුඩිම තබා තිබුන දීසිය ලෙවකන්න පටන්ගත්තා. මේ වනවිටත් සිදුවූ දෙයින් විලියම් ගේ හිතට පුදුමාකාර කෝපයක් දැනෙමින් තිබුනා. ඒ නිසාම එයා මහා හයියෙන් බෙරිහන් දෙමින් හිතේ තිබුන කෝපය පිට කරන්න වුනා.

'මම කිසිම දෙයක් ගෙනාවේ නෑ. ඒ වගේම මම තමුසෙලාට කිසිම දෙයක් දෙන්නෙත් නෑ. ඒ හින්දා මාව තරක මිනිහා නොකර දැන්ම ම මෙතැනින් පිටවෙලා යනවලා.'

එහෙම කියන ගමන් ම විලියම්, සෑම් ගේ ඇඟට කඩා පැන්නා. නොසිතූ විදිහට සිද්ධ වුන මේ දේ හින්දා සෑම් විසිවෙලා ගිහිං පාර අයිනේ තිබුන කානුවට වැටුනා. එතකොටම ඇල්බට් සහ ලියෝපෝල්ඩ් දෙන්නත් විලියම් ගේ ඇඟට කඩාපැන්නා. ඒ අතර කානුවෙන් ගොඩට ආපු සෑමුත් මිතුරන් ට එක් වෙලා විලියම් එරෙහිව සටනට අවතීර්ණ වුනා. දැන් තමයි නියම යුද්ධය ආරම්භ වුනේ.



.....................................................................................

'දෙයියනේ පුඩිම අතුරුදහන් වෙලා. ඇත්තමයි මට නම් ඒක හිතාගන්නත් අමාරුයි. ඒ වුනත් පුඩිම නෑ.'

තවත් ටික වෙලාවකට පස්සෙ අමුත්තන් ඉන්න තැනට දුවගෙන ආපු බ්‍රවුන් මහත්මිය පුදුමයෙන් බෙරිහන් දුන්නා.

'ඔව්... ඔයාලට සංග්‍රහ කරන්න කියලා මම විශේෂයෙන් ම හදපු පුඩිමයි මේ නැතිවෙලා තියෙන්නේ. නැතිවෙන්න විනාඩි දෙකකට ඉස්සර වෙලා පුඩිම ගබඩා කාමරයේ තිබ්බා කියලා කෝකියා කියනවා. හැබැයි දැන් ඒක නෑ. හැබැයි කුස්සියේ දොරෙන් ආපු කෙනෙක් නම් නෙවෙයි පුඩිම හොරකම් කරලා තියෙන්නේ. මොකද කෝකියා හැමවෙලාවෙම කුස්සියේ ඉඳලා තියෙනවා. මේ හොරකම කරපු කෙනා එළියෙන් ඇවිත් ගබඩාවේ දොර ඇරලා තමයි පුඩිම අරන් ගිහිං තියෙන්නේ.'

බ්‍රවුන් මහත්මිය ගේ විස්තරය අසාගෙන හිටපු විලියම් ගේ තාත්තා, ඒ කියන්නේ බ්‍රවුන් මහතා පුටුවෙන් නැගිටින ගමන් ම මෙහෙම කිව්වා.

'එහෙමනම් හොරා තවම වැඩි ඈතක ගිහිං නැතිව ඇති.'

බිල් මහතා ද පුටුවෙන් නැගිට්ටා.

'හරි... අපි ඉක්මන් කෙරුවොත් හොරාව අල්ලාගන්න බැරිවෙන එකක් නෑ. සමහර විට හොරා වත්ත පල්ලෙහා තියෙන ෂර්බරි බඳුරු අස්සට වෙලා පුඩිම කනවා ඇති. අපි ඉක්මනට ගිහිං බලමු.'

මිනිසුන් තිදෙනා එක පෙළට සිටින ලෙසට සකස් වී සෙමෙන් සෙමෙන් ෂර්බරි පඳුරු යාය දෙසට ඇවිදගෙන ගියා. ඔවුන් ට මුලින් ම ඇසුනේ අතු ඉති කැඩෙන විට නැගෙන සිහින්

හඬක්. ඉන්පසුව කිසියම් භාජනයක් අතින් ගෙන බල්ලෙකුගෙන් බේරෙන්නට වෙර දරන කෙනෙකුගේ අඳුරු ඡායාවක් ඔවුන් ට පෙනුනා.

'අන්න ඉන්නවා මිනිහා.'

'සද්ද කරන්න එපා. අපි හෙමින් ම ගිහිං එයාව අල්ලා ගනිමු.'

'හොරා මගේ සීසර් එක්ක යාළුවෙලා වගෙයි.'

'එයා වැඩිය ලොකු කෙනෙක් නෙවෙයි.'

'මට නම් පෙනෙන විදිහට හොරා කොල්ලෙක්.'

මේ කථාබහ ඇසෙද්දී විලියම් ගේ තාත්තා ගේ හිතේ උපන්නේ පුදුමාකාර අන්දමේ සිතිවිලි සමුදායක් සහ සැකයක්. ඒ වුනත් එයා අනිත් අයත් එක්ක හොරා පසුපස ලුහු බඳින්න වුනා. මේ වනවිටත් හොරා ගේ අඳුරු රුව ලෝරල් පඳුරු අස්සේ සැඟවිලා අවසන්. පිරිස බොහෝම සෙමින් හොරා පසුපස ලුහු බැන්දා. තවත් ටික වෙලාවකදී ඔවුන් ට හමුවුනේ පුඩිම තිබූ භාජනය ලෙවකමින් සිටින සීසර් ය. විලියම් ගේ සුරතල් බල්ලා ජම්බල්, සීසර් දෙස නොඉවසිලිමත් ව බලා සිටින අන්දමත් පිරිස දැක්කා.

'ඉක්මන් කරන්න. මේ හොරා පැනලා යන්න ඉස්සර වෙලා අපි කොහොම හරි අල්ල ගන්න ඕනෑ.'

මිස්ටර් බිල් එහෙම කිව්වා. ඊට පස්සේ පිරිස ලෝරල් පඳුරු යාය පසුකරගෙන ඉදිරියට දුවගොස් විලියම් ගේ ගෙවත්ත කෙළවරට පැමිණියා. මේ වෙලාවේ ඔවුන් දැක්කේ පුදුමාකාර දසුනක්. විලියම් ඔහුගේ හිත මිතුරන් තිදෙනා සමඟ පුදුමාකාර අන්දමේ යුද්ධයක්. පඳුරු යායට උඩින් තමන් දෙස බලාගෙන සිටින හිස් තුනක් විලියම් යාන්තමට දැක්කා. හැබැයි සටන නිසා ඔවුන් කවුදැයි හොඳින් ම



බලාගන්න නම් විලියම් ට හැකිවුනේ නෑ. හැබැයි වැඩිහිටියන් බෙරිහන් දෙමින් කියන දේ නම් විලියම් ට හොඳින් ම ඇහුනා.

'කමෝන් විලියම්.'

'ඔය හොරුන්ට යන්න දෙන්න එපා. කොහොම හරි එකෙක් ව අල්ලාගන්න.'

'නියම සටන විලියම්. නියම සටන'

'තව හයියෙන් ගහලා. හොරුන්ගෙන් එකෙක් අල්ල ගන්න.'

මේ වනවිටත් ඇල්බට් ගේ නාසයෙන් ලේ ගලනවා. ඔහු හඬමින් ම උදව් ඉල්ලා බෙරිහන් දෙමින් තමන් ගේ නිවස දිහාට දුවන්න පටන්ගත්තා. කානුවට වැටී සිටි ලියෝපෝල්ඩ් දනි පනි ගා නැගිටලා දුවන්න වුනෙත් එතකොටමයි. දැන් ඉතිරි වෙලා ඉන්නේ සෑම් විතරයි. හැබැයි සෑම් විශාල සිරුරක් තියෙන කෙනෙක්. ඒ නිසා විලියම් ට ඔහු සමඟ සෑහෙන වෙලාවක් සටන් කරන්න සිද්ධ වුනා. ඔන්න එතකොටම තමයි මිස්ටර් බිල් ගේ දුවැන්ත බල්ලා සීසර් එතැනට කඩාගෙන පැන්නේ.

සීසර් ගේ රුව යාන්තමින් දැක්කා විතරයි සෑම් පාර දිගේ පණ එපා කියලා දුවන්න පටන්ගත්තා. එතකොටම විලියම් ගේ සටන හමාර වුනා. හැබැයි මේ වනවිටත් ඔහුගේ කමිසයේ කොලරය ඉරිලා. ටයි පටිය ගැලවෙලා. කබාය කීතු කීතු වෙලා. කණෙනුත් ලේ ගලාගෙන එනවා. ඒ වුනත් සටනින් ජයගත්තු සතුටත් එක්ක තමන් දිහා බලාගෙන ඉන්න වැඩිහිටියන් පිරිස දිහා ඔහු බලාගෙන හිටියේ ආඩම්බරය ඉතිරුන බැල්මකුත් එක්කයි.

..............................................................

තවත් සෑහෙන වෙලාවකට පස්සේ විලියම් සැහැල්ලු ඇඳුමක් ඇඳගෙන තමන් ගේ කාමරයේ ඇඳ මත දිගාවෙලා හිටියා.

sinhalaebooks.com



සටනින් පසු ඉතිරිවුන තුවාල වල වේදනාව සමඟ අත පය වල කැක්කුම ඔහුට හොඳින්ම දැනෙනවා. ඒ වුනත් අද දවසේ සිදුවුන හැමදෙයක් ගැනම ඔහු කල්පනා කරන්න වුනා.

තමත් දඩබ්බර පෙනුමක් තියෙන, නපුරු කොල්ලෝ තුන් දෙනෙක් නිවසට කැඳවාගෙන ආ හැටි,

නිවසේ තිබුන විශාල පුඩිම හොරකම් කළ හැටි,

පාර අයිනේ දී කොල්ලෝ තුන්දෙනෙක් සමඟ ඇති තරම් ගහගත්තු හැටි, විලියම් ට සිහිපත් වුනා.

මේ සටනින් විලියම් ට කමිස කොලරය, ටයිපටිය සහ කබාය අහිමි වුනා. ඒ වගේම ඇස ළඟ කළු පැහැවුන ලොකු තැල්මකුත් ඉතිරිවුනා.

මොනදේ වුනත් ගෙදර අය හිතන්නේ විලියම් වීර ක්‍රියාවක් කළා කියලයි. පුඩිම හොරකම් කළ හොරුන් සමඟ විලියම් සටන් කළා කියලයි ඔවුන් තවමත් හිතාගෙන ඉන්නේ. ඇත්තටම සිද්ධ වුනේ මොකක් ද කියලා ගෙදර අය දන්නවා නම් සිද්ධවෙන්නේ මොනතරම් අවාසනාවන්ත දෙයක් ද කියලත් විලියම් දන්නවා. හැබැයි අද සිද්ධ වුන හැමදෙයක් ම විලියම් ගේ වාසනාවටම වුනා වගෙයි.

මේ දේවල් ගැන කල්පනා කරන ගමන් ම විලියම් ගේ දෑස පුරා නිදිමත තැවරෙන්න වුනා. නිදිමතින් දෑස් පියවෙන්නට ඉස්සර වෙලා එයා සිහිත් හඩින් මෙසේ කොඳුරන්නත් අමතක කෙරුවේ නෑ.

'ඔවා ගැන වැඩිය හිතන්න ඕනෑ නෑ. මොකද කොළු කාලේ මේ වගේ දඩබ්බර වැඩ ඕනෑ කෙනෙක් කරනවා නේ.'

# 2.
# පරිච්ඡේදය

# විලියම් ගේ තවත් දඟ වැඩක්

විලියම් ගේ ඉස්කෝලේ තියෙන නාට්‍ය සංගමය හරිම ජනප්‍රිය එකක්. විලියම් ද ඒ සංගමයේ සාමාජිකයෙක්. පාසැලේ හැමෝම නාට්‍ය සංගමය ගැන ගොඩාක් හොඳ කිව්වත් විලියම් ට නම් එය පෙන්වන්න බෑ.

ඔන්න එක දවසක් නාට්‍ය සංගමය ඓතිහාසික නාට්‍යයක් පාසැලේ දී රඟ දැක්වුවා. ක්‍රිස්ටෝපර් කොලොම්බස් ඇමෙරිකාව හොයා ගවේෂණය කිරීමෙන් පසුව එහි සිටින ස්වදේශික මිනිසුන් සමඟ කරන සටනයි මේ නාට්‍යයෙන් නිරූපනය වුනේ. මේ නාට්‍යයේ චරිතයක් රඟ දක්වන්නට පැමිණෙන ලෙසට විලියම් ටත් ආරාධනාවක් ලැබුනා. හැබැයි එයා කොහොමටවත් කැමැති

sinhalaebooks.com



වුනේ නෑ. ශාලාවේ පසුපසම අසුන් පේලියේ වාඩිවෙලා නාට්‍යය බලන්නයි ඔහු වැඩියෙන්ම කැමැත්තක් දක්වූවේ.

නාට්‍යයේ රඟපාන ක්‍රිස්ටෝපර් කොලොම්බස් ට නම් විලියම් ගේ කැමැත්තක් තිබුනේ නෑ. ඒ නළුවා සුදුම සුදු පාට කෙනෙක් අතික එයා රඟපාන විදිහටත් විලියම් කැමැති වුනේ නෑ. තාත්තා ගේ පෙනුම වගේම ගමේ තැපැල් පියන් ගේ හැසිරීමත් නාට්‍යයේ ක්‍රිස්ටෝපර් කොලොම්බස් ට තියෙන නිසයි එයා මේ නළුවාට වැඩියෙන් ම අකමැති වුනේ. ඒ වුනත් ස්වදේශිකයින් ට රඟපාන නළුවන් දිහා නම් විලියම් ඇහිපිය නොහෙලා බලාගෙන හිටියා. ඒ අය තමයි ජේම්ස් මයිනර්, පින්චින් මේජර්, සහ ගෝග්ල්ස්. මේ නළුවෝ කවුද කියලා විලියම් හොඳටම දන්නවා. හැබැයි එයා වැඩියෙන් ම කැමැති වුනේ ඒ අය ඇඳලා හිටපු ඇඳුම් වලටයි.

ස්වදේශිකයින් විදිහට රඟපාන නළුවන් ගේ මුළු ඇඟම අපූරු වොල්නට් දුඹුරු පාටකින් හැඩ ගන්වලයි තිබුනේ. ඒ හින්දා නළුවන් ගේ ඇස් සහ දත් තවත් දීප්තිමත් විදිහට පෙනෙනවා. මේ අපූරු පෙනුම තියෙන නළුවන් වේදිකාවට ආවම නාට්‍යය මොනතරම් ලස්සන ද කියලා විලියම් ට හිතෙනවා. ඒ විතරක් නෙවෙයි ස්වදේශිකයින් විදිහට රඟපාන නළුවන් ගේ සපත්තු වගේම ඔවුන් ඉනේ එල්ලගෙන ඉන්න කඩු ආදියත් දිස්නය දෙන විදිහට පොලිෂ් කරලා තිබුනා. එයත් විලියම් ගේ හිත ගත්ත තවත් දෙයක් බවට පත්වෙලා තිබුනා.

ටික වෙලාවකින් නාට්‍යය අවසන් වුනා. නරඹන්නන් ගංගාවක් වගේ ශාලාවෙන් එළියට යද්දී විලියම් ද ඔවුන් අතරින් රිංගමින් වේදිකාව පිටුපස පැත්තට ගියේ තමන් ගේ හිත ගත්තු නළුවන් තවත් හොඳින් දකබලාගන්නයි. කවදාහරි දවසක ඒ විදිහේ අපූරු ඇඳුම් කට්ටලයක් හැඳගෙන රඟපාන්න තමයි විලියම් ගේ හිත දැන් ඔහුට බල කරන්නේ. ඇත්තටම දැන් ඒ සිතිවිල්ල විලියම්



ගේ හිතේ පැලපදියම් වුන අපූරු සිහිනයක් බවටත් පත්වෙලා. මේ සිහිනයත් එක්ක තවත් ටික දුරක් යද්දී හයවැනි පංතියේ ඉගෙන ගන්න කොළුවෙක් විශාල පෙට්ටියකුත් ඔසවාගෙන කොරිඩෝරය දිගේ තමන් සිටින පැත්තට ඇවිදගෙන එන හැටි විලියම් දක්කා.

විලියම් දකපු ගමන් ම ඒ ළමයා බෙරිහන් දුන්නේ කිසියම් නොකැමැත්තකින් වගේ.

'කොහෙද මේ කළබලෙන් දුවන්නේ ?. ඔයාගේ කළබලේ හින්දා තව ටිකෙන් මගේ අතේ තියෙන පෙට්ටියත් බිමට වැටෙනවා. එහෙම වුනා නම් මේක ඇතුලේ තියෙන වටිනා දේවල් හැම තැනම වැටිලා, කැඩිලයි නතර වෙන්නේ.'

විලියම් යටහත් පහත් විදිහට පැත්තකට වෙලා පෙට්ටියේ තියෙන්නේ මොනවද කියලා විපරම් කෙරුවා. ඇත්තටම ඒකේ තිබුනේ නාට්‍යයයේ නළුවන් වෙස් ගන්වන පාට වර්ග. දුඹුරු, කළු සහ කොල පාට තින්ත බඳුන්, ක්‍රීම් බෝතල් සහ පවුඩර් බඳුන් කිහිපයකුත් ඒ පෙට්ටියේ තියෙන හැටි විලියම් යාන්තමින් දක්කා. මේ දේවල් දක්කට පස්සේ විලියම් ගේ දෑස දීප්තිමත් වුනේ ඔහුටත් නොදැනීමයි. ඒ හින්දා ඔහු යටහත් පහත් විදිහට මෙහෙම කිව්වා.

'අයියා.... මම ඔයාට මේ පෙට්ටිය ගෙනියන්න උදව් කරන්න ද ?. එහෙම වුනාම ඔයාට තවත් ලේසි වෙයි නේ.'

වැඩිමහල් සිසුවා විලියම් දෙස උනන්දුවෙන් බැලුවා. ඇත්තටම මේ වෙලාවේ විලියම් ගේ යෝජනාව ගොඩාක් හොඳ එකක් කියලා ඔහුටත් හිතෙන්න ඇති.

'හා....හොඳයි. එහෙනම් මට මේක ගෙනියන්න උදව් වෙන්නකෝ.'

එහෙම කියමින් ම විශාල පෙට්ටිය විලියම් අතට දුන්න ළමයා අත් දෙක වනමින් ඔහුට ඉදිරියෙන් කොරිඩෝරය දිගේ ගමන්

sinhalaebooks.com



කරන්න පටන්ගත්තා. විලියම් පෙට්ටිය අතට ගත්තේ රටක් රාජ්‍යයක් හිමි කරගත්තා වගේ සතුටකින්.

පෙට්ටියත් අතින් අරන් කොරිඩෝරය දිගේ ඇවිදගෙන යන විලියම් හෙමින් ම එහි පියන ටිකක් විවෘත කෙරුවා. ඉන්පසුව දුඹුරු පාට, පාට කුරු දෙකක් අරන් සාක්කුවට ඔබාගත්තා. ඇත්තටම මේ වෙලාවේ විලියම් හරිම ක්‍රියාශීලියි. ඒ වගේ ඉක්මන් කමක් නිවසේ වැඩ කටයුතුවලදී නම් කවදාවත් ම ඔහු ගෙන් දකින්න ලැබෙන්නේ නෑ. මේ වගේ නරක වැඩ වලදී විලියම් හරිම ඉක්මන්. ඒ වගේම කපටියි.

හයවැනි වසරේ පංති කාමරය ළඟට ගිය විලියම් තමන් අතේ තිබුන පෙට්ටිය නාට්‍ය සංගමයේ අයෙකුට භාරදුන්නා. විලියම් ගේ මේ උපකාරය ගැන නාට්‍ය සංගමයේ නිළධාරියාටත් හරිම පුදුමයි. විශේෂයෙන් ම පාසැලේ දේවල් වලට සහභාගි වීම නිතරම මඟ හරින විලියම් දැන් ඔවුන් ට උදව් කරන්නට ඉදිරිපත් වෙලා.

'විලියම් ගේ හැසිරීම ගොඩාක් හොඳ අතට හැරිලා කියලයි මට නම් හිතෙන්නේ.'

ආපහු එන්න සූදානම් වෙනකොට නාට්‍ය සංගමයේ ප්‍රධානියා අනිත් අයට කියන හැටිත් විලියම් ට යාන්තමින් ඇහුනා.

..............................................................

ගෙදර ගිය ගමන් ම විලියම් වැඩ පටන්ගත්තා. සෑහෙන වෙලාවකට පසුව ඔහු කණ්නාඩියෙන් මුහුණ බැලුවේ තමන් ගේ වර්ණ ගැන්වීම මොනතරම් අපූරුද කියලා දකබලාගන්නයි. ඇත්තටම ඒ වෙලාවේ කණ්නාඩියෙන් පෙනුනේ විලියම් ගේ සැබෑ රුව නෙවෙයි. පාසැලේ දි හොරකම් කරගත් දුඹුරු පාට තීන්ත කූරු දෙකින් වෙස් ගන්වන ලද දුඹුරු පාට මුහුණක් තියෙන වෙනස් ම විදිහේ විලියම් කෙනෙක්. දැන් නම් තමන් ගේ පෙනුම අපූරු



ස්වදේශිකයෙක් වගෙයි කියලා විලියම් ට හිතුනා. හැබැයි ඔහු ඇඳගෙන ඉන්න ඇඳුම නම් ස්වදේශික ඇඳුමක් නෙවෙයි. ඒ හින්දා විලියම් තමන් ගේ පෙනුමට ගැළපෙන ඇඳුමක් ගැන හිතන්න වුනා. ඔහුට මුලින් ම හමුවුනේ පාපන්දු ක්‍රීඩාවේ යෙදෙද්දී අඳින කොට කලිසම. ඊට පස්සේ අයියා රොබට්ගේ පාපන්දු බැනියම ත් විලියම් ගේ ඇඳුම් කට්ටලයට එකතු වුනා. හැබැයි මේ ඇඳුම් අඳින්න ඉස්සර වෙලා ස්වදේශිකයින් ගේ ඇඳුමට සමාන වෙන විදිහේ වෙනස් කම් ටිකක් කරන්නත් විලියම් අමතක කෙරුවේ නෑ. (තමන් කරන වෙනස්කම් නිසා වටිනා ඇඳුම් කට්ටලය වැරහැලි වෙන එක ගැන විලියම් ටිකක්වත් කල්පනා කෙරුවේ නෑ.) මේ හැමදේකටම පස්සේ විලියම් ආයේමත් කණ්නාඩිය ළඟට ආවා. ඒ වෙලාවේ නම් කණ්නාඩියෙන් පෙනුනේ හැබෑම ස්වදේශික ගෝත්‍රිකයෙකුගේ රූපයක්. දැන් ඉතින් එළිමහනට ගොසින් කිසියම් වීර ක්‍රියාවක් කරන්නයි විලියම් හිතාගෙන ඉන්නේ.

ස්වදේශිකයෙක් විදිහට වෙස් වලාගෙන කාමරයක් අස්සේ හිටියට වීර ක්‍රියාවක් කරන්න බෑ කියලා විලියම් දන්නවා. හැබැයි මේ විදිහේ ඇඳුම් ඇඳගෙන නිවසින් එළියට යන්න අම්මාගෙන් ඉඩක් ලැබෙන්නේ නම් නෑ. මේ ගැටළු ගැන ටික වෙලාවක් කල්පනා කළාට පසුව ඔහුට අපූරු අදහසක් සිහිපත් වුනා. කාමරයේ ජනේලය ළඟම වැවී තිබුන ගසක් දිගේ බඩ ගා ගෙයින් එළියට පනින්න ඔහු ට වැඩි වෙලාවක් ගියේ නෑ.

'විලියම්.....'

නිවසේ විසිත්ත කාමරය දෙසින් ඒ හඬ ඇසෙද්දී විලියම් ලෝරල් ගස් යාය අසලටත් ගිහිං. නිවස දෙසින් තමන් ට කථා කරන හඬ ඇසුන ගමන් ම විලියම් ගල් ගැහිලා වගේ එතැනම නතර වුනා.

'මේ දැන් විලියම් ගේ ඇතුලේ හිටියා කියලා සහතිකයි.

sinhalaebooks.com



විලියම්.....'

ඒ කථා කරන්නේ අම්මා කියලා විලියම් දන්නවා. ඒ හින්දා ඇයට කිසියම් පිළිතුරක් දෙන්න ඕනෑ කියලත් විලියම් කල්පනා කෙරුවා. ඔහු ගොඩාක් කීකරු විදිහට මෙහෙම කිව්වේ ඒ නිසයි.

'ඇයි අම්මා...'

'ඔයා මොකද කරන්නේ ?.'

'මම මේ ගෙවත්තට වෙලා වැදගත් දෙයක් ගැන කල්පනා කරනවා අම්මා.'

විලියම් ගොඩාක් කීකරු හඬකින් එහෙම කියද්දී බ්‍රවුන් මහත්මිය, තමන් අසල සිටි බ්‍රවුන් මහතා ට ආඩම්බරයෙන් මෙහෙම කියන්නත් අමතක කෙරුවේ නෑ.

'අපේ විලියම් දඟයි තමයි. ඒ වුනාට සමහර වෙලාවට එයා හිතාගන්න ත් අමාරු විදිහේ දේවල් කරනවා.'

.....................................................................

විලියම් තමන් ගේ නිදහස් ලෝකයට පා තැබුවා. දැන් ඔහු ගතින් මෙන් ම මනසින් ද සූර වීර ස්වදේශික ගෝත්‍රිකයෙක් බවට පත්වෙලා හමාරයි. කානු උඩින් පනිමින් ද කඳු පල්ලම් දිගේ වේගයෙන් දුවමින් ද ඔහු සිතින් මවාගත් නපුරු කැලෑ සතුන් සහ ආක්‍රමණික සුදු ජාතිකයින් සමඟ සටන් කරනවා. මේ ආකාරයේ වීර වික්‍රමාන්විත රංගනයක යෙදෙමින් ම විලියම් තැනිතලාව පියමං කොට කැලෑ බද ප්‍රදේශයකට අවතීර්ණ වුනා. මේ කැලෑව ස්වදේශික ගෝත්‍රිකයින් ගේ රජ දහන කියලයි විලියම් උපකල්පනය කරන්නේ. ඒ නිසා දැන් ඔහු තමන්ගේ රඟ පෑම ද වඩාත් තාත්වික අන්දමින් නිරූපනය කරනවා. විලියම් මොනතරම් දක්ෂ විදිහට ගෝත්‍රික චරිතය නිරූපනය කළා ද කියනවා නම් ඔහු ගේ දුණු හී පහරින් සුදු



ජාතික ආක්‍රමණිකයින් සෑහෙන ප්‍රමාණයක් මරණයට පත්වුනා. සුදු ජාතිකයින් පමණක් නොවේ නපුරු සිංහයින්, දැවැන්ත අලියන් සහ රයිනෝසිරස් සතුන් පවා විලියම් ඉදිරියේ පරාජය වෙන හැටි මේ වෙලාවේ දකින්න පුළුවන්. (හැබැයි විලියම් ගේ මේ අපූරු රංගනය බලන්න කිසිම නරඹන්නෙක් කැලෑවේ හිටියේ නෑ).

සුදු ජාතික ආක්‍රමණිකයින් ට පහර පිට පහර දෙමින් ද රුදුරු වන සතුන් පරාජය කරමින් ද විලියම් කැලෑව තුළ තව තවත් ඉදිරියට ගමන් කෙරුවා. ටික වෙලාවකට පසුව විලියම් හිටියේ කැලෑවෙන් වටවුන විවෘත පිට්ටනියක් වැනි ස්ථානයකයි. පුදුමයකට වගේ මේ තැනිතලාවේ මිනිසුන් විශාල පිරිසක් ද රැස්වෙලා හිටියා. මේ මිනිසුන් පිරිස ඉදිරියේ කළු පැහැති ඇඳුමක් හැඳගෙන සිටි වැදගත් පෙනුමක් තියෙන මහත්මයෙක් තමන් ගේ අත්ල දෙස බලා සිටින බවත් විලියම් දැක්කා. මේ පිරිස කිසියම් දෙයක් බලාපොරොත්තුවෙන් සිටින බවකුයි බැලූ බැල්මටම පෙනෙන්න තිබෙන්නේ. ඊළඟ නිමේශයේදී පිරිස විලියම් දෙසට හැරී බැලුවා. ඒ සැනින් ම ඔවුන් හැමෝ දෙනාම වාඩිවෙලා හිටපු තැන් වලින් නැගිටලා එක්වරම සතුටින් බෙරිහන් දෙන්න පටන්ගත්තා.

'අන්න එයා ඇවිත්...'

මෙතැන සිද්ධ වෙන්නේ මොකක් ද කියලා විලියම් ට හිතාගන්නවත් අවස්ථාවක් ලැබුනේ නෑ. පිට්ටනියේ රැස්වෙලා හිටපු මිනිසුන් රොත්ත එක පාරටම දුවගෙන ඇවිත් විලියම් ව වටකර ගත්තා. මේ සිදුවීමෙන් විලියම් මොනතරම් බය වුනා ද කියනවා නම් ඔහු එක පාරටම පිට්ටනිය මැදම වාඩිවුනා. තවත් ටික වෙලාවකින් පූජක තුමෙක් ඇවිත් බියෙන් වෙවුලමින් සිටින විලියම් ගේ අතකින් අල්ලා ගෙන කරුණාවන්ත හඬකින් මෙහෙම කිව්වා.

'පුංචි ළමයෝ... ඔයා කිසිදේකට බයවෙන්න එපා.'

sinhalaebooks.com



එතකොටම කුඩා නාවික තොප්පියක් පැළැඳ සිටි උස කෙට්ටු කාන්තාවක් ද ඉදිරියට ඇවිත් මෙහෙම කිව්වා.

'මේ ළමයට ඉංග්‍රීසි භාෂාව කථා කරන්න බැරිව ඇති කියලා මට හිතෙනවා. මොකද අපේ රටෙන් පිට ඉන්න අයට ඉංග්‍රීසි වැඩිය බෑ.'

එතකොටම මහත කාන්තාවක් සෙනඟ අස්සෙන් විලියම් ඉන්න තැනට පැමිණියා. එයා අතේ විශාල කිරි වීදුරුවක් සහ ලොකුම ලොකු බනිස් ගෙඩියක් ද තිබුනා. ඇත්තටම විලියම් ට දැන් හොඳටම බඩගිනියි. කොහොම වුනත් වෙස් මාරුකරගෙන හිටපු විලියම් ගේ වාසනාවටයි දැන් හැමදෙයක් ම සිද්ධ වෙන්නේ. ඒ වගේම තමන්ට ඉංග්‍රීසි භාෂාව කථා කරන්න බැරි විදිහට රඟ පාන්න ඕනෑ කියලත් විලියම් හිතුවා. එහෙම කෙරුවොත් තමයි මේ අහඹු රඟපෑම වඩාත් සාර්ථක වෙන්නේ කියලත් විලියම් දන්නවා. ඒ අතර මහත කාන්තාව විලියම් ගේ අතකින් අල්ලාගෙන ගොස් පිරිස ඉදිරියේ තබා තිබෙන පුටුවක වාඩි කෙරෙව්වා. දැන් විලියම් බනිස් ගෙඩිය හා කිරි වීදුරුව බොන්නයි සූදානම් වෙන්නේ. ඇත්තටම ඔහු මේ දේවල් කෙරුවේ හරිම කෑදර විදිහට. විලියම් බනිස් ගෙඩිය එක පාරටම කට ඇතුළට ඔබාගන්නා ආකාරය දිහා පිරිස බලාගෙන හිටියේ පුදුමයෙන් දෑසුත් මහත් කරගෙනයි. ඒ අතර පූජක තුමා විදිහට පෙනී හිටපු තැනැත්තා උස්, එමෙන්ම ගොරෝසු හඬකින් පිරිස අමතන්න පටන්ගත්තා.

'ආදරණීය සහෝදර වරුනි... අද අමුත්තෙක් එනවා කියලා අපි කවුරුත් දැනගෙනයි හිටියේ. දැන් එයා ඇවිත් ඉන්නවා. ඇත්තටම මේ ගැන මම ආයේ සැරයක් මතක් කරන එක තේරුමක් නැති වැඩක් කියලා මම දන්නවා. මේ දැන් ඇවිත් ඉන්නේ බෝර්නියෝ සිට අපේ සංගමය බැහැදකින්න ඇවිත් ඉන්න විශේෂ අමුත්තයි.'

පූජක තුමා කථාව නතර කරලා මදක් පහත්වුනා. ඉන්පසුව



ඔහු විලියම් ගේ හිස අත ගා මුහුණ පුරාම විහිදුන අපූරු සිනාවකින් විලියම් ට සංග්‍රහ කෙරුවා. මේ වෙලාවේ විලියම් ගේ මුහුණ පුරාම පැතිරිලා තිබුනේ කිසියම් කම්පනයක්. ඒ වගේම හිනා බිඳක් වත් විලියම් ගේ මුහුණේ තිබුනේ නෑ. මේ වෙනස වටහාගත්තු නිසාදෝ පූජක තුමා ඉක්මනින් ම තමන් ගේ අත විලියම් ගේ හිසෙන් ඉවතට ගත්තා. ඉන්පසුව පූජක තුමා විලියම් සිටින තැනින් අඩි කිහිපයක් ඉදිරියට ගිහිං ආයේමත් රැස්වෙලා ඉන්න අමුත්තන්ට කථා කරන්න වුනා.

'ඇත්තටම මේ හැන්දෑ වරුවේ අපේ විශේෂ අමුත්තා මෙහාට ආපු එක ලොකු ගෞරවයක්. මීට අවුරුදු දෙකකට විතර ඉස්සර වෙලා අපේ දේවස්ථානයේ සාමාජිකයෝ එකතු වෙලා බෝර්නියෝ නගරයේ ජීවත් වෙන අහිංසක ළමයින් ට අධ්‍යාපනය ලබන්න ඕනෑ කරන පහසුකම් සලසා දුන්නා කියලා ඔයාලට මතක ඇති. අපි ඒ දේ කෙරුවේ සමාජ සේවයක් විදිහට. අපි කරපු සේවය ගැන කළගුණ සලකන්න තමයි මේ අමුත්තා අද මෙහාට ආවේ.'

දේවගැති තුමා එතැනින් කථාවට විරාමයක් තියද්දි එතුමාගේ බිරිඳ වන කුඩා නාවික හිස් වැස්මක් පැළැඳ සිටි කෙට්ටු, උස කාන්තාව කථා කරන්න පටන්ගත්තා.

'මේ ඇවිත් ඉන්න අමුත්තගේ නම තමයි ගෞරවනීය හබකුක් ජෝන්ස් තුමා. අපි කරපු උදව් උපකාර වලට ස්තුති කරන්නත් එක්කමයි අද මෙහාට ආවේ.'

එහෙම කියන ගමන් ම දේවගැති තුමාගේ බිරිඳ අපූරු හිනාවකින් විලියම් ට සංග්‍රහ කෙරුවා. හැබැයි මේ වනවිටත් විශාල බනිස් ගෙඩියම විලියම් ගේ මුව තුළ පදිංචි වෙලා ඉවරයි. ඒ නිසා ඔහු ට සිනාසෙන්නත් පහසු වුනේ නෑ. විලියම් කථා කරගන්නත් බැරිව පුදුමයෙන් වගේ බලාගෙන සිටිද්දි දේවගැති වරයා වන තියෝපිලස් මග් තුමා ඒ හා සමානම පුදුමයකින් විලියම් දිහා ටික

sinhalaebooks.com



වෙලාවක් බලාගෙන හිටියා. ඉන්පසුව තමයි එතුමා නැවතත් කථා කරන්න පටන්ගත්තේ.

'සහෝදරවරුනි. මේ හබකුක් ජෝන්ස් තුමා අද එනවා කියලා මට කල් ඇතිවම දන්වලයි තිබුනේ. අපිට හොඳ හිත දක්වන්නයි එතුමා මෙහාට ආවේ කියලා ඔය සහෝදරවරු හොඳින් ම දන්නවා. ඉතින් අපිත් මේ ගෞරවනීය පුංචි අමුත්තාට අපේ ඉහළම ගෞරවය දක්වන්න ඕනෑ.'

එහෙම කියලා තමන් ගේ කථාව අවසන් කළ දේවගැති තුමා විලියම් ගේ ඇස්වලට හසුනොවෙන මානයේ තියෙන පුටුවක වාඩිවෙලා මුහුණේ නැගී තිබුන දාඩිය බිඳු පිස දමාගත්තා. මේ වනවිටත් මිනිසුන්. ගැහැණුන් සහ ළමයින් ගෙන් සමන්විත වුන විශාල පිරිසක් විලියම් වාඩි වී සිටින පුටුව වටේට රොක් වෙලා ගොඩාක් උනන්දුවෙන් ඔහු දිහා බලාගෙන ඉන්නවා. හැබැයි මොන දේ වුනත් තමන් ළඟ තිබුන විශාල කිරි වීදුරුවේ අන්තිම බින්දුවත් කැඳර කමින් ගිල දමන්න නම් විලියම් අමතක කෙරුවේ නෑ.

විලියම් කිරි වීදුරුව පානය කරලා අවසන් වෙනවත් එක්කම කලින් ඔහු දුක පුරුදු මහත කාන්තාව ඉදිරියට ඇවිත් චොකලට් ජින්ජර්ලි පළුවක් මේසය මතින් තිබ්බා. විලියම් ඒ චොකලට් පළුව ඩැහැගත්තේ දවස් ගාණක් බඩගින්නේ හිටපු වන සතෙක් රසවත් මස් කුට්ටියක් ඩැහැගන්නාක් වැනි ඉක්මන් කමකින්.

'මෙතුමා කථා කරනකම් තමයි මම මේ ඉවසිල්ලක් නැතිව බලාගෙන ඉන්නේ.'

පිරිස අතර සිටි කෙනෙක් සිහින් හඬින් මුහුණන හඬ විලියම් ට යාන්තමට ඇහුනා. ඒ අතර තවකෙක් මෙවැනි දෙයක් කිව්වා.

'කොහොම වුනත් මෙයා අපි දුන්න බනිස්වලටයි, කිරි වීදුරුවටයි, චොකලට් පළුවටයි විශේෂ ස්තුතියක් කරයි කියලා මට



හිතෙනවා.'

'හැබැයි එයා ඉංග්‍රීසි දන්නේ නැතිව ඇති.'

තවෙකෙක් එහෙම කියද්දී විලියම් පුටුවෙන් නැගිටලා ගොඩාක් පැහැදිලි හඬකින් හැබැයි එයාටත් නොතේරෙන මොකක් දෝ භාෂාවකින් වචන කිහිපයක් කථා කෙරුවා. විලියම් ගේ කථාව අහගෙන හිටපු දේවගැති තුමා ගේ බිරිඳ ඉක්මනින් ම එයාගේ අදහස ප්‍රකාශ කෙරුවා.

'ගෞරවනීය හබකුක් තුමා කථා කරන්නේ හින්දි භාෂාව කියලා මට හිතෙනවා. මොකද අපේ තාත්තා අවුරුදු කිහිපයක් ඉන්දියාවේ හිටපු හින්දා මම හින්දි භාෂාව ගැන ටිකක් දන්නවා.'

දේවගැති බිරිඳගේ කථාව හමාර වෙනවාත් සමඟම විලියම නැවත වතාවක් හරිම අපූරු විදිහට නොතේරෙන භාෂාවෙන් වචන කිහිපයක් කථා කෙරුවා. එතකොටම පිරිස අතරින් ඉදිරියට ආපු වයසක කාන්තාවක් තවත් විශාල චොකලට් පළුවක් විලියම් ඉදිරියෙ තියලා සතුටින් බෙරිහන් දුන්නා.

'අනේ මෙතුමා කථා කරන භාෂාව හරිම ලස්සනයි නේ. කිසිම සැකයක් නෑ. එයා අපි ට ස්තුති කරන්න ඇති. කොහොම වුනත් මේ වගේ පෙරදිග භාෂාවලට මම හරිම කැමැතියි. ඒවා අපිට තේරෙන්නේ නැතිවුනත් භාෂාව කථා කරනකොට හරිම ගීතවත් රිද්මයක් තියෙනවා.'

ඒ අතර දේවගැති බිරිඳ ආයේමත් කථා කෙරුවා.

'කිසිම සැකයක් නෑ. මෙතුමා කථා කරන්නේ හින්දි භාෂාව. මට දැන් තමයි ඒ භාෂාව තේරෙන්නේ.'

'ඉතින් මොකක් ද මෙතුමා හින්දි භාෂාවෙන් කිව්වේ ?.'

පිරිස අතර ඉන්න කෙනෙක් එහෙම අහද්දී දේවගැති බිරිඳ

sinhalaebooks.com



මවාගත් ආඩම්බරයකින් වගේ පිළිතුරු දුන්නා.

'අපි දුන්න කෑම වලටයි, අපේ කරුණාවන්ත කමටයි ගොඩාක් ස්තුතියි කියලයි හබකුක් තුමා කිව්වේ.'

'මොනතරම් ලස්සන ද ?.'

සතුට පිරුණ හඬකින් එහෙම කියපු මහත කාන්තාව තවත් විශාල චොකලට් පළුවක් විලියම් ට දුන්නා.

'මම මේ චොකලට් එක ගත්තේ ගෙදර ගිහිං මගේ පුතාට දෙන්න. ඒ වුනත් මම ඒක අපේ පුංචි හබකුක් තුමාට තෑගි දෙනවා. කොහොම වුනත් අපි මේ සැරේ හබකුක් තුමාට ඇඳුම් ටිකක් දුන්නොත් හොඳයි කියලා ඔයාලට හිතෙන්නේ නැද්ද?.'

'ඒ වුනත් මේ කොළ පාට කමිසය නම් මට හොඳට මතකයි වගේ දැනෙනවා.'

දේවගැති තුමාගේ බිරිඳ එහෙම කියද්දී විලියම් ගේ හිත පුරා කිසියම් කම්පනයක් ගලාගෙන ගියා. එයා නොතේරෙන භාෂාවෙන් නැවතත් කථා කෙරුවේ ඒ කම්පනය ද සමගයි. එතකොටම මහත කාන්තාව ගේ කටහඬ ඇහුනා

'මෙයා නම් දේවදූතයෙක් වගෙයි. එහෙම වුනා කියලා ඔයාලා මොනව හරි දෙන්න හිතාගෙන ඉන්නවා නම් ඒක නොවරදවාම දුන්නොත් හොඳයි කියලයි මට හිතෙන්නේ. ඒක නෙවෙයි දේවගැති තුමා. අපේ පුංචි අමුත්තගේ නම මොකක් ද ?. එයාගේ නමෙන් ම කථා කරන්න තියෙනවා නම් තමයි මම වැඩියම කැමැති.'

තියෝපිලස් මග් දේවගැති තුමා ටික වෙලාවක් කල්පනා කෙරුවා. ඔහු දෙගිඩියාවෙන් පිරුණ හඬකින් මෙහෙම කිව්වේ ඉත්පසුවයි.



'ආ... ඇත්තටම එයාගේ නම මොකක් ද කියලා මට හරියටම මතක නැහැනේ.'

'එයා එවපු ලියුමෙවත් නම තිබුනේ නැද්ද ?.'

'ඒ ලියුමත් නැතිවෙලා නේ. මේ වෙලාවේ ඒ ගැන කථා කරන එක තේරුමක් නැති වැඩක්. ඇත්තම කියනවා නම් මට මේ පොඩි කොළුවගේ ඇස් දෙක දිහා කෙලින් බලාගෙන ඉන්න බෑ වගෙයි. ඒවා හරිම දීප්තිමත්.'

තියෝපිලස් මග් දේවගැති තුමා තම බිරිඳට එහෙම කිව්වා. දේවගැති තුමාගේ කථාව දිහා උනන්දුවෙන් බලාගෙන හිටපු එතුමා ගේ බිරිඳ කිව්වේ මේ වගේ දෙයක්.

'මේ විදිහේ කළු පාට හමක් තියෙන අයගේ ඇස් දීප්තිමත් කියලා මම අහලා තියෙනවා. අනික හමේ කළු පාට නිසා ඒ අයගේ මුහුණ වුනත් අමුතුම ලස්සනක් තියෙනවා.'

'ඒක නම් හරි තමයි. බලන්නකෝ... අපි ඉන්න එංගලන්තේ අය සුදුම සුදු පාටයි. ඒ නිසා අපේ ජාතිකයින් ගේ මුහුණුත් එක වගේම සුදුමැලි පාටයි.'

දේවගැති තුමා සහ බිරිඳ තමන් ගැන කුමක් දෝ කථාවෙන බව විලියම් ට යාන්තමින් ඇහුනා. ඒ නිසා එයා නැවත වතාවක් නොතේරෙන භාෂාවෙන් කථා කරන්න වුනා.

'බුන්කින් ඒලිස් ලිපීස්....'

'අන්න බලන්න. මේ ළමයා කථා කරන්නේ හින්දි භාෂාව කියලා මට ඉර හඳ වගේ විශ්වාසයි.'

දේවගැති තුමා ගේ බිරිඳ වඩාත් විශ්වාස හඬකින් එහෙම කියද්දී පිරිස අතරේ හිටපු පොඩි එකෙක් සිහින් හඬකින් 'ඔය ඉන්නේ විලියම් බ්‍රවුන් කියලා' බෙරිහන් දුන්නා.

sinhalaebooks.com



ඒ හඬ ඇහෙනවත් එක්කම විලියම් තිගැස්සිලා කටහඬ ආ දිහාවට හිස හරවලා බැලුවා. හැබැයි විලියම් ගේ වාසනාවට වගේ පොඩි එකා කියපු දේ වැඩිහිටියෝ විශ්වාස කෙරුවේ නෑ.

'මොන පිස්සු කථාවක් ද ළමයෝ ඔය කියන්නේ ?. මේ ඉන්නේ විලියම් බ්‍රවුන් වෙන්නේ කොහොම ද ?. මෙයා මුහුදෙන් එයා ඉන්දියාව ද කොහෙද කියන රටෙන් ආපු ආගන්තුකයෙක් නේ.'

ළමයාගේ අම්මා නොසතුටු හඬකින් තර්ක කරන හඬත් විලියම් ට ඇහෙනවා. හැබැයි ළමයාත් තමන් ගේ මතය සනාථ කරන්න තවත් උත්සාහ කරනවා.

'ඔයාල හොඳටම රැවටිලා. ඔය ඉන්නේ විලියම් බ්‍රවුන් කියලා මට හොඳටම විශ්වාසයි.'

'විලියම් බ්‍රවුන් ගැන මම හොඳටම දන්නවා. එයා සුදුපාටයි. ඒ වුනාට මේ ළමයා කළු පාටයි කියලා පෙනෙන්නේ නැද්ද ?.'

අම්මා ගේ ඒ තර්කය හමුවේ නම් පොඩි එකා මදක් පසු බා සිටියා. ඔහු දෙගිඩියාවෙන් වගේ මෙහෙම උත්තරයක් දුන්නෙත් ඒ නිසා වෙන්න ඇති.

'ඔව්... ඒක නම් ඇත්ත තමයි.'

ඒ අතර ඔවුන් විලියම් වාඩිවෙලා හිටපු මේසය ළඟට සෙමෙන් සෙමෙන් ඇවිදගෙන ආවා. ඇත්තටම තමන් ව අඳුනාගෙන තිබෙන්නේ පුංචි ගැහැණු ළමයෙක් කියලා විලියම් දක්කේ එතකොටයි. කුඩා ගැහැණු ළමයාත් සමඟ මේසය ළඟට ආපු අම්මා සමාව ඉල්ලන්නාක් වැනි හඬකින් මෙහෙම කිව්වා.

'මේ ළමයා කියපු දේවල් ඔයා ගණන් ගන්න එපා. ඇත්තටම මෙයාගේ ඉස්කෝලෙත් ඔයා වගේම ළමයෙක් ඉන්නවා. ඒකයි



මෙයා රැවටිලා තියෙන්නේ. ඔයා ටිකක් අපිත් එක්ක කථා කරන්න කැමැති ද පුංචි ළමයෝ ?.'

'ඒ ගැන කිසිම සැකයක් තියා ගන්න එපා. මෙයා ඇති තරම් ඔයාලා එක්ක කථා කරයි.'

දේවගැති තුමාගේ බිරිඳ විලියම් වෙනුවට ඉදිරිපත් වෙලා ඒ වගේ පිළිතුරක් දෙනකොටම කුඩා ගැහැණු ළමයා නැවත වතාවක් වෙවුලන හඬකින් බෙරිහන් දුන්නා.

'දෙයියනේ... මේ ඉන්නේ විලියම් බ්‍රවුන් ම තමයි. ආයේ කිසිම සැකයක් නෑ.'

එතකොටම ගැහැණු ළමයාගේ අම්මා කෝපයෙන් බෙරිහන් දෙන්න වුනා.

'ඔන්න මම නොකිව්වයි කියන්න එපා. ආයේමත් ඔය කථාව කිව්වොත් මම ඔයාව දැන්ම ම ගෙදර එක්ක යනවා. ඔය වගේ කථා වලින් වෙන්නේ මේ අහිංසක ළමයාගේ හිත රිදෙන එක විතරයි. අනික මේ ළමයා ගොඩාක් දුර ඉඳන් ආවේ අපිව හමුවෙන්න. ඉතින් ඔයා මේ ළමයට ගොඩාක් කාරුණික වෙන්න ඕනෑ. ටිකක් හිතන්නකෝ. ඔයා ගොඩාක් දුර රටකට යනවා. එහිදී හම්බ වෙන අය ඔයාට විලියම් බ්‍රවුන් කියලා කිව්වොත් ඔයාට දුක හිතෙනවා නේද ?. දැන් මේ අහිංසක ළමයටත් ඒ විදිහෙම දුකක් දැනෙනවා ඇති. ඒ හින්දා ඔයා ආයේනම් ඔය කථාව කියන්න එපා.'

අම්මා ගේ තර්ජනය නිසාම පොඩි එකී ඉන්පසුව වචනයක් වත් කථා කෙරුවේ නෑ. දේවගැති වරයා උනන්දුවෙන් වගේ ගේට්ටුව දිහා බැලුවේ ඉන්පසුවයි. විනාඩි කිහිපයක් ගේට්ටුව දිහා නොඉවසිලිමත් ව බලාගෙන හිටපු දේවගැති වරයා බලාපොරොත්තු බිඳුන හඬින් මෙහෙම කිව්වා.

sinhalaebooks.com



'මට පෙනෙන විදිහට නම් එයා එන්නේ නෑ වගෙයි. අපි එහෙමනම් ගෞරවනීය හබකුක් ජෝන්ස් තුමා එක්ක ගිහිං තේ මේසයේ වාඩිවෙමු. ඊට පස්සේ අපිට පුළුවන් රැස්වීම ආරම්භ කරන්න.'

දේවගැති තුමාගේ යෝජනාවත් එක්කම පිරිස අතරින් නැගුණ සිහින් කථා බහ වැඩිවෙලාවක් යන්න ඉස්සර වෙලා මහා ඝෝෂාවක් බවට පත්වුනා. ඒ අතරම විලියම් පිරිස දිහාට හැරිලා නොතේරෙන භාෂාවෙන් මෙහෙම කිව්වා.

'ස්විෂි...'

'හැමෝටම ස්තුතියි කියලයි එයා කියන්නේ ?.'

විලියම් ගේ වචනය හමාර වෙනවාත් සමගම දේවගැති බිරිඳ නොතේරෙන භාෂාව පරිවර්තනය කරලා පිරිස ට ඉදිරිපත් කෙරුවා. විලියම් මේ සිදුවෙන හැමදෙයක් ම දරාගත්තේ හිත යටින් හිනාවෙමින්.

හැබැයි මේ අතර විලියම් ව හඳුනාගත්තු කුඩා ගැහැණු ළමයා විලියම් වටේ කරකැවෙමින් ඔහුව තව තවත් හඳුනාගන්නට උත්සාහ කරනවා.

'අම්මා... මෙයා ඇත්තටම කළු පාට කෙනෙක් නෙවෙයි. මෙයා...'

කුඩා ගැහැණු ළමයාට තමන් ගේ කථාව හමාර කරන්න එයාගේ අම්මා ගෙන් අවස්ථාවක් ලැබුනේ නෑ. අම්මා ඉක්මනින් ම ඉදිරියට ගොසින් ගැහැණු ළමයා ගේ කට අතින් වසා දැම්මේ මෙහෙම කියමින්.

'මොනව වුනත් කමක් නෑ. දැන්ම ම කට වහනවා. මේ ළමයා හොඳටම කළු පාට කෙනෙක් කියලා පෙනෙන්නේ නැද්ද ?



නිකං මෝඩයෙක් වගේ කථා කරන්න එපා තේරුනා ද ?.'

'ඇත්තටම අද එනවා කියපු දේවගැති තුමා එන්නේ නෑ වගෙයි. ඒ හින්දා එතුමා වෙනුවට ආපු මේ ළමයාට අපි හොඳින් සංග්‍රහ කරමු.'

විලියම් ට චොකලට් පෙත්තක් දුන්න මහත කාන්තාව එහෙම කියද්දී අනිත් අයත් හිස සොලවලා ඒ අදහස අනුමත කෙරුවා.

හැබැයි මේ වනවිටත් විලියම් නොසිතූ කරදරයකට මුහුණ දෙමිනුයි හිටියේ. අව්ව තදින් පායලා තියෙන නිසා විලියම් ගේ නළල පුරා දහදිය බිඳු නැගිලා. එයා අතින් නළල පිරි මැද්දේ දහදිය බිඳු පිසදමාගන්න හිතාගෙනයි. හැබැයි නළල පිහිනවත් එක්කම මුහුණේ තවරා තිබුන කළු පැහැති තීන්ත ආලේපයෙන් පදාසයක් ම ඔහු ගේ අතේ තැවරුනා. දැන් ඒ කොටසේ ඔහු ගේ නියම හමේ පාට මතුවෙලා. විලියම් කලබලයෙන් වගේ අතේ තිබුන තීන්ත පැල්ලම දිහා බලාගෙන ඉඳලා අත කමිසයේ පිස දැම්මා. එතකොටම විලියම් ගේ අතේ තිබුන කළු පාට තීන්ත පැල්ලම එයා ඇඳගෙන හිටපු කොල පාට කමිසයේ තැවරුනා. මේ සිද්ධ වුන දේ දිහා බලාගෙන හිටපු පිරිස අතරින් ඉන්පසුව මතුව ආවේ වචනයෙන් විස්තර කරන්න බැරි තරමේ නිහඬතාවයක්.

'පුදුමයි...'

එක් කාන්තාවක් එහෙම කියද්දි තවත් වයසක කාන්තාවක් පුදුමය පිරුණ හඬකින් මේ වගේ දෙයක් කිව්වා.

'සත්තයි. මේ වගේ දෙයක් නම් මම කවදාවත් ම දැකලා නෑ.'

ඒ අතර දේවගැති තුමාගේ කටහඬත් ඇහුනා.

'මට නම් හිතාගන්නත් බෑ. ඇත්තටම දේවගැති හබකුක්

sinhalaebooks.com



ජෝන්ස් ව මම පුංචි කාලේ ඉඳන් දන්නවා. හැබැයි එයාට මේ විදිහට පාට වෙනස් කරන්න පුළුවන් කියලා මම දැනගෙන හිටියේ නෑ.'

'ඒ ගැන වැඩිය හිතන්න හොඳ නෑ. සමහර විට තද ඉර එළිය හින්දා සිද්ධ වුන වෙනස් කමක් වෙන්නත් පුළුවන්. මොකද හිරු එළිය වැටුනා ම ඕනෑම කෙනෙකුගේ සමේ තියෙන වර්ණ වෙනස් වෙන්න පුළුවන් නේ.'

වයසක කාන්තාව එහෙම කියද්දී තමයි විලියම් ගේ හිතට යන්තම් හරි සහනයක් දැනුනේ. හැබැයි වැඩි වෙලා යන්න ඉස්සර වෙලා මෙතැනින් මිදිලා කැලේට පැන ගන්න එක ඇඟට ගුණයි කියලා නම් විලියම් ට ඒ වෙලාවේ හිතුනා. එනපොට හොඳ නෑ කියලා විලියම් ට හිතෙනවා. මොන දේ වුනත් සුදානම් කොට තිබෙන අපූරු තේ පැන් සංග්‍රහය භුක්ති විඳින්නේ නැතිව නම් යන්න ඔහු ගේ හිත නැමෙන්නේ නෑ. ඒ අතර දේවගැති තුමා තමන් ගේ හිතේ තියෙන දෙගිඩියාව වචන කිහිපයක තවරලා පිරිස ඉදිරියේ දිග හැරිලා.

'ටිකකට ඉස්සර වෙලා අර පුංචි ගැහැණු ළමයා කියපු දේ ගැන අපි මීට කලින් ටිකක් හිතුවා නම් හොඳයි කියලා මට දැන් හිතෙනවා.'

දේවගැති තුමා ගේ කථාව හමාර වෙන්නටත් පෙරම වයසක කාන්තාව ආයේමත් මෙහෙම කිව්වා.

'මම කිව්වනේ... ඔයා මේ කිසිම දෙයක් ගැන සැක කරන්න එපා. අනික මේ ළමයට ඉංග්‍රිසි කථා කරන්නත් බෑ. එයා කථා කරන්නේ හරිම අමුතු භාෂාවක් නේ. ඒ හින්දා අපි මොකටද මෙයාව සැක කරන්නේ ?.'

'හරි... අපි ඉස්සර වෙලා තේ ටිකක් බීලා ඉඳිමුකෝ. ඊට



පස්සේ මේ ගැන තව ටිකක් කථා කරන්න පුළුවන්.'

දේවගැති තුමා එහෙම කිව්වට පස්සේ තමයි විලියම් ගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ. ඉන්පසුව පිරිස තේ පානය කිරීම සඳහා නිවස ඇතුළට ගියා.

විලියම් තේ මේසයේ වාඩිවෙනවත් එක්ක වයසක කාන්තාව විශාල බන්දේසියක් ගෙනැත් ඔහු ඉදිරියේ තිබ්බා. ඊට පස්සේ ඇය මොනවදෝ දෙයක් කිව්වත් බන්දේසියට හිත ගිහිං තිබුන නිසා විලියම් ට ඒ දේ මොකක් ද කියලා හරියට මතක තිබුනේ නෑ.

'ඒ ළමයා කේක් බන්දේසිය දිහා බලාගෙන ඉන්නේ හරිම කෑදර විදිහට.'

වයසක කාන්තාව සිහින් හඬින් එහෙම කියමින් ම කෑම කාමරයෙන් පිටවුනා. විලියම් ට ඒ වචන ටික නම් හොඳින් ඇහුනා. හැබැයි එයා ඒ ගැන වැඩිය තැකීමක් කෙරුවේ නෑ. මේ වනවිටත් එයා විශාල කේක් බන්දේසියට වග කියන්න පටන් අරගෙනයි තිබුනේ.

බන්දේසියේ තිබුන අන්තිම කේක් කෑල්ලත් කටට ඔබා ගනිමින් සිටින විලියම් ට නිවස දෙසට ඇවිදගෙන එන අමුත්තන් දෙදෙනෙකුගේ ඡායාවන් යාන්තමින් පෙනුනා. ඔවුන් දෙදෙනාගෙන් කෙනෙක් දේවගැති වරයෙක්. අනිකා විලියම් ගේ ම වයසම ඇති කොළු ගැටයෙක්. දැන් ඉතින් නම් හැමදෙයක් ම අවසානයි කියලා විලියම් ට හිතුනා. මේ පැමිණෙන්නේ මොවුන් බලාපොරොත්තුවෙන් සිටින අමුත්තන් දෙදෙනා බව විලියම් ට කිසිම සැකයක් නොමැතිවම හිතාගන්න පුළුවන්. අමුතු ඇඳුම් හැඳගෙන තේ මේසයේ වාඩිවෙලා ඉන්න තමන් දැක්කොත් අමුත්තන් ගේ ප්‍රතිචාරය මොකක් ද කියලත් විලියම් හොඳින් ම දන්නවා. ඔවුන් පැමිණෙන්නේ නොසෑහෙන තරම් බඩගින්නකින් විය යුතුය. එසේනම් තමන් ට සුදානම් කොට

sinhalaebooks.com



තිබූ තේ පැන් සංග්‍රහය විලියම් විසින් සම්පූර්ණයෙන් ම ගිල දමා ඇති බව දැනගතහොත් අමුත්තන් කැලෑ පූසන් දෙදෙනෙක් මෙන් කෝපයට පත්වෙනු ද නොඅනුමානය.

මෙවැනි සිතිවිලි හිතේ තෙරපෙද්දී විලියම් ඉක්මනින් ම තේ මේසයෙන් නැගිට්ටා. ඉන්පසුව මහා හයියෙන් දුවගෙන ගොස් කෑම කාමරයේ පැත්තකින් තියෙන ජනේලයෙන් පිටතට පැන්නා. අවාසනාවක මහත. විලියම් ගේ වේගය නිසා සමබරතාවය ගිලිහි ගොස් ඔහු අමුත්තන් දෙදෙනා ගේ ඇඟේ හැප්පුනා. සිද්ධ වුනේ මොකක් ද කියා හිතාගන්නත් නොහැකිව දේවගැති වරයා පැත්තකට විසිවෙලා වැටුනා. කොළු ගැටයා විසිවෙලා ගොසින් ගසක වදිනවත් විලියම් යාන්තමට වගේ දැක්කා.

සිද්ධ වුන දේ දැකපු ගමන් තියෝපිලස් පග් දේවගැති තුමා පුදුමයෙන් බෙරිහන් දුන්නා. ඉන්පසුව ඔහු මේසය මත තිබුන හිස් කේක් බන්දේසිය අතට අරන් වේගයෙන් දුවන විලියම් දිහාට පහර දුන්නා. හැබැයි ඒ බන්දේසි පහර වැදුනේ දේවගැති තුමාගේ බිරිඳටයි. ඇය මේ වනවිටත් විලියම් ට පිරි නමන්නට උණුසුම් තේ බඳුනක් රැගෙන එමිනුයි හිටියේ. බන්දේසි පහර වදිනවත් සමගම දේවගැති බිරිඳ උණුසුම් තේ වලින් නැහැවුනා. ඒ විතරක් නෙවෙයි වේගයෙන් විසිවී ගිය බන්දේසිය මහළු කාන්තාවගේ ඇඟෙත් වැදිලා අසල තිබුන වටිනා මල් පෝච්චියත් කෑලි කෑලි බවට පරිවර්තනය කෙරුවා. පුංචි ගැහැණු ළමයාගේ අම්මා විශාල පියානෝව යට සැඟවිලා හිටපු නිසා ඇයට නම් කිසිම කරදරයක් වුනේ නෑ. මේ කලබැගෑනිය මැද්දේම විලියම් වේගයෙන් දුවගෙන ගොස් අසල තිබුන කැලෑවට වැදිලා නොපෙනී ගියා.

විලියම් ගේ හිතේ දැන් තියෙන්නේ දෙගිඩියාවක්. ඉක්මනින් ම නිවසට ගොසින් තමන් ගේ වෙස් මාරු කිරීම අයින් කරගන්නයි ඔහු කල්පනා කරන්නේ. ඇත්තටම ඒ දේ ඉක්මනින් ම කරන්නයි



විලියම් ට ඕනෑවෙලා තියෙන්නේ. හැබැයි නැවත නිවසට යන්නටත් ඔහු ගේ හිත අදමදි කරනවා. තමන් කරපු දේ අපූරු විනෝදාත්මක දෙයක් බව විලියම් ට හිතෙනවා. දේවගැති වරයා සහ පිරිස තමන් ට රැවටිලා අපූරු සංග්‍රයක් පිරිනමපු හැටි සිහිවෙන කොට නම් විලියම් ට මහා හයියෙන් හිනාවෙන්න හිතෙනවා. ඔවුන් පිරිනමපු කේක් පුදුමාකාර විදිහට රසවත් කියලා විලියම් ට සිහිපත් වුනේ එතකොටයි. මේ විනෝදය තමන් ට උරුම වන්නේ තාත්තා සිදුවීම දැනගන්නා තෙක් පමණයි කියලත් විලියම් ට ඒ වෙලාවේ හිතුනා.

.......................................................................

තැනිතලාව පුරාම නැවතත් පුදුමාකාර අන්දමේ නිහඬතාවයක් පැතිරී තිබුනා. පිරිස කිසිම හැලහොල්මනක් නැතිව තම තමන් ගේ පුටු මත වාඩිවෙලා නොඉවසිලිමත් බලාගෙන සිටිනවා. ඔවුන් ට ඉදිරියෙන් තබා තිබෙන මේසයේ තියෝපිලස් පග් දේවගැති තුමා, හබකුක් ජෝන්ස් දේවගැති තුමා සහ එතුමාගේ සහායක කුඩා ළමයා වාඩිවෙලා හිටියා. විලියම් විසින් අහවර කරන ලද කේක් බන්දේසියක් වෙනුවට සකස් කරන ලද වෙනත් කෑම බන්දේසියකුත් මේසයේ පැත්තකින් තබා තිබුනා. ටික වෙලාවකින් හබකුක් ජෝන්ස් දේවගැති තුමා වාඩිවෙලා හිටපු පුටුවෙන් නැගිටලා දුක්බර හඬකින් කථා කරන්න පටන්ගත්තා.

'නෝනාවරුනි... මහත්වරුනි.'

දේවගැති තුමා කථාව පටන්ගනිද්දී ම පිටුපස අසුනක වාඩිවෙලා හිටපු කුඩා ගැහැණු ළමයාගේ සමච්චල් සහගත කටහඬ පිරිස අතර තිබුන නිහඬතාවය බිඳ දැම්මා.

'ඒ හිටියේ විලියම් බ්‍රවුන් කියලා මම මොනතරම් කිව්ව ද ?. කවුරුවත් ඇහුවේ නෑ. මම කියපු දේ ඇහුවනම් මේ වගේ දෙයක් වෙන්නෙත් නෑ.'

sinhalaebooks.com

# 3.
# පරිච්ඡේදය

# විලියම් ගේ වාසනාව

විලියම් ගේ අම්මා. ඒ කියන්නේ බ්‍රවුන් මහත්මිය දරුණු සෙම්ප්‍රතිශ්‍යාවකින් සුවපත් වුනේ මේ මෑතකදී. වෛද්‍යවරුන් ඇයට නිර්දේශ කොට තිබුනේ පදිංචි ස්ථානය වෙනස් කරලා ටික දවසක් වෙනත් ප්‍රදේශයක ජීවත් වෙන්න කියලයි. අන්න ඒ නිසයි බ්‍රවුන් මහත්මිය එලන් නැන්දා ගේ ගෙදර යන්න තීරණය කෙරුවේ. අම්මාව මේ ගමන එක්ක යන්න භාරවුනේ විලියම්ටයි.

ගෙදර හැමෝම බල කරලා කිව්ව නිසා විලියම් ගමන යන්න කැමැති වුනත් ඔහු ගේ හිතේ නම් කිසිම මනාපයක් තිබුනේ නෑ. මොකද මේ යන ගමනින් කිසිම විනෝදයක් ලබන්න බැරි බව විලියම් හොඳින් ම දන්නවා. විලියම් ගමනට අකමැති බව දැනගත්තු



විගසම ගෙදර අයගෙන් ඔහුට පුදුමාකාර විදිහේ විරෝධයක් එල්ල වුනා. විලියම් ගේ අයියා රොබට් තමයි දරුණුම දෝෂාරෝපනය එයාට එල්ල කෙරුවේ.

'අම්මා ගොඩාක් දරුණු විදිහට අසනීප වෙලා යාන්තම් ගොඩ ගියා. අම්මට තව ටිකක් හොඳ වෙන්න ඕනෑ නිසයි වෙනස් පරිසරයකට ගිහිං ටික දවසක් ඉන්න කියලා දොස්තරලා කිව්වේ. හැබැයි විලියම් නම් මේ වැඩේට කිසිම සහයෝගයක් දෙන්නේ නෑ. එයා හදන්නේ අම්මව තවත් ලෙඩකරන්නයි. ඇත්තටම විලියම් හරිම ආත්මාර්ථකාමී කෙනෙක්. මට දුක ඒක නෙවෙයි. විලියම් මොනතරම් වැරැදි කෙරුවත් අම්මා එයාට තමයි වැඩියෙන්ම ආදරේ කරන්නේ.'

මේ වගේ දෝෂාරෝපන, ඇණුම් බැනුම් ගොඩාක් ඇහුවට පස්සේ විලියම් හරිම අකමැත්තෙන් වගේ එලන් නැන්දලාගේ ගෙදර යන්න කැමැති වුනා.

එලන් නැන්දලාගේ ගෙදර ගැන කල්පනා කරන්නව ත් විලියම් සතුටු නෑ. එලන් නැන්දගේ ගෙවත්ත. එලන් නැන්දා ඇති කරන පූස් පැටව් රොත්ත. එලන් නැන්දා කථා කරන විදිහ විතරක් නෙවෙයි එලන් නැන්දා විනෝදාංශ විදිහට කරන දේවල් වලට වුනත් විලියම් ගේ කැමැත්තක් තිබුනේ නෑ.

එලන් නැන්දලාගේ ගෙදර ගිය මුල්ම දවසේ හැන්දෑව උදාවුනා. මෙ වනවිටත් අම්මා නිවස ඇතුළේ හොඳට විවේක ගන්නවා. කරන්න කිසිම දෙයක් නැති හින්දා විලියම් ගෙවත්තේ ගහක් යට වාඩිවෙලා පොතක් කියවන්න වුනා. මේ වෙලාවේ අම්මා පෙනෙන්න හිටියේ නෑ. ටික වෙලාවකට පසුව එලන් නැන්දා මොකක් දෝ පොතක් අරන් ඇවිත් විලියම් ගේ අතට දුන්නා.

'මෙන්න මේ පොත කියවන්න විලියම්. මේකේ නම. නිවසේ

sinhalaebooks.com



දිප්තිමත් ආලෝකය පීටර්.. මේක හරිම ලස්සන පොතක් පුතා. මේ පොත ඇත්තම ඇත්ත කථාවක්. ඔයා දන්නව ද පොත ලියලා තියෙන්නේ මේකේ කථා නායකයා වන පීටර් ගේ අම්මා. ඉස්සර වෙලාම මේ පොත කියවලා ඉවර කරන්නකෝ. ඊට පස්සේ අපි පොත ගැන ටිකක් සාකච්ඡා කරමු. සමහර විට මේ පොත කියෙව්වම ඔයාගේ ජීවිතේ ලොකු පරිවර්තනයක් වෙයි කියලත් මට හිතෙනවා.'

එලන් නැන්දගේ පෙරැත්තය හින්දම විලියම් පොතේ පිටු කිහිපයක් කියෙව්වා. පොතේ කථා නායකයා වන පීටර් ගේ හැඩරුව ගැන චිත්‍රයක් දූත් විලියම් ගේ හිතේ මැවෙනවා. පීටර් ට තියෙන්නේ බටර් පාට කැරැලි ගැසුන කොණ්ඩයක්. මුහුණ පුරා නිතරම යාන්තම් හිනාවක් මතුවෙන බවත් පොතේ සඳහන් වෙලා තිබුනා. කොහොම වුනත් තවත් ටික වෙලාවක් පොත කියෙව්වට පස්සේ විලියම් ට කම්මැලි හිතුනා. එයා පොත පැත්තකින් තියලා එලන් නැන්දගේ පූස් පැටියත් එක්ක සෙල්ලම් කරන්න උත්සාහ කළා. හැබැයි පූස් පැටියා නම් විලියම් එක්ක සෙල්ලම් කරන්න කැමැති වුනේ නෑ. එයා එක පාරටම විලියම් ගේ මුහුණ පහුරු ගාලා බයිසිකල් නතර කරන මඩුව පැත්තට දුවගෙන ගියා. මේ වෙලාවේ විලියම් පූසා පස්සෙන් පන්නන්න කල්පනා කෙරුවේ නෑ. ඒ හින්දා එයා ළඟම තිබුන ඇපල් ගහකට ගොඩවෙන්න පටන්ගත්තා. හැබැයි එලන් නැන්දගේ ගෙවත්තේ තියෙන කිසිම ගසක් 'ළමයින් සඳහා වෙන් කරන ලද ඒවා නොවෙයි' කියලා විලියම් දන්නේ නෑ. එහෙම තහංචියක් තිබුනත් විලියම් ඒ ගැන මායිම් කරන්නෙත් නෑ.

විලියම් ඇපල් ගහට ගොඩවෙලා පුංචි අත්තක් උඩ හිටගත්තා. එතකොටම ඒ අත්ත ගහෙන් ගැලවෙලා පොළවට වැටුනා. ඇපල් ගෙඩි ටිකක් කඩාගෙන බිමට බැස්ස විලියම් ඉන්පසුව ඇපල් ගෙඩියක් කන ගමන් ම තවත් දඟකාරකමක් කරන්න පටන්ගත්තා. එලන් නැන්දගේ හරිම අපූරු ක්‍රිසන්තිමම් මල් පාත්තියේ තිබුන උසම මල්



ගස් කිහිපයක් ගලවලා ඒවාගේ මුල් එකිනෙකට සන්සන්දනය කරලා බලන එකයි විලියම් මේ වෙලාවේ කරමින් හිටියේ. ඔන්න ඔය වෙලාවේ තමයි එලන් නැන්දා ඉක්මන් ගමනින් ඔහු සිටින තැනට ඇවිදගෙන ආවේ. විලියම් ඉක්මනින් ම මල් පාත්තියෙන් නැගිට්ටා. එතකොටම එලන් නැන්දා කථා කරන හඬ ඔහුට ඇහුනා.

'විලියම්... ඔයා මම දුන්න පොත කියවලා ඉවර ද ?.'

'ඔව් නැන්දේ...'

විලියම් කිසිම හැඟීමක් නැති හඬකින් කියද්දි එලන් නැන්දා සතුටින් හිනාවෙමින් ම මෙහෙම කිව්වා.

'දෙයියනේ... ඔයා හරිම ඉක්මනට පොත් කියවනවා නේ. පොඩ්ඩක් ඉන්න... පීටර් ගැන ලියපු තවත් පොතක් මම ළඟ තියෙනවා. මම ඒකත් ඔයාට කියවන්න ගෙනැත් දෙන්නම්. ඔයා කැමැති යි නේද ?.'

විලියම් කිසිම දෙයක් නොකියාම ගොඩාක් ආචාරශීලි විදිහට කහින්න වුනා. ඉන්පසුව ඔහු එලන් නැන්දා ට මේ ආකාරයේ උත්තරයක් දුන්නා.

'ඔයාට ගොඩාක් ස්තුතියි නැන්දේ. හැබැයි මෙ වෙලාවේ මට පොත් කියවන්න තරම් හොඳ මානසිකත්වයක් නෑ. ඇත්තටම වෙන මොනව හරි දෙයක් කරන්න තියෙනවා නම් මම හරිම කැමැතියි.'

විලියම් එහෙම කියද්දී එලන් නැන්දා පුදුමයෙන් වගේ විලියම් දිහා බලාගෙන හිටියා.

'විලියම්... ඔයා මොනවගේ දෙයක් ද කරන්න කැමැති ?.'

'මට කියන්න තේරෙන්නේ නෑ නැන්දේ. හැබැයි මොනව හරි ක්‍රීඩාවක් වගේ දෙයක් කරන්න තියෙනවා නම් හොඳයි කියලා

sinhalaebooks.com



හිතෙනවා.'

එලන් නැන්දා ගේ ගෙදර ක්‍රීඩා භාණ්ඩයක් විදිහට තිබුනේ ගොඩාක් පරණ දුන්නකුයි, ඊතල ටිකකුයි විතරයි. ඒවා එලන් නැන්දා ගේ තරුණ කාලේදී කාගෙන්දෝ හම්බ වුන පුරාවස්තුවක්. ටික වෙලාවක් කල්පනා කළ එලන් නැන්දා මේ පරණ දුන්නයි, ඊතල ටිකයි ගෙනැත් විලියම් ට දුන්නා.

'මෙන්න පුතා. ඔයා මේ ටික අරන් ගිහිං ඉලක්කයට විදින්න පුරුදු වෙන්න.'

මේ අපූරු ක්‍රීඩා භාණ්ඩය විලියම් අතට ගත්තේ උතුරා යන අන්දමේ සතුටකින්. ඒ සතුට එයා වචනවල තවරලා එලන් නැන්දා ඉදිරියේ දිග හරින්නත් අමතක කෙරුවේ නෑ.

'ඔයාට ගොඩාක් ස්තුතියි එලන් නැන්දේ. හැබැයි මට ඉලක්කයට විදින්න පුරුදු වෙන්න නම් දෙයක් නෑ.'

තවත් ටික වෙලාවක් විලියම් එක්ක කථා කර කර හිටපු එලන් නැන්දා ටිකක් නිදාගන්න හිතාගෙන නිවසේ උඩු මහලේ තියෙන එයාගේ කාමරේට ගියා.

දැන් මෙතැන ඉන්නේ විලියම් විතරයි. ඒ හින්දා එයා දුන්නයි, ඊතල ටිකයි අරන් හිතේ හැටියට හතර වටේටම විදින්න පටන්ගත්තා. විලියම් මුලින්ම කෙරුවේ අසල තිබුන ඇපල් ගහේ ගෙඩිවලට ඊතල වලින් විදින එකයි. එයා විදපු සමහර ඊතල ඉලක්කය හොයගෙන ගියා. ඒ නිසා වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා ඇපල් ගහ මුල ගෙඩි ගොඩාක් වැටිලා තිබුනා. ඔය අතරෙදිම විලියම් ගේ දුන්නෙන් විහිදුන ඊතලයක් එලන් නැන්දා ගේ ගෙයි ජනෙල් වීදුරුවක වැදිලා කැඩිලා බිඳිලා ගියා.

මේ දේවල් වලින් විතරක් විලියම් ගේ සෙල්ලම නතර වුනේ නෑ. එයා ඊට පස්සේ දුන්නයි, ඊතලයයි අරන් එලන් නැන්දා



ගේ පුරතල් පූසා පසු පස පන්නන්න වුනා. පූසා උමතුවෙන් වගේ පසුපස නොබලාම දිව්වා. ඉන්පසුව විලියම් ගේ දුන්නෙන් විහිදුන ඊතලය අල්ලපු ගෙවත්තේ ඉන්න උයන්පල්ලා ගේ කකුල් දෙක ළඟටම වැටුනා.

ගෙවත්තේ මේ වගේ දේවල් සිද්ධ වෙද්දී එලන් නැන්දා හදිසියෙන් ම වගේ නින්දෙන් පිබිදුනා. මේ වෙනකොටත් තමන් ට කරපු දේ ගැන කියමින් උයන්පල්ලා විලියම් ට හොඳ හැටි බනිනවා. එලන් නැන්දා ඉක්මනින් ම එතැනට ගිහිං උයන්පල්ලා ගේ ග්‍රහණයෙන් විලියම් ව බේරාගත්තා. ඊට පස්සේ එලන් නැන්දා විලියම් ට ටිකක් ඇවිදින්න යන්න කියලා යෝජනා කෙරුවා. විලියම් ගේ චරිත ලක්ෂණ හැටියට එයා තැනක හිරවෙලා ඉන්න කැමැති කෙනෙක් නෙවෙයි. එළිමහන් ජීවිතේකට තමයි විලියම් වැඩියෙන් ම කැමැත්තක් දක්වන්නේ. මෙන්න මේ ගැන වටහාගත්තු නිසයි නැන්දා විලියම්ට ඇවිදින්න යන්න කියලා කිව්වේ. ඒ අතරම විලියම්, එලන් නැන්දා දිහාට හැරිලා මෙහෙම කිව්වා.

'නැන්දේ.... මොනව හරි දෙයක් හරියට කරන්න හොඳ පුහුණුවක් තියෙන්න ඕනෑ. ඉතින් මටත් මේ දුන්නෙන් විදින්න පුහුණුවක් තිබුනොත් හොඳයි කියලා ඔයාට හිතෙන්නේ නැද්ද ?. ඇත්තටම මම මෙච්චර වෙලා කෙරුවෙත් දුන්නෙන් විදින්න පුහුණු වෙන එකයි. ඒ වගේ දෙයක් කරනකොට පොඩි පොඩි වැරැදිම් සිද්ධ වෙනවා තමයි.'

විලියම මේ වගේ කථාවක් කිව්වේ තවත් අදහසක් හිතේ තියාගෙනයි. ඒ බව ඉවෙන් වගේ තේරුම් ගත්තු නිසාදෝ එලන් නැන්දා උරහිස සෙලෙව්වා.

'විලියම... පුතා. ඔයා දැන් ටිකක් ඇවිදින්න ගියොත් හොඳයි කියලා මට හිතෙනවා. ඔයාට එහෙම හිතෙන්නේ නැද්ද ?.'

sinhalaebooks.com



'මට නම් එහෙම හිතෙන්නේ නෑ නැන්දේ. හැබැයි මම ඇවිදින්න යනකොට මේ දූන්නයි, ඊතල ටිකයි අරන් ගියොත් නම් හොඳයි කියලා හිතෙනවා. මම මේක අරන් යන්න ද ?'

'මම නම් හිතන්නේ ඒ වැඩේ ඒතරම් හොඳ නෑ.'

එලන් නැන්දා හිස සොලවමින් එහෙම කියද්දී විලියම් බලාපොරොත්තු බිඳුන හඬකින් මෙහෙම කිව්වා.

'හරි... එහෙම නම් කමක් නෑ.'

.............................................................

විලියම් සාක්කුවට අත් දෙකත් ඔබාගෙන කිසිම අරමුණක් නැතිව පාර දිගේ ඔහේ ඉදිරියට ඇවිදගෙන ගියා. ඒ අතර එලන් නැන්දා ආයේමත් නිදාගන්න හිතාගෙන එයාගේ කාමරේට රිංගුවා. දූන් නම් නිවස පුරා තියෙන්නේ පුදුමාකාර නිහඬ බවක්. හැබැයි ඒ නිහඬ බව විලියම් ගේ හිතේ නම් තිබුනේ නෑ. මේ නිවස පුදුමාකාර පාළු තැනක් කියලයි එයාට හිතෙන්නේ. මීට සතියකට පෙර තමන් ගේ නිවසේ ගෙවුන අපූරු දවස් ගැන විලියම් ට සිහිපත් වෙනවා. ඒ වුනත් දූන් විලියම් හරිම ඒකාකාරි පරිසරයක හිර කාරයෙක් බවට පත්වෙලා.

මේ පරිසරයේ තිබෙන්නේ මොනතරම් ඒකාකාරි දේවල් ද ?. කිසිම තේරුමක් නැති කොළු ගැටයා පීටර් ගැන ලියවුන පොත්, නපුරු උයන්පල්ලා, වගේම එලන් නැන්දා ගේ කුලැටි පූස් තඩියා... මේ හැම දෙයක් ම පීටර් ට හරිම ඒකාකාරියි. මේ ඒකාකාරි දේවල් එක්ක කිසිම සතුටක් ලැබෙන්නේ නෑ කියලා විලියම් ට වැටහෙනවා. අනික මේ විදිහට ඇවිදින්න යන එකෙන්වත් කිසිම විදිහක සතුටක් ලැබෙයි ද කියලා විලියම් ගේ හිතේ තියෙන්නේ සැකයක්. අනික මේ පලාතේ ඔහුට කිසිම යාළුවෙක් වත් නෑ. ඒ වගේම මේ වගේ ඒකාකාරි පලාතක ඉන්න කිසිම කෙනෙක් එක්ක හිතවත් කමක්



ඇති කරගන්න වුනත් විලියම් ගේ හිතේ කිසිම කැමැත්තක් නෑ. මේ පලාතේ ඉන්න කොළු ගැටවුනුත් එලන් නැන්දා දූන්න පොතේ ඉන්න පීටර් වගේ කියලා විලියම් ට හිතෙනවා. පීටර් ගැන නම් දූන් විලියම් ගේ හිතේ තිබෙන්නේ පුදුමාකාර විදිහේ තරහක්. ඒ වගේ යාළුවෙක් නිකමටවත් හම්බ වෙන්න විලියම් කැමැති නෑ.

මේ වනවිටත් විලියම් කඳුකර පාර දිගේ සෑහෙන දුරක් ඇවිදගෙන ගොස් අවසන්. දූන් එයාට හොඳටම මහන්සියි. තවත් ටික වෙලාවකට පසුව ඔහු පඳුරු යායක් මැදින් වැටී තිබුන කුඩා අඩි පාරක් දිගේ ඉදිරියට ඇවිදගෙන යන්න පටන්ගත්තා. ඒ පාර දිගේ ටික දුරක් ගියාට පසුව කාගේදෝ ලස්සන ගෙවත්තකටයි විලියම් අවතීර්ණ වුනේ. විලියම් ගේ හිත කළබල වෙලා. ඒ හින්දා මේ ගෙවත්ත කාගෙද කියලා කල්පනා කරන්න වුනත් විලියම් සූදානම් වුනේ නෑ. ගෙවත්ත කෙළවර ලස්සන පුංචි ගෙයක් තියෙනවා. විලියම් දෙපාරක් හිතන්නේ නැතිව ඒ ගේ දිහාවට ඇවිදගෙන යන්න වුනා. තමන් ගේ හිතේ තියෙන ඒකාකාරි බව මකා දමන්න පුළුවන් කෙනෙක් මේ ගෙදරවත් හිටියොත් හොඳයි කියලා විලියම් ඒ වෙලාවේ කල්පනා කෙරුවා.

ගේ ළඟටම ආවට පස්සේ විලියම් එක පාරටම නතර වුනා. ඔහු නතර වෙලා තියෙන්නේ ජනේලයක් අසලයි. ඒ ජනේලයෙන් කාමරය ඇතුළ හොඳින් පෙනෙනවා.

විලියම් කිසිම කථාවක් නොමැතිව ජනේලයෙන් කාමරය දිහා බැලුවා. එහි මේසයක් මත පොත් පත් තොගයක් ගොඩගසා තිබෙන හැටි ඔහු ට පෙනෙනවා. එයා කිසිම කථාවක් නොමැතිව පොත් පිට කවර වල තිබෙන නම් කියවන්න පටන්ගත්තා. 'දරුවන් ව තේරුම් ගන්නා හැටි', 'දරුවන් ට යහමඟ පෙන්වන්නට උපදෙස් ටිකක්', 'සෑම මවකම කියවිය යුතු පොතක්' වගේ එකම මාතෘකාවක් යටතේ ලියැවුන පොත් පත් මහා ගොඩාක් මේසය මත තබා තිබුනා.

sinhalaebooks.com



ඒ විතරක් නෙවෙයි. ටයිප් රයිටරයකින් ලියූ සටහන් ගොඩාක් සහ මව්වරුන් වෙනුවෙන් ම පළ කරන සඟරාවක පිටපත් මහා ගොඩාක් ද මේසය උඩ තිබුනා.

මෙතැන තියෙන්නේ අපූරු පොත් එකතුවක් නේද කියලා විලියම් ට ඒ වෙලාවේ හිතුනා. ඒ වගේම පීටර් ගැන ලියැවුන පොත් නොතිබීම ගැනත් එයාට හරිම සතුටුයි. මේ වගේ දේවල් ගැන කල්පනා කරන ගමන් ම විලියම් නැවත වතාවක් ජනේලයෙන් කාමරය ට එබිලා බැලුවා.

මිනිසෙක් මේසය ළඟ වාඩිවෙලා ලියුමක් කියවනවා. එයාගේ මුහුණ පුරා කිසියම් බියක සේයාවක් තැවරිලා තියෙන හැටිත් විලියම් දැක්කා. තවත් ටික වෙලාවකින් ඒ මිනිසා හිස ඔසවලා විලියම් දිහා බැලුවා. මිනිසා සහ විලියම් විනාඩියක් දෙකක් එකිනෙකා ගේ මුහුණු දිහා එක එල්ලේම බලාගෙන හිටියා. හැබැයි දෙදෙනාගෙන් කවුරුවත් වචනයක්වත් කථා කෙරුවේ නෑ. ඉන්පසුව මිනිසා ලියුම පැත්තකින් තියලා ඉක්මනින් ම කාමරය හරහා ඇවිදගෙන යන හැටිත් විලියම් දැක්කා. මේ මිනිසා එන්නේ තමන් ට හොඳ හැටි බනින්න කියලා විලියම් ට හිතුනා. ඒ නිසා ඔහු කියන දේවල් වලට ගොඩාක් තදින් පිළිතුරු දෙනවා කියලා කල්පනා කරපු විලියම් එතැනම නතර වෙලා හිටියා. තවත් තත්ත්පර කිහිපයක දී මිනිසා කාමරයෙන් එළියට ඇවිත් විලියම් ඉදිරියේ හිටගත්තා. හැබැයි එයාගේ මුහුණේ කිසිම කෝපයක සේයාවක්වත් තැවරිලා තිබුනේ නෑ.

'හලෝ... ළමයා කොහොමද ?. ඔයා මේ ළඟ ද නතර වෙලා ඉන්නේ ?.'

විලියම් ළඟට ආපු ආගන්තුක මිනිසා ගොඩාක් හිතවත් විදිහට ඇහුවා. ටික වෙලාවක් නිහඬව හිටපු විලියම් නොසැලකිලිමත් විදිහට දුන්නේ මේ ආකාරයේ පිළිතුරක්.



'ඔව්... මම මේ ළඟ තමයි ඉන්නේ.'

'කොච්චර දෙයක් ද ?. ඒක නෙමෙයි ළමයා මට පොඩි උදව්වක් කරන්න පුළුවන් ද ?. මම ඔයා ඉල්ලන ඕනෑම දෙයක් දෙන්නම්. සිලිමක්, දෙකක් නෙමෙයි දහයක් වුනත් දෙන්නම්. ඒ විතරක් නෙවෙයි. ඔයා මෙහේ ඉන්න දවස්වල ඕනෑම වෙලාවක මගේ ගෙදර එන්න. මම ඔයා කැමැති ඕනෑම දෙයක් දෙන්නම්. මේ කැලේ කුරුළු කූඩු තියෙනවා. ඔයාට පදින්න මම පොඩි බයිසිකලයකුත් දෙන්නම්කෝ. අනික මගේ ගේ පිටිපස්සේ පුංචි පොකුණකුත් තියෙනවා. ඒ විතරක් නෙවෙයි ඔයාට ඕනෑම දෙයක් කරන්න මගේ ගෙවත්තේ ඉඩ තියෙනවා.'

මිනිසා දිගින් දිගටම කියවාගෙන යද්දී විලියම් ගේ හිතට ඇතිවුනේ සතුටක් සමඟ පුදුමයක්. ඔහු ඉක්මන් හඬකින් මෙසේ කිව්වෙත් ඒ නිසයි.

'ඔය කියන දේවල් ලැබෙනවා නම්, මම ඔයා කියන ඕනෑම දෙයක් කරන්නම්.'

'ඒ හැමදේම ඔයාට දෙනවා කියලා මම පොරොන්දු වෙනවා. හැබැයි අද හැන්දෑවේ ඔයා මට උදව්වක් කරන්න ඉදිරිපත් වෙන්න ඕනෑ.'

'කිසිම සැකයක් තියාගන්න එපා මහත්මයා. ඔයා කියපු දේවල් වලට මම ඕනෑම දෙයක් කරනවා. සහතිකයි.'

විලියම් උනන්දුවෙන් එහෙම කියද්දී ආගන්තුකයා පුදුමාකාර අන්දමේ කලබලයකින් විලියම් ට කථා කරන්න වුනා.

'හරි... එහෙමනම් ඉක්මනට ගේ ඇතුළට එන්නකෝ. අපිට වැඩිවෙලාවක් ඉතිරිවෙලා නෑ. මොකද ඒ ගැහැණු කෙනා මෙලහකටත් එනවා ඇති. හරි. ඔයාට මේ දේ විතරයි කරන්න

sinhalaebooks.com



තියෙන්නේ. ඒ ගැහැණු කෙනා ආපුවාම ඔයා පීටර් විදිහට රඟපාන්න ඕනෑ. ඒ වගේම මම ඔයාගේ අම්මා විදිහට රඟපානවා. මම කියපු දේ ඔයාට තේරුනා නේද ?.'

මිනිසා එහෙම කියද්දී විලියම් ගේ හිතට ඇතිවුනේ පුදුමාකාර විදිහේ කම්පනයක්. විලියම් මොනතරම් හයියෙන් කථා කළා ද කියනවා නම් මිනිසා ගේ දෑසත් මහත්වුනා.

'අර පොත්වල ඉන්න කමකට නැති කොල්ලා, පීටර් විදිහට රඟපාන්න කියලද ඔයා මට කියන්නේ ?.'

'එයා කමකට නැති කොල්ලෙක් නෙවෙයි. අපූරු කෙනෙක් කියලයි හැමෝම කියන්නේ. ඕනෑ නම් මම ඔයාට ඒ ගැන කියලා මට එවලා තියෙන ලියුම් තොගයක් වුනත් පෙන්වන්නම්.'

මිනිසා එහෙම කිව්වා. හැබැයි මේ වෙලාවේ විලියම් ගේ හිත වැසී තිබෙන්නේ ඔහු ගේ ගෙවත්තේ තිබෙන පොකුණ, අසල ඇති කැලෑව, ලස්සන ගෙවත්ත, සහ මිනිසා විසින් දෙන්නට පොරොන්දු වී තිබෙන සිලිං දහයේ මුදල ගැන වූ සිතිවිලි වලින්. මේ අපූරු දේවල් නැති කරගන්න නම් විලියම් ටිකක්වත් කැමැති නෑ.

'පීටර් කියන්නේ සත්තු වත්තකින් එළියට පැනපු වඳුරෙක් වගේ කෙනෙක්. ඒ වුනත් මට කමක් නෑ. හැබැයි මම පීටර් වගේ රඟපෑවා කියලා වෙන කාටවත් කියන්නේ නෑ කියලා පොරොන්දු වෙනවා නම් මම ඔයා කියන විදිහට රඟපාන්නම්.'

'හරි... හරි... ළමයා මම ඔයා කියන දේ ට කැමැතියි. හැබැයි අපිට කථා කර කර ඉන්න වෙලාවක් නෑ. මොකද ඒ ගැහැණු කෙනා දැනටමත් එනවා ඇති. එයා ගෙට ගොඩවුනාම මම එයාව හම්බ වෙන්න යන්නේ නෑ. ඔයා ඉස්සරහට ගිහිං එයාව පිළි අරන් මම තමයි පීටර් කියලා කියන්න. හැබැයි ඔයාට පීටර් ට තියෙන



කිසිම හැඩරුවක් පිහිටලා නැති එකයි මගේ හිතට තියෙන එකම කනගාටුව. ඔයාගේ කොණ්ඩේ පීටර් ගේ වගේ කැරැලි ගැහිලා නෑ. හමේ පාටත් වෙනස්. ඒ විතරක් නෙවෙයි. ඔයා පීටර් ට වඩා ගොඩාක් ලොකුයි. ඔයාගේ කථාබහ, හැසිරීම වගේ දේවලුත් පීටර් ට ගැළපෙන්නේ නෑ.'

මිනිසා ඒ විදිහේ දෙයක් කියද්දී නම් විලියම් ට හොඳටම කේන්ති ගියා. මොන දේ ලැබුනත් කවුරුහරි කෙනෙක් තමන් ව බාල්දු කරනවට විලියම් ටිකක්වත් කැමැති නෑ. එයා අමනාපයෙන් වගේ මෙහෙම කිව්වේ ඒ නිසයි.

'හරි...ඔයා කියන විදිහට මම මේ වැඩේට ගැළපෙන්නේ නැතිනම් වෙන කවුරුහරි කෙනෙක් හොයාගන්න. මොකද පීටර් ගේ මෝඩ මුහුණට ගැළපෙන කෙනෙක් හොයාගන්න එච්චර අමාරුවෙන එකක් නැහැනේ.'

විලියම් ගේ තර්ජනයට නම් මිනිසා පුදුමාකාර විදිහට බයවුනා. ඔහු බැගෑපත් විදිහට ආයාචනා කෙරුවේ ඒ නිසයි.

'එපා...එපා..යන්න එපා ළමයා. මම ඒ වගේ දෙයක් කිව්වට තරහ වෙන්නත් එපා. මොනව කරන්නත් දැන් වැඩි වෙලාවක් ඉතිරිවෙලා නෑ. ඒ ගෑණු කෙනා දැනටමත් ඇවිල්ලද දන්නේ නෑ. අනේ ළමයා... ඔයා එයාව හම්බ වෙලා පීටර් විදිහට රඟපාන්න. මම ඉල්ලන්නේ එච්චරයි. ඊට පස්සේ ඔයා මේක ඔයාගේ ගෙදර කියලත් එයාට කියන්න. අම්මා කොහෙද කියලා ඒ කාන්තාව ඇහුවොත් දරුණු හිසරදයක් හැදිලා නිදාගෙන ඉන්නවා කියලත් කියන්න. ඒ හින්දා අම්මව හම්බ වෙන්න බෑ කියන එක නම් අමතක කරන්නේ නැතිවම ඒ ගැහැණු කෙනාට කියන්න ඕනෑ. ඊට පස්සේ එයා යන්න ගියාම ඔයා ඇවිත් මට කියන්න ඕනෑ හොඳ ද ?.'

මිනිසා උපදෙස් ගොඩාක් දුන්නා. විලියම් හිස වනා ඒ හැමදෙයකටම එකඟ වෙද්දීම උස ගැහැණු කෙනෙක් නිවසට එන

sinhalaebooks.com



පාර දිගේ එන හැටි පෙනුනා. ඇය දුටු විගසම මිනිසා අමුතු, සිහින් හඬකින් බෙරිහන් දෙමින් ගේ ඇතුළට දුවගෙන ගියා.

..............................................................

ඇත්තටම විලියම් ට අහම්බෙන් වගේ හම්බ වෙලා තියෙන්නේ ලේඛක මහත්මයෙක්. එයාගේ නම මොන්ක්ටන් ග්‍රැහැම්. මොන්ක්ටන් මහතා මව්වරුන් වෙනුවෙන් පළකරන 'මන්ත්ලි සිග්නල්' කියන සඟරාවට නිතරම ලිපි ලියනවා. මෙයට පෙර විලියම් කියවපු පොතේ හිටපු පීටර් ගැන තමයි මොන්ක්ටන් මහතා ලියන්නේ. එහිදී ඔහු පෙනී හිටින්නේ පීටර් ගේ අම්මා විදිහටයි.

පීටර් ගේ අම්මා විදිහට පෙනී සිටිමින් මොන්ක්ටන් මහතා ලියන ලිපි පෙළ පාඨකයින් අතර හරිම ජනප්‍රියයි. ඒ වගේම ඔහු පීටර් ගැන පොත් කිහිපයකුත් පළ කරලා තියෙනවා. මෙයට ටික වෙලාවකට ඉස්සර වෙලා එලන් නැන්දා විසින් තමන් ට දුන්නෙත් ඒ පොතක් කියලා විලියම්ට සිහිපත් වුනේ එතකොටයි.

හැබැයි මේ වෙනකොට නොසිතූ ඇබැද්දියකට මුහුණ දෙන්නත් මොන්ක්ටන් මහතා ට සිදුවෙලා. පීටර් ගේ අම්මා හම්බවෙන්න ආගන්තුක කාන්තාවක් නිවසට එනවා. හැබැයි මේ ලිපි පෙළ ලියන්නේ පිරිමියෙක් කියලා දැනගත්තොත් මොන්ක්ටන් මහතා ට සිද්ධ වෙන අවමානයත් සුළු පටු එකක් නෙවෙයි. මෙන්න මේ අපහසු තත්ත්වයෙන් තමන් ව මුදාගන්න කියලයි මොන්ක්ටන් මහතා විලියම ට කිව්වේ.

විලියම මේ දේවල් ගැන කල්පනා කරමින් සිටිද්දී ම ගේට්ටුවෙන් ඇතුළු වුන කාන්තාව නිවස ළඟටම ඇවිත් ඉදිරිපස දොරට තට්ටු කරන හඬ විලියම් ට ඇහුනා. විලියම් උදාසීන විදිහට ගිහිං දොර විවෘත කෙරුවා. ආගන්තුක කාන්තාව විලියම් දිහා බලාගෙන හිටියේ පුදුමයෙන් වගේ. විලියම් ද නොසැලී කාන්තාව දිහා බලාගෙන හිටියා.



'සුප උදෑසනක් පුංචි ළමයෝ...'

ආගන්තුක කාන්තාව ගොඩාක් හිතවත් විදිහට එහෙම කියද්දී විලියම් නොපැකිලිව ඇයට සුබ පැතුවා. මොන්ක්ටන් මහතා විසින් තමන් ට දෙන්නට පොරොන්දු වුන කුඩා බයිසිකලය, ඔහු ගේ ගෙවත්ත පිටුපස තියෙන අපූරු පොකුණ අවට කැලෑවේ තියෙන කුරුළු කූඩු. ඒ වගේම මොන්ක්ටන් මහතා දෙන්නට පොරොන්දු වුන සිලිං දහයක මුදල. මේ හැමදෙයක්මත් විලියම් ට මතක් වුනා. තමන් ගේ රඟපෑම ගොඩාක් හොඳට කරන්න ඕනෑ කියලා ඔහු කල්පනා කෙරුවේ ඒ නිසයි. ඒ අතරම ආගන්තුක කාන්තාව ආයේමත් විලියම්ගෙන් මෙහෙම ඇහුවා.

'ඔයාගේ නම මොකක් ද දරුවෝ ?.'

කාන්තාව ඇසූ පැනයට උත්තරයක් දෙන්න ඉස්සර වෙලා විලියම ටිකක් ඇය දිහා විපරමින් බැලුවා. කාන්තාව ගේ පෙනුම එතරම් නපුරු නෑ. එයාට තියෙන්නේ කරුණාවන්ත මුහුණක්. හිසේ කෙස් සුදු පැහැයට හැරිලා. තියුණු බැල්මක් තියෙන දෑස් ඇස් කණ්නාඩියකින් වැසී තිබුනා. මේ ලක්ෂණත් එක්ක කාන්තාව නපුරු කෙනෙක් නෙවෙයි කියලා සහතික වශයෙන් ම නිගමනය කළා ට පසුව විලියම් ඇයට උත්තරයක් දෙන්න ඉදිරිපත් වුනා.

'ඇත්තටම නෝනා මගේ නම තමයි පීටර්.'

විලියම ගේ පිළිතුර ඇහුන ගමන් ම කාන්තාවගේ කරුණාවන්ත මුහුණේ කිසියම් අමුතු බැල්මක් ඇඳුනා. විලියම් ගේ හිතේ කිසියම් තිගැස්මක් ඇතිවුනෙත් ඉබේටම වගෙයි. ඒ අතර කාන්තාව සැකය ඉතිරෙන හඬකින් මෙහෙම කිව්වා.

'පීටර්... ඒකනම් කොහොමටවත් වෙන්න බෑ.'

'හරි... ඔය නෝනා හිතන්නේ මගේ කැරලි ගැහුන හිසකෙස් නැති එක ගැන වෙන්න ඇතිනේ. ඇත්තටම ඒවාට සිද්ධ වුනේ

මොකක් ද කියලා මම කියන්නම්. දවසක් මම සත්තු වත්ත බලන්න ගියා. ඉතින් වඳුරෝ ඉන්න කූඩුව ළගට ගියාම තපුරු වඳුරෙක් මගේ හිස කෙස් ටික ඔක්කොම උදුරලා දැම්මා. ඇත්තටම මගේ තට්ටේ තමයි ඉතිරිවුනේ. ඊට පස්සේ ඔලුවේ ආවේ මේ වගේ හිසකෙස්. අන්න එදායින් පස්සේ තමයි මගේ කැරැලි හිස් කෙස් නැතිවුනේ.

'දෙයියනේ... මොනතරම් අවාසනාවන්ත සිද්ධුවීමක් ද ?. මේ සිද්ධියෙන් පස්සේ ඔයාගේ අම්මා ගොඩාක් දුක්වෙන්න ඇති නේද?.'

කාන්තාව දුක්බර විදිහට අහද්දී විලියම් සැහැල්ලුවෙන් උත්තර දුන්නා.

'ඇත්තටම නෑ. මගේ පස්සේ ආපු හිසකෙස් වලට අම්මා ගොඩාක් කැමැති වුනා.'

මේ පිළිතුරත් එක්ක ආගන්තුක කාන්තාව ගැන කිසියම් නොකැමැත්තකුත් විලියම් ගේ හිතේ ඇතිවෙන්න පටන්ගත්තා. ඇය කථාව දිගින් දිගටම පවත්වා ගනිමින් සැහෙන වෙලාවක් මෙතැන නතර වෙලා ඉන්න හදන එක ගැනයි විලියම් නොකැමැත්තට පත්වුනේ. තවත් මොහොතකින් කාන්තාව ආයේමත් කථා කරන්න වුනා. දැඩි කල්පනාවක නිමග්න වෙලා හිටපු හින්දා විලියම් ට ඇගේ කථාව ඇහුනේ සිහිනයෙන් ඇසෙන්නා වගෙයි.

'මොනව වුනත් ළමයා... මම හිතාගෙන හිටියට වඩා ඔයා ගොඩාක් වෙනස් කියලා හිතෙනවා. ඔයා ගොඩාක් උසයි. ඒ වගේම මහතයි. පොත් වලින් මම කියවපු පීටර් ට තිබුනේ ඔය විදිහේ හැඩහුරුකම් නෙවෙයි නේ.'

කාන්තාවගේ ඒ පැනයටත් දෙන්න පිළිතුරු විලියම් ළඟ තිබුනා. එයා කිසිම කළබලයක් නැති විදිහට මෙහෙම කිව්වේ ඒ නිසයි.

'සහතික ඇත්ත නෝනා. ඒ පොත් වල මම ගැන තිබුනේ



මීට සැහෙන කාලෙකට ඉස්සර වෙලා තිබුන හැඩරුව නේ. මම දැන් ඊට වඩා ගොඩාක් වයසයි. ඒ වගේම පහුගිය ටිකේ මට සැහෙන්න අසනීප වුනා. අන්න ඒ නිසයි මේ විදිහට වෙනස් වෙලා ඉන්නේ.'

'ඇත්තම ද පීටර් ?. ඒ වුනත් ඔයාගේ අම්මා නම් ඒ ගැන මට ලියුම් වලින් දැන්නුවේ නැහැනේ.'

කාන්තාව දුක්බර විදිහට කියද්දී විලියම් ආයේමත් සැහැල්ලු හඬකින් පිළිතුරු දුන්නා.

'ඇත්තම කියනවා නම් මම අසනීප වෙලා හිටියා කියලා අම්මා දන්නෙවත් නෑ. මොකද එයා දුක්වෙයි කියලා මම කිව්වේ නෑ. අසනීපයක් තිබුනත් මම නෑ වගේ හිටියා. අන්තිමේට සිද්ධ වුනේ හිතපු නැති විදිහට මගේ රූපය වෙනස් වුන එකයි.'

කාන්තාව ටික වෙලාවක් කල්පනා කෙරුවා. විලියම් තෙපලූ ගල් පැලෙන බොරුව ඇය විශ්වාස කරන්නට ඇත. ටික වෙලාවකට පසුව කාන්තාව මේ වගේ දෙයක් කිව්වේ ද ඒ නිසා ය.

'ඔව්... වෙලා තියෙන්නේ මොකක් ද කියලා මට හිතාගන්න පුළුවන්. හොඳයි... අපි ඒ දේවල් අමතක කරමුකෝ. මට ඔයාගේ අම්මව හම්බවෙන්න පුළුවන් ද ?. එයා මාව බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා මම දන්නවා. ඔයා ගිහිං අම්මට මම ගැන කියන්නකෝ. මගේ නම රුබිනා ස්ට්‍රේන්ජ්.'

'අම්මා මට ඔයා ගැන කිව්වා නෝනා. ඒ වුනත් කනගාටුයි. මේ වෙලාවේ අම්මට හොඳටම අසනීපයි. ඒ හින්දා ඔයාව හම්බවෙන්න එන්න විදිහක් නෑ. ඒ ගැන සමාවෙන්න කියලා කියන්න කියලත් අම්මා මට කිව්වා.'

විලියම් එහෙම කියද්දී කාන්තාවගේ කරුණාවන්ත මුහුණට කිසියම් දුක්බර බවක් ආරෝපනය වුනා. ඉන්පසුව ඇය කිව්වේ

sinhalaebooks.com



විලියම් හිතෙකින්වත් හිතපු නැති දෙයක්.

'මොනවා... ඔයාගේ අම්මට සනීප නෑ. එහෙමනම් මට එයාව හම්බවෙන්න ම ඕනෑ. මොකද අසනීපයෙන් ඉන්න එයාට මොනව හරි උදව්වක් කරන්න වුනත් මට පුළුවන් වෙයි.'

'මට කනාගාටුයි නෝනා... ඔයා හොඳටම පරක්කුයි. මගේ අම්මා වෙනුවෙන් ඔයාට දැන් කිසිම දෙයක් කරන්න ලැබෙන්නේ නෑ.'

'ඒ වුනත් ඔයා දොස්තර කෙනෙක්ව ගෙන්නුවේ නැද්ද ?.'

'ඇයි නැත්තේ... මම දොස්තර කෙනෙකුටත් අම්මා ව පෙන්නුවා. දැන් ඉතින් කිසිම දෙයක් කරන්න විදිහක් නෑ කියලයි දොස්තරත් කිව්වේ.'

'දෙයියනේ... ඒ කියන්නේ ඔයාගේ අම්මා...... ?'

'ඔව්... නෝනා... දැනටමත් මගේ අම්මා බාගෙට මැරිලා ඉවරයි.'

විලියම් කිසිම බයක් සැකක් නැතිව ඒ වගේ බොරුවක් කියද්දී ආගන්තුක කාන්තාව ගේ මුහුණ ශෝකයෙන් බරවුනා. එයා මේ වගේ දෙයක් කිව්වෙත් දරාගන්න බැරි තරම් ශෝකයකින් යුතුවයි.

'එහෙමනම් මට එයාට උදව්වක් කරන්න ලැබෙන්නේ නෑ. ඇත්තමයි. මේ කනගාටුදායක ආරංචිය නම් මට දරාගන්න අමාරුයි. මගේ පපුව වාවන්නේ නෑ. මම තව ටිකක් කලින් මෙහාට ආව නම් මොනව හරි දෙයක් කරන්න තිබුනා. දෙයියනේ... මම පරක්කුවෙලා ආපු හින්දා හැමදෙයක් ම ඉවරයි.'

එහෙම කියන ගමන් ම කාන්තාව ඉක්මන් ගමනින් නිවස ඇතුළට ඇවිදගෙන යන්න වුනා. විලියම් ද ඇය පසුපසින් ඇවිදගෙන ගියේ කිසිම අරමුණක් නැතිවයි. අනික මේ වගේ දෙයක් වෙයි



කියලා මොන්ක්ටන් මහතා වුනත් බලාපොරොත්තු වුනේ නෑ. රූබිනා ස්ට්‍රේන්ජ් මහත්මිය නිවසින් පිටවෙලා යනතෙක් ඔහු තමන්ගේ කාර්යාල කාමරයේ ජනේලය ළඟට වෙලා ඉවසිල්ලක් නැතිව බලාගෙන ඉන්නවා. කොහොම වුනත් රූබිනා මහත්මිය කාමරේට ඇතුල් වෙන බව යාන්තමින් දැකපු ගමන් ම මොන්ක්ටන් මහතා නැවතත් අතුරුදහන් වුනා.

මොන්ක්ටන් මහතා ගේ කාර්යාල කාමරයට ඇතුළු වුන රූබිනා මහත්මිය ශුද්ධ වූ තැනකට ආවාක් මෙන් උනන්දුවෙන් වටපිට බලන්න පටන්ගත්තා. ඒ අතරම ඇය පුදුමය මුසුවුන හඬකින් මෙවැනි දෙයකුත් ඇසුවා.

'පීටර්... ඔයාගේ අම්මා ඔයා ගැන ගොඩාක් දේවල් ලියුවේ මෙතැන ඉඳල ද ?'

'ඔව්... නෝනා. මේක තමයි අම්මගේ කාර්යාල කාමරය.'

'අනේ දෙයියනේ... මට නම් විශ්වාස කරන්නත් අමාරුයි. ඔයාගේ අම්මා මේ වගේ තැනක ඉඳලා මොනතරම් නම් පොත් ලියන්න ඇද්ද ?.'

එහෙම කියපු කාන්තාව තමන් ගේ දිගු, සිහින් නහයෙන් ඉතා වේගයෙන් හුස්ම ගන්න පටන්ගත්තා. කාන්තාව ඉකි බිඳින බව විලියම් ට වැටහුනේ එතකොටයි. කාන්තාව ඉන්පසුව කිව්වේ නම් විලියම් හිතපු නැති විදිහේ දෙයක්.

'දෙයියනේ පීටර්... මේ කාමරේ තියෙන දුම්කොළ ගඳ. ඔයාගේ අම්මා සිගරට් එහෙම බිව්වේ නෑ නේද ?.'

'නෑ... මේ දුම් පයිප්පය එයාගේ.'

'කාගෙද ?.'

කාන්තාව පුදුමයෙන් ඇහුවා. විලියම් ට තමන් කථා

sinhalaebooks.com



කරන්නේ මොකක් ද කියලා එකපාරටම අමතක වුන නිසා ම මෙහෙම කිව්වා.

'ඔහු ගේ...'

තමන් ගේ කට වැරදුනා කියලා විලියම් ට සිහිපත් වුනේ එතකොටයි. ඒත් එක්කම මේ නිවස හිමි මහත්මයා තමන් ට දෙන්නට පොරොන්දු වුන කුඩා බයිසිකලය, සිලිං දහය වගේ තෑගි බෝග හැමදෙයක් ම දෑස් ඉදිරියේ බොඳවෙලා යන හැටි විලියම් හිතෙන් වගේ දැක්කා. ඒත් එක්කම රූබිනා මහත්මිය විලියම් ගේ හිත සනසන්නට වගේ මෙහෙම කිව්වා.

'ඔයාගේ හිත ගොඩාක් කළබල වෙලා කියලා මට හිතෙනවා පීටර්. කිසිම සැකයක් නෑ. ඔයා අම්මා ගැන ගොඩාක් දුක්වෙනවා ඇති. ඔයාගේ අම්මා මට එවපු හැම ලියුමක් ම ලියන්න ඇත්තේ මේ පෑනෙන් වෙන්න ඇති නේද ? මේ තීන්ත උරණ කඩදාසියත් ඔයාගේ අම්මා පාවිච්චි කරපු එකක් ද ?. අනේ පීටර්... මම මේ කඩදාසියෙන් කෑල්ලක් ගන්න ද ?. මට එතකොට හැමදාම ඔයාගේ අම්මව මතක් වෙයි.'

මේ සිදුවීම වෙද්දී මොන්ක්ටන් ග්‍රැහැම් මහතා හිටියේ කාමරයේ මේසය යට හැංගිලයි. එයා ඒ විදිහට හිටියේ හරිම අමුරුවෙන්. මොකද වැඩුන මිනිසෙකු වුන ඔහුට මේ තරම් පුංචි මේසයක් අස්සේ හැංගිලා ඉන්න එක ලේසි පාසු වැඩක් වුනේ නෑ. රූබිනා ස්ට්‍රින්ජ් මහත්මිය නිවසින් පිටවෙලා යනතෙක් මොන්ක්ටන් මහතා ඉවසිල්ලක් නැතිව බලාගෙන හිටියත් එය ඉක්මනින් සිදුවුනේ නෑ.

මොන්ක්ටන් මහතා ට දූන් නම් මේසේ අස්සට වෙලා ඉන්න හරිම අමාරුයි. එයා අපහසුවෙන් එහාට මෙහාට හැරෙද්දී රූබිනා මහත්මිය එයාව දැක්කා. ඒ සමගම ඇය තමන් ගේ දොතොලට ඇඟිල්ලක් තබා සද්ද නොකරන ලෙසට ඉඟිකොට සිහින් හඬින්



මෙහෙම කිව්වා.

'ෂ්.... පීටර්. සද්ද කරන්න එපා. අපි ඉන්න තැන තියෙන මේසය යට කවුද මිනිහෙක් හැංගිලා ඉන්නවා. ඔයාගේ අම්මාගේ දේවල් වලට බාධා කරන්න එන මිනිහා කවුද ?. කළබල වෙන්න එපා. මම එයා එක්ක ගණුදෙනු කරන්නම්.'

එහෙම කියපු රූබිනා මහත්මිය බොහෝම සීරුවෙන් කාමරයෙන් එළියට ගියා. විලියම් ඇය දිහා බලාගෙන හිටියේ කරකියා ගන්න දෙයක් නැති විදිහටයි. ඉන්පසුව ඇය සාලයේ මේසයට එලා තිබුන දිගු මේස රෙද්ද අතට ගත්තා. ඉන්පසුව බිත්තියේ එල්ලා තිබුන පරණ කිනිස්සක් සහ හාන්සි පුටුවේ තිබුන කුෂන් කොට්ටයත් අතට ගත්තා. ඒ අතරම ඇය විලියම් ට සිහින් හඬින් කොඳුරලා මේ විදිහට අවවාද කරන්නත් අමතක කෙරුවේ නෑ.

'පීටර්... හොඳට මතක තියාගන්න. ඔයාගේ අම්මා මරණාසන්නවයි ඉන්නේ. ඒ හින්දා කිසිම සද්දයක් කරන්න නම් එපා. මම හැම දෙයක් ම බලාගන්නම්.'

එනපොට හොඳ නෑ කියලා මේසය යට ඉන්න මොන්ක්ටන් මහතා දැනගත්තා. ඔහු දණහිස් අස්සේ ඔලුව හංගාගෙන තවත් සැඟවෙන්න උත්සාහ ගත්තේ ඒ නිසයි. ඒ වුනත් ඉන්පසුව සිදුවූයේ ඔහු හීනෙකින්වත් හිතපු නැති විදිහේ දෙයක්. ඉක්මනින් ම කාමරයට ආපු රූබිනා මහත්මිය මොන්ක්ටන් මහතා වාඩිවෙලා ඉන්න ඉරියව්වෙන් ම සිටිද්දී දිගු මේස රෙද්දෙන් ඔහුව කිටි කිටියේ වෙලුවා. දූන් මොන්ක්ටන් මහතා ට සෙලවෙන්නවත් විදිහක් නෑ. මේ හැමදෙයක් ම වෙන්න විනාඩි දෙකක් වත් ගියේ නෑ.

මොන්ක්ටන් මහතා හොඳ හැටි වෙලා දුටු රූබිනා මහත්මිය පරණ කිනිස්සත් අතට අරන් කෝපයෙන් මුසපත් වුන හඬකින් කථා කරන්න වුනා.

sinhalaebooks.com



'ඔහොම හිටපන් පල්හොරා. උඹ එක වචනයක් හරි කිව්වොත් මම මේ කිනිස්සෙන් අනිනවා. මේ ගෙදර කාන්තාව මගේ හොඳ යාළුවෙක්. උඹ හදන්නේ එයාගේ වටිනා දේවල් හොරකම් කරන්න නේද ?.'

රැබීනා මහත්මිය කිනිස්සත් දිගු කරගෙන එහෙම කියද්දි මොන්ක්ටන් මහතා ගේ දෑස බියෙන් මුසපත් වෙන හැටි විලියම් දක්කා. මේ කිනිස්සේ තුඩ මොනතරම් තියුණු ද කියලා මොන්ක්ටන් මහතා ට අමුතුවෙන් කියන්න දෙයක් නෑ. කෝපයෙන් මුසපත් වෙලා ඉන්න කාන්තාව එයින් ඇන්නොත් සිද්ධ වෙන්නේ මොකක් ද කියලත් මොන්ක්ටන් මහතා හොඳින් ම දන්නවා. කරකියා ගන්න දෙයක් නැති තැන ඔහු හරිම අසරණ විදිහට විලියම් දිහා බැලුවා. හැබැයි මේ වෙලාවේ විලියම් ට වුනත් කරන්න දෙයක් ඉතිරිවෙලා තිබුනේ නෑ. ඔහු මොන්ක්ටන් මහතා ඉන්න තැනින් ටිකක් ඈතට ඇවිදගෙන ගියේ ඒ නිසයි.

ටික වෙලාවකට පසුව රැබිනා මහතීමය විලියම් දිහාට හැරිලා මෙහෙම කිව්වා.

'සමහර විට මේ හොරා ගැන ඔයාගේ අම්මා දන්නවා ඇති පීටර්. පොඩ්ඩක් ඉන්නකෝ මම ගිහිං දැන්ම ම අහගෙන එන්නම්. කොහෙද එයාගේ කාමරය තියෙන්නේ ?. හරි ඒ ගැන කරදර වෙන්න ඕනෑ නෑ. මම ම ගිහිං හොයාගන්නම්.'

එහෙම කියපු රැබීනා මහත්මිය ඉක්මන් ගමනින් ගේ ඇතුළට ඇවිද යද්දි විලියම් මේසය අස්සේ ඉන්න මොන්ක්ටන් මහතා දිහා උනන්දුවෙන් බැලුවා. මේස රෙද්දෙන් කිටි කිටියේ වෙලී සිටින ඔහු පුදුමාකාර විදිහට බියවෙලා. ඉහින් කනින් දහදිය ගලාගෙන එන හැටිත් විලියම දැක්කා. මොන්ක්ටන් මහතා ගේ දෑස් ද බියෙන් මහත්වෙලා. මේ අතර ඔහු කිසියම් දෙයක් කියන්න උත්සාහ කෙරුවත් මුවෙන් කිසිම වචනයක් පිටවුනේ නෑ.



මොන්ක්ටන් මහතා හිස පාත් කරගෙන කකුල් වල ගැට ගසා තිබෙන බැමි ලිහන්න අසාර්ථක උත්සාහයක් ගනිද්දි රැබීනා මහත්මිය පුදුමයෙන් මහත්වුන දෑස් වලින් යුතුවම ආයේමත් ඔවුන් සිටින තැනට ඇවිදගෙන ආවා.

'පීටර්... ඔයාගේ අම්මා ගේ ඇතුළේ නෑ. එයා කොහෙද ගිහිල්ලා. මම හැම කාමරේකම බැලුවා. ඒ වුනාට කවුරුවත් පෙනෙන්න හිටියේ නෑ.'

රැබීනා මහත්මිය එහෙම කියද්දි ම මොන්ක්ටන් මහතා වියරුවෙන් වගේ බැමි ලිහා ගන්න උත්සාහ කරන්න වුනා. ඔන්න ඔය අතරෙදි තමයි නිවසේ සේවිකාව බියෙන් මෙන් ම කෝපයෙන් බෙරිහන් දෙමින් එතැනට කඩාගෙන පැන්නේ.

'දෙයියනේ... මොකක් ද මේ කරන අපරාදේ ?. මේ අපේ ගෙදර මහත්තයා නේ. ඔයාලා හදන්නේ අපේ මහත්තයාව මරලා දාන්න ද ?'

සේවිකාවගේ කටහඬ ඇහුන ගමන් ම රැබීනා මහත්මිය පුදුමයෙන් මහත් කරගත් දෙනෙත් වලින් විලියම් දිහාට හැරුනා.

'පීටර්...ඔයාගේ තාත්තා ජීවතුන් අතර ඉන්නවා කියලා මම දැනගෙන හිටියේ නැහැනේ.'

එහෙම කියන ගමන් ම ඇය මෙසය යට සිටින මොන්ක්ටන් මහතා දෙසට හැරිලා කෝපයෙන් බෙරිහන් දෙන්නත් අමතක කෙරුවේ නෑ.

'නපුරු මිනිහෝ... කෝ ඔයාගේ බිරිඳ ?. කොහෙද ඔයාගේ බිරිඳ ඉන්නේ කියලා දැන්වත් මට කියනව ද ?.'

'මම කසාද බැඳලා නෑ. ඉතින් මට කොහෙන්ද බිරිඳක් ?.'

මොන්ක්ටන් මහතා කෝපයෙන් බෙරිහන් දෙද්දි රැබීනා

sinhalaebooks.com



මහත්මිය තවත් පැනයක් ඔහුට යොමු කෙරුවා.

'එහෙනම් කවුද පීටර් ගැන ලිපි ලියුවේ ?.'

'ඒවා ලිව්වෙත් මම මයි.'

'එතකොට පීටර් ගේ අම්මා කියලා ලිපිවල තිබුනේ...'

'පීටර් ගේ අම්මා කියලා කෙනෙක් නෑ.'

මොන්ක්ටන් මහතා ගේ වේදනාත්මක කටහඬ ඇහෙනවත් එක්කම මෙතෙක් වෙලාවක් රුබිනා මහත්මිය ගේ මුහුණේ තිබුන කෝපය පහවෙලා ගියා. ඉන්පසුව ඇය කථා කරන්න වුනේ කිසියම් නෝක්කාඩු ස්වරයකින්.

'දෙයියනේ... මට සමාවෙන්න මහත්මයා. මම නොදන ඔයාට ගොඩාක් කරදර කෙරුවා. පව් අහිංසක පීටර්... මට ඔයා ගැනත් දුකයි. ඒ වුනත් පීටර් ගේ අම්මා මට සෑහෙන කාලෙක ඉඳන් ලියුම් එව්වනේ.'

මොන්ක්ටන් මහතා ආයේමත් කෝපයෙන් සහ වේදනාවෙන් බෙරිහන් දුන්නා.

'මම කිව්වනේ... මෙහේ පීටර් ගේ අම්මා කියලා කෙනෙක් නෑ. ඒ වගේම පීටර් කියලා කෙනෙකුත් නෑ. මෙහෙ ඉන්නේ මම විතරයි. මේ හැමදෙයක් ම පටවලා ගෙන ඔයා මට පුදුමාකාර විදිහට වද දුන්නා. මාව මේස රෙද්දකින් බැන්දා. පිහියකින් අනින්න හැදුවා. කරුණාකරලා දැන්වත් මෙතැනින් යන්න කල්පනා කෙරුවොත් නරක ද ?. අනික මේ ළමයා කවුද කියලවත් මම දන්නේ නෑ. එයා අහම්බෙන් මගේ ගෙවත්තට ආපු කෙනෙක්.'

මොන්ක්ටන් මහතා ගේ කථාවට සවන්දීගෙන හිටපු රුබිනා මහත්මිය අසල තිබුන පුටුවක වාඩිවුනා. එයාගේ දෑස් පුදුමයෙන් මහත්වෙලා.



'ඇත්තමයි... ඔයා කියන්නේ මොකක් ද කියලා මට ටිකක්වත් තේරෙන්නේ නෑ මහත්මයා.'

මොන්ක්ටන් මහතා මෙතෙක් දිනක් සඟවාගෙන තිබුන රහස් සියල්ලක් ම රුබිනා මහත්මියට විස්තර කෙරුවා. මේ කථාව ඇහුවට පස්සෙවත් ඇය තමන් ගේ නිවසින් පිටවෙලා යයි කියලා මොන්ක්ටන් මහතා හිතුවත් ඇත්තටම එය සිද්ධ වුනේ නෑ. දිගු සුසුමක් හෙලලා හිත සැහැල්ලු කරගත් රුබිනා මහත්මිය ගොඩාක් හිතවත් විදිහට මේ වගේ උත්තරයක් දුන්නා.

'ඔයා මොනතරම් අපූරු මිනිහෙක් ද කියලා මට දැනුයි තේරෙන්නේ. බයවෙන්න එපා. සත්තකින් ම මම ඔයාගේ රහස වෙන කාටවත් කියන්නේ නෑ. අනික ගැහැණු කෙනෙක්ගේ හිතේ තියෙන මුදු මොලොක් බව තේරුම් අරන් ඒ වගේ ලස්සන ලිපි පෙළක් ලියන්න තරම් ඔයාට තිබුන දක්ෂතාවය ගැන මට හරිම පුදුමයි. ඉතින් අපි හොඳ යාළුවෝ වගේ ආශ්‍රය කෙරුවොත් හොඳයි කියලා ඔයාට හිතෙන්නේ නැද්ද ?. අපි ටිකක් කථා කරමු. ඔක්කොටම ඉස්සර වෙලා මේ කාමරේ ටිකක් අස්පස් කෙරුවොත් හොඳයි කියලා මට හිතෙනවා. ගැහැණු කෙනෙක් සුද්ධ කෙරුවොත් තමයි කාමරයක් හොඳට පිරිසිදු වෙන්නේ. ඊට පස්සේ අපි කථා කරමු. කිසිම සැකයක් නෑ. අපිට ගොඩාක් ලස්සන හිතවත් කමක් පටන්ගන්න පුළුවන් වෙයි.'

රුබිනා මහත්මිය එහෙම කිව්වට පස්සේ මොන්ක්ටන් මහතා විලියම් දිහාට හැරිලා ස්තුතිය පළකරන බැල්මකින් සංග්‍රහ කෙරුවා. ඔහු මෙසේ කිව්වේ ඉන්පසුවයි.

'ළමයා... ඔයා ටිකක් වෙලා ඉන්න... හොඳ ද ?.'

'මට බෑ මහත්මයා... මොකද දැනටමත් පරක්කු වෙලා හින්දා ආපහු යන්න ඕනෑ. ඒ මොනව වුනත් ඔයා මට වුන පොරොන්දු එකක්වත් අමතක කරන්නේ නෑ නේද ?.'

sinhalaebooks.com



'ආ... නෑ.'

මොන්ක්ටන් මහතා සැලෙන හඬකින් කිව්වා. හැබැයි මේ වෙලාවේ නම් එයාගේ හිතේ කිසියම් තිගැස්මක් තියෙනවා කියලා විලියම් ට හිතුනා. විලියම් මෙවැනි දෙයක් කිව්වෙත් ඒ නිසාමයි.

'මම නතර වෙලා ඉන්න නැන්දගේ ගෙදර ගෙවත්ත ඒතරම් ලොකු නෑ. ඒ හින්දා මට නිතරම මෙහේ ඇවිත් සෙල්ලම් කරන්න පුළුවන්. අද හැන්දෑවේ තේ බිව්වට පස්සේ මම ආපහු එන්නම්. ඔයා පොරොන්දු වුන බයිසිකලයයි, සල්ලි ටිකයි ලෑස්ති කරලා තියන්න.'

එහෙම කියපු විලියම් මොන්ක්ටන් මහතා ගේ නිවසින් පිටවෙලා ආවා. අන්න එතකොටම තමයි රූබිනා මහත්මිය ආයේමත් කථා කරන්න වුනේ.

'අපි දූන් කථා කරන්න ලැජ්ජාවෙන්න ඕනෑ නෑ. මගේ යාළුවෝ මට කථා කරන්නේ රූබි කියලා. ඔයත් මට එහෙම කථා කරනව නම් මම කැමැතියි.'

රූබිනා මහත්මිය එහෙම කියද්දී මොන්ක්ටන් මහතා පුදුමයෙන් දෑස් මහත් කරගෙන ඇය දිහා බලාගෙන හිටියා. ඇත්තටම සිද්ධ වුන කිසිම දෙයක් ගැන ඔහුට හිතාගන්නත් අමාරුයි වගේ.

..................................................

විලියම් නැන්දා ගේ ගෙදර ඇවිත් තේ පානය කෙරුවා. ඇත්තටම අද හැන්දෑ වරුවේ විලියම් මොනව ද කෙරුවේ කියලා දැනගන්න විලියම් ගේ අම්මට හිතුනා.

'ඔයා දන්නව ද අම්මා ?. අද මට අපූරු මහත්මයෙක් හම්බ වුනානේ. එයාගේ ගෙවත්තේ ඇති තරම් සෙල්ලම් කරන්න කිව්වා. ඒ විතරක් නෙවෙයි එයා මට බයිසිකලයකුයි, සල්ලිත් දුන්නා.'



විලියම් එහෙම කියද්දී එලන් නැන්දා ඉක්මනින් ම විලියම් දිහාට හැරුනා.

'කොහෙද ඔය කියන මහත්මයා ඉන්නේ ?.'

'මේ පාරේ කෙළවරම තියෙන ගෙයි නැන්දේ.'

'හරි... ඔය කියන ගෙදර මම දන්නවා. ඇත්තටම හරිම ලස්සන ලොකු ගෙවත්තක් තියෙනවා. ඇත්තටම ඔයා හරිම වාසනාවන්තයි විලියම්. ඒ වුනත් මට තේරුම් ගන්න බැරි.....'

එලන් නැන්දා කථාව නතර කරලා ටිකක් කල්පනා කරද්දී විලියම්ට අම්මා ගේ කටහඬ ඇහුනා.

'එයා හොඳ කෙනෙක් වෙන්න ඇති. මොකද සමහර මිනිස්සු අනිත් අයට සලකන්න හරිම කැමැතියි.'

බ්‍රවුන් මහත්මිය එහෙම කියද්දී එලන් නැන්දා පුටුවෙන් නැගිට්ටා.

'පොඩ්ඩක් ඉන්නකෝ... මම ඔයාට කියවන්න හොඳ පොතක් ගෙනැත් දෙන්නා. කිසිම සැකයක් නෑ. ඔයා මේ පොත කියවන්න නම් ගොඩාක් ආසාවෙයි. මේ පොත ලියලා තියෙන්නේ පීටර් කියලා පොඩි ළමයෙක් ගැනයි. පොත ලියලා තියෙන්නේ ළමයාගේ අම්මා. මේක ඇත්තම ඇත්ත කථාවක් කියලයි සඳහන් වෙන්නේ. පොත මොනතරම් ලස්සන ද කියනවා නම් මට කිහිප සැරයක් ම ඇඬුනා. අද හැන්දෑවේ විලියමුත් මේ පොත කියෙව්වා. මේ පීටර් කියන කෙනා ගේ අම්මා සඟරා වලටත් ලිපි කියනවා මම දැකලා තියෙනවා. ඒවත් හරිම ලස්සනයි. ඉන්නකෝ... මම ඔයාට ඒ පොත ගෙනැත් දෙන්නම්.'

එහෙම කියපු එලන් නැන්දා පොත අරන් එන්න ගේ ඇතුළට ගියා. විලියම් ඇය දිහා බලාගෙන හිටියේ හිත යටින් සිනාවෙමින්. සිද්ධ වෙලා තියෙන්නේ මොකක් ද කියලා එයා හොඳින් ම දන්නවා.

sinhalaebooks.com



ඒ හින්දා පිටවෙන්න ආපු හිනාව පිට කරන්නේ නැතිව මූබය ඇතුළෙම තියාගන්න විලියම් උත්සාහ කෙරුවා.

# 4.
# පරිච්ඡේදය

# විලියම් සහ රහස් පරීක්ෂණය

විලියම් ගේ ගමේ තියෙන නාට්‍ය සංගමයේ මෙහෙයවීමෙන් නාට්‍යයක් පෙන්නුවා. විලියම් මේ නාට්‍යය නැරඹුවේ හරිම ආසාවෙන්. ඇත්තටම එයාගේ හිත තදින් ම ඇදිලා යන කථාවක් තමයි නාට්‍යය පුරාම ගලාගෙන ගියේ. හැබැයි රොබට් සහ එතල් ඒ කියන්නේ විලියම් ගේ අයියයි, අක්කයි දෙන්න මහා හයියෙන් හිනාවුනේ ඇයි කියලා නම් විලියම් ට හිතාගන්න අමාරුයි. විලියම් ඒ ගැන වැඩිය කල්පනා කරන්න ගියේ නෑ. එහෙම වුනොත් නාට්‍යය නරඹන්නට අතපසු වෙන හින්දා එයා නිහඬවම වේදිකාව දිහාට අවධානය යොමු කරගත්තා.

දූත් නාට්‍යයේ රඟ දක්වෙන්නේ මිනීමැරුමක් පිළිබඳ

sinhalaebooks.com



ප්‍රවනිකාවක්. විලියම් මේ දිහා බලාගෙන හිටියේ කටත් ඇරගෙනයි. තවත් ටික වෙලාවකින් නිල ඇඳුම් හැඳගත් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් වේදිකාවට ඇවිත් මිනී මැරුම ගැන පරීක්ෂණ පවත්වන්න වුනා. මිනී මැරුම ගැන හෝඩුවාවක් හොයාගන්නට පොලිස් නිලධාරීන් ඉතා සියුම් ව පරීක්ෂණ පවත්වන ආකාරය යි දූන් වේදිකාව මත රඟ දක්වෙන්නේ. හොර කල්ලිය මොනතරම් සූක්ෂම විදිහට අපරාධය සිදු කරලා තියෙනව ද කියනවා නම් පොලීසියට කිසිම හෝඩුවාවක් හොයාගන්න ලැබුනේ නෑ.

ටික වෙලාවකින් මේ මිනී මැරුම ගැන පරීක්ෂණ පවත්වන්නට ඉතා දක්ෂ රහස් පරීක්ෂකයෙක් පැමිණෙනවා. මිනී මැරුම වුන ස්ථානයට පැමිණි රහස් පරීක්ෂකයා හැම තැනම සියුම් ව පරීක්ෂා කරමින් සිටින ආකාරයයි දූන් වේදිකාවේ රඟ දක්වෙන්නේ. මොහොතකින් ඔහු මිනී මැරුම සිදුවූ ස්ථානයේ තිබුන සිගරට් කොටයක් අහුලා ගන්නවා. මේ දෙය කලින් පරීක්ෂණ කළ පොලිස් නිලධාරීන් ට හොයාගන්න පුළුවන් ලැබුනේ නෑ. මිනීමැරුම ගැන හොඳ හෝඩුවාවක් මේ සිගරට් කොටයෙන් ලැබෙන බවයි රහස් පරීක්ෂකයා නරඹන්නන් ට පවසන්නේ.

මේ ආකාරයෙන් දිගින් දිගටම ඇදී යන නාට්‍යය අවසන් වෙන්නේ රහස් පරීක්ෂකයා විසින් මිනීමැරුමේ සැකකරු අත් අඩංගුවට ගැනීමෙන්. ඇත්තටම මිනීමැරුම සිදුකොට තිබෙන්නේ කාන්තාවක් විසින් කියලයි අන්තිමේදී හෙළිදරව් වෙන්නේ.

නාට්‍යය බලලා අවසන් වුනාට පස්සේ විලියම් ආපහු ගෙදර යන්න පිටත් වුනේ හරියට හීනෙන් ඇවිදිනවා වගෙයි. එයාගේ හිත පුරාම තිබෙන්නේ රහස් පරීක්ෂකයා ගේ දක්ෂකම් ගැනයි. ඉතාම පුංචි හෝඩුවාවක් ඔස්සේ පරීක්ෂණ සිදුකොට මිනීමරුවා අල්ලා ගන්නට ඔහු දක්වූ සමත් කම විලියම් ගේ හිත පුරාම සැරි සරනවා.

එදා නින්දට යද්දීත් විලියම් නාට්‍යය ගැනම කල්පනා



කෙරුවා. තමාටත් රහස් පරීක්ෂකයෙක් වෙන්න තියෙනවා නම් මොනරම් හොඳ ද කියලයි ඔහුට සිහිපත් වෙන්නේ. එහෙම වුනා නම් තමන් ගේ සුරතල් බල්ලා ජම්බල් එක්ක ගිහිං අපරාධකාරයින් අල්ලා ගන්නට පුළුවන් නේද කියලත් විලියම් කල්පනා කෙරුවා.

..............................................................................

'මේ දවස්වල හැම තැනම හොරු. ඒ හින්දා හොඳට විමසිල්ලෙන් ඉන්න වෙයි.'

පසුදින උදේ තේ මේසයේදී අම්මා එහෙම කියද්දී විලියම් ඒ කථාව අසාගෙන හිටියේ නොඉවසිල්ලෙන්. තමන් ගේ රහස් පරීක්ෂණයට අම්මා දුන්න හෝඩුවාව හොඳ ආරම්භයක් වෙයි කියලා ඔහුට ඒ වෙලාවේ හිතුනා.

ටික වෙලාවකට පස්සේ විලියම් සුරතල් බල්ලා ජම්බලුත් එක්ක නිවසින් පිටවුනා. එයා පාර දිගේ ඉදිරියට ඇවිදගෙන ගියේ අවට තියෙන ගෙවල් දිහා ත් ගොඩාක් විපරමින් බලන ගමන්මයි. පාර අයිනේ තියෙන විශාල ගෙවල් වල හොරු, අපරාධකාරයෝ වගේ අය ඉන්න පුළුවන් කියන සැකය විලියම් ගේ හිතේ ගොඩාක් තදින් ම කිඳා බැහැලයි තිබුනේ. මේ ගැන හිතමින් ම විලියම් තව තවත් පාර දිගේ ඉදිරියට ඇවිදගෙන ගියා.

මේ විදිහට ටික දුරක් යද්දී දුම්රිය ... පැත්තේ සිට ඇවිදගෙන එන මිනිසෙක් විලියම් ට අහම්බෙන් වගේ හම්බ වුනා. ඔහු අතේ විශාල කළු පැහැති බෑගයක් ද තිබුනා. විශාල බෑගයක්... එය දුටු ගමන් ම සැකයක් විලියම් ගේ හිතේ පැළපදියම් වෙන්න වැඩි වෙලාවක් ගියේ නෑ. එයා උනන්දුවෙන් වගේ මිනිසා දෙස බැලුවේ ඒ නිසයි. හොරෙකුට විශාල බෑගයක් අවශ්‍යයි නේද ?. ඒ වගේ සිතිවිල්ලක් හිතට එද්දී විලියම් ඉක්මනින් ම මිනිසා පසු පසින් ගොස් විපරම් කරන්න තීරණය කෙරුවා. මේ වනවිටත්

sinhalaebooks.com



ජම්බල් උද්දාමයෙන් බෙරිහන් දෙනවා.

මිනිසා ටික දුරක් ඇවිදගෙන යනතෙක් නොඉවසිලිමත් බලාගෙන සිටි විලියම් පඳුරුවලට මුවාවෙමින් සෙමෙන් සෙමෙන් මිනිසා ලුහු බඳින්න පටන්ගත්තා. මේ විදිහට සෑහෙන දුරක් ගියාට පසුව මිනිසා විශාල ගේට්ටුවකින් ඇතුළු වෙලා වත්තක් මැද තියෙන නිවසක් දිහාට යන හැටි ත් විලියම් දැක්කා.

දැන් නම් විලියම් ගේ හිතට දැනෙන්නේ පුදුමාකාර සතුටක්. තමන් ගේ සැකය හරියටම හරි කියලා එයාට හිතෙනවා. එයා ඉක්මනින් ම සාක්කුවට අත දමලා සුදු පාට හුණු කූරක් අරන් ගේට්ටු කනුවේ කතිරයක් සටහන් කෙරුවා. විලියම් අද උදේ පාසැලේ චිත්‍ර පාඩම වෙලාවේදී ගුරුතුමාට හොරෙන් මේ හුණු කූර සාක්කුවේ දමාගත්තෙත් මේ වගේ දේවල් වලට ප්‍රයෝජනවත් වෙයි කියන විශ්වාසයෙන්. ගේට්ටුවේ තියෙන කතිරය කවුරුහරි දැක්කොත් සැක කරයි කියලා හිතුන නිසා විලියම් ළඟ පාත තියෙන ගස් කිහිපයකත් ඒ විදිහෙම කතිර ලකුණු දැම්මා.

..............................................................

එදින රාත්‍රියේ දි තමන් ගේ පරීක්ෂණය ආරම්භ කරන්නයි විලියම් හිතාගෙන හිටියේ. ගෙදර අය නින්දට ගියාට පස්සේ විලියම් හනි හනික රාත්‍රියට අඳින ලෝගුවක් වගේ ගවුම හැඳගත්තා. ඊට උඩින් කබාය දමාගත්තට පස්සේ ඔහු ගේ රහස් පරීක්ෂක ඇඳුම් කට්ටලය සම්පූර්ණයි. ගමනට සූදානම් වුනාට පස්සේ එයා කිසිම සද්දයක් ඇහෙන්නේ නැති විදිහට නිවසේ පහත මාලයට ඇවිත් පසුපස දොරෙන් එළියට ගියා. මේ වනවිට ජම්බලුත් ගමනට සූදානම් වෙලා විලියම් පසුපසින් ඇවිදගෙන එනවා.

තවත් ටික වෙලාවකට පස්සේ විලියම සහ ජම්බල් පාර දිගේ ඉදිරියට ගමන් කරන්න වුනා. දවල් ඇවිත් කතිර සළකුණක් දැමූ ගේට්ටුව හොයාගන්නට විලියම් ට එතරම් අපහසු වුනේ නෑ.



නිවසේ එක් ජනේලයක් විවෘත කොට තිබෙන බවත්, මුළු නිවසම අන්ධකාරයේ ගිලී තිබෙන බවත් විලියම් තමන් ගේ මුල්ම නිරීක්ෂණයේදී දැකබලා ගත්තා. මේ නිවස මොන විදිහේ එකක් ද ?. දැන් විලියම් සූදානම් වෙන්නේ තමන් ගේ නිරීක්ෂණයේ දෙවැනි අදියර ක්‍රියාත්මක කරන්නයි.

විලියම් මුලින් ම කලේ ජම්බල් ව කබාය අස්සේ සඟවාගන්නා එකයි. ඉන්පසුව ඔහු විවෘත වෙලා තිබුන ජනේලයෙන් නිවස තුළට ඇතුළු වුනා. විලියම් ඇතුළු වෙලා තිබුනේ අඳුරු කාමරයකටයි. වාසනාවකට වගේ එහි දොර විවෘත කොට තිබුන නිසා විලියම් බොහෝම සීරුවට කාමරයෙන් එළියට ආවා. දැන් ඔහු ඉදිරියේ තිබෙන්නේ විවෘත කොරිඩෝරයක්. ඒ කොරිඩෝරය පසෙකින් තවත් කාමරයක් තිබුනා. විලියම් නිකමට වගේ ඒ කාමරයේ ජනේලයෙනුත් එබිලා බැලුවා.

අද හවස බෑගයක් අතින් ගත් මිනිසා කෑම මේසයේ වාඩිවෙලා රාත්‍රී ආහාරය ගනිමින් සිටින හැටි විලියම් දැක්කේ එතකොටයි. මේ වෙලාවේ මිනිසා හැඳගෙන සිටින්නේ රතු පැහැති රාත්‍රී කබායක්. මිනිසා සමඟ මුතු වලින් සැදූ ආභරණ පැළැඳගත් කාන්තාවක් ද ආහාර ගනිමින් සිටිනවා. ඒ නිමේශයේදීම විලියම් ගේ හිතට තවත් අදිසි සිතිවිල්ලක් ඇතිවුනා. මේ කාන්තාව පැළැඳ සිටින මුතු ආභරණ මිනිසා පෙර දිනයේදි හොරකම් කළ ඒවා විය හැකි ද ? මිනිසා හවස් වරුවේ දී මුතු ආභරණ සාප්පුවකින් මේ දේවල් හොරකම් කරන්නට ඇත. ඉන්පසුව ඔහු ඒවා සිය බිරිඳට ගෙනැවිත් දෙන්නට ඇත. මේ අවස්ථාවේදී ඇය පැළැඳගෙන සිටින්නේ ඒවා විය යුතුය.

මේ අකාරයේ සිතිවිලි සමඟ ටික වෙලාවක් ඔවුන් දෙස බලා සිටි විලියම් කොරිඩෝරය දිගේ තව ටිකක් ඉදිරියට ඇවිදගෙන ගොසින් තවත් කාමරයක් ගැන විපරම කරන්න වුනා.

sinhalaebooks.com



මේ නිවසේ සිටින්නේ නගරයේ වෙළෙන්දෙක් වන කෑම්බි මහතා කියලා විලියම් දැනගෙන හිටියේ නෑ. කෑම මේසයේ වාඩිවෙලා ඉන්න කෑම්බි මහතා දුක්බර බැල්මක් මුහුණේ රඳවාගෙන සිය බිරිඳ දිහාට හැරිලා දුක්බර හඬකින් මෙහෙම කිව්වා.

'මගේ හිතට දුක හිතෙන දෙයක් ගැන ඔයාට කියන්න තියෙනවා.'

'ඔයා කියන්න හදන්නේ මොකක් ගැනද ජිම ?.'

කෑම්බි මහත්මිය පුදුමයෙන් වගේ එහෙම අහද්දී ඔහු මෙතෙක් වෙලාවක් මුවඟ රැඳුන සුරුට්ටු කොටය පැත්තකට දමලා කථා කරන්න වුනා.

'අද හැන්දෑවේ මම ගෙදර එනකොට පුංචි කොල්ලෙක් හම්බවුනා. එයා මීට ඉස්සර නම් කවදාවත් හම්බ වෙලා නෑ. මිනිහා මම දැකපු ගමන් ම පුදුම විදිහට විපරම් කරන්න පටන්ගත්තා. පස්සෙන් ඇවිල්ලත් විපරම් කෙරුවා. ඒ කොල්ලා එහෙම කෙරුවේ ඇයි කියලයි මම මෙච්චර වෙලාවක් කල්පනා කෙරුවේ. මම කියන දේ ඔයා විශ්වාස කරයිද දන්නේ නෑ. අපි රෑ කෑමට වාඩිවෙන්න සූදානම් වෙනකොටත් ඒ කොල්ලා ගේට්ටුව ළඟ ඉඳන් අපේ ගේ දිහා බලාගෙන හිටියා. ටික වෙලාවකට පස්සේ එයා ගේ ළඟට ඇවිත් ජනේලෙන් අපි දිහා බලාගෙන හිටියා. මම හොඳටම දැක්කා. මේ වෙලාවේ එයා ඇඳගෙන හිටියේ කළු පාට ලෝගුවක්. මම කාමරේට ගිහිං විපරම් කරද්දී ඒ කොල්ලා අතුරුදහන් වුනා. එයා මේ විදිහට විපරම් කරන්නේ ඇයි කියලයි මම මේ කල්පනා කරන්නේ. ඇත්තටම ඒ මොකද කියලා මට හිතාගන්න අමාරුයි. හැබැයි මෙතැන මොකක් හරි අද්භූත දෙයක් සිද්ධ වෙනවා කියලා මට හිතෙනවා.'

කෑම්බි මහතා කථාව හමාර කරද්දී කෑම්බි මහත්මිය ඔහු දිහා බලාගෙන හිටියේ කටත් ඇරගෙනයි. ඉන්පසුව ඇය මසමින්



සිටි මැහුම පැත්තකින් තබමින් ම මෙහෙම කිව්වා.

'ජිම...ඔයා කියන කථාව මට විශ්වාස කරන්න බෑ. කොහොම වුනත් මේ විදිහේ අමුතු දෙයක් ආයේමත් දැක්කොත් ඔයා ඉක්මනින් ම ගිහිං මානසික වෛද්‍යවරයෙක් හම්බ වුනොත් හොඳයි කියලා මට හිතෙනවා.'

'මම ත් එහෙම හිතුවා. දෙයියනේ... ආයේමත් ඒ කොල්ලා දකින්න නොලැබුනොත් මොනතරම් හොඳ ද ?.'

මේ වනවිටත් විලියම් ආපහු නිවසට ගිහිං සුවබර නින්දකට අවතීර්ණ වෙලත් අවසන්. නින්දේදිත් ඔහු දැක්කේ කෑම්බි මහතා සහ මහත්මියයි. ඔවුන් දෙදෙනාටම මාංචු දමා පොලීසියෙන් රැගෙන යන හැටි විලියම් හීනෙනුත් දැක්කා.

..............................................................

පසුදින උදෑසන පුවත්පත බලමින් සිටි විලියම් ගේ තාත්තා ගෙදර අයට දැනුම් දුන්නේ හොරකමක් ගැන පුවතක්.

'ඊයේ වටිනා ආභරණ වගයක් මංකොල්ල කාලා. මේ පත්තරේ ඒ ගැන හැම විස්තරයක් ම තියෙනවා.'

'හා..හා..'

තාත්තා කියූ දේ ඇසූ විගසම විලියම් උනන්දුවෙන් එහෙම හඬක් පිටකෙරුවා. ඒ අතරම බ්‍රවුන් මහත්මිය තමන් අතේ තිබුන ලියුම පැත්තකින් තියලා කථා කරන්න වුනා.

'කෑම්බි මහත්මිය සෙනසුරාදා රෑ කෑමට ඒ අයගේ ගෙදර එන්න කියලා අපිට ආරාධනාවක් කරලා. මේ ලියුම එවලා තියෙන්නෙත් ඒ අය.'

'කවුද අම්මා කෑම්බි කියන්නේ ?.'

sinhalaebooks.com



විලියම් ගේ අක්කා එතල් එහෙම අහද්දී බ්‍රවුන් මහත්මිය දුන්නේ මේ ආකාරයේ පිළිතුරකි.

'ඒ අය අපේ පලාතට අළුතින් ම ආපු අය. ග්‍රීන් ලේන් එකේ අන්තිම ගෙදර තමයි ඉන්නේ.'

'හා...හා..'

විලියම්ගෙන් නැවතත් සමච්චල් හඬක්. එතකොටම විලියම් ගේ අයියා රොබට් කෝපයෙන් මෙහෙම කිව්වා.

'විලියම්... මොකද ඔය විදිහට බෙරිහන් දෙන්නේ ?. පිස්සු හැදිගෙනවත් එනව ද ?.'

'ඒ මොකද කියලා දැනගන්න කැමැති ද රොබට් ?. හැබැයි මම ඔයාට ඒ ගැන කිසිම දෙයක් කියන්නේ නෑ.'

සමච්චල් සහගත හඬකින් එහෙම කියපු විලියම් ඉක්මනින් ම තමන් ගේ කාමරයට ගියා. ඉන්පසුව ජනෙල් පඩියට හිස බරකරගෙන දක්ෂ රහස් පරීක්ෂකයෙක් වගේ කල්පනා කරන්න වුනා. ඉතාම කුඩා හෝඩුවාවක් ඔස්සේ ගොසින් හොරු අල්ලා ගන්නේ කොහොමද කියලයි ඔහු මේ වෙලාවේ කල්පනා කරන්නේ.

එදින හැන්දෑවේ කෑම්බ් මහතා නිවසට ආවේ ගොඩාක් දුක්බර බැල්මක් ද මුහුණේ රඳවාගෙනයි. ගෙට ගොඩවුනා ගමන් ම එයා කෑම්බ් මහත්මියට මෙහෙම කිව්වා.

'අද මම මානසික වෛද්‍යවරයෙක් ව හම්බ වෙන්න ගියා. මම දකපු කොල්ලා ගැන දොස්තරට හැමදෙයක් ම කිව්වා. ඔයා දන්නවද ?. දොස්තර මගෙන් පැයක් තිස්සෙ එක එක විදිහේ ප්‍රශ්න ඇහුවා. මගේ ජීවිතයේ පහුගිය දේවල්. එතකොට මේ කොල්ලා හින්දා මම තිගැස්සුනා ද වගේ දේවල් තමයි වැඩියම ඇහුවේ. මේ කොල්ලා ගිය නොවැම්බර් මාසෙදිත් හම්බ වුනා කියලා මට මතක්



වුනේ ඔන්න එතකොට තමයි. මේ වගේ මානසික විකාර සමහර වෙලාවට ඇතිවෙනවා කියලත් දොස්තර කිව්වා. මම ආපහු එනකොට අපේ ආගතා නැන්දවත් බලන්න ගියා. එයානම් කිව්වේ මේක නපුරු ලකුණක් කියලයි. ඒ හින්දා ආගතා නැන්දා මාව මානසික පරීක්ෂණ ආයතනයට එක්ක යන්නත් ලෑස්තිවුනා. ඒ වුනත් අද අපිට රාත්‍රී සාදයක් තියෙනවා නේ. අන්න ඒක ඉවර වුනාට පස්සේ ඒ ගමන යන්නයි මම හිතාගෙන ඉන්නේ.'

කෑම්බ් මහතා ගේ දිගු කථාබහ අසාගෙන සිටි කෑම්බ් මහත්මිය පුදුමයෙන් දෑස් මහත් කරගෙනම කථා කරන්න වුනා.

'දෙයියනේ ජිම්... මේකනම් පුදුම විදිහේ කථාවක් කියලයි මට හිතෙන්නේ.'

..........................................................

මේ අතර විලියම් තමන් ගේ රහස් පරීක්ෂණය ගැන දිගින් දිගටම කල්පනා කරමින්නුයි හිටියේ. ගොඩාක් වෙලාවක් කල්පනා කළාට පසුව එයා තමන් ගේ පරීක්ෂණ වලට කිසිම විදිහක සහායකයෙක් හවුල් කරගන්නේ නෑ කියලා තීරණය කෙරුවා. විලියම් බැලූ නාට්‍යයේ හිටපු රහස් පරීක්ෂකයා ට නම් සහායකයෙක් හිටියා. එයා තමයි සැකකරුවන් ගෙන් ප්‍රශ්න අසමින් සටහන් පොතේ ලියා ගත්තේ. හැබැයි තමන් ගේ පරීක්ෂණවලට හවුල් වෙන්න පුළුවන් සහායකයෙක් ගැන විලියම් ට මතක් වුනේ නෑ. ඒ හින්දා එයා තනියම මේ රහස් පරීක්ෂණය දිගටම කරගෙන යන්නයි කල්පනා කෙරුවේ.

අද හවස කෑම්බ් මහතා ගේ නිවසේ පැවැත්වෙන රාත්‍රී සාදයට විලියම් ද සහභාගි වෙන්න තීරණය කෙරුවා. ඉන්පසුව කාටත් හොරෙන් නිවස ඇතුළට ගොසින් සැඟවෙන්නටත්, සාදය පටන්ගත් විගසම සඟවා ඇති වටිනා ආභරණ සොයාගන්නටත්

sinhalaebooks.com



විලියම් සැළසුමක් සකස් කෙරුවා. (කෘඹ්බි මහතා හොරෙක් යන නිගමනය මත පදනම් වෙලා තමයි විලියම් මේ හැමදෙයක් ම කරන්නෙ) හොර බඩුත් සමග හොරාත් අල්ලා පොලිසියට දුන්නා ම තමන් ට පුදුමාකාර විදිහේ ගෞරවයක් ලැබෙනවා කියලත් විලියම් සිහින මවනවා. සමහර විට මහ රැජිනගෙන් ගෞරව නාමයක් පවා ලැබෙන්න පුළුවන් කියලත් විලියම් ඒ වෙලාවේ හිතුවා.

විලියම් හනි හනික තමන් ගේ කාමරයට වැදිලා ලෝගුවක් වගේ තියෙන එයාගේ කළු පාට නිදන ඇඳුම හැඳගත්තා. ඉන්පසුව නාට්‍යයේ දුටු රහස් පරීක්ෂකයා මුවේ තබාගෙන සිටි දුම් පයිප්පය මෙන් පෙනෙන්නට මහත පැන්සලක් කටේ තබාගත්තා. ඇත්තටම මීට ටික දවසකට ඉස්සර වෙලා උයන්පල්ලා ගේ ඇත්තම ඇත්ත දුම් පයිප්පය කටේ තබා උරන්නට පුරුදුවුන නිසා දුම් පයිප්පයක් හරියට උරන්නේ කොහොමද කියලා විලියම් දන්නවා.

දැන් විලියම් රහස් පරීක්ෂණයට සූදානම්. හැබැයි ගෙදර අතින් අය සාදයට යන්නට පෙර ඔහු කෘඹ්බි මහතා ගේ නිවසට යා යුතුයි. කාටත් හොරා විලියම් නිවසින් පිටවුනේ ඒ නිසයි. ඔහු පාර දිගේ ඉක්මන් ගමනින් ඇවිදගෙන ගොස් කෘඹ්බි මහතා ගේ නිවස අසලට ළඟාවුනා. මේ වනවිටත් සාදයට සියල්ල සූදානම්. ඒ නිසා නිවස පුරාම විදුලි බුබුලු දමා තිබෙන හැටිත් විලියම් ට පෙනෙනවා. ඒ නිසා මෙවර ඔහු නිවසට ඇතුළු වෙන්න තෝරාගත්තේ ගබඩා කාමරයේ තිබෙන ජනේලයයි.

විලියම් බොහෝම සීරුවට ගබඩා කාමරයේ ජනේලයෙන් ඇතුළට රිංගුවා. සාදයට සූදානම් කළ රසවත් කෑම බීම වලින් ගබඩාව පිරිලා ඉතිරිලා ගිහිං. මේ දේවල් දැක්කට පස්සේ විලියම් ට තමන් ගේ රහස් පරීක්ෂණයත් මොහොතකට අමතක වුනා වගෙයි. එයා ඉක්මනින් ම රාස්බෙරි ක්‍රීම් බඳුනක් හිස් කෙරුවේ ඒ නිසයි. තවත් විනාඩි ගණනකට පස්සේ විලියම් ආයේමත් තමන් ගේ



පරීක්ෂණය ආරම්භ කෙරුවා. එයා කිසිම සද්දයක් නොමැතිව පඩිපෙළ දිගේ උඩු මහලට ගොඩවෙද්දී හිතපු නැති විදිහට නිවසේ හිමිකරුවා වන කෘඹ්බි මහතා ඔහු ඉදිරියටම පැමිණියා. විලියම් ගේ මුහුණ දිහා ටික වෙලාවක් බලාගෙන හිටපු කෘඹ්බි මහතා පුදුමාකාර වේගයකින් ආපසු දුවගොස් කෘඹ්බි මහත්මියගේ කාමරයට කඩා පැන්නා.

'මාරි... මම අර කියපු කොල්ලා ආයේ පාරක් දැක්කා.'

කෘඹ්බි මහතා බියෙන් වෙවුලමින් එහෙම කියද්දී කෘඹ්බි මහත්මිය පුදුමයෙන් ඔහු දිහාට හැරුනා.

'මොකක් ගැනද ඔයා කියන්නේ ?.'

'අර මගේ හිතේ නිතරම හොල්මන් කරන පුංචි කොල්ලා. අන්න එයා. දැන් දිග ලෝගුවක් වගේ ඇඳුමකුත් ඇඳගෙන කොරිඩෝරය දිගේ මම ඉස්සරහට ඇවිදගෙන ආවා. වෙනදා වගේම නපුරු බැල්මකුයි එයාගේ මුහුණේ තිබුනේ. ඇත්තමයි... එයා කවුද කියලා මට තවම හිතාගන්න බෑ.'

එහෙම කියන ගමන් ම කෘඹ්බි මහතා නළලේ නැගී තිබුන දහදිය බිඳු පිස දමාගත්තා. ඒ අතරම ඔහු මෙවැනි දෙයක් කියන්නත් අමතක කෙරුවේ නෑ.

'කිසිම සැකයක් නෑ. මේ කොල්ලා නම් අවතාරයක් ම තමයි. අද අපේ ගෙදර රසවත් කෑම ජාති එහෙමත් තියෙනවා නේ. ඉතින් මේ අවතාර කොල්ලටත් අපේ ගෙදර එන්න හිතෙන්න ඇති. කෝකටත් මම ගිහිං ඇඟ පත හෝදාගෙන පිරිසිදු වෙලා එන්නම්. මොකද අපිරිසිදුවට ඉන්නකොටත් අවතාරවල බැල්ම වැටෙනවා කියලා මම අහලා තියෙනවා.'

'මමත් සාදයට සූදානම් වෙන්න යනවා. ඔයාට මේ සිද්ධිය ගැන තව දුරටත් හිතන්න ඕනෑ නම් සාදයෙන් පස්සේ හිතන්න

sinhalaebooks.com



පටන්ගන්න.'

කෑම්බ් මහත්මිය එහෙම කිව්වේ අවවාදයක් විදිහටයි. කෑම්බ් මහතා ටික වෙලාවක් කල්පනා කරමින් සිට වෙවුලන හඬකින් මෙහෙම කිව්වා.

'හොඳයි... ඒ වුනත් මම දූන් ඒ අවතාරය දැක්කනේ. මම කොහොමද ඒක මේ තරම් ඉක්මනට අමතක කරන්නේ ?.'

'මම දන්නේ නෑ. ඒ වුනත් අවතාරය නිතරම ඔයා පස්සෙන් විතරක් පන්නන්නේ ඇයි කියලයි මම මේ කල්පනා කරන්නේ.'

එහෙම කිව්වේ කෑම්බ් මහත්මියයි. කොහොම වුනත් මේ වෙනකොටත් නිවසට රිංගා ගත් අවතාරය ඇඳක් අස්සේ හැංගිලා ඉන්නවා කියලා කවුරුවත් දූනගෙන හිටියේ නෑ ?. විලියම් දූන් බලා සිටින්නේ ඉක්මනින් ම සාදය ආරම්භ වෙනතුරුයි. මේ වනවිටත් සාදයට අමුත්තන් එකා දෙන්නා බැගින් පැමිණෙන හඬ නිවසේ පහත මාලය දෙසින් ඇසෙනවා.

'ඔයාලා ආපු එක ගැන අපිට හරිම සතුටුයි.'

කෑම්බ් මහතා සහ මහත්මිය අමුත්තන් පිළිගත්තේ ඒ වගේ හෘදයාංගම වචන වලින් සංග්‍රහ කරමින්. මේ හැම දෙයක් ම උඩු මහලේ හැංගිලා ඉන්න විලියම් ට ඇහෙනවා. එයා සමච්චල් සිනාවක් මුවට නංවාගෙන තමන්ට ම මෙසේ කියාගත්තා.

'තව ටික වෙලාවක් ඉවසන්නකෝ. ඊට පස්සේ වෙන්නේ මොකක් ද කියලා හැමෝටම බලාගන්න පුළුවන් වෙයි.'

දූන් පහත මාලයේ සාදය ජයටම ආරම්භ වෙලා. විලියම් සෙමෙන් සෙමෙන් සැඟවිලා හිටපු තැනින් එළියට ඇවිත් වටපිට විපරම් කරන්න වුනා. විලියම් මුලින් ම සෝදිසි කළේ කෑම්බ් මහතා ගේ අත් ලේන්සු ආදියයි. මෙයින් කිසියම් හෝඩුවාවක්



හොයාගන්නයි විලියම් කල්පනා කරන්නේ. ඒ වුනත් එයා ගේ උත්සාහය සාර්ථක වුනේ නෑ. මොන දේ වුනත් එයා පරීක්ෂණය අතරමඟ නතර කරන්නත් කැමැති වුනේ නෑ. ඒ හින්දා විලියම් අසල තිබුන තවත් දොරක් විවෘත කරගෙන නිවසේ ඊළඟ කාමරයට ඇතුළු වුනා. එය කෑම්බ් මහතා ගේ නිදන කාමරයයි. විලියම් මුලින් ම කළේ පසෙක තිබුන ලොකු අල්මාරිය විවෘත කර විපරම් කරන එකයි. අල්මාරියේ පැත්තක විශාල හම් බෑගයක් තබා තිබුනා. විලියම් ගේ වාසනාවට වගේ බෑගයට අගුළු දමා තිබුනෙත් නෑ. ඒ හින්දා විලියම් ඉක්මනින් ම බෑගය විවෘත කෙරුවා. කෑම්බ් මහතා විසින් සොරාගන්නා ලද රත්තරන්, මුතු සහ මැණික් ආදිය මේ බෑගයේ තිබෙනවා කියලයි විලියම් හිතන්නේ. විලියම් ගේ සැකය සනාථ වෙමින් එම බෑගයේ ස්වර්ණාභරණ මහා විශාල තොගයක් ම තිබුනා. විලියම් ඉක්මනින් ම ඒවා තමන් ගේ කබා සාක්කුවට ඔබාගත්තා. ඒ විතරක් නෙවෙයි. කාමරයේ තිබුන රිදී ආභරණ සහ මල් පෝච්චි ආදියත්, තමන් ගේ හැම සාක්කුවකටම ඔබා ගත්තා. මේ හැම දෙයක්ම හොර බඩු බවයි විලියම් හිතන්නේ. දූන් ඔහු සූදානම් වෙන්නේ මේ දේවල් හොරකම් කළ කෑම්බ් මහතා ව අත් අඩංගුවට ගන්නයි. හැබැයි ඔහු ව අල්ලා බැඳ ගන්නට මාංචු යුවලක් නම් ය ගෙන එන්නට විලියම් ට අමතක වුනා.

........................................................................

මේ වනවිටත් පහත මාලයේ තිබෙන සාදය ගොඩාක් සරුවට පැවැත්වෙනවා. මේ දවස්වල පලාතේ සිද්ධ වෙන හොරකම් ගැනයි වැඩි දෙනෙක් කථා කරමින් හිටියේ.

'ඒ හොරු ගෙවල් වලට පැනලා වැඩියෙන් ම අරන් ගිහිං තියෙන්නේ ආභරණ ලු. මම ඒ ගැන පත්තරේ තියෙනවා දැක්කා.'

බ්‍රවුන් මහත්මිය එහෙම කියද්දී ඇය අසලම සිටි කෑම්බ් මහත්මියගේ මුහුණ සුදුමැලි වුනා. ඇය ඉක්මනින් ම කෑම්බ් මහතා

sinhalaebooks.com



දිහාට හැරුනේ විදුලියක් වගේ.

'දෙයියනේ ජීම්...මගේ රත්තරන් බඩු දමලා තියෙන පෙට්ටිය ලොක් කරන්න අමතක වුනා. ඒ පෙට්ටිය මගේ අල්මාරියෙයි තියෙන්නේ.'

කෘම්බි මහතා ඉක්මනින් ම නැගිට්ටේ මේ වගේ දෙයක් කියමින්.

'ඔයා කලබල වෙන්න එපා. මම දැන්ම ම ගිහිං බලලා එන්නම්කෝ.'

කෘම්බි මහතා ඉක්මනින් ම උඩු මහලේ තියෙන කාමරය ට යන්න තරප්පු පෙළ ළඟට ගියා. හැබැයි තරප්පු පේළිය පටන්ගන්න තැනදීම ඔහුට විලියම් ව හම්බ වුනා. මේ වෙනකොටත් විලියම් ගේ සාක්කු හැම එකක් ම රත්තරන්, රිදී ආභරණ වලින් පිරිලයි තිබුනේ.

විලියම් ව දැකපු ගමන් ම කෘම්බි මහතා ගේ දෙතොල සුදුපාට වුනා. ඔහු සාදය තියෙන තැනට දුවගෙන ගියේ ඉත්පසුවයි. කෘම්බි මහතා ඉක්මනින් ම බිරිඳ සිටින තැනට ගොසින් වෙවුලන හඬකින් මෙහෙම කිව්වා.

'අනේ... මට නම් උඩ කාමරේට යන්න කියන්න එපා. අර අවතාර කොල්ලා එතැන ඉන්නවා.'

කෘම්බි මහතා ගේ කථාව අසාගෙන සිටි පිරිස අතරින් මතුවුනේ සිහින් විලාපයක් වැනි හඬක්.

'දෙයියනේ... ඔයාලගේ ගෙදර හොල්මන් තියෙනව ද ?.'

සාදයට ඇවිත් හිටපු සමහර අය එහෙම අහද්දී කෘම්බි මහතා බියෙන් වෙවුලමින් උත්තර දෙන්න ඉදිරිපත් වුනා.

'නෑ.. අපේ ගෙදර හොල්මන් තියෙනවා කියලා හිතන්න



අමාරුයි. ඒ වුනත් මේ ළඟ දී ඉඳන් මොකක් දෝ අද්භූත දෙයක් සිද්ධ වෙනවා.'

හැමෝම මේ කථාව අසාගෙන හිටියේ පුදුමයෙන් දැස් මහත් කරගෙනයි. ඒ අතර කෘම්බි මහතා සැලෙන හඬකින් තමන් ගේ කථාව දිගටම කරගෙන ගියා.

'මේ අද්භූත හොල්මන පුංචි කොළු ගැටයෙක්. පුදුමේ කියන්නේ මට මේ කොල්ලව හැමතැනම පෙනෙනවානේ. පාරේදි, ගෙදරදී වගේ ඕනෑම තැනකදී ඒ කොල්ලා හරිම අමුතු විදිහට මම දිහා බලාගෙන ඉන්නවා. එයාගේ බැල්ම මොන වගේද කියලා මට විස්තර කරන්න නම් අමාරුයි. හැබැයි ඒ කොල්ලට තියෙන්නේ හිතවත් විදිහට බලන බැල්මක් නෙවෙයි. මේ කරදරේ ඉවසන්නම බැරි තැන මම මනෝ වෛද්‍යවරයෙක් හම්බ වෙන්නත් ගියා.'

පිරිස අතරේ බොහෝම සෙමින් පටන්ගත් කථා බහ දැන් මදක් විශාල ඝෝෂාවක් බවට පත්වෙලා.

'ඔයා කියන හොල්මන දැනුත් මේ ගේ ඇතුලේ ඉන්නව ද?.'

'ඔව්... හැබැයි වෙන අයට ඒ හොල්මන පෙනෙයි කියලා මම හිතන්නේ නෑ.'

'කොයි එකටත් අපි ගිහිං හොල්මන ගැන බලමු කෝ.'

'හොඳයි... ඔයාලා කියනවා නම් අපි ගිහිං බලමු. කෝකටත් පරිස්සම් වෙන්න ඕනෑ. මොකද අද්භූත බලවේගවලට හරිම නපුරු දේවල් කරන්න පුළුවන් කියලා මම අහලා තියෙනවා.

මේ කථාබහෙන් පසුව නිර්භීත මිනිසුන් කිහිප දෙනෙක් හොල්මන සිටින කාමරය කරා සෙමෙන් සෙමෙන් ඇවිදගෙන ගියා. තවත් ටික වෙලාවකින් මහා හයියෙන් තර්ක කරන හඬක් එදෙසින් ඇසෙන්නට වුනා. මේ කටහඬ මොනතරම් හුරු පුරුදු ද

sinhalaebooks.com



කියනවා නම් බ්‍රවුන් මහතා සහ මහත්මියගේ සිරුරු පුරාම කිසියම් අමුතු හිරිවැටීමක් ගලාගෙන යන්න වුනා.

'ඔයාලා කවුරුවත් මාව අල්ලන්න එපා. කරුණාකරලා ඔයාලගේ වැඩක් බලාගෙන පැත්තට වෙලා ඉන්න. මම රහස් පරික්ෂකයෙක්. හැබැයි අද මට මාංචු ජෝඩුව ගෙනෙන්න බැරිවුනා. ඔයාලා දන්නව ද ?. මෙ තියෙන ආභරණ ඔක්කොම හොරකම් කරපුවා. ඒ හින්දා මගේ රාජකාරියට බාධා කරන්න එපා. මම දැන්ම ම පොලීසියට ටෙලිෆෝන් කරනවා. මේ කෘම්බි කියන්නේ හොරෙක් කියලා එතකොට ඔප්පු වෙයි. මෙයාට හොර කල්ලියක් තියෙනවා. මම කියන්නේ බොරු කියලා හිතෙනවා නම් එයාගේ ලේන්සුව බලන්න. මේකේ තියෙන්නේ හොර කල්ලියක සළකුණක් කියලා ඔයාලට අඳුන ගන්න පුළුවන් ද ?.'

මේ කථාබහ අතරින් ම මිනිසුන් විසින් විලියම් ව කෑම කාමරය තියෙන තැනට ඇදගෙන ආවා. විලියම් ව දකිනවත් එක්කම කෘම්බි මහතා බියන් වෙවුලමින් දෑත් වලින් මුහුණ වසාගත්තා. ඒ අතර විලියම් ව අල්ලාගෙන සිටි තරුණ මිනිසෙක් කිව්වේ මේ වගේ දෙයක්.

'බයවෙන්න එපා. මේ ඉන්නේ හොරෙක්. මේ හොරාගේ සාක්කු හැම එකක් ම හොරකම් කරපු බඩු වලින් පිරිලා.'

'පිස්සු කථා කියන්න නැතිව මට යන්න දෙනවලා.'

විලියම් නොඉවසිලිමත් විදිහට බෙරිහන් දෙනකොට ම කෘම්බි මහත්මියගේ වේදනාත්මක හඬත් පැතිරුනා.

'දෙයියනේ... මගේ ආභරණ ටික.'

බ්‍රවුන් මහත්මිය ගේ දෑස් සහ විලියම් ගේ දෑස් එකිනෙකට හමුවුනේ ඔන්න ඔය වෙලාවෙදියි. තමන් ගේ පුතා කරන්න හදන



දේ ගැන කල්පනා කරද්දී ඇතිවුන හදිසි කම්පනය හින්දම බ්‍රවුන් මහත්මිය එකා පාරටම කලන්තේ දාලා වැටුනා. ඊට පස්සේ සෑහෙන වෙලාවක් යනකම් බ්‍රවුන් මහත්මිය ට පියවි සිහිය නම් ලැබුනේ නෑ.

කෘම්බි මහතා හොරෙක් කියලමයි විලියම් දිගින් දිගටම තර්ක කරමින් කිව්වේ. මාංචු යුවලක් ගෙනැවිත් දමා ඔහුව පොලිසියට රැගෙන යන්නට උදව් කරන්න කියලත් එයා සාදයට ඇවිත් හිටපු අයට කිව්වා.

'ඔයාලා මම කියන දේ පිළිගන්නේ නැද්ද ?. මෙ ආභරණ ඒ අයගේ කියලා කියනවා. හැබැයි කොහොමද ඔප්පු කරන්නේ ?. මම කෘම්බි මහත්මයා ගැන දවස් කිහිපයක් ම ඇහැගහගෙන හිටියේ. එක දවසක් එයා ලොකු බෑග් එකකුත් අරන් එනවා මම දැක්කා. අන්න ඒ බෑග් එකේ තමයි හොර බඩු තියෙන්න ඇත්තේ.'

විලියම් කියන දේ බොරු කියලා ඔප්පු කරන්න වගේම තමන් ගේ නිවරැදි කම ගැන අනිත් අයට ඒත්තු ගන්වන්නට කෘම්බි මහතාට පුදුමාකාර විදිහට මහන්සි වෙන්න සිද්ධ වුනා. සෑහෙන වෙලාවකට පසුව විලියම් ගේ රහස් පරික්ෂක රඟපෑම අවසන් වුනා. විලියම් නිසා ඇතිවුන හිත් රිදීම බ්‍රවුන් මහතා ගේ හිතෙන් නම් ඒතරම් ලේසියෙන් මැකිලා ගියේ නෑ.

මේ අවාසනාවන්ත සිදුවීම හින්දා බ්‍රවුන් පවුලේ අය රාත්‍රී සාදයත් අතර මඟ නතර කරලා ගෙදර ආවා. විලියම් කරපු දේ නිසා පුදුමාකාර විදිහට බැනුම් අහන්නත් එයාට සිද්ධ වුනා. හැබැයි තමන් කරපු දේ සාර්ථක වුනා නේද කියලා හිතෙද්දි නම් විලියම් ට හරිම සතුටුයි. කොහොම වුනත් මේ සිදුවීමත් එක්කම විලියම් ගේ රහස් පරික්ෂක වැඩ පිළිවෙලත් අවසන් වුනා.

sinhalaebooks.com

# 5.
# පරිච්ඡේදය

## විලියම් සහ සර්කස් සංදර්ශනය

ඔන්න එක දවසක් විලියම් ගේ ගමේ කෙළවර තියෙන විශාල පිට්ටනියට සර්කස් කණ්ඩායමක් ආවා. පිට්ටනියේ මැද හරියට වෙන්න විශාල කූඩාරමක් සකස් කරන හැටිත් විලියම් දැක්කා. ඇත්තටම මේ වගේ අමුතු දෙයක් කොතැනක හරි සිද්‍ධවෙනවා නම් එතැනට ගොසින් හිතේ හැටියට විපරම් කරන එක විලියම් ගේ පුරුද්දක්. ඒ හින්දා සර්කස් කූඩාරම සකස් කරන තැනටත් විලියම් කාන්දමක් වගේ ඇදිලා ගියා.

පිට්ටනියේ පැත්තකට වෙලා විලියම් සර්කස් කණ්ඩායම දැවැන්ත කූඩාරම ඉදිකරන හැටි බලාගෙන හිටියේ හරිම ආසාවෙන්. ඒ අතරම එයාගේ විමසිලිමත් දෑස් පිට්ටනිය වටේටම ගමන් කරනවා. සර්කස් සංදර්ශනය ආරම්භ වුනාම ඇවිත් නොවරදවාම බලන්න ඕනෑ කියලා විලියම් දැනටමත් තීරණය කරගෙනයි ඉන්නේ. සිංහයින්



කොටියන්, අශ්වයින් සහ බල්ලන් ගේ දස්කම්. රත්තරන් පාට හිසකෙස් තියෙන, කොට ගවුම හැදගෙන විශ්මිත විදිහට දස්කම් පෙන්වන ගැහැණු ළමයින් ගේ හැකියාවන් වගේම නහයේ රතුපාට බෝලයක් අලවාගෙන නරඹන්නන් සිනා සයුරේ ගිල්වන විහිළු කාරයින් දැකගන්නත් විලියම් බලාගෙන ඉන්නේ ඉවසිල්ලක් නැතිව. අවුරුදු එකොළහක් වන විලියම් ගේ ජීවිත කාලේ පුරාවටම එයා සර්කස් සංදර්ශනයක් දකින මුල්ම අවස්ථාවයි මේ උදාවෙන්නට යන්නේ.

සර්කස් කණ්ඩායම සිටින තැනට මදක් එහායින් තිබෙන කූඩුවක සිංහයින් සහ කොටියන් ගාල් කොට තිබෙනවා. ඒ වගේම විශාල ලොරියක් උඩ අලියෙක් සහ ඔටුවන් දෙදෙනෙකුත් සිටින හැටි විලියම් දැක්කා. වෑන් රථයක තිබෙන පුංචි කූඩුවක කොළ පාට ඇඳුම් අන්දවා සිටින වඳුරන් කිහිප දෙනෙක් සිටින හැටිත් විලියම් දැක්කා.

'ෂා... නියමයි නේ.'

මේ සිදුවීම් දිහා බලාගෙන ඉන්න අතරේම විලියම් ගේ මුවෙන් ඒ ආකාරයේ සතුටුදායක වචන කිහිපයකුත් පිටවුනේ ඉබේටම වගෙයි.

මේ දේවල් විතරක් නෙවෙයි. පිට්ටනියේ මදක් ඈතට වෙන්නට වසා දමූ වෑන් රථ කිහිපයක් තියෙන හැටිත් විලියම් ට පෙනෙනවා. මේ වෑන් රථ විවෘත කරලා තිබුනා නම් මොනතරම් අපූරුද කියලා විලියම් ට හිතුනේ අන්න ඒ වෙලාවේදියි. එහෙම වුනා නම් ඒ රථවල තිබෙන්නේ මොනව ද කියලත් දැකබලා ගන්න තිබුනා නේද කියලා විලියම් ට හිතෙනවා. සමහර විට මේ වාහන වල සිටින්නේ සර්කස් සංදර්ශනයට සහභාගි වෙන පිනුම් කාරියන් සහ නරඹන්නන් සිනා ගන්වන විහිළු කාරයින් වෙන්නට ඇත. විලියම් මේ අයගෙන් වැඩියෙන් ම කැමැති වුනේ නිමක් නැති

sinhalaebooks.com



විදිහට විහිළු කරමින් නරඹන්නන් කුල්මත් කරන විහිළු කාරයින් ටයි. තාත්තා ත් සර්කස් කණ්ඩායමක විහිළු කාරයෙක් වුනා නම් මොනතරම් අපූරු ද කියලත් විලියම් ට හිතුනා. එහෙම වුනා නම් ගෙදරදිත් ඇති තරම් හිනාවෙන්න තිබුනා නේද කියලයි විලියම් ට කල්පනා වුනේ.

තවත් ගොඩාක් වෙලාවක් සර්කස් කණ්ඩායම දිහා බලාගෙන හිටපු විලියම් ඉන්පසුව සෙමෙන් සෙමෙන් නිවස බලා ඇවිදගෙන යන්න වුනා. එයා ගෙදර එනකොටත් ගොඩාක් රෑ වෙලා. ඒ හින්දා විලියම් ඉක්මනින් ම රාත්‍රී ආහාරය අරන් කෙලින් ම තමන් ගේ කාමරේට රිංගා ගත්තා. එදා රෑ හීනෙනුත් විලියම් දැක්කේ සර්කස් කණ්ඩායමයි. සිංහයින්, කොටියන්, අශ්වයින්, විහිළු කාරයින් පිරී තිබෙන අපූරු සර්කස් සංදර්ශනයක් එයා හීනෙනුත් රස වින්දා.

'ඔයාලා දන්නව ද ?. ගම්මානය කෙළවර තියෙන පිට්ටනියට සර්කස් කණ්ඩායමක් ඇවිත්.'

පහුවදා උදේ තේ මේසයේදී විලියම් තමන් දුටු අපූරු ආරංචිය ගැන අනිත් අයට දැනුම් දුන්නා.

'විලියම්... කටේ කෑම පුරවාගෙන කථා කරන්න එපා. ඒක හොඳ පුරුද්දක් නෙවෙයි.'

තාත්තා එහෙම කියද්දී විලියම් එයා දිහා බලාගෙන හිටියේ කිසිම හැඟීමක් නැති විදිහට. තාත්තා විහිළු කාරයෙක් වුවා නම්. මොනතරම් හොඳ ද කියන සිතිවිල්ල නම් ඒ වෙලාවේ විලියම් ගේ හිතෙන් පලා ගියා. මොකද විහිළු කාරයින් කිසිම දවසක මේ ආකාරයේ නපුරු කථා කියන්නේ නෑ කියලා විලියම් දන්නවා. හැබැයි සර්කස් කණ්ඩායමක් ඇවිත් කියන අපූරු ආංරචිය ගෙදර අයට කොහොම හරි දැනුම් දෙනතෙක් විලියම් ට ඉවසිල්ලක් නෑ. එයා තවත් සැරයක් ඒ ගැන කිව්වේ ඒ නිසයි. ඒ සැරේ නම් අම්මා



විලියම් ගේ ආරංචියට සවන් දෙන්න තරම් කාරුණික වුනා.

'ඔව් පුතා... ඔයා කියපු දේ අපිට ඇහුනා... ඒක නෙවෙයි එතල්. ඔතන තියෙන මාමලේඩ් එක තාත්තාට දෙන්න. ඔයා මොකක් ගැනද කිව්වෙ විලියම් ?.'

විලියම් ට කථා කරන්න ඉස්සර වෙලා තාත්තා කාර්යාලයේ ප්‍රශ්නයක් ගැන විස්තර කරන්න වුනා. එයාගේ කථාව විනාඩි කිහිපයක් පුරාම ගලාගෙන ගිය නිසා තමන් ගේ කථාව ඉදිරිපත් කරන්නට විලියම් ට තවත් ටික වෙලාවක් බලාගෙන ඉන්න සිද්ධ වුනා.

'මම කියන්නේ මේකයි අම්මෙ. මම ත් ඒ සර්කස් එක බලන්න යන්නයි හිතාගෙන ඉන්නේ.'

විලියම් ස්ථිර හඬකින් කියද්දී නම තේ මේසයේ වාඩිවෙලා හිටපු හැමෝගෙම අවධානය ඉක්මනින් ම ඔහු වෙතට යොමු වුනා. හැබැයි ඉතාම සෙමින් හඬකින් කථා කරන්න වුනේ එයාගේ අම්මයි.

'ඔයා ඒ ගමන යන්නේ කොහොමද කියලයි මම මේ කල්පනා කරන්නේ පුතා. මොකද ඔය සර්කස් එක පටන්ගන්නේ හැමදාම හැන්දෑවට. ඉතින් ඔයාට හැන්දෑවට නැටුම් පන්තියට යන්න තියෙනවා නේද ?.......'

'නැටුම් පන්තිය ගැන ද අම්මා කියන්නේ ?. ඒ වුනත් අම්මෙ. මෙ තරම් ලස්සන සර්කස් එකක් අත ළඟටම ඇවිත් තියෙද්දී මාව නැටුම් පන්තියට යවන්න පුළුවන් වෙයි කියලා ඔයා හිතනව ද ?.'

විලියම් සමච්චල් විදිහට එහෙම අහද්දී බ්‍රවුන් මහත්මිය කතා කෙරුවේ ස්ථිර හඬකින්.

'මම දැනටමත් නැටුම් පාඩම් දොලහකටම සල්ලි ගෙවලා තියෙනවා කියන එක අමතක කරන්න එපා විලියම්. අනික නැටුම්

sinhalaebooks.com



පන්තියේ උගන්වන මිස් කැරිව් හරිම සැරයි. ඔයා පන්තියට ගියේ නැතිනම් ඒකට නිදහසට කාරණා කියන්නත් සිද්ධ වෙයි.'

'හරි අම්මා... එහෙම නම් මට අද හැන්දෑවේ සර්කස් බලන්න යන්න පුළුවන් නේ. මොකද අද මට නැටුම් පන්තියත් නැහැනේ.'

විලියම් එහෙම අහද්දී බ්‍රවුන් මහත්මියගෙන් ලැබුනේ බලාපොරොත්තු බිඳෙන ආකාරයේ උත්තරයක්.

'මම හිතන්නේ නෑ විලියම්. මොකද අද හැන්දෑවේ ඔයාගේ සීයයි, ලිලියන් ලොකු අම්මයි දෙන්න අපේ ගෙදර එනවා. ඉතින් ඒ අය එද්දී ඔයා ගෙදර ඉන්නම ඕනෑ. එහෙම නැතිනම් සීයගෙයි, නැන්දගෙයි හිත හොඳටම රිදෙයි.'

අම්මා එහෙම කිව්වත් විලියම් නම් තමන් ගේ අදහස ලේසියෙන් පැත්තකට දමන්න සූදානම් නෑ. එයා මේ ආකාරයේ දෙයක් කිව්වෙත් ඒ නිසයි.

'සීයයි, නැන්දයි දෙන්නා අපේ ගෙදර එන්නේ සතියක් ම නතර වෙන්නනේ. ඉතින් එක දවසක් මාව හම්බ වුනේ නෑ කියලා ඒ අය මොනවත් හිතන එකක් නෑ. අනික ලිලියන් ලොකු අම්මා ගිය සැරේ ආපු වෙලාවේ සිද්ධ වුන දේවල් එයාට තවම මතක ඇති. ඒ දේවල් මතක තියෙනවා නම් මම ගෙදර නොඉන්න තරමට ලිලියන් නැන්දා කැමැති වෙයි.'

'ඔයා මොනව කිව්වත් සර්කස් බලන්න යන්න එපා කියලයිමම ඔයාට කියන්නේ. ඔය සර්කස් එක රෑ අට විතර වෙනකන් පටන්ගන්නේ නෑ, අනික සර්කස් එක ඉවර වෙනකොට ගොඩාක් රෑ වෙනවා. අන්න ඒකත් මම අකමැති වෙන්න හේතුවක්. කොහොම වුනත් ඔයා සර්කස් බලන්න යන්න නම් හිතන්න එපා. මම ඒකට ඉඩදෙන්නේ නෑ.'

බ්‍රවුන් මහත්මිය තීරණාත්මක විදිහට බෙරිහන් දුන්නා. හැබැයි



විලියම් තවමත් තමන් ගේ අවශ්‍යතාවය ඉටුකරගන්නට වෙහෙසෙනවා.

'ඇයි අම්මා එහෙම කියන්නේ ?. මට දැන් වයස අවුරුදු එකොලහයි. මම දැන් පොඩි ළමයෙක් නෙවෙයි. ඒ හින්දා මට සර්කස් එක බලන්න තනියම යන්න පුළුවන්.'

ඔන්න ඔය වෙලාවේදී තමයි බලමින් සිටි පුවත්පත පැත්තකින් තියමින් ම විලියම් ගේ තාත්තා කථාවට මැදිහත් වුනේ.

'විලියම්... ඔයා දිගින් දිගටම කියන ඔය කථාවෙන් මට තේරෙන්නේ හිතුවක්කාර ළමයෙක් ගේ හැසිරීමක්. ඒ හින්දා වැඩි වෙලා යන්න ඉස්සර වෙලා ඔය කථාව නතර කරගත්තොත් හොඳයි කියලයි මම කියන්නේ.'

තාත්තා ගේ නිහඬ තර්ජනය අහපු ගමන් විලියම් ඉක්මනින් ම කට වසාගත්තා. එය හැම අතින්ම සුබදායකයි කියලා ඔහු දන්නවා. ඒ වුනත් තමන් ගේ තාත්තා විහිළු කාරයෙක් නෙවෙයි කියන එක නම් දැන් ඔහුට සහතිකයි. මොන දේ වුනත් සර්කස් එක බලන්න යනවා කියන සිතිවිල්ල නම් විලියම් ගේ සිතෙන් මැකිලා නෑ. ගැඹුරු නිහඬතාවයක් මැද ම ඔහු උදෑසන ආහාර වේල අවසන් කෙරුවත් සර්කස් එක ගැන සිතිවිල්ල තවමත් එයාගේ හිතේ හොල්මන් කරනවා. කොහොම හරි සර්කස් එකට යනවා... ඔව් කොහොම හරි සර්කස් එකට යනවා කියලයි විලියම් ගේ යටි හිත දිගින් දිගටම හඬ ගා කියන්නේ.

'විලියම්... කෑම මේසෙන් නැගිටින්න ඉස්සර වෙලා අත් පිස්නාව පිළිවෙලකට නමන්න.'

තාත්තා එහෙම කියද්දී විලියම් කිසිම කථාවක් නොමැතිව ඒ දේත් කෙරුවා. හැබැයි ඒ අතරම ඔහු ගේ සිතේ තවත් දෙයක් ගැන සනිටුහන් වුනා.

sinhalaebooks.com



'තාත්තට නම් කවදාවත් ම සර්කස් එකක විහිළු කාරයෙක් වෙන්න බෑ. මොකද විහිළු කාරයින් ට මේ වගේ නපුරු විදිහට කථා කරන්න බැහැනේ.'

කොහොම වුනත් විලියම් කියපු හැමදෙයක් ම පවුලේ අයගේ හිත් වල රැඳිලා තිබුනා. එදින හැන්දෑවේ එතල් විසින් විලියම් ව නැටුම් පන්තියට කැඳවාගෙන ගියෙත් ඒ නිසාමයි. විලියම් මේ ගමන ගියේ ටිකක් වත් කැමැත්තකින් නෙවෙයි. කිසිම කථාවක් නැතිව ඔහු ඉදිරියට ඇවිදගෙන ගියත් වරින් වර 'කෙහෙල් මල් නැටුම් පන්තිය... මේක කිසිම තේරුමක් නැති වැඩක්.' වගේ වචන නම් මුමුණන්න අමතක කෙරුවේ නෑ. මේ හැමදෙයකින් ම ප්‍රකට වුනේ විලියම් ගේ හිතේ තියෙන නොකැමැත්තයි.

නැටුම් පන්තිය වෙලාවේදීත් විලියම් ගේ සිත එක තැනක තිබුනේ නෑ. එය නිතර නිතර සර්කස් කණ්ඩායම සිටින පිට්ටනිය කරා දුවගෙන ගියා. පාඩමට අවධානයක් නොමැති ළමුන් ගැන නැටුම් ගුරුවරිය වන මිස් කැරිව් එතරම් මනාපයක් නොදක්වන බවත් විලියම් ට රහසක් නෙවෙයි.

'ළමයි... ඔයාලගේ දකුණු කකුල ඉදිරියට තියන්න. දකුණු කකුල කියලයි මම කිව්වේ විලියම් බ්‍රවුන්. ඔයා තියන්නේ වම් කකුල. හරි දැන් පියවර තුනක් ඉදිරියට යන්න. ඉදිරියට... විලියම් බ්‍රවුන්. මම ඔයාට ගහක් වගේ එක තැන හිටගෙන ඉන්න කියලා කිව්ව ද ?. හරි... දැන් ඔයාලගේ සහායකයගේ අත් අල්ලාගන්න. විලියම් බ්‍රවුන්... ඔයාගේ සහායකයා හෙන්රි නෙවෙයි.'

කැරිව් මෙනෙවිය. දිගින් දිගටම එහෙම කියවාගෙන යද්දී විලියම් ගේ නියම සහායකයා වන හෙන්රි පුදුමයෙන් වගේ ඇය දිහා බලාගෙන හිටියා.

කැරිව් මෙනවිය මොනතරම් බෙරිහන් දුන්නත් එදා නැටුම්



පාඩම නම් නියමාකාරයෙන් කරන්න ඔහුට හැකිවුනේ නෑ. නැටුම් පන්තියේ ඉන්න ළමයි, ඔවුන් ගේ රංගන හැකියාවන් වගේ කිසිම දෙයක් අද විලියම් ට පෙනෙන්නේ නෑ. එයාගේ මනස පුරාම තිබෙන්නේ සර්කස් කණ්ඩායමේ ඉන්න සිංහයින්, කොටියන්, අලියන් වගේ දේවලුයි. වර්රක එයා සර්කස් කණ්ඩායමේ ඉන්න විහිළු කාරයින් මනැසින් දැක්කා. ඒ වගේ වෙලාවට නැටුම අමතක වෙලා අපූරු හිනාවක් මුවට නැගුනත් කැරිව් මෙනවිය දකියි කියන බිය හින්දා ගොඩාක් අමාරුවෙන් ඒ හිනාව මුවා කරගන්නත් විලියම් අමතක කෙරුවේ නෑ.

මේ වගේ දේවල් අතරේම විලියම් ඔහුවට එපාවට වගේ නැටුමත් කරගෙන ගියා. විලියම් ගේ පිළිවෙලක් නැති නැටුම හින්දා ගොඩාක් අපහසුවට පත්වෙලා හිටියේ එයාගේ සහායකයා විදිහට නැටුමට එක්වෙලා හිටපු කුඩා ළමයා යි. විලියම් ගේ වැරැදිම බලාගෙන ඉන්න බැරිම තැන කුඩා ගැහැණු ළමයා හයියෙන් බෙරිහන් දීලා මෙහෙම කිව්වා.

'මට නම් විලියම් එක්ක තව එක සැරයක් වත් මේ නැටුම කරන්න බෑ. අනික මම එයා එක්ක නටන්න කැමැතිත් නෑ. එයා එක්ක නෙවෙයි. වෙන කවුරුවත් එක්කවත් මට නටන්න බෑ.' විලියම් පටන්ගත්ත වෙලාවේ ඉඳලා නැටුම කරන්නේ වැරැදියට.'

එහෙම කියන ගමන් ම ගැහැණු ළමයා මහා හයියෙන් අඩන්න වුනා. මේ හැඬුම හින්දම නැටුම් පාඩමත් ටික වෙලාවකට නතර වුනා. කුඩා ගැහැණු ළමයා සාක්කුවේ තිබුන පුංචි ලේන්සුවක් අතට අරන් කඳුළුත් පිසදමාගත්තා.

'මට නම් විලියම් එක්ක නටන්න බෑ. හරියට නටන්න පුළුවන් වෙන කෙනෙක් එක්ක මම නටන්නම්. විලියම් නටන්නේ වැරැදියට.'

ගැහැණු ළමයා ගුරුතුමියට කියද්දී විලියම් පුදුමයෙන් වගේ

sinhalaebooks.com



ඇය දිහා බැලුවා.

'මම... මොනවත් කෙරුවේ නෑ. අනික මේ ළමයා අඬන්නේ ඇයි කියලත් මට හිතාගන්න බෑ.'

විලියම් නිදහසට කරුණු ඉදිරිපත් කෙරුවත් කැරිව් මෙනවියගේ කෝපාන්විත දෝෂාරෝපනයෙන් ගැළවෙන්න නම් ඒ වචන ටික ප්‍රමාණවත් වුනේ නෑ.

'විලියම්... ඔයා මොනවත් කෙරුවේ නෑ කියන එක ඇත්ත වෙන්න පුළුවන්. හැබැයි ඔයා වැරැදියට නටපු හින්දයි ඒ ළමයා අඬන්නේ. මොකද ඔයා හින්දා එයාටත් නැටුම් ඉගෙන ගන්න බැරිවුනා නේ.'

'ආ... මගේ නැටුම හින්ද ද මෙයා ඇඬුවේ ?. ඒක හරි කථාවක් නේ. හැබැයි මම ටිකක් හෙමිනුයි නටන්නේ. ඒකට අඬන්න ඕනෑ නැහැනේ. අනික තවත් හෙමින් නටන අය ඕනෑ තරම් ඉන්නේ. එහෙමනම් ඒ අයත් අඬනවා ද ?.'

විලියම් එහෙම කියද්දී කුඩා ගැහැණු ළමයාගේ හැඬුම තවත් වැඩිවුනා. මේ වනවිටත් හැන්දෑ වරුව ගොඩාක් උණුසුම් වෙමිනුයි තිබෙන්නේ. ඒ නිසා ද කොහෙද කැරිව් මෙනවිය තරමත් නිවුන හඬකින් මෙහෙම කිව්වා.

'හරි.... විලියම් බ්‍රවුන් සහායකයා විදිහට අරන් නටන්න කැමැති වෙන කවුරුහරි ඉන්නව ද ?. එහෙම වුනොත් මාරිට පොඩි විවේකයක් දෙන්න පුළුවන්.'

කැරිව් මෙනෙවිය එහෙම ඇහුවත් නැටුම් පන්තියේ ඉන්න කවුරුවත් උත්තරයක් දුන්නේ නෑ. විලියම් ගේ හිතට කිසියම් නොඉවසිල්ලක් ගලාගෙන එද්දී ම ඔහු මෙහෙම කිව්වා.

'හරි... කවුරුවත් කැමැති නැතිනම් මට සහායකයෙක් ඕනෑත්



නෑ. අනික මම හෙමින් නටනකොට මෙතැන ඉන්න අනිත් අය අඬනවා නේ. ඒ හින්දා මම ගෙදර යන්න ද ?. මම හිටියොත් මෙතැන ඉන්න හැමෝම අඬන්න පුළුවන්. කවුරුවත් අඬවනවට වඩා මම ඉක්මනින් ම ගෙදර යන එක හොඳයි.'

විලියම් එහෙම කිව්වේ කපටි අදහසක් හිතේ තියාගෙන. හැබැයි මිස් කැරිව් නම් ඒ අදහසට කැමැත්තක් දක්වූයේ නෑ.

'නෑ... විලියම්. ඔයා ගෙදර යන්න ඕනෑ නෑ. මම මෙහෙම දෙයක් යෝජනා කරන්නම්. විලියම් බ්‍රවුන් එක්ක නටන්න කැමැති ඕනෑම කෙනෙකුට මම ගානේ චොකලට් එකක් දෙනවා. කවුද කැමැති ?.'

ටික වෙලාවක නිහඬතාවයක් පන්තිය පුරා පැතිරුනා. කෙට්ටු, කුඩා ගැහැණු ළමයෙක් අවසානයේදී අභියෝගය භාරගත්තා. විලියම් එයාගේ අතකින් අල්ලාගෙන නැටුම පුරුදු වෙන්න සූදානම් වෙන ගමන් ම මෙහෙම කියන්නත් අමතක කෙරුවේ නෑ.

'ඔන්න... ඔයත් මම හින්දා අඬන්න නම් එපා හොඳ ද ?.'

හැබැයි නැටුම අතරමග දී ඒ කුඩා ගැහැණු ළමයාත් සුපුරුදු පරිදිම තමන් ගේ දුක් ගැනවිල්ල ගුරුතුමියට ඉදිරිපත් කෙරුවා.

'අනේ... විලියම් මගේ කකුල පෑගුවා.'

'මම හිතලා නෙවෙයි එහෙම වුනේ. මම නටනකොට එයාගේ කකුල මගේ කකුල තියෙන තැනට එනවා. ඒ හින්දා මට එයාගේ කකුල පෑගුනා. ඉතින් මම මොකද කරන්නේ ?. මෙයා එක්ක දිගටම නැටුවොත් එයාගේ කකුලත් දිගටම පෑගෙයි.'

විලියම් නිදහසට කරුණු ඉදිරිපත් කරද්දී කැරිව් මෙනවිය කරකියා ගන්න දෙයක් නැතිව වගේ නළල අතගා ගත්තා.

'විලියම්...ඇත්තටම ඔයා නැටුම් ඉගෙන ගන්න හදන්නේ

sinhalaebooks.com



මොකටද කියලා මට නම් හිතාගන්න බෑ.'

කැරිච් මෙනවිය නොසතුටෙන් එහෙම අහද්දී විලියම්ගෙන් ලැබුනෙත් ඒ අකාරයේම නොසතුටු පිලිතුරක්.

'ඇත්තටම මිස් කැරිච්...මම නැටුම් ඉගෙන ගන්නේ මට ඕනෑ හින්දා නෙවෙයි. මගේ අම්මලට ඕනෑ හින්දා. මම නැටුම් වලට ටිකක්වත් කැමැති නෑ.'

මේ වගේ විවිධාකාර හැල හැප්පීම් මැද්දේ නැටුම් පන්තියත් අහවර වුනා. හැබැයි සර්කස් එක ගැන හිතේ තිබුන හින්දා විලියම් නම් කිසිම දෙයක් හරියට කෙරුවේ නෑ. නැටුම් පන්තිය ඉවර වෙලා විලියම් නැවතත් නිවස කරා ඇවිද ආවේ සර්කස් කණ්ඩායම නතර වෙලා ඉන්න විශාල පිට්ටනිය අද්දරින්මයි. හවස නැටුම් සංදර්ශනය අහවර වෙලා තියෙන හින්දා දැන් පිට්ටනිය පුරාම තිබෙන්නේ පුදුමාකාර පාළුවක් සහ අන්ධකාරයක්. වටේ පිටේ කවුරුවත් පෙනෙන්න නෑ. ඒ වුනත් සර්කස් මඩුවේ දොර ළඟ වැතිරිලා ඉන්න විශාල බල්ලෙක් ටර්නිප් අලයක් හපන ආකාරය නම් විලියම් දැක්කා. මේ වනවිටත් සර්කස් කණ්ඩායමේ සාමාජිකයින් ඔවුන් ගේ කැරවෑන් වලට ගොසින් රාත්‍රී ආහාරය සජ්ජායම් වෙමිනුයි හිටියේ. කැරවෑන් අසලින් යද්දී ඔවුන් හඬ නගා සිනාසෙන හඬ විලියම් ට ඇහුනා. කැරවෑන් වල දොරවල් හොඳින් වසා තිබෙන නිසා ඔවුන් කරන්නේ මොකක් ද කියලා නම් විලියම් දැක්කේ නෑ. මිනිසුන් ගේ කථාබහ සහ සිනා හඬ අතරින් කුඩා ළමයෙක් හඬන සද්දයත් විලියම් ට ඇහුනා.

'මේ ළමයා නම් හරිම වාසනාවන්තයි. මෙයාව නම් කවදාවත් ම නැටුම් පන්තියකට යවන්න කවුරුවත් හිතන්නේ නැතිවෙයි. ඒක මොනතරම් වාසනාවක් ද?.'

කැරවෑන් එක ළඟින් එද්දී විලියම් එහෙම කල්පනා කෙරුවා. නැටුම් පන්තිය ගැන එයාගේ හිතේ තියෙන තොක ... වන



වල හොඳින් ම තැවරිලා තිබුනා.

විලියම් ගෙදර එනකොටත් මූරි සීයා සහ ලිලියන් නැන්දා ඇවිත් හිටියා. මූරි සීයා මීට ඉස්සරින් කවදාවත් ම හම්බ වෙලා නැති හින්දා විලියම් එයා දිහා බැලුවේ පුදුමයෙන් වගේ. මෙයට ඉස්සර විලියම් ට වයස්ගත පුද්ගලයින් ඕනෑ තරම් හම්බ වෙලා ඉන්නවා. හැබැයි මූරි සීයා තරම් වයසක කෙනෙක් ඔහු ට හම්බ වුනේ ජීවිතයේ පළමු වතාවටයි. මේ තරම් වයසක අය තවමත් ජීවත් වෙලා ඉන්නව ද කියන සැකයත් ඒ වෙලාවෙම විලියම් ගේ හිතට ඇතිවුනා.

මූරි සීයා හරිම පුංචි කෙනෙක්. එයාගේ ඇඟ පුරාම රැලි වැටිලා තියෙනවා. ඒ විතරක් නෙවෙයි එයා ගේ ඇඟ ත් වෙවුලන හැටිත් විලියම් දැක්කා. මූරි සීයාගේ හිසේ එක කෙස් ගහක්වත් නෑ. මුහුණ කහපාටයි. මුහුණේ හැම තැනම පුංචි පුංචි රැලි වැටිලා. සීයා හිනාවෙනකොට දත් නෙවෙයි වැඩිපුරම පෙනෙන්නේ විදුරුමස්. එයාගේ කටේ දත් ගොඩාක් වැටිලා තිබුනත් විදුරු මස්වල පාළුව මකන්න වගේ කළු පාට වුන දත් තුනක් විතරක් අතරින් පතර රැඳිලා තියෙනවා. අළුත් බිත්තරයක් වගේ දිලිසෙන මූරි සීයාගේ ඔලුව බලන්න ලස්සනයි. ඇත්තම කියනවා නම් විලියම් ඒ දිලිසෙන ඔලුව දිහා මොනතරම් වෙලාවක් බලා සිටියා ද කියලා ඔහුට මතක නෑ.

මූරි සීයාව බලාගන්න එක තමයි ලිලියන් නැන්දගේ එකම රාජකාරිය බවට පත්වෙලා තියෙන්නේ. හැම විනාඩියකම ඔහු ගේ ඕනෑ එපාකම් ගැන හොයලා බලන ලිලියන් නැන්දා ඇත්තටම අපූරු දියණියක් කියලා කවුරුත් කිව්වා.

'මම සීයාව ලයිට් එක පැත්තට හරවලා වාඩි කරන්න ද ?. අනේ මට කරුණාකරලා පානුයි, බටරුයි ටිකක් දෙනව ද ?. සීයා වැඩියෙන් ම කැමැති ඒවාට. සීයේ... ඔයාට ඔහොම ඉන්න එක

sinhalaebooks.com



පහසුයි ද ?. මම කුෂන් කොට්ටයක් ෆේත්තු කරන්න ද ?. ආ... මෙ පුංචි ස්ටූල් එකෙන් කකුල් දෙක තියාගන්න. සීයේ... මෙ ඉන්නේ විලියම්. ඔයා කලින් දැකලා නැහැනේ. මෙයා තමයි හරිම දඟ විලියම්.'

'විලියම්...'

මූරි සීයා ගොත ගසමින් එහෙම කියද්දී විලියම් ට කිසියම් අමුතු හැඟීමක් ඇතිවුනා. ඒ අතරම ලිලියන් නැන්දා තවත් වචන කිහිපයක් මුමුණන්න අමතක කෙරුවේ නෑ.

'විලියම් කියන්නේ කිසිම දෙයක් ගැන බරපතල විදිහට හිතන්නේ නැති ළමයෙක්.'

හවස තේ පානයෙන් පසුවත් ලිලියන් නැන්දා මූරි සීයාගේ ඔනෑ එපාකම් ගැන හොයලා බැලුවා.

'මූරි සීයේ... ඔයා දැන් නිදාගන්න ගියොත් හොඳයි නේද ?. මොකද දුර ගමනක් ආපු ගමන් ම ඔයා මහන්සිත් ඇතිනේ. ඒ හින්දා දැන් ටිකක් නිදාගන්න. ඔයාලා දන්නව ද ?. සීයා දුර ගමනක් ගියාට පස්සේ ටිකක් වේලාසනින් නිදාගන්න කැමැතියි.'

එහෙම කියපු ලිලියන් නැන්දා උඩු මහලේ තියෙන කාමරය කරා මූරි සීයා රැගෙන යන්නත් අමතක කෙරුවේ නෑ.

මෙ හැමදෙයක් ම දිහා බලාගෙන හිටපු විලියම් හැන්දෑවේ හත හමාර වෙනකොටම එයාගේ කාමරේට රිංගා ගත්තා. විලියම් ගොඩාක් නිහඬ විදිහට ඉන්න එක ගැන ගෙදර අනිත් අයටත් හරිම පුදුමයි. විලියම් ට සර්කස් එක ගැන අමතක වෙලා ඇති කියලයි ඒ අය සැක කෙරුවේ. ඒ හින්දා සර්කස් එක ගැන වචනයක් වත් කථා කරන්නවත් ගෙදර කවුරුවත් හිතුවේ නෑ. හැබැයි විලියම් ගේ නිහඬ බව පිටුපස්සේ තියෙන්නේ කවුරුවත් හිතපු නැති විදිහේ ලොකු සැළසුමක් කියලා නම් කවුරුවත් දැනගෙන හිටියේ නෑ.



කාමරේ ඇඳ උඩ වාඩිවුන විලියම් ඉතාම තීරණාත්මක දෙයක් ගැන කල්පනා කරන්න වුනා. ඇත්තටම එයා හිතන්නේ නිවසින් පිටවෙලා ගිහිං සර්කස් එක බලන්නේ කොහොමද කියලයි. මෙස් විතරක් දමාගෙන පඩිපෙළ බැහැලා සාලයට ගියොත් ඉදිරිපස දොර ඇරගෙන එළියට යන එක අමාරු වැඩක් නෙවෙයි කියලා විලියම් දන්නවා. හැබැයි මෙ සැලැස්මෙ ලොකු අවදානමක් තියෙනවා. ගෙයින් පිටවෙන්නට උත්සාහ කරද්දි කවුරුන් හෝ දුටුවහොත් සිදුවන්නේ හරිම අවාසනාවන්ත දෙයක්. ඒ කියන්නේ විලියම් ගේ සැලැස්ම එහෙම පිටින්ම අසාර්ථක වෙනවා. ඒ වගේ දෙයක් සිද්ධ වෙනවටත් විලියම් කොහොමටවත් කැමැති වුනේ නෑ. නිවසින් පිටවෙන්නට තිබෙන ඊළඟ ක්‍රමය නම් ජනේලයෙන් එළියට පැනීමයි. හැබැයි විලියම් ගේ කාමරය පිහිටා තිබෙන්නේ නිවසේ තුන්වැනි මහලේ ය. ඒතරම් උසක සිට බිමට පනින්නට හැකියාවක් නෑ කියලත් විලියම් දන්නවා. විලියම් ගේ කාමරයට හරියටම යටින් දෙවැනි මහලේ තිබෙන්නේ මූරි සීයා ගේ නිදන කාමරයයි. මූරි සීයාගේ කාමරයේ ජනේලය ළඟ නම් විශාල ගසක් තියෙනවා. කොහොම හරි ඒ ජනේලයෙන් එළියට ආවොත් නම් ගස දිගේ බිමට බැසගන්න පුළුවන් කියලා විලියම් ට ඒ වෙලාවේ සිහිපත් වුනා. තේ පානයෙන් පසුව මූරි සීයා නිදාගන්න ගිය නිසා මෙ වනවිටත් ඔහු තද නින්දේ පසුවෙනවා කියලයි විලියම් නිගමනය කෙරුවේ. ඒ නිසා ඔහු දෙවැනි සැලැස්ම ක්‍රියාවේ යොදවන්න තීරණය කෙරුවා.

විලියම් සෙමෙන් සෙමෙන් පඩිපෙළ බැසගෙන විත් දෙවැනි මහලේ තිබෙන මූරි සීයාගේ නිදන කාමරයේ දොර විවෘත කෙරුවා. පුදුමයකට වගේ කාමරයේ විදුලි පහන දල්වලයි තිබුනේ. තවත් ටික වෙලාවකින් සම්පූර්ණ ඇඳුම් කට්ටලයකින් සැරසුන මූරි සීයා කාමරයේ ගිනි උදුන ළඟ වාඩිවෙලා ඉන්න හැටි විලියම් දැක්කා. විලියම් ගේ සැලැස්මට එරෙහිව තවත් බාධකයක්... ඒ ගැන කල්පනා

sinhalaebooks.com



කරමින් ම විලියම් මූරි සීයා දිහා ඇසිපිය නොහෙලා බලාගෙන හිටියා. විලියම් දිහාට හැරුන සීයා කට පුරා සිනාසෙමින් ම ඔහුට මෙසේ කිව්වා.

'හලෝ විලියම්... කොහොමද ?. මම තවම නිදාගත්තේ නෑ.'

විලියම ටික වෙලාවක් සීයා දිහා බලාගෙන හිටියා. ඊට පස්සේ එයා කාමරයට ඇතුළු වෙලා දොර වසා දමන ගමන් සිහින් හඬින් මෙහෙම කිව්වා.

'සීයේ... මම මේ ජනේලයෙන් එළියට පනින්න ද ?.'

'ඔව්... කමක් නෑ විලියම. ඒ වුනත් ඔයා කොහෙද මේ වෙලාවේ යන්න හදන්නේ ?.'

මූරි සීයා උනන්දුවෙන් ඇහුවත් විලියම ගේ පිළිතුරේ නම් කිසිම උනන්දුවක් තැවරිලා තිබුනේ නෑ.

'මම සර්කස් එකක් බලන්න යන්නයි හදන්නේ.'

විලියම ගේ උත්තරය අහපු ගමන් මූරි සීයාගේ යටට ගිලුන දෑස් වල පුදුමාකාර අන්දමේ දීප්තියක් පැතිරුනා.

'ආ... නියමයි නේ. ඔයා සර්කස් එකක් බලන්න යන්න ද හදන්නේ ?. සෑහෙන කාලෙකට ඉස්සර වෙලා මමත් සර්කස් එකක් බැලුවා. අශ්වයෝ. අලියෝ....'

'සිංහයෝ, කොටියෝ, ඔටුවෝ, විකටයෝ... ඒ අයගේ සෙල්ලම් බලන්න ලස්සනයි.'

සීයා ගේ කථාවේ අවසානය සනිටුහන් කෙරුවේ විලියම විසින්. ඒ අතරම සීයා නැවතත් පුදුමාකාර උනන්දුවකින් මෙහෙම ඇහුවා.

'ඔව්... සර්කස් වල විකටයොත් ඉන්නවා නේ. ඒ අයගේ



හිනාවලට බඩ අල්ලගෙන හිනාවෙන්න පුළුවන්. ඒක නෙවෙයි විලියම්... ඔයා තනියම ද සර්කස් එක බලන්න යන්නේ ?.'

'ඔව්...' එහෙම කියන ගමන් විලියම් කාමරයේ ජනේලය ළඟට සමීප වුනා. ඒ අතරම මූරි සීයා ගේ කටහඬ නැවතත් ඇසුනා.

'ඔයා සර්කස් බලන්න යනවා කියලා ගෙදර අය දන්නව ද?.'

'නෑ...'

මේ වනවිටත් මහළු මිනිසා සිටියේ පුදුමාකාර විදිහේ උද්දාමයකින්. එයාගේ වචන වල පවා ඒ උද්දාමය කිසිම අඩුවක් නැතිව තැවරිලා තිබුනා.

'විලියම... මටත් ඔය සර්කස් එක බලන්න යන්න ඕනෑ. අනේ මාවත් එක්ක යනව ද ?.'

සීයා කිව්වේ විලියම හීනෙකින්වත් හිතපු දෙයක් නෙවෙයි. හැබැයි විලියම නම් ඒ අදහසට ටිකක් වත් කැමැත්තක් දක්වුවේ නෑ.

'ඒ වුනත් සීයේ... ඔයා කොහොමද ජනේලයෙන් එළියට ගිහිං ගහ දිගේ බිමට බහින්නේ ?.'

'ඒ ගැන කලබල වෙන්න එපා පුතා. මම පල්ලෙහා මාලයට ගිහිං ඉස්සරහා දොර ඇරගෙන එළියට එන්නම්. ඔයා මම එනකම් මිදුලට වෙලා බලාගෙන ඉන්න.'

මූරි සීයා උද්දාමය පෙරෙන හඬකින් එහෙම කිව්වත් විලියම නම් ඒ අදහසට කැමැත්තක් දක්වුවේ නෑ.

'ඒක හරියන වැඩක් නෙවෙයි සීයේ. හැබැයි ඔයා ඉස්සරහා දොරෙන් එළියට එන්න හිතාගෙන ඉන්නවා නම් මම ත් ඔයා

sinhalaebooks.com



එක්කම එන්නම්.'

සියා, විලියම් ගේ අදහසට එකපයින් ම කැමැති වුනා. ඒ නිසා විලියම් හනි හනික සියාගේ තොප්පිය, කබාය අරන් ඇවිත් එයාට ඇඳගන්න උදව් කෙරුවා. හිතේ තියෙන සතුට නිසාම මහළු මිනිසා ගේ මුහුණ පුදුමාකාර අන්දමේ සිනාවකින් ඔපවත් වෙලයි තිබුනේ. ඒ අතරම එයා විලියම් ගෙන් මේ ආකාරයේ පැනයක් අහන්නත් අමතක කෙරුවේ නෑ.

'විලියම්... පුතා. ඔය සර්කස් එකේ විකටයෝ එහෙම ඉන්නවා නේද ?. විකටයෝ නැති සර්කස් එකකින් වැඩක් නෑ.'

'කිසි දේකට බය වෙන්න එපා සීයේ. මේ සර්කස් එකේ විකටයෝ ඉන්නවා කියලා මට හොඳටම සහතිකයි.'

මේ කථාබහෙන් පස්සේ විලියම් සහ සීයා හෙමින් හෙමින් පඩිපෙළ බැසගෙන නිවසේ පහත මාලයට ඇවිදගෙන ආවා. ඇත්තටම මේ වෙලාවේ වාසනාව තිබුනේ ඔවුන් ගේ පැත්තේ. බ්‍රවුන් මහතා, මහත්මිය, එතල්, සහ ලිලියන් නැන්දා බ්‍රිජ් ක්‍රීඩාවේ නිතර වෙමිනුයි හිටියේ. ඒ හින්දා ඔවුන් ට අහස කඩාගෙන වැටුනත් දැනෙන්නේ නෑ. මේ නිසාම විලියම් ට සහ මූරි සීයා ට කිසිම අපහසුවක් නැතිව නිවසින් පිටවෙන්න ට වාසනාව ලැබුනා.

නිවසින් පිට වූ වහාම මූරි සීයා දත් නැති කටින් සමච්චල් සිනාවක් නගමින් මෙහෙම කිව්වා.

'මම හොඳටම නිදි කියලයි ලිලියන් හිතාගෙන ඉන්නේ.'

'ශ්.... සද්ද කරන්නේ නැතිව ඉක්මනට එන්න සීයේ. පරක්කු වුනොත් සර්කස් එක පටන් ගනියි.'

විලියම් එහෙම කියලා සීයාත් සමගම පය ඉක්මන් කරලා සර්කස් මඩුව තියෙන පැත්තට ඇවිදගෙන ගියා.



විලියම් ට සහ සීයාට කිසිම අපහසුවකින් තොරව සර්කස් මඩුව තියෙන පිට්ටනිය ළඟට එන්න ට හැකිවුනා. හැබැයි ටිකට් ගන්න ඕනෑ මුදල් තමන් ළඟ නෑ කියලා විලියම් ට සිහිපත් වුනේ එතකොටමයි. විලියම් ළඟ තිබුන අවසන් පැන්සයත් පොප්කෝන් බෑගයක් ගන්න ඊයේ වියදම් වෙලයි තිබුනේ. මුදල් නැතිව සර්කස් සංදර්ශනය බලන්න නොහැකි බව විලියම්, මූරි සීයා ට කිව්වේ හිත පුරා දිවයන ශෝකයත් සමගයි. ඒ බව අහපු ගමන් ම සීයාත් කළබලයෙන් වගේ තමන් ගේ කබායේ සාක්කු හැම එකක් ම අවුස්සන්න වුනා. ඒ වෙලාවෙත් වාසනාව තිබුනේ ඔවුන් එක්ක. සීයා ගේ සාක්කුවේ තිබුන පැන්සයක් අහම්බෙන් වගේ ඔහුට හමුවුනා.

'කිසි දේකට බයවෙන්න එපා විලියම්. මම ළඟ සල්ලි තියෙනවා. අපිට දන් කිසිම බාධාවක් නැතිව සර්කස් එක බලන්න පුළුවන්.'

සර්කස් එක බලන්න ප්‍රවේශපත් ගත්තු විලියම් සහ සීයා සෙනග අතර තෙරපෙමින් ම මඩුව ඇතුළට රිංගා ගත්තා. ඉන්පසුව ඔවුන් දෙදෙනා ඉදිරිපස ම තිබෙන අසුන් දෙකක වාඩිවුනා. විලියම් වගේ ම සීයාත් වටපිට බැලුවේ හරිම ආසාවෙන්. අශ්වයින්, සිංහයින්, කොටියන්, අලියන් සහ තවත් සතුන් විශාල ප්‍රමාණයක් ගාල් කොට තිබෙන කූඩු අතරින් සීයා සෙව්වේ රතු පාට නාස් තියෙන විකටයින් ව. හදිසියේම ඔහු ට විකටයින් දෙදෙනෙක් ව දකින්න ලැබුනා. සීයා සතුට ඉතිරෙන හඬකින් බෙරිහන් දුන්නේ ඒ සමගමයි.

'විලියම්.... අන්න විකටයෝ ඉන්නවා. දෙයියනේ... ඒ අය කියන විහිළු කථා අහන්න මම හරිම ආසයි.'

ඔන්න එතකොටම පුංචි කැමරාවක් අතින් ගත්තු විකටයෙක් නරඹන්නන් අතරට ආවා. දන් ඔහු සූදානම් වෙන්නේ නරඹන්නන් ව ඡායාරූප ගත කරන්නයි. ඉදිරි පෙළේ වාඩිවෙලා හිටපු ගොවි

sinhalaebooks.com



මහතෙක් සහ ඔහු ගේ බිරිඳ ට ඉදිරියට එන්න කියලා විකටයා කිව්වා. ඒ දෙන්නත් ශාලාව මැද තියෙන පුංචි වේදිකාවට ගියේ හරිම ආසාවෙන්. විකටයා වේදිකාව මැද පුටුවක් තියලා ගොවි බිරිඳ එහි වාඩි කෙරෙව්වා. ඇයට පිටුපසින් ගොවි මහතා ට සිටගන්න සැලැස්සුවා.. දැන් ගොවි මහතා බිරිඳගේ කරට අතකුත් දමාගෙන ඡායාරූපයට පෙනී සිටින්නට සූදානම්. හැම දෙයක් ම සූදානම් කරපු විකටයා. හෙමින් සීරුවේ පිටුපස දොරෙන් නොපෙනී ගියා. විකටයා ඡායාරූපය ගන්නා තෙක් ගොවි යුවල ඉවසිල්ලක් නැතිව බලාගෙන ඉන්නවා. හැබැයි විනාඩි කිහිපයක් ගතවෙලා ගියත් විකටයා නම් ආපහු ආවේ නෑ. තමන් විහිළුවකට ලක්වෙලා කියලා තේරුම් ගත්තු ගොවි යුවල ආපහු තමන් ගේ ආසන වලට ආවේ නරඹන්නන් ගේ හිනා හඬ මැද්දෙයි.

විකටයා ගේ මේ අපූරු විහිළුවෙන් විලියම් විතරක් නෙවෙයි මූරි සීයා ත් පුදුමාකාර විදිහට හිනාවුනා. සීයා මොනතරම් උද්දාමයට පත්වෙලා හිටිය ද කියනවා නම් එයා හිනාවුනේ විලියම් ගේ පිටටත් හයියෙන් පහරක් එල්ල කරමින්.

'දෙයියනේ විලියම්. විකටයා හොරෙන් ම යන්න ගිහිං. අර ජෝඩුව හිතාගෙන ඉන්නේ විකටයා පිටුපස්සෙන් ඉඳන් ෆොටෝ එක ගනියි කියලයි. මේක නම් හරිම අපූරු විහිළුවක්. හිනාවෙලාම මගේ බඩත් රිදෙනවා.'

මේ වගේ විහිළු වැඩ සටහන් කිහිපයකට පසුව තමයි සර්කස් සංදර්ශනය නියම විදිහට ආරම්භ වුනේ. සර්කස් සංදර්ශනය ආරම්භ වෙන බව ප්‍රේක්ෂකයින් ට දැන්වූවේ දිගු යටි රැවුලක් වවා සුදු පාට කමිසයක් හැඳ සිටි අයෙකු විසින්. ඔහු සර්කස් කණ්ඩායමේ නායකයා කියලයි මූරි සීයා, විලියම් ට කිව්වේ. එයා කළුම කළු පාට අශ්වයෙක් පිට නැගගෙන ඇවිත් කසය වනමින් මේ පණිවුඩය කියද්දී නරඹන්නන් ඉහළට ගත් හුස්ම පහලට නොහෙලා බලාගෙන ඉන්න



වුනා. විලියම් ට හරිම පුදුමයි.

ඉන්පසුව ආරම්භ වුනේ රත්තරන් පාට හිසකෙස් තියෙන, සුදු පාට ඇඟට හිරවුන කලිසමක් හැඳ සිටි ගැහැණු ළමයා ගේ අපූරු පිනුම් සංදර්ශනයයි. කළුම කළු පාට අශ්වයා පිටේ තනි කකුලින් හිටගෙන ඒ ගැහැණු ළමයා සර්කස් මණ්ඩපය වටේ රවුමක් ගියා. මේ අපූරු දර්ශනය දිහා විලියම් මෙන් ම මූරි සීයා ත් බලාගෙන හිටියේ කටත් ඇරගෙනයි.

'ෂා... නියමයි.'

විලියම් එහෙම කියද්දී සීයා ත් කථාවට එක් වුනා.

'එයා හරිම දක්ෂයි නේද විලියම් ?.'

'ඒ වගේම එයා හරිම ඉක්මන් නේද සීයේ ?.'

තවත් මොහොතකින් සුදු පාට අශ්වයෙකු ගේ පිට උඩ නැගගත් තවත් මිනිසෙක් වේදිකාව උඩට ආවා. අශ්වයින් දෙදෙනා එකිනෙකා ගේ හැප්පෙයි ද කියලා විලියම් ට ඒ වෙලාවේ නම් ගොඩාක් බය හිතුනා. ඊළඟ නිමේශයේදී ගැහැණු ළමයා කරන්න පටන්ගත්තේ තවත් අපූරු සෙල්ලමක්. එයා සුදු පාට අශ්වයාගේ පිටේ ඉඳලා කළු අශ්වයා ගේ පිටට පිනුමක් ගැහුවා මේ විදිහට එයා මාරුවෙන් මාරුවට අශ්වයින් ගේ පිටවල් උඩට පිනුම් ගසන ආකාරය නරඹන්නන් බලා සිටියේ සතුටින් ඔල්වරසන් දෙමින්. මේ ගැහැණු ළමයා දිහා බලා සිටිද්දී විලියම් ට සිහිපත් වුනේ අල්ලපු ගෙදර ඉන්න කුඩා ගැහැණු ළමයා. කවදහරි දවසක එයා සර්කස් කණ්ඩායමක පිනුම් කාරියක් වුනොත් තමන් විකටයෙක් වෙනවා කියලා විලියම් අදිසියේ තීරණය කෙරුවේ ඒ වෙලාවේදියි.

පිනුම් සංදර්ශනයෙන් පස්සේ විකටයා නැවතත් වේදිකාවට ආවා. එයා දුවන අශ්වයින් නතර කරන්න උත්සාහ කරමින් අපූරු විහිළුවක් ඉදිරිපත් කෙරුවා. නරඹන්නන් ගේ සිනා හඬින් සර්කස් මඩුව ම දෙවනත් වුනේ අන්න එතකොටයි.

sinhalaebooks.com



විකටයින් ගේ ඉල ඇදෙන විහිළු, ලස්සන කාන්තාවන් ගේ ලොමු ඩැහැගැන්වෙන පිනුම් සංදර්ශන, සතුන් ගේ දක්කම්, ගිනි වළලු වලින් පැනීම වගේ ගොඩාක් දේවල් මේ සර්කස් සංදර්ශනයට අයත් වෙලා තිබුනා. ඒ නිසා වෙලාව ගත වෙනවා වත් විලියම් ට සහ සීයා ට දැනුනේ නෑ. මේ වනවිටත් ඔවුන් ගෙදරින් පිටවෙලා ඇවිත් සෑහෙන වෙලාවක් ගතවෙලා.

සර්කස් සංදර්ශනය අවසන් වෙලා විලියම් සහ සීයා නැවතත් නිවස කරා එන්නට පාරට බැස්සා. දෙදෙනාගේම හිත් සතුටින් පිරිලා ඉතිරිලා ගිහිං.

' සර්කස් එක නම් නියමයි නේද විලියම් ?.'

සීයා එන ගමන් ම එහෙම ඇහුවත් විලියම් කිසිම දෙයක් කිව්වේ නෑ. හිත පිරිලා තියෙන සතුට අතරින් කිසියම් දෙගිඩියාවක් ද එයාගේ හිතේ නැතුවා නෙවෙයි. තමන් සහ සීයා හොර රහසේම නිවසින් පිටවෙලා ගිහිං කියලා දැනටමත් ගෙදර අය දැනගෙන ඇති. එසේ නම් ඔවුන් ගේ ප්‍රතිචාරය කොයි ආකාරයෙන් ද කියලා විලියම් ට ඉවෙන් වගේ දැනෙනවා.

කිසිම කථාවක් නැතිව සීයා සහ විලියම් නිවසේ ගේට්ටුව ළඟටම ආවා. ඔන්න එතකොට තමයි විලියම් චංචල වුන හඬකින් කථා කරන්න වුනේ.

'කිසිම සැකයක් නෑ. ගෙදර අය මට හොඳ දඬුවමක් දෙයි. ඒ වුනත් කමක් නෑ. මම කොහොම හරි සර්කස් එක බැලුවනේ. සීයේ. ලිලියන් නැන්දා ගෙන් ඔයාටත් හොඳටම බැනුම් අහන්න වෙන එක නම් සිකුරුයි.'

විලියම් එහෙම කියද්දී මූරි සීයා ලොඹු කටින් සිහින් සිනාවක් පෑවා.



'ඔයාට කියන්න විලියම්. මම කොල්ලා කාලේ බැලුවට පස්සේ අද තමයි සර්කස් එකක් බැලුවේ. ඉතින් මේ වගේ සර්කස් එකක් බලලා බැනුම් ඇහුවත් හිතට දුකක් නෑ.'

ඒ අතර විලියම් සීයාගෙන් මේ වගේ පැනයකුත් ඇහුවා.

'සීයේ... ඔයා නැටුම් ඉගෙන ගෙන තියෙනව ද ?.'

'ඔව්....'

'ඉතින් ඔයා නැටුම් වලට කැමැති ද ?.'

'මමනම් චුට්ටක්වත් කැමැති නෑ විලියම්.'

සීයා ගේ ඒ කථාවත් එක්කම පුදුමාකාර විදිහේ සතුටක් විලියම් ගේ හිතට දැනුනා. සීයා සහ තමා අතර තිබෙන්නේ එක ආකාරයේ සිතිවිලි කියලා දැනගත් විගසම විලියම් සතුටින් ඉපිලෙන්න වුනා. මේ වෙනකොටත් ඔවුන් නිවසේ ඉදිරිපස දොර ළඟටම ඇවිත්. සාලයේ කවුරුවත් පෙනෙන්න හිටියේ නෑ. මොන පුදුමයක් ද ?. විලියම් ගේ අම්මා, තාත්තා, අක්කා සහ ලිලියන් නැන්දා තවමත් බ්‍රිජ් ක්‍රීඩාවේ නිරත වෙනවා. ඒ නිසා විලියම් ට සහ සීයා ට පෙර පරිදිම සීරුවෙන් ඇවිදගෙන ගොසින් තම තමන් ගේ නිදන කාමර වලට යන්න එතරම් අපහසුවක් වුනේ නෑ.

.................................................

පසුවදා උදේ කෑම වෙලාවේදී විලියම් ගේ අම්මා ගොඩාක් දුක්බර විදිහට මෙහෙම කිව්වා.

'විලියම්... ඊයේ ඔයාට සර්කස් බලන්න යන්න බැරිවුන එක ගැන මට හරිම කනගාටුයි. ඔයාව එක්ක යන්න කෙනෙක් නැතිවුන නිසයි එහෙම දෙයක් වුනේ. දුක්වෙන්න එපා. අද හෙටම ඔයාට සර්කස් එක බලන්න යන්න පුළුවන් වෙයි.'

'ඔයාට ස්තුතියි අම්මේ...'

sinhalaebooks.com



කෑම පිඟාන දිහා බලාගෙනම විලියම් එහෙම කිව්වා. හැබැයි එයා හිටියේ හිත යටින් හිනාවෙවී. ඒ අතර අම්මා ආයේමත් කථා කෙරුවා.

'ඊයේ සිද්ධ වුන දේ ගැන ඔයාට දුකක් නෑ නේද විලියම් ?.'

'මට කිසිම දුකක් නෑ අම්මේ.'

ඔන්න එතකොටම ලිලියන් නැන්දාත් ඇවිත් කථාවට මැදිහත් වුනා.

'අර බලන්නකෝ. අපේ සීයා අද ඉන්නේ හරිම ප්‍රබෝධමත් විදිහට. එයා මේ විදිහේ සතුටකින් ඉන්නවා මම දැක්කමයි. කොහොම වුනත් ඊයේ තේ පානයෙන් පස්සේ සීයා ට නිදාගන්න යන්න කියපු එක හොඳ දෙයක් කියලා මට හිතෙනවා. එයා ගොඩාක් වෙලා නිදාගත්ත හින්දා තමයි අද උදේ මේ තරම් සතුටින් ඉන්නේ.'

ලිලියන් නැන්දා එහෙම කියද්දී ම විලියම් මේසයට උඩින් මූරි සීයා දිහා බැලුවා. එයාගේ මුහුණේ සිහින් හිනාවක් තැවරිලා තියෙන හැටි විලියම් දැක්කා. විලියමු ත් යාන්තමට හිනාවෙලා සීයා ගේ හිනාවට ප්‍රතිචාරයක් දැක්වූවා පමණයි. කිසිම දෙයක් කියන්න ගියේ නෑ.

# 6.
# පරිච්ඡේදය

# නිවුන් දරුවන් විකිණීමට තිබේ.

විලියම් සහ එයාගේ අතිජාත මිත්‍රයා වන ජින්ජර් මේ දවස්වල ඉන්නේ පුදුමාකාර විදිහේ ගැටළුවකට මැදිවෙලා. පැණි රස කෑමක් ගන්න පැන්ස දෙකක් හොයාගන්න නොලැබීම තමයි ඒ අයට තියෙන බරපතලම ගැටළුව. මේ නිසා විලියම් ගේ වගේම ජින්ජර් ගේ දවසුත් පුදුමාකාර විදිහේ ඒකාකාරී බවකින් වැසිලා ගිහිං. තමන් ට බලපා තිබෙන බරපතල මූල්‍ය අර්බුදයට විසඳුමක් හොයාගන්න ඔවුන් දෙදෙනාම වැඩි හිටියන් හම්බ වුනා. ඒ වුනත් ඔවුන්ගෙන් වත් කිසිම විදිහක සතුටුදායක පිළිතුරක් ලැබුනේ නෑ. පොඩි ළමයින් ගේ අවශ්‍යතා ගැන වැඩිහිටියන් ට අවබෝධයක් නැති එක ගැන විලියම් ට වගේම ජින්ජර්ටත් හරිම තරහයි. සීනි බෝල ටිකක් කන්න කොහොම හරි සල්ලි හොයාගන්න ඕනෑ

sinhalaebooks.com



කියලා මේ වෙලාවේ දෙදෙනාම හිතුවා.

ජින්ජර් ගේ ගේ ඉස්සරහා ලොකු පිට්ටනියක් තියෙනවා. විලියම් සහ ජින්ජර් දෙදෙනා මේ පිට්ටනියේ වාඩිවෙලා දිගින් දිගටම කල්පනා කරන්න කළේ සල්ලි හොයන්න මොන විදිහේ සැළසුමක් දියත් කරන්න ඕනෑ ද කියලයි. සෑහෙන වෙලාවක් සාකච්ඡා කළා ට පසුව සැළසුම් තුනක් ගැන අදහස් ඔවුන් ඉදිරියේ තිබුනා.

පළමු වැනි සැළසුම - ඔවුන් ළඟ තිබෙන ඉන්දියන් රබර් බෝලය අල්ලපු ගෙදර කොලුවාට අළෙවි කොට පැන්ස දෙකක් ලබා ගැනීම.

දෙවැනි සැළසුම - විලියම් ගේ තාත්තා ගේ ගොවිපොළෙන් පැණි රසැති උක් ගසක් ගලවාගෙන ගොස් අසල තියෙන මොන්ටිසෝරියේ ළමයින් ට පැන්ස පහ හමාරකට අළෙවි කිරීම. හැබැයි මේ දෙයින් සිදුවෙන අතුරුඵලය ගැන කල්පනා කිරීමෙන් පසුව ඔවුන් ඒ අදහස අමතක කරලා දැම්මා.

තුන්වැනි සැළසුම - නිවුන් දරුවන් අළෙවි කිරීම

ඇත්තටම මේ සැළසුම් අතරින් නිවුන් දරුවන් අළෙවි කිරීම හොඳම සැළසුම කියලා විලියම් සහ ජින්ජර් දෙදෙනාම තීරණය කෙරුවා. නිවුන් දරුවන් කියන්නේ ජින්ජර් ගේ ඥාති සහෝදරයින් දෙදෙනෙක්. ඔවුන් මේ දවස්වල නිවාඩුවක් ගතකරන්න ජින්ජර් ගේ නිවසට ඇවිල්ලයි ඉන්නේ. ඒ අය හරිම කරදරකාර අය හින්දා පහුගිය සතිය ගොඩාක් දිගයි කියලා ජින්ජර් ට හිතුනා. නිවුන් දරුවන් තමන් ගේ නිවසට පැමිණි දා ඉඳන් ම පුදුමාකාර විදිහේ කරදර ගොඩකට මුහුණ දෙන්නත් ජින්ජර් ට සිද්ධ වුනා. ඒ නිසා ඔවුන් විකුණලා හෝ මේ කරදරෙන් මිදෙන්න ඕනෑ කියලා ජින්ජර් දැනටමත් තීරණය කරගෙනයි ඉන්නේ.



ජෝර්ජ් සහ ජෝන් තමයි මේ නිවුන් සහෝදරයෝ දෙන්නා. ඒ අයට අවුරුදු තුන හමාරක් විතර ඇති. මේ දෙන්නා කරන දඟකාරකම් වලින් ජින්ජර් තමයි වැඩිපුරම බැට කෑවේ. ඒ විතරක් නෙවෙයි. අද උදේ අම්මා කියපු තවත් දෙයක් හින්දා ජින්ජර් ගේ හිත පුදුමාකාර විදිහට රිදුනා.

'ජින්ජර්... ඔය ළමයි දෙන්නා හොඳට පිරිසිඳු කරලා තියන්න. අද ඒ අයව එක්ක යන්න අම්මා එනවා.'

අම්මා ඒ වගේ රාජකාරියක් පවරපු එකින් තමන් ගේ අභිමානය පළුදු වුනා කියලයි ජින්ජර් විශ්වාස කරන්නේ. එමෙන්ම රස කැවිලි කන්න ඔවුන් විකුණනවා නම් අද හවසට පෙර ඒ දෙය කරන්න ඕනෑ කියලත් ජින්ජර්, විලියම් ට අවධාරණයෙන් ම කියා සිටියා.

විලියම් සහ ජින්ජර් නිවුන් සහෝදරයින් දෙදෙනා බලන්න යනකොටත් ඔවුන් තණපිටියේ වාඩිවෙලා සිහින් තණකොල ගලවාගෙන කනවා. මොවුන් කරන නොපනත් කම දිහා කෝපයෙන් බලා සිටි විලියම් නොසතුටු හඬකින් මෙහෙම කිව්වා.

'මේ අයට නම් වැඩිපුර සල්ලි දිලා ගන්න කවුරුවත් කැමැති වෙන එකක් නෑ. බලන්නකෝ. ජින්ජර්. මේ අය කරන දේ.'

'ඊයා... ඇත්තමයි. මේ යෝධයෝ දෙන්න නැති කරදර තමයි ඇති කරගන්නයි හදන්නේ.'

ජින්ජර් එහෙම කියද්දි විලියම් ගේ හිතට අපූරු අදහසක් පහල වෙමිනුයි තිබුනේ.

'මම කියන්න ද වැඩක් ජින්ජර්. අපි ඉන්නේ ගොඩාක් පරණ කාලෙක කියලා හිතමු. ඔයාට මතක ද මිස් ජෝන්ස් අපිට ඉතිහාස පාඩමක කිව්ව දේ ?. ඉස්සර හිටපු මිනිස්සු වහල්ලු විදිහට මිනිස්සු විකුණලා තියෙනවා. අපිත් මේ දෙන්න කාටහරි වහල්ලු විදිහට

sinhalaebooks.com



විකුණමු.'

විලියම් ගේ අදහස මොනතරම් අපූරුද කියනවා නම් ජින්ජර් ගේ දෑස් පුදුමාකාර සතුටකින් දිලිසෙන්න වුනා. හැබැයි එයාගේ හිතේ පුංචි කුකුසකුත් නොතිබුනා ම නොවේ. ජින්ජර් මේ විදිහට කිව්වේ ඒ නිසයි.

'මේ කොල්ලෝ දෙන්න වහල්ලු විදිහට ගන්න කවුද කැමැති වෙන්නේ ?. අනික මම දන්න තරම් වෙන කවුරුවත් මේ අය ගැන දන්නෙත් නැහැනේ.'

'ඔයානම් හරිම මෝඩයෙක් ජින්ජර්. මිනිස්සු මේ දෙන්නා ගැන දන්නේ නෑ තමයි. අපි ඒ අයට ඒ ගැන කියන්නෙත් නෑ. ගැනුම් කාරයින් මේ අයව කොහේ හරි තැනක තියලා පෙන්නමු. මේ කොල්ලෝ දැකපු ගමන් ඕනෑ කෙනෙක් සල්ලි වලට ගන්න කැමැති වෙයි.'

'හොඳයි බැරිවෙලාවත් අපි කියන ගාණට ගන්න අකමැති වුනොත්'

'අඩු ගාණකට හරි මේ අයව විකුණන්න බලමු.'

'හරි විලියම් එහෙම කරමු. මොනවද ඔට්ටු ?. අපි කියන ඕනෑම ගාණකට මේ අයව ගන්න ගණුදෙනු කාරයෙක් ඉදිරිපත් වෙයි.'

ජින්ජර් සතුටින් එහෙම කිව්වත් විලියම් නම් ඒ අදහසට කැමැති වුනේ නෑ.

'ඔයා කියන දේ වෙන්නේ නෑ ජින්ජර්. මේ අයට වැඩිපුර ගාණක් දෙන්න කවුරුවත් කැමැති වෙන්නේ නෑ. මේ අය තාම පොඩියි. වහල්ලු විදිහට වැඩ ගන්න නම් මේ අය තව ලොකු වෙන්න ඕනෑ. ඉතින් ගන්න කෙනාට සිද්ධ වෙන්නේ මේ අය



ලොකු වෙනකම් කන්න බොන්න දෙන්න. ඒ හින්දා අපිට මේ දෙන්නව ලොකු ගාණකට නම් විකුණන්න ලැබෙන්නේ නැතිවෙයි.'

විලියම් එහෙම කියද්දී ජින්ජර් ගේ මුහුණේ තිබුන හිනාව ආයේමත් මැකිලා ගියා.

'ඉතින් අඩු ගාණකට හරි මේ අයව ගන්න කවුරුහරි ඉදිරිපත් වෙයි ද විලියම් ?.'

'අපි උත්සාහ කරලා බලමු ජින්ජර්. හැබැයි මේ දවස්වල වහල් වෙළඳාම සිද්ධ වෙන්නේ නෑ කියලත් එදා ඉතිහාස පාඩමේදි අපිට කියලා දුන්නා. දැන් වහල් වෙළඳාම සම්පූර්ණයෙන් ම නතර කරලලු තියෙන්නේ.'

ජින්ජර් ගොඩාක් ගැඹුරු විදිහට විලියම් කියපු දේ ගැන හිතන්න පටන්ගත්තා. එයා ඉන්පසුව කිව්වේ මේ වගේ දෙයක්.

'හිත අධෛර්යය කරගන්න එපා විලියම්. ආයේමත් වහල් වෙළඳාම පටන් ගනිමු. අපිට ඒ වැඩේ කරන්න පුළුවන්. අනික මේ කොල්ලෝ දෙන්න දැකපු ගමන් ඕනෑම කෙනෙක් සල්ලිවලට ගන්න කැමැති වෙයි. මම කියන්නේ අඩු ගාණකට හරි ඒ අයව ගනියි.'

'හරි... ඔයා කියන දේ මට තේරෙනවා ජින්ජර්. හැබැයි මේ අයව විකුණුවාට පස්සේ ඔයා ඒ අයගේ අම්මට මොනවද කියන්නේ ?. අපි එයාගේ නිවුන් දරුවෝ දෙන්න සල්ලි වලට විකුණලා සීනි බෝල කෑවා කියල ද ඔයා කියන්න හිතාගෙන ඉන්නේ ?.'

........................................................................

ජින්ජර් දිගින් දිගටම කල්පනා කරන්න වුනා. එයාගේ හිතට කිසියම් අදහසක් පහල වුනේ ඔන්න එතකොටයි. එයා ඉක්මනින් ම තමන් ගේ අදහස ගැන විලියම් ට කිව්වා.

'විලියම්... කවුරු හරි මේ දෙන්නව පැහැරගෙන ගියා කියලා

sinhalaebooks.com



අපි ඒ අයගේ අම්මට කියමු. එතකොට කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැනේ.'

ජින්ජර් එහෙම කියද්දී විලියම් ගේ මුහුණත් සතුටින් ආලෝකමත් වුනා.

'අන්න ඒ අදහස නම් හොඳයි ජින්ජර්.'

විලියම් තමන් ගේ අදහසට අනුමැතිය පළකලාට පසුව ජින්ජර් නිවුන් සහෝදරයන් දෙදෙනා දිහාට හැරිලා ගොඩාක් හිතවත් විදිහට මෙහෙම ඇහුවා.

'ඔයාලා දෙන්නා වහල්ලු වෙන්න කැමැති ද ?.'

'අනේ අපි හරිම කැමැතියි. ඉක්මනට අපිව වහල්ලු කරන්න.'

වහල්ලු ගැන කිසිම දෙයක් නොදන හිටපු ජෝර්ජ් සහ ජෝන් එක හඬින් කිව්වා. සතුටු සිනාවක් මුවට නංවා ගන්නා ගමන් ම ජින්ජර් ආයේමත් විලියම් දිහාට හැරුනා.

'අන්න දක්ක ද විලියම්. ඒ අය වහල්ලු වෙන්න එක පයින් කැමැතියි. ඔයා මෙතැනම ඉන්න. මම ඕනෑකරන දේවල් ටික ලෑස්ති කරන්නම්.'

'ඔයා මේ වැඩේට හරිම උනන්දුයි වගේ ජින්ජර්. ඒ වුනත් මේ වැඩේ කොහෙන් කෙළවර වෙයිද කියලයි මම මේ කල්පනා කරන්නේ.'

තවත් විනාඩි කිහිපයකට පසුව ජින්ජර් විශාල දන්වීම් පුවරු දෙකකුත් අරන් ආපහු ආවා. ඒ දන්වීම් වල සඳහන් වෙලා තිබුනේ මේ වගේ වචන කිහිපයක්.

**මේ වහලා විකිණීමට තිබේ**

**ඔබත් ලාබෙට හිමිකර ගන්න**



එම දන්වීමේ ම අනිත් පැත්තේ සඳහන් වෙලා තිබුනේ මෙවැන්නක්.

**ලාබ කළ මිල**

**පැන්ස 6 1/2 යි**

ඊට පස්සේ ජින්ජර් මේ දන්වීම නිවුන් සහෝදරයින් දෙදෙනාගේ බෙල්ලේ එල්ලුවා. මේක අපූරු සෙල්ලමක් කියලා හිතපු නිසා දෝ ඔවුන් දෙදෙනා වෙතින් කිසිම විදිහක විරෝධයක් නම් පළවුනේ නෑ.

මේ හැමදේකටම පස්සේ ජින්ජර් සහ විලියම් වහල්ලුන් දෙදෙනාත් කැටුව පාර අද්දරට ගොස් නතර වෙලා බලාගෙන හිටියේ ගණුදෙනුකරුවන් පැමිණෙන තුරුයි. හැබැයි ඔවුන් ගේ වහල් වෙළඳාම හිතපු තරම් සාර්ථක වුනේ නෑ. ගොඩාක් වෙලාවක් බලාගෙන හිටියත් මිනිසුන් තුන් දෙනෙක් විතරයි ඔවුන් සිටින තැන පසුකරගෙන ගියේ. හැබැයි ඒ අය නම් නිකමටවත් වහලුන් දිහා බැලුවේ නෑ.

තමන් කරන්නට යන්නේ මොකක් ද කියලා ජින්ජර් විසින් නිවුන් සහෝදරයින් ට යාන්තම්වත් දනගන්න ඉඩ තිබ්බේ නෑ. ඒ හින්දා ඔවුනුත් මේ වැඩේට පුදුමාකාර විදිහේ ආසාවකින් සහභාගි වුනා.

බොහෝ වෙලාවක් ගත වුනා. හැබැයි නිවුන් සහෝදරයින් දෙදෙනා ව තවමත් අලෙවි කරගන්නට නම් විලියම් ට සහ ජින්ජර් ට හැකිවුනේ නෑ. දන් නම් ඔවුන් ට පුදුමාකාර විදිහට මහන්සියි. කොහොම වුනත් තවත් ටික වෙලාවකට පසුව මහළු මිනිසෙක්

sinhalaebooks.com



ඔවුන් සිටින පැත්තට ඇවිදගෙන ආවා. ඔහු ඇවිදින්නේ හරිම සෙමින්. අතින් කටින් බඩු මළු එල්ලාගත් මහළු මිනිසා සමීපයට පැමිණෙන තෙක් බලාගෙන සිටි විලියම් බලාපොරොත්තු පිරුණු හඬකින් මෙහෙම ඇහුවා.

'මහත්මයා... ඔයාට වහලෙක් එහෙම ඕනෑ ද ?.'

'මොකක් ද කිව්වේ ?.'

'ඔයාට වහලෙක් ඕනෑ ද කියලයි මම ඇහුවේ .'

'මට හරියට ඇහුනේ නෑ. ආයේත් කිව්වනම් බලන්න.'

'ඔයාට වහලෙක් එහෙම ඕනෑ ද ?.'

එවර නම් විලියම් බොහෝම සෙමින් ඒ වුනත් පැහැදිලිව මිනිසාගෙන් ඇහුවා. හැබැයි ඒ පාරත් මිනිසා ගේ ප්‍රතිචාරය සුබවාදි වුනේ නෑ.

'ළමයා... හයියෙන් කථා කරන්න. මම අන්ධයෙක් කියලා ඔයාට පෙනෙන්නේ නැද්ද ?. ඇත්තටම ඔයාලට මොනවද ඕනෑ ?. මට ඒ ගැන පැහැදිලිව කියනව ද ?.'

මිනිසා ගේ පිළිතුර අහපු ගමන් විලියම් ගේ හිත කඩා වැටුනා වගෙයි. ඒ වුනත් මේ අවස්ථාව මග හරින්න හොඳ නෑ කියලා හිතපු හින්දා එයා තවත් හයියෙන් බෙරිහන් දීලා මෙහෙම කිව්වා.

'ඔය මහත්මයා ට වහලෙක් ඕනෑ ද කියලයි මම ඇහුවේ.'

විලියම් ගේ කථාව අවසන් වෙනවාත් සමගම මහළු මිනිසා කෝපයෙන් බෙරිහන් දෙන්න වුනා.

'මම වහලෙන් වැටුන ද කියලා ඇහැව්වා. ඔයාලා නම් පුංචි වුනත් හරිම තපුරු කොල්ලෝ දෙන්නෙක්. අන්ධ මිනිහෙක්



වුන මටත් ඔයාලා විහිළු කරනවනේ.'

කෝපයෙන් එහෙම කියපු අන්ධ මිනිසා එයා අතේ තිබුන සුදු සැරයැටියෙන් විලියම් පහරක් එල්ල කෙරුවා. ඊට පස්සේ එයා මොනවාදෝ මුමුණමින් යන්න ගියා.

සිද්ධ වුන දේ හින්දා විලියම් ගේ හිත පුදුමාකාර විදිහේ කම්පනයක් දැනෙනවා. එයා තමන් ගේ මිතුරු ජින්ජර් දිහාට හැරිලා මෙහෙම කිව්වේ ඒ නිසයි.

'ජින්ජර්.. මෙතැන ඉඳලා නම් වැඩේ කරන්න බැරිවෙයි. ඒ හින්දා අපි වහල්ලු දෙන්නවත් අරගෙන මිනිස්සු වැඩිය ඉන්න තැනකට යමු.'

විලියම් ගේ යෝජනාව අහපු ගමන් නිවුන් සහෝදරියෝ දෙන්නා සතුටින් බෙරිහන් දෙන්න වුනා. තවත් අළුත් තැනකට ගොසින් මේ සෙල්ලම කරන්නට ලැබුන එක ගැන ඔවුන් දෙදෙනාටම හරිම සතුටුයි. ඒ හින්දා ජෝර්ජ්, ජින්ජර් ගේ අතකින් අල්ලා ගත්තා. විලියම්, ජෝන් ගේ අතින් අල්ලාගෙන ඉදිරියට කැඳවාගෙන ගියා. මේ වනවිටත් වහලුන් දෙදෙනා ඔවුන් ගේ දැන්වීම් පුවරුත් පිටේ එල්ලාගෙනයි හිටියේ. ඒ අතර ජින්ජර්, විලියම් කණට කර රහසින් මෙහෙම කිව්වා.

'අපි වෙන පාරකින් යමු. එහෙම කළාම බැරිවෙලාවත් මේ අය ආපහු එන්න හැදුවොත් පාර මතක නැතිවෙයි.'

ඉන්පසුව පිරිස ගමන් කලේ නියමිත පාර මඟ හරිමින් අතුරු පාරවල් ඔස්සේ ය. විලියම් කථා කරන තුරුම ඔවුන් නිහඬවම ඉදිරියට ගමන් කෙරුවා.

'අපි ඉස්සර වෙලාම හම්බ වෙන ගේ ළඟට යමු.'

විලියම් එහෙම කිව්වත් එයාගේ කටහඬෙහි කිසියම් ප්‍රාණවත්

sinhalaebooks.com



බවක් නම් ගැව්ලාවත් තිබුනේ නෑ. මොකද මේ කරන වැඩේ භයානක කම ගැන ඔහු හොඳින් ම දන්නවා. සීනි බෝල කන්න සල්ලි නැති හින්දයි මේ වැඩේ කරන්න ඔහු ජින්ජර් ට කැමැත්ත දුන්නේ. කොහොම වුනත් නිවස අසලට පැමිණි ඔවුන් ගේට්ටුවත් ඇරගෙන ම ගෙවත්ත දිගේ නිවස දිහාට සෙමෙන් සෙමෙන් ඇවිදගෙන ගියා. වහල්ලු දෙදෙනාත් කිසිම කථාවක් නොමැති ව ඒ වුනත් හරිම සතුටින් ඔවුන් සමග ඇවිදගෙන එනවා. ගෙදර ඉස්සරහා දොර ළඟට පැමිණියාට පසුව ජින්ජර් වෙවුලන හඬින් විලියම් ට මෙහෙම කිව්වා.

'විලියම්... මේ ගෙදර අයට ඔයා කථා කෙරුවොත් තමයි හොඳ. මොකද මට වඩා ඔයාට හොඳට කථා කරන්න පුළුවන් නේ.'

'ඔව්... හැම එකකටම මම කථා කෙරුවොත් හොඳයි. අනික ඔයාට වඩා මට කථා කරන්න පුළුවන් කියලා ඔයා හිතන එකත් හොඳයි. අන්න ඒ හින්දා මම කථා කරනකම් ඔයා පැත්තකට වෙලා සද්ද නැතිව ඉන්න ඕනෑ. තේරුනා ද ජින්ජර් ?.'

එහෙම කියන ගමන් ම පිරිස ඉදිරිපස දොර අසලට ළංවුනා. දොර වසා ඇත. ඒ වුනත් දොර ළඟම ලොකු කිරි ජෝගුවක් තබා තිබෙන හැටිත් ඔවුන් දැක්කා.

'මම හිතන විදිහට නම් ගෙදර අය එළියට ගිහිං. ඒකනේ මේ කිරි ජෝගුවක් දොර ළඟ තියලා තියෙන්නේ.'

ජින්ජර් එහෙම කියද්දී විලියම් ද වටපිට විපරම් කරන්න වුනා. ඔහු ජින්ජර් දිහාට හැරිලා මෙහෙම කිව්වේ ඉන් පසුවයි.

'ඔව්... ගෙදර අය එළියට ගිහිං. ඔන්න ජින්ජර්. ඔයා කැමැති නම් මේ කිරි ජෝගුවට කථා කරන්න. ඒකට කථා කරන්නත් බැරිනම් නිකා ඉන්න.'



විලියම් ගේ සමච්චල් සහගත කථාව ඇහුන සැනින් ම ජින්ජර් ගේ මුහුණ කෝපයෙන් කළු වුනා. ඔහු මෙහෙම කිව්වෙත් සඟවාගත් කෝපයෙන් යුතුවයි.

'ඔයා නුවණක්කාරයෙක් කියලද හිතන්නේ විලියම් ?. හරි... එහෙම නම් මේ විදිහට වහල්ලු විකුණලා සීනි බෝල කන්න සල්ලි හොයමු කියලා මුලින් ම යෝජනා කෙරුවේ කවුද කියලා කියන්න බලන්න. මහ ලොකු නුවණක්කාරයාට ඒවගේ දෙයක් වත් යෝජනා කරන්න බැරිවුනා.'

'අනේ ජින්ජර්... ඔයාගේ මහ ලොකු යෝජනාවෙන් ඇති වැඩක් නෑ. මේ වහල්ලු දෙන්නා ගන්න කවුරුවත් කැමැති වෙන එකක් නෑ. අපි මේ කවුරුවත් නැති ගෙයක් ළඟට ඒ අයව එක්ක ගෙන ඇවිත් නිකං තර්ක කරකර ඉන්නවා. ඒකද ඔයාගේ මහ ලොකු යෝජනාව ?.'

විලියම් ගේ සහ ජින්ජර් ගේ තර්ක කිරීම දැන් මහා ලොකු ඝෝෂාවක් බවට පත්වෙලයි තියෙන්නේ. ඒ අයට කරන්නට පැමිණි දෙයත් අමතක වෙලා. ඔන්න එතකොටම තමයි නිවුන් සහෝදරයින් ගෙන් කෙනෙක් වන ජෝර්ජ් උස් හඬින් මෙහෙම ඇහුවේ.

'මම කරන දේ නතර කරන්න ඔයාලට හිතෙන්නේ නැද්ද?.'

ජෝර්ජ් එහෙම කියද්දී විලියම් කෝපයෙන් වගේ ඔහු දිහා බලාගෙන හිටියා. ඉන්පසුව ඔහු දොර ළඟ තියෙන විදුලි සීනුවේ බොත්තම දිගටම ඔබාගෙන හිටියා. විදුලි සීනුව මහා හයියෙන් නාද වෙන්න පටන්ගත්තා. සීනුවේ නාදය නිවස ඇතුළේ දෝංකාර දෙමින් ඇසුනත් එය තුළ සිටින කවරෙක් හෝ ඉදිරිපස දොර ළඟට නම් පැමිණියේ නෑ.

'මේ ගෙදර මිනිස් පුළුටක් වත් නෑ කියලා මම කිව්වේ ඒ නිසා තමයි.'

sinhalaebooks.com



එහෙම කියන ගමන් ම විලියම් නිකමට වගේ කිරි ජෝගුව තබා තිබෙන තැන බැලුවා. එයාගේ ඇස් පුදුමයෙන් මහත් වුනේ ද එතකොටමයි.

'ෂා... නියම වාසනාවක් නේ.'

විලියම් එහෙම කියන ගමන් ම කිරි ජෝගුව ළඟ තබා තිබුන කාසිය අතට ගත්තා. ඔහු ගේ දෑස දීප්තියෙන් බැබැලෙනවා. තවත් ටික වෙලාවකට පසුව තමන් ගේ දීප්තිමත් දෑස නිවුන් සහෝදරයන් දෙසට යොමු කරන ගමන් ම විලියම් මෙහෙම කිව්වා.

'ඔන්න අපිට මේ අයගේ වටිනාකම හම්බ වුනා. හැබැයි අද අපේ ගණුදෙනුව අතින් පාඩුයි. අපේ වහල්ලු මේ තරම් ලාබයි කියලා මම නිකමටවත් හිතුවේ නෑ.

හැබැයි ජින්ජර් නම් කථා කරන්න වුනේ කිසියම් දෙගිඩියාවක් ද හිතේ තියාගෙනයි.

'ඒ වුනත් විලියම්... මේ ගෙදර අයට අපේ වහල්ලු ඕනෑ ද කියලා අපි හරියටම දන්නේ නැහැනේ.

'ඒ ගැන සැක කරන්න එපා ජින්ජර්. මේ අයට අපේ වහල්ලු ඕනැමයි. අනික මේ තරම් හොඳ වහල්ලු දෙන්නෙක් හිතන්නත් බැරි තරම් අඩු මුදලකට ලැබුන එක ගැන ඒ අය ගොඩාක් සතුටු වෙයි. මොනවද ඔට්ටු ?. මේ වහල්ලු දෙන්නා සෑහෙන කාලයක් බලාගත්තට පස්සේ පවුම් වලින් ඒ අයට මිල නියම කරන්න මේ ගෙදර අයට පුළුවන්.'

විලියම් ගේ කථාව හමාර කරන්නුට අවස්ථාවක් ලබා නොදීම ගේට්ටුවෙන් ඇතුළුවුන කිරි ගෙනියන කොළුවා ඔවුන් සිටි තැනට ආවා. විලියම් පුදුමාකාර ඉක්මනින් ම අතේ තිබුන කාසිය සාක්කුවට ඔබාගත්තා.



'හලෝ ළමයි...'

කිරි ගෙනියන කොළුවා හිතවත් විදිහට එහෙම කියද්දී විලියම් හිනාවුනේ යාන්තමට වගේ. ඇත්තටම කිරි භාජනය ළඟ තබා තිබුනේ කිරි ජෝගුවට ගෙවිය යුතු මුදලයි. හැබැයි දැන් ඒ මුදල තියෙන්නේ විලියම් ගේ සාක්කුවේ කියලා කිරි ගෙනියන කොළුවා දනගෙන හිටියේ නෑ. ඒ අතරම කිරි ගෙනියන කොළුවා පුදුමාකාර හඬිසියකින් මෙහෙම කිව්වා.

'හලෝ ළමයි... ඔයාලා මේ ගෙදර ද ඉන්නේ ?. එහෙමනම් හොඳයි. අද ගෙදර අයට මගේ කිරි ජෝගුවට සල්ලි තියලා යන්න බැරිවෙලා. පොඩ්ඩක් ඒ අයට සල්ලි ගැන මතක් කරනව ද ?.'

එහෙම කියපු කිරි කොළුවා බයිසිකලයත් පැදගෙන නිවසින් පිටවෙලා ගියා. කොළුවා නොපෙනී ගියාට පසුව නිවුන් සහෝදරයින් ගෙන් කෙනෙක් වන ජෝන් මහා හයියෙන් බෙරිහන් දුන්නා.

'අපි කරන දේ නතර කරන්න ඕනෑද ?.'

එතකොටම ජෝර්ජ් ගේ කටහඬත් ඇහුනා.

'අපි කරන දේ නතර කරන්න ඕනෑ ද ?.'

නිවුන් සහෝදරයින් දෙදෙනා මාරුවෙන් මාරුවට බෙරිහන් දෙනකොට විලියම් ඔවුන් දිහා උනන්දුවෙන් බැලුවා. ඔන්න එතකොට තමයි එයාට අපූරු අදහසක් පහළ වුනේ.

'හරි... හරි... ළමයි කළබල වෙන්න එපා. ඔයාලා කැමැති නම් මේ අපූරු කිරි ජෝගුව ම බොන්න.'

විලියම් එහෙම කියනවත් එක්කම නිවුන් සහෝදරයන් දෙදෙනා කිරි ජෝගුවට පොර කන්න පටන්ගත්තා. ඔවුන් දෙදෙනා මොනතරම් කළබල වෙලා ද කියනවා නම් ජෝගුවෙන් ඉහිරුන කිරි ඒ අය පැළැඳගෙන සිටි දුන්වීම වල වගේම ඇඳගෙන හිටපු

sinhalaebooks.com



ඇඳුම් වලත් තැවරුනා. කොහොම වුනත් මේ කළබලය අස්සෙම විශාල කිරි ජෝගුවම නිවුන් සහෝදරයින් දෙදෙනා අතර බෙදිලා ගියා. ඒ අතර විලියම් ඉක්මනින් ම ජින්ජර් දිහාට හැරිලා මෙහෙම කිව්වා.

'ජින්ජර්... ඉක්මන් කරන්න. අපි දැන්ම ම ගිහිං මේ සිලිමටම රස කැවිලි ගනිමු. ඊට පස්සේ ඇවිත් පොඩි එවුන් දෙන්නා එක්ක යමු.'

විලියම් ගේ අදහසට නිවුන් සහෝදරයින් දෙදෙනාත් එක පයින් ම කැමැති වුනා. ඊට පස්සේ තමයි විලියම් සහ ජින්ජර් ඉක්මන් ගමනින් රස කැවිලි කඩය දිහාට ඇවිදගෙන යන්න පටන්ගත්තේ. මේ වනවිටත් නිවුන් සහෝදරයින් දෙදෙනා නිවසේ එළිපත්ත උඩ වාඩිවෙලා එකිනෙකාට විහිළු කරනවා. ඔවුන් පැළැඳගෙන ඉන්න දැන්වීම් පුවරු කිරි වලින් තෙතබරිත වෙලා තිබුනත් ඒවායේ ලියා තිබුන අකුරු නම් තවමත් හොඳින් පෙනෙන්නට තිබුනා. විලියම් සහ ජින්ජර් පාර දිගේ තව ටිකක් දුර ඇවිදගෙන ගියා. හදිසියේම ජින්ජර් ගේ කම්පනයෙන් පිරුණු කටහඬ විලියම් ට ඇහුනා.

'විලියම්... ඇත්තටම අපි කරපු වැඩේ හරිද ?.'

'ඔයා මොනව කියනව ද කියලා මට හිතාගන්න බෑ ජින්ජර්. මේ වැඩෙන් අපිට පාඩුයි කියලා හිතෙන්නේ නැද්ද ?. අපි වහල්ලු දෙන්නා විකුණන්න හිතාගෙන හිටියේ එක්කෙනෙක් පැන්ස හය හමාරකට. ඒ වුනත් අපිට දැන් ලැබිලා තියෙන්නේ එකම එක සිලිමක් විතරයි. අතින් පාඩු විඳගෙන බිස්නස් කරනකොට හොඳ නරක ගැන වැඩිය හිතන්න බෑ.'

අහම්බෙන් හම්බ වුන සිලිමෙන් රස කැවිලි ගොඩාක් ගන්නට විලියම් ට සහ ජින්ජර් ට පුළුවන් වුනා. ලිකෝරයිස්, බුල්ස් අයි සහ සර්ප්‍රයිස් පැකැට් දෙකක් ම ගන්නටත් ඔවුන් ට හැකිවුනා.



මේ තරම් රසවත් සීනි බෝල තොගයක් ම ,භුක්ති විඳිමින් සිටි නිසා කාලය ගතවෙලා යන බවක් ඔවුන් ට දැනුනේ නෑ. ඇත්තටම ඒ ගැන මුලින් ම විලියම් ට සිහිපත් කෙරුවේ ජින්ජර් විසිනුයි.

'විලියම්... අපි හොඳටම පරක්කු වෙලා. අපි දැන්ම ම ගිහිං අර කොළුවෝ දෙන්නා ආපහු එක්ක ගියොත් හොඳයි. මොකද ඒ අයගේ අම්මා දැනටමත් ඇවිත් ඇති.'

ජින්ජර් ගේ කථාවත් සමග විලියම් ඔහුත් සමග හනි හනික නිවුන් සහෝදරයින් දෙදෙනා නතර කොට සිටි නිවස කරා දුවන්නට පටන්ගත්තා. ඒ අතරම ඔහු ජින්ජර් දිහාට හැරිලා මේ විදිහට කියන්නත් අමතක කෙරුවේ නෑ.

'ජින්ජර්... අපිට ඒ දෙන්නව කිසිම කරදරයක් නැතිව ආපහු එක්ක යන්න පුළුවන් වෙයි නේද ?.'

'ඔව් විලියම්. ඒ ගැන බයවෙන්න දෙයක් නෑ.'

ජින්ජර් ඒ වගේ දෙයක් කිව්වේ හිත රවටාගන්නටයි. මොකද මේ වනවිටත් නිවුන් සහෝදරයින් දෙදෙනා ගේ අම්මා පැමිණ සිටින්නට හැකිය. එසේ නම් තත්ත්වය වඩාත් භයානක වෙන බවටද කිසිම සැකයක් ද නැත.

ටික වෙලාවකින් විලියම් සහ ජින්ජර් ඔවුන් කලින් සිටි නිවසේ ගේට්ටුවෙන් ඇතුළු වෙලා නිවස දිහාවට දුවන්න වුනා. ඔවුන් ගේ හදවත් කඩා වැටුනේ ඉබේටම වගෙයි. නිවසේ දොර ළඟ වාඩි වී සිටි නිවුන් සහෝදරයින් දෙදෙනා පෙනෙන්නටත් හිටියේ නෑ. කඩා බිඳ දැමූ කිරි බඳුන පමණක් දොරකඩ විසිරී තිබේ. ළමුන් දෙදෙනා අතුරුදහන් ව ඇති බව වටහාගත් නිමේශයේදීම විලියම් ගේ සහ ජින්ජර් ගේ හදවත් පුදුමාකාර බියකින් ගැහෙන්නට වුනා.

'කෝ... ඒ දෙන්නා අතුරුදහන් වෙලා නේද ?. අපි ඉක්මන්

sinhalaebooks.com



කරලා ඒ අයව හොයන්න පටන්ගනිමු. එහෙම නැතිනම් මහා විනාශයක් තමයි සිද්ධ වෙන්නේ.'

ජින්ජර් එහෙම කියන ගමන් ම නිවසේ ඉදිරිපස විදුලි සීනුව නාද කෙරුවා. සීනුවේ හඬ නිවස තුළ දෝංකාර දෙමින් මැකී ගිය ද කිසිවෙකු ගේ හෝ ඡායාවක්වත් නිවස තුළින් මතුවූයේ නැත. විලියම් ගේ මුහුණ කළු වී තිබේ. නළල රැළි වෙලා ය. නිවුන් සහෝදරයින් දෙදෙනා ඉක්මනින් ම සොයා නොගත හොත් තමන් ට මුහුණ දෙන්නට සිදුවෙන භයානක අවස්ථාව සිහිපත් වෙද්දි විලියම් ගේ සිත පුරා මහා බියක් ද තැවරෙන්නට විය. ඒ අතරම ජින්ජර් ගේ බියපත් කටහඬ ද විලියම් ඇසිත.

' විලියම්... අපි දැන් මොකද කරන්නේ ?. කිසිම සැකයක් නෑ ඒ කොල්ලෝ දෙන්නා මේ අහල පහලම ඇති. අනේ අපි ඉක්මන් කරලා ඒ අයව හොයමු.'

'හොඳයි ජින්ජර්... ඒ වුනත් මේ සිද්ධ වුන දේ ගැන ඔයා ඒ ළමයින් ගේ අම්මට කියන්න ද හිතාගෙන ඉන්නේ ?.'

ඉන්පසුව විලියම් සහ ජින්ජර් නිවස වටේමත් , ගෙවත්ත පුරාමත් නිවුන් සහෝදරයින් සොයා ඇවිද්දා. ඒ අතරම ඔවුන් හඬ නගා 'ජෝර්ජ්','ජොනි' යනුවෙන් බෙරිහන් දෙමින් ළමුන් ට අඬ ගසන්නත් අමතක කෙරුවේ නෑ. හැබැයි මොනතරම් හෙව්වත් ළමුන් දෙදෙනා ගේ සේයාවක්වත් හමුවුනේ නෑ. තවත් සැහෙන වෙලාවකට පසුව විලියම් සහ ජින්ජර් බලාපොරොත්තු බිඳුන සිත් වලින් යුතුව නැවතත් ගේට්ටුව දෙසට ඇවිදගෙන එන්න වුනා.

'විලියම්... අපි දැන් මොකද කරන්නේ ?.'

ජින්ජර් ගේ කටහඬ බියෙන් මුසපත් වෙලා ය. විලියම් ඔහුට දුන්නේ කෙටි පිළිතුරකි.

'අපිට කරන්න කිසිම දෙයක් නෑ ජින්ජර්.'



ටික වෙලාවකට පසුව ඔවුන් ඉතාමත් ම සෙමින් පාර දිගේ නිවෙස කරා ඇවිද යන්නට වුනා. ඒ අතර විලියම් ගේ හැගීමක් නැති කටහඬ ජින්ජර් ට ඇහුනා.

'ඒක නෙවෙයි ජින්ජර්. සිද්ධ වුන දේ ගැන ඔයා ඒ ළමයින් ගේ අම්මට කියනව ද ?. ඔයාට බැරිනම් කියන්න. මම ම ඒ ගැනත් කියන්නම්.'

ජින්ජර් ගේ මුහුණ මලානික වී ගොසිනි. ඔහු විලියම් ට පිළිතුරක් දෙන්න ඉදිරිපත් වුනේ තවත් සැහෙන වෙලාවකට පසුවයි. ජින්ජර් ගේ කටහඬ ට හැඬුම් බර බවක් පැමිණ තිබෙන බවත් විලියම් ඒ වෙලාවේ වටහාගත්තේ ය.

'හොඳයි විලියම්... මම ඒ ගැන කියන එක භාරගන්නම්. මොකද දැනටමත් ඔයා සැහෙන වෙලාවක් කථා කරලා තියෙනවා නේ. ඔයා තවත් මහන්සිවෙන්න ඕනෑ නෑ. මම මේ කථාව නිවුන් ළමයින් ගේ අම්මට කියන්නම්.'

මේ කථාවෙන් පසුව සැහෙන වෙලාවක නිහඬතාවයක් ඔවුන් දෙදෙනා අතර මෝරා වැඩුනි. ඒ නිහඬතාවය බිඳුනේ ජින්ජර් ගේ කටහඬින්.

'මොනදේ සිද්ධ වුනත් අපිට ඇති තරම් සීනි බෝල කන්න ලැබුන එක නම් ලොකු දෙයක් නේද විලියම් ?.'

ජින්ජර් එහෙම කිව්වත් විලියම් නම් කිසිම දෙයක් කියන්න ගියේ නෑ. සීනි බෝල මොනරම් රසවත් වුනත් තවත් මොහොතකින් තමන් ට මුහුණ දෙන්න සිදුවෙන දේවල් නම් ඉතාම අමිහිරියි කියලා එයාට හොඳටම වැටහෙනවා. විලියම් කිසිම දෙයක් නොකියාම ඉදිරියට ඇවිදගෙන ගියේ ඒ නිසයි.

තවත් ටිකකින් විලියම් සහ ජින්ජර් නිවස ආසන්නයේම තිබෙන වංගුවක් අසලම පැමිණියා. දිග ගවුමක් වැනි කබායක් හැඳ

sinhalaebooks.com



සිටි කාන්තාවක් පුදුමාකාර වේගයකින් ඔවුන් වෙතට දුවගෙන ආවේ එතකොටමයි. ඇය දුටු විගසම ජින්ජර් බියෙන් හඬන්නාක් වැනි හඬකින් කෙඳිරි ගාන ආකාරය විලියම් ට ඇහුනා.

'විලියම්... ඔය එන්නේ නිවුන් ළමයින් ගේ අම්මා.'

ඔවුන් දෙදෙනා ඉදිරියට ආ කාන්තාව කිසිම ගරු සරුවක් නැති කෝපාන්විත හඬකින් මෙහෙම ඇහුවා.

'කෝ... මගේ නිවුන් දරුවෝ දෙන්නා ?.'

කාන්තාවගේ කටහඬ ඇහුන ගමන් ම තමන් පොළව යටට කිඳා බසින්නාක් වැනි සිතිවිල්ලක් විලියම් ගේ සිතට දැනුනා. එයා බියෙන් බිම බලාගෙන සිටිද්දී කාන්තාව පෙරටත් වඩා කෝපයෙන් බෙරිහන් දුන්නා.

'මම අහන්නේ. කෝ මගේ ළමයි දෙන්නා ?.'

ජින්ජර් මේ වනවිටත් බියෙන් වෙවුලනවා. ඒ නිසා කාන්තාවට පිළිතුරු දෙන්න සිද්ධ වුනෙත් විලියම්ට මයි.

'ඇත්තම කියනවා නම් ඒ අය ඉන්නේ කොහෙද කියලා කියන්න දන්නේ නෑ. මොකද අපි ඒ අයව වහල්ලු විදිහට විකුණුවා.'

..............................................

ඇත්තටම මේ වනවිට නිවුන් සහෝදරයින් ට සිද්ධ වෙලා තිබුනේ මොකක් ද දන්නව ද ?. විශාල කිරි ජෝගුවක් ම බිව්ව නිසා ඔවුන් දෙදෙනාටම තද නිදිමතක් දැනෙන්න වුනා. ඒ හින්දා ඔවුන් දෙදෙනා එකිනෙකා ගේ උරහිස් මත ඔලුව තියාගෙන දොරකඩ හොඳටම නිදාගන්න වුනා. හැබැයි ඒ අයට මේ විදිහට නිදාගෙන ඉන්න ලැබුනේ විනාඩි කිහිපයක් විතරයි.

තරුණයෙක් ඇවිත් ඔවුන් ගේ උරහිස් වලින් සොලවද්දී තමයි නිවුන් සහෝදරයින් දෙදෙනා තින්දෙන් පිබිදුනේ. තරුණයා



සමග තරුණ කාන්තාවන් දෙදෙනෙකුත් ඉන්න හැටි ඔවුන් දැක්කා. ඒ කාන්තාවන් දෙදෙනාගෙන් කෙනෙක් උස කෙට්ටු කෙනෙක්. අනිත් කෙනා මිටි මහත කාන්තාවක්.

'ළමයි... ඔයාලා කොහෙද ඉන්නේ ?.'

එක කාන්තාවක් එහෙම අහද්දී ජෝර්ජ් හයියෙන් හිනාවෙලා මේ වගේ උත්තරයක් දුන්නා.

'අපි ඉන්නේ මෙහෙනේ.'

කුඩා කොළුවාගේ උත්තරය අහපු ගමන් තරුණ මිනිසා අතක් ඔසවලා නළල පිස දමාගත්තා.

'දෙවියන් ට ස්තුති වෙන්න. මේ දෙන්නා ගේ ඇතුළට ගිහිං නෑ කියලා මට හිතෙනවා. එහෙම වුනා නම් හැමදෙයක් ම ඉවරයි.'

උස කාන්තාව ළමයි දෙන්නා දිහා බලාගෙන හිටියේ මැඩගත් කෝපයකින් යුතුවයි. ඒ අතරම ඇය මේ වගේ දෙයකුත් කිව්වා.

'මේ අයගේ කථාව නම් අමුතුයි. සමහර විට ඒ අය කියන දේවල් වල වෙන මොනව හරි අදහසක් තියෙන්නත් පුළුවන්.'

ඒ අතර තරුණයා දොරේ අගුල් දෙසත් බිම වැටී බිඳී ගොස් තිබෙන කිරි ජෝගුව දෙසත් විපරමින් බලා හිඳ දොර ඇරගෙන නිවසට ඇතුළු වුනා. ඔහුට පිටුපසින් උස කාන්තාව, මිටි කාන්තාව සහ ජෝර්ජ් සහ ජෝන් දෙදෙනා ද නිවසට ඇතුළු වුනා. ඒ අතරම තරුණයා විමසිලිමත් හඬකින් නැවතත් මෙහෙම කිව්වා.

'මම දොරේ අගුල හොඳට දමලා තිබුන හින්දා මේ අයට ගෙට ඇතුළු වෙන්න පුළුවන් වෙන්න නැතිව ඇති.'

ඒ අතරම ඇහුනේ මිටි කාන්තාවගේ කටහඬයි.

'ඇත්තටම මේ ළමයි මෙහාට එක්ක ආවේ කවුද කියලයි

sinhalaebooks.com



අපි හොයන්න ඕනෑ. ඒ කෙනා කවුද කියලා ඔයාට හිතාගන්න බැරි ද ?.'

ඔන්න එතකොටම තමයි ජෝන් මේ කථාවට මැදිහත් වුනේ.

'අපි වහල්ලු. තව ටිකකින් විලියම් ඇවිත් අපිව එක්ක යයි.'

'මගේ දෙයියනේ... ඒක නම් ඒතරම් හොඳ දෙයක් නෙවෙයි.'

තරුණයා පුදුමයෙන් බෙරිහන් දෙද්දී එක් කාන්තාවක් නිවුන් සහෝදරයින් ගේ පිටේ එල්ලා තිබුන දන්වීම කියවන්න වුනා.

'වහල්ලු... පැන්ස හය හමාරයි. සමහර විට ඒක හොරුන් ගේ මොකක් හරි රහස් සංකේතයක් වෙන්න පුළුවන්. මගේ දෙයියනේ... අපි මංකොල්ල කාරයින් ගේ උගුලකට අහුවුනා වද්ද ?. කෝකටත් පරක්කු වෙන්නේ නැතිව මේ ළමයි දෙන්නව ආචාර්ය බර්නාඩෝ ගේ ගෙදරට එක්ක ගියොත් හොඳයි කියලා මට හිතෙනවා.'

'හැබැයි මේ අයට වැඩි වෙලාවක් පරක්කු වෙන්න බැරි වෙයි. ළමයි... ඔයාලට තව ටික වෙලාවක් අපිත් එක්ක ඉන්න පුළුවන් ද ?.'

මිටි මහත කාන්තාව ගොඩාක් හිතවත් විදිහට එහෙම ඇහුවත් නිවුන් සහෝදරයින් නම් ඒ අදහසට කැමැත්තක් දක්වූයේ නෑ. ජෝර්ජ් නොඉවසිලිමත් හඬකින් මෙහෙම කිව්වෙත් ඒ නිසාමයි.

'බෑ... අපි වහල්ලු. අපිට එක්ක යන්න විලියම් තව ටිකකින් එයි.'

'හරි... මට දැන් හැමදෙයක් ම තේරෙනවා. මේ කියන විලියම් තමයි මංකොල්ල කණ්ඩායමෙ නායකයා. ගෙට ඇතුළු වෙන්න ක්‍රමයක් හොයාගන්න හිතාගෙන මිනිහා මේ ළමයි දෙන්නා කල්



ඇතිව එවන්න ඇති.'

කෙට්ටු, උස කාන්තාව සිහින් හඬින් බෙරිහන් දෙද්දී ජෝන් ගේ හැඬුම්බර කටහඬ ඇහුනා.

'මට නම් දැන් හොඳටම බඩගිනියි.'

වැඩිවෙලාවක් යන්න ඉස්සර වෙලා කරුණාවන්ත මිටි මහත කාන්තාව නිවුන් සහෝදරයින් දෙදෙනා ට විශාල කෑම භාජනයක් ගෙනැත් දුන්නා. ඔවුන් දෙදෙනා කෑම භාජනයට කඩා පැන්නේ ගොදුරකට ඇදෙන කොටියන් දෙදෙනෙක් වගෙයි. පොරකමින්, බෙරිහන් දෙමින් නිවුන් සහෝදරයින් කෑම බඳුනට පොරකද්දී තරුණ ගැහැණුන් දෙදෙනා ශබ්දය දරාගන්න බැරිව අත්වලින් කන් වසාගත්තා. ඒ අතර තරුණයා ඉක්මනින් ම මුළුතැන්ගේ දෙසට දුවගෙන ගියේ නිවුන් සහෝදරයින් ට තවත් කෑම ටිකක් ගෙනැවිත් දෙන අදහසින්.

'කොහෙද මේ ගෙදර ගබඩා කාමරය තියෙන්නේ ?. මේ කොල්ලෝ දෙන්නට තව කෑම දුන්නේ නැතිනම් උන් අපිවත් කයි.'

'දෙයියනේ... ඔයා කියන කිසිම දෙයක් මට ඇහෙන්නේ නැහැනේ.'

උස කෙට්ටු කාන්තාව එහෙම කියලා තවත් හයියෙන් කන් දෙක වසාගත්තා. ඒ අතර තරුණයා නැවතත් ආපහු ආවේ පැණි සහ ජෑම් පිරුණ බඳුන් දෙකකුත් දෑතට අරගෙනයි. ඉන්පසුව තරුණයා පැණි සහ ජෑම් බඳුන් දෙක නිවුන් සහෝදරයින් ගේ අතට දුන්නා. මේ අපූරු කෑම දැකපු ගමන් ඔවුන් ගේ බෙරිහන් දීම තවත් වැඩිවුනා මිසක් ටිකක්වත් අඩුවුනේ නම් නෑ. කාන්තාවන් දෙදෙනා නැවතත් අත්වලින් කන් වසාගනිද්දී තරුණයා කරකියා ගන්න දෙයක් නැතිව තළල පිසදමාගත්තා.

'මට නම් තවත් මේ කරදරය ඉවසන්න බෑ. මම මේ ගෙදරට

sinhalaebooks.com



ආවේ නිවි හැනහිල්ලේ වැඩ කරන්න හිතාගෙන. මේ කරදරකාර කොල්ලෝ තව දුරටත් මෙහේ ඉන්නවා නම්. මට කිසිම වැඩක් කරගන්න ලැබෙන්නේ නෑ.'

කරදරය ඉවසන්න බැරිම තැන තරුණයා චෝදනාත්මක විදිහට එහෙම කියද්දී උස කෙට්ටු කාන්තාව ඔහුව සනසවන්න උත්සාහ කෙරුවා.

'බැණෝ... කළබල වෙන්න එපා. අනික ඔයා නැතිව අපිට විතරක් මේ ගෙදර ඉන්නත් බැහැනේ. අපි ටිකක් ඉවසලා බලමුකෝ.'

'නැත්දේ. ඔයා නම් ගොඩාක් හොඳ කෙනෙක්. හැබැයි මේ වෙලාවේ නම් ඔයාගේ කරුණාවන්ත කම ගැන මට සිහින මවන්න විදිහක් නෑ.'

තරුණයා එහෙම කියද්දී කෙට්ටු කාන්තාව ස්ථිර හඬකින් මේ වගේ උත්තරයක් දුන්නා.

'ඇත්තටම මම අදම ආපහු යන්න හිතාගෙනයි ආවේ. කොහොම වුනත් මම යන්න ඉස්සර වෙලා මේ කොළු ගැටවුන් ගේ අබිරහස විසඳලා ම යන්නම්.'

එහෙම කියන ගමන් ම කෙට්ටු කාන්තාව නිවුන් සහෝදරයින් ගේ පිටේ එල්ලා තිබුන දැන්වීම දිහා නැවතත් අවධාරණයෙන් බලා සිටියා. ඇය කථා කරන්න වුනේ තවත් විනාඩි කිහිපයකට පමණ පසුවයි.

'මේ දැන්වීම දිහා බලද්දී මට මහ අමුත්තක් දැනෙනවා. මේක ලියලා තියෙන්නේ රහස් සංඥා භාෂාවකින්. මොනව හරි රහස් පණිවුඩයක් කියන එක නම් සහතිකයි.

'ඒත් කවුද මේ විදිහේ පණිවුඩයක් අපිට එවන්නේ ?.'

මෙතෙක් වෙලාවක් නිහඬව සිටි මිටි මහත කාන්තාව කථා



කෙරුවා. ඇය දිහා නොකැමැත්තෙන් වගේ බලා සිටි කෙට්ටු කාන්තාව මෙහෙම කිව්වා.

'පොඩ්ඩක් කළබල වෙන්නේ නැතිව ඉන්නකෝ. මට ටිකක් කල්පනා කරන්න ඉඩ දුන්න නම් මේ රහස් සංඥාව මොකක් ද කියලා තෝරාගන්න අමාරුවෙන එකක් නෑ.'

ඊට පස්සේ තරුණයා සහ තරුණියන් දෙදෙනා ගොඩාක් විමසිලිමත් විදිහට නිවුන් සහෝදරයින් දෙදෙනා දිහා බලාගෙන හිටියා. ජෝර්ජ් ගේ මුහුණේ ගොඩාක් උකුවට පැණි තැවරිලා. ජෝන් මුහුණ පුරාම තිබෙන්නේ ජෑම්. ඔවුන් දෙදෙනා පැණි සහ ජෑම් අතරින් දත් පෙන්වා පිරිසට හිනාවුනා. ටික වෙලාවකට පසුව කෙට්ටු තරුණිය, තරුණයා ට බොහෝම සෙමින් මෙහෙම කිව්වා.

'හරි... මම හිතවත් විදිහට මේ අයත් එක්ක කථා කරලා ඇත්ත මොකක් ද කියලා දැනගන්නම්. අපිට මොකක් හරි පොටක් පාදාගන්න බැරිවෙන එකක් නෑ. ළමයි... ඇත්තටම කවුද ඔය විලියම් කියලා කියන්නේ ?.'

'විලියම් කියන්නේ හරිම අපූරු කෙනෙක්.'

ජෝර්ජ් කිසිම ගාණක් නැතිව කිව්වා. හැබැයි කෙට්ටු කාන්තාවගෙන් තවත් පැනයක්.

'ඒක ඇත්ත වෙන්න පුළුවන් ළමයෝ... ඒ වුනත් විලියම් මොනවද කරන්නේ ?. එයා කවුද ?.'

'විලියම් කරන්නේ අපිව සල්ලි වලට විකුණන එක.'

ජෝන් ආඩම්බරයෙන් කිව්වත් කාන්තාව නම් ඔහු දිහා බැලුවේ සැකයෙන් වගේ.

'ඒක වෙන්න බෑ. මොකද කාටවත් පුංචි ළමයි සල්ලිවලට විකුණන්න බැහැනේ.'

sinhalaebooks.com



'මොකද බැරී... විලියම් ඒ දේ කරනවා නේ.'

'එයා ඔය ළමයින් ගේ තාත්තා ද ?.'

'අනේ නෑ. එයා තමයි විලියම්. එයා කරන්නේ අපිව සල්ලි වලට විකුණන එක.'

ජෝර්ජ් සහ ජෝන් හිස සලමින් ස්ථිර හඬකින් ම එහෙම කිව්වා.

..........................................................................

'මේ අය කියන්නේ ළමයි පැහැරගන්න කෙනෙක් ගැන. කිසිම සැකයක් නෑ. විලියම් කියන කෙනාගේ රස්සාව තමයි ළමයි පැහැරගන්න එක. දැක්ක ද ?. මම ගොඩාක් හොඳට ප්‍රශ්න කරලා මේ සිද්ධියේ සුළමුල හොයාගත්ත හැටි. අපි දැන් හිතන්න ඕනෑ මේ මිනිහා හොයාගන්නේ කොහොම ද කියලයි.'

කෙට්ටු තරුණිය තියුණු හඬකින් කියද්දී මිටි මහත කාන්තාවත් කථාවට එකතු වුනා.

'ඒක ඇත්ත. ඒ වුනත් මම තවම කල්පනා කරන්නේ මේක මොකක් හරි සැළසුමක් ද එහෙම නැතිනම් රහස් සංකේතයක් ද කියලයි.'

'ඔය විලියම් කියන කෙනා ඉන්නේ කොහෙද කියලා ඔයාලා දන්නව ද ?.'

කෙට්ටු කාන්තාව ජෝර්ජ් ගෙන් අහද්දී ඔහු උදාරම් හඬකින් ඉක්මන් උත්තරයක් දුන්නා.

'ඔව්... දන්නවා.'

'එහෙම නම් කිසිම අමාරුවක් නෑ. ළමයි... අපි දැන් විලියම් කියන නපුරු මිනිහව අල්ලගන්නයි හදන්නේ. ඔයාලා අපිට උදව්



කරන්න ඕනෑ.'

'මේක නම් හරිම නරක දෙයක් වුනා. ඇත්තටම ඒකෙන් සිද්ධ වුනේ මගේ වැඩ හැම එකක් ම අවුල් වුන එකයි.'

තරුණයා කෝපයෙන් බෙරිහන් දෙද්දී කෙට්ටු කාන්තාව ඔහු දිහාට හැරිලා නොසතුටු හඬකින් මෙහෙම කිව්වා.

'ඔයාගේ වැඩ නම් කොහොම කරගන්න බැරි ද ?. ඒ වුනත් දැන් අපි ඉස්සරහා තියෙන්නේ හරිම බරපතල රාජකාරියක්. මෙතැන සිද්ධ වෙලා තියෙන්නේ ළමයි පැහැර ගැනීමක්. ඒ වගේම රහස් සංකේතයක් ඒ අයගේ පිටේ එල්ලලා කරන්න ගිය මහා විනාසයක්. අපි මේක කොහොම හරි හොයන්න ඕනෑ.'

'ඔයාට ගොඩාක් ස්තූතියි නැන්දේ. ඒ වුනත් ඔය වගේ දරුණු වැඩ වලට සම්බන්ධ වෙන්න නම් මම කැමැති නෑ.'

තවත් ටික වෙලාවකට පමණ පසුව පිරිස විලියම් නම් මහා භයානක පැහැරගන්නා අල්ලා ගැනීම සඳහා පිටත් වෙන්න සූදානම් වුනා. කෙට්ටු කාන්තාව ජෝන් ගේ අතින් අල්ලාගත් අතර මිටි මහත කාන්තාව ජෝර්ජ් ගේ අතින් අල්ලා ගත්තා. හැබැයි තරුණයා නම් තමන් ගේ නොකැමැත්ත තවමත් ප්‍රකාශ කරනවා.

'දෙයියනේ... මම මේ ගෙදරට ආවේ නිදහසේ මගේ වැඩ කටයුතු කරගන්නයි. ඒ වුනත් දැන් මොකක් ද මේ සිද්ධ වෙලා තියෙන්නේ ?.'

තරුණයා ගේ නොකැමැත්ත ගැන ගණනකටවත් නොගත් කෙට්ටු කාන්තාව ජෝන් දිහාට හැරිලා මෙහෙම කිව්වා.

'හරි... දැන් ඔයාලා අපිව විලියම් ගේ ගෙදරට එක්ක යන්න ඕනෑ.'

'අපි මොනව හරි ආයුධයක් අරන් ගියොත් හොඳයි නේද ?.'

sinhalaebooks.com



මිටි මහත කාන්තාව ඒ වගේ යෝජනාවක් ඉදිරිපත් කරද්දි අනිත් කාන්තාව තරුණයා දිහාට හැරිලා මෙහෙම කිව්වා.

'බය වෙන්න දෙයක් නෑ. විවියන් අපිට ආරක්ෂාව සපයයි.'

විලියම්, එහෙම නැතිනම් තරුණයා ඒ අවස්ථාවේදීත් තමන් ගේ නොකැමැත්ත ප්‍රකාශ කෙරුවා. හැබැයි කාන්තාවන් දෙදෙනාගෙන් ඔහුට කිසිම බුරුලක් නම් ලැබුනේ නෑ.

දූන් පිරිසත් සමඟ නිවුන් සහෝදරයින් දෙදෙනා පාර දිගේ විලියම් ගේ නිවස කරා ඇවිදගෙන යනවා. ඔවුන් දෙදෙනා වෙතින් දක්නට ලැබුනේ හරිම සැහැල්ලු විලාසයක්. හැබැයි ටිකක් දුර ගියාට පසුව නිවුන් සහෝදරයින් දෙදෙනා එක පාරටම නතර වුනා.

'ඉස්සරහට යන්න ඕනෑ නම් අපිට තව ජෑම් ටිකක් කන්න වෙනවා.'

ජෝන් ඒ වගේ යෝජනාවක් කරද්දී ජෝර්ජ් ද ඉක්මනින් ම කථාවට එක් වුනා.

'අපි ආපහු ගෙදර ගිහිං ජෑම් ටිකක් හරි පැණි ටිකක් හරි කාලා එමුද ?.'

ළමයි දෙදෙනා ගේ යෝජනාවට ගැහැණුන් දෙදෙනා නම් කැමැති වුනේ නෑ. ඒ අතර කෙට්ටු කාන්තාව, මිටි මහත කාන්තාව දිහා ට හැරිලා මේ විදිහේ යෝජනාවක් ඉදිරිපත් කෙරුවා.

'මම කියන්න ද වැඩක්. අපි දෙන්නා මෙ පාර දිගේ ටිකක් ඉස්සරහට ගිහිං බලමු. අපි එනකම් විවියන් ළමයි දෙන්නා එක්ක ඉඳියි.'

එහෙම කියපු කාන්තාවන් දෙදෙනා නිවුන් සහෝදරයන් ව තරුණයා ළඟ තියලා පාර දිගේ ඉදිරියට ඇවිදගෙන ගියා. ඔවුන් ආපහු ආවේ තවත් විනාඩි ගණනකට පසුවයි. ඒ වනවිටත් තරුණයා



ගසකට හේත්තු වෙලා කල්පනා කරනවා.

'අපි පාරේ කෙළවරටම ගියා. කිසිම වැදගත් දෙයක් හම්බ වුනේ නෑ. ඒක නෙවෙයි විවියන්... කෝ ළමයි දෙන්නා ?.'

කෙට්ටු කාන්තාව එහෙම අහද්දී තමයි විවියන් කල්පනාවෙන් මිදුනේ. වටපිට බැලූ ඔහු කලබලයෙන් වගේ මෙහෙම කිව්වා.

'මොන ළමයි ද නැන්දේ ?. ආ... අර කරදරකාරයෝ දෙන්න ද ?. දූන් මෙතැන හිටියනේ. කෝ කොහෙද ගියේ ?. කිසිම සැකයක් නෑ. ඒ අය මගේ ඇස් වහලා පැනලා යන්න ඇති.'

'දෙයියනේ මේ ළමයි කොහෙද ගියේ ?.'

කෙට්ටු කාන්තාව පුදුමයෙන් බෙරිහන් දෙමින් අවට විපරම් කරන්න වුනා. හැබැයි නිවුන් සහෝදරයින් ගේ සේයාවක්වත් ඇයට දකින්න ලැබුනේ නෑ. තරුණයා කලබලයෙන් වගේ හිස අත ගා ගනිද්දී මිටි මහත තරුණිය සිහින් විලාපයක් නැගුවා.

'මේක නම් හරිම භයානක වැඩක්. ඒ කොල්ලෝ දෙන්න අපිව පාළු තැනකට එක්ක ඇවිත් පැනලා ගිහිං. දූන් කවුරුහරි ඇවිත් අපිව මරලා දමන්න වුනත් පුළුවන්.'

'ඒ කොල්ලන් ව කරදරයක් වෙන්නේ නැතිවෙයි. මොකද පොඩි එවුන් වුනාට ඒ අයට හොඳට මොළේ තියෙනවා. මට නම් දූන් හරිම සිතලයි. අපි ඉක්මනින් ම ආපහු යමු ද ?.'

තරුණයා එහෙම කිව්වත් කෙට්ටු කාන්තාව නම් ඒ අදහසට කැමැති වුනේ ම නෑ.

'මෝඩ කථා කියන්න එපා. ඒ ළමයි දෙන්නා හොයාගන්න කම් මම මෙතැනින් අඩියක් වත් තියන්නේ නෑ. ඕනෑ වුනොත් මම අද රෑ පුරාම ඒ ළමයින් ව හොයනවා. ඔයාලා දෙන්නාත් මම එක්ක ඉන්නම ඕනෑ.'

sinhalaebooks.com



ඔන්න එතකොටම තමයි පටු පාර දිගේ කාගේදෝ ඡායාවක් ඔවුන් සිටින පැත්තට ඉක්මනින් ම පැමිණුනේ. ඒ ඡායාව දැකපු ගමන් කෙට්ටු කාන්තාව බියෙන් මුමුණන්න වුනා.

'අන්න කවුදෝ පාර දිගේ එනවා. අපි දැන් බය නැතිව ඒ එන කෙනාට මුහුණ දෙන්න ඕනෑ. සමහර විට ඒ එන්නේ මංකොල්ල කාරයෙක් වෙන්න ඇති. විවියන්... කළබල වෙන්න නම් එපා. මම දැන්ම ම ඔයාට කියන්නේ ඒකයි.'

ඇත්තටම පාර දිගේ ඔවුන් සිටින දිහාවට ඇවිදගෙන ආවේ කාන්තාවක්. ඇය දකපු ගමන් පිරිසගේ හිතේ තිබුන බියත් ඉක්මනින් ම පහවෙලා ගියා. ටික වෙලාවකට පසුව දහදියෙන් පෙඟුන, බියෙන් විසල් වුන දෑස් ඇති කාන්තාවක් ඔවුන් ඉදිරියේ පෙනී සිටියා.

'ඔයාලා පුංචි ළමයි දෙන්නෙක් එහෙම දැක්ක ද ?. එක්කෙනෙක් ගේ නම ජෝන්.'

කාන්තාව එහෙම කියද්දී කෙට්ටු කාන්තාව ඉක්මනින් ම ඇගේ කථාවට යමක් එකතු කෙරුවා.

'අනිත් කෙනා ජෝර්ජ්. එහෙම නේද ?.'

..........................................................

වියලි කානුවක නිදා වැටෙමින් සිටි නිවුන් සහෝදරයින් දෙදෙනාව හොයාගන්න විලියම් ට තවත් සෑහෙන වෙලාවක් ගියා. ඒ වනවිටත් ජෝන් ගේ සහ ජෝර්ජ් ගේ මුහුණු වල ජෑම් සහ පැණි හොඳ හැටි තැවරිලයි තිබුනේ. විලියම් සහ පිරිස ඔවුන් අසලට පැමිණෙනවාත් සමගම කානුවේ නිදාගෙන හිටපු නිවුන් සහෝදරයින් දෙදෙනා ඉක්මනින් ම නින්දෙන් පිබිදුනා.

'අනේ විලියම්... ඔයා හරිම හොඳයි...'

ජෝර්ජ් නිදිබර හඬකින් එහෙම කියද්දී ජෝනුත් නින්දෙන්



ම ඒ කථාවට යමක් එක් කෙරුවා.

'ඔව්... අපි හින්දා ඔයාලට සීනි බෝල කන්න සල්ලි හම්බ වුනා. ඒ වගේම ඔයාලා හින්දා අපිට ඇති තරම් ජෑමුයි, පැණි යි කන්නත් ලැබුනා.'

sinhalaebooks.com

## 7.
## පරිච්ඡේදය

# විලියම්ගෙන් අනහිත සහ හොඳ හිත

එක දවසක් විලියම් එයාගේ අළුත් යාළුවෙක්ව හම්බ වෙන්න පාර දිගේ යමින් හිටියා. ඇත්තටම විලියම් මේ ගමන යන්නේ ගොඩාක් සතුටින්. එයා මහා හයියෙන් උරුවම් බාමින් යන්නේ ඒ සතුට නිසාමයි.

විලියම් ගේ නොපීරූ හිසකෙස් හොඳටම අවුල්වෙලා. ඒ හින්දා දකින ඕනෑම කෙනෙකුට හිතෙන්නේ විලියම් බොරු කොණ්ඩයක් දාගෙන ඉන්නවා වගෙයි.

කොහොම වුනත් විලියම් මහා හයියෙන් උරුවම් බාමින් ම තමන් අගේ අළුත් යාළුවා නතර වෙලා ඉන්න නිවස දිහාවට



ඇවිදගෙන යන්න වුනා. විලියම් ගේ උරුවම් හඬ ගොඩාක් දුරට ඇහෙනවා. අළුත් යාළුවාටත් විලියම් ගේ උරුවම් හඬ දුරතියාම ඇහුනා. එයා අත් දෙකින් ම කන් වසාගත්තේ කිසිම තාලයක් නැති විලියම් ගේ උරුවම් හඬින් බේරෙන්නටයි.

විලියම් ගේ අළුත් යාළුවා තමයි විවියන් ස්ට්‍රේන්ජ්. එයා කවියෙක් වගේම පුවත්පත් කලාවේදියෙක් විදිහටයි වැඩ කරන්නේ. තමන් ගේ වැඩ කටයුතු නිවිහැනහිල්ලේ කරගන්න ඕනෑ නිසා විවියන් මේ වගේ ගම්බද ප්‍රදේශයක පුංචි ගෙයක් කුලියට අරගෙන ජීවත් වෙන්න ආවේ මේ ළඟදී. හැබැයි විවියන් බලාපොරොත්තු වුන නිහඬ නිසංසල බව ඔහුට ලැබුනේ විලියම් හම්බවෙන්න ඉස්සර වෙලා විතරයි. ඊට පස්සේ එයාටත් විලියම් ගේ අණසකට යටත් වෙන්න සිද්ධ වුනා.

විලියම් නම් තමන් ගේ අළුත් හිතවතා විවියන් ගැන ගොඩාක් කැමැති වුනා. හැබැයි විවියන් කියන්නේ මේ වගේ කරදරකාර කොළු ගැටවුන් ට ඒතරම් කැමැති කෙනෙක් නෙවෙයි. තමන් ගේ සපත්තු පිහ දමන්න, දූන්ම මෙතැනින් යන්න කියලා තමන් ව එළවාගන්නේ නැති නිසයි විලියම් අළුත් හිතවතා ට වැඩියෙන් ම කැමැති වුනේ. ඒ වගේම විලියම්, විවියන් ඉස්සරහා හැසිරුනේ සුචව කීකරු ගෝලයෙක් වගේ. ඒ කීකරුකම ගැන හරියටම කියනවා නම් සිංහයෙක් ඉස්සරහා බැගෑපත් වෙන හාවෙක් වගේ කියලා කිව්වොත් කිසිම වරදක් නෑ.

හැබැයි විවියන් ස්ට්‍රේන්ජ් ටිකක් හරි නම්‍යශීලි විදිහට විලියම් ට සළකන්න වුනොත් විලියම් ගේ හැසිරීම සම්පූර්ණයෙන් ම වෙනස් වෙනවා. ඒ වෙලාවට විවියන් කියන කිසිම දෙයක් විලියම් අහන්නේ නෑ.

විවියන් හම්බ වෙන්න ආපුවාම විලියම් වාඩිවෙන්නේ ඒ ගෙදර තියෙන හොඳම පුටුවේ. ඊට පස්සේ එයා ලොකු කේක්

sinhalaebooks.com



පළුවක් ගිල දමන ගමන් තෝරතෝංචියක් නැතිව කථා කරන්න පටන්ගන්නවා. මෙන්න මේ වෙලාවට තමයි විවියන් ට පුදුමාකාර විදිහට තරහ යන්නේ.

ඔන්න එක දවසක් අහම්බෙන් වගේ විවියන් ට, විලියම් අම්මා හම්බ වුනා. මුලින් ම කථා කළේ විලියම් ගේ අම්මා ය.

'මිස්ටර් ස්ට්‍රේන්ජ්... ඔයා හම්බ වුන එකත් ගොඩාක් හොඳයි. අපේ විලියම් ඔයාගේ ගෙදර ඇවිත් වැඩ පාළු කරන්නේ එහෙම නෑ නේද ?.'

'නෑ මිසිස් බ්‍රවුන්. මම විලියම් ට හරිම කැමැතියි.'

විවියන් ගේ උත්තරය අහපු ගමන් විලියම් ගේ අම්මා පාර දිගේ ඇවිදගෙන ගියේ හරිම සැහැල්ලු හිතකින්. ඒ අතරම එයා මෙවැනි දෙයක් ගැන කල්පනා කරන්නත් අමතක කෙරුවේ නෑ.

'විවියන් ස්ට්‍රේන්ජ් වගේ ලෝක ප්‍රකට ලේඛකයෙක් ආශ්‍රය කරන්න ලැබුන එක ඇත්තටම විලියම් ගේ වාසනාව. විලියම් වුනත් ඒ තරුණයා එක්ක ආශ්‍රය කරන්න එක පයින් ම කැමැති ඇති.'

මෙයට පෙර දවසේ තුන් පාරක් ම විලියම් තමන් ගේ අළුත් හිතවතා හම්බ වෙන්න ගියා. එක සැරයක් එයා යනකොට විවියන් ඉතාම වැදගත් කවියක් ලියන්න පටන්ගත්තා විතරයි. ගොඩාක් නිවි හැනහිල්ලේ කවිය ලියන්න කල්පනා කෙරුවත් විලියම් ගේ පැමිණීමත් එක්කම කවිය විතරක් නෙවෙයි විවියන් ගේ නිහඬබවත් බිඳිලා ගියා.

විලියම් තමන් ගේ අළුත් යාළුවා හම්බවෙන්න යන්නේ එයාගේ මවුත් ඕගනයක් වාදනය කරගෙනමයි. විලියම් විසින් ම නිර්මාණය කරගත්තු තාලයක් තමයි මවුත් ඕගනයෙන් නිතරම පිටවෙන්නේ. ඒ හඬ කිසිම කෙනෙකුට ලේසියෙන් අහගෙන ඉන්න පුළුවන් එකක් නම් නෙවෙයි.



ඔන්න එදාත් විලියම් මවුත් ඕගනයත් වාදනය කරගෙන ම විවියන් ගේ ගෙදරට ගොඩවුනා. එයා මේ එන්නේ තුන්වැනි වතාවටයි. විලියම් දැකපු ගමන් ම මුහුණ කෝපයෙන් රතු වුනත් මවාගත් ආචාරශීලි කමකින් යුතුව හිනාවෙන්න නම් විවියන් අමතක කෙරුවේ නෑ.

'විලියම්... ඔය සංගීතය ඔයාලගේ ගෙදරදී වාදනය කෙරුවොත් හොඳයි කියලා හිතෙන්නේ නැද්ද ?.'

විවියන් මහතා නොකැමැත්තකින් එහෙම අහද්දී විලියම් ආචාරශීලි විදිහට හිනාවෙමින් මෙහෙම කිව්වා.

'ඇත්තටම නෑ. මොකද අපේ ගෙදර අය කවුරුවත් සංගීතයට කැමැති නෑ. හැබැයි ඔයා නම් සංගීතයට කැමැති කෙනෙක් කියලා මම දන්නවා.'

තවත් සෑහෙන වෙලාවක් විලියම්, විවියන් මහතා ගේ ගෙදර ගත කෙරුවා. එයා පිටවෙලා ගියාට පසුව විවියන් මහතා කවිය ලියන්න සූදානම් වුනත් කිසිම අදහසක් හිතට ආවේ නෑ. ඇත්තටම විලියම් ගේ කරදරකාර කථාවලින් එයාගේ හිත පිරිලා.

එදා දවල් කෑමෙන් පස්සේ විවියන් මහතා 'ස්වභාවධර්මය සහ දේවත්වය' වන මාතෘකාව යටතේ කියලා ලිපියක් ලියන්න සූදානම් වුනා. ඔන්න එතකොටම තමයි විලියම් නැවතත් කඩා වැදුනේ. මේ වෙලාවේ විලියම් පණ තියෙන මීයෙක් සහ මැරුණ බත් කුරෙක් තමන් ගේ හිතවතා ට පෙන්වන්නට රැගෙන විත් තිබුනා. ඒ විතරක් නෙවෙයි මාළු පැටව් කිහිප දෙනෙක් දමා තිබුන මඩ වතුර භාජනයක් ද විලියම් ගේ අතේ තියෙන හැටි විවියන් මහතා දැක්කා. විලියම් මේ හැමදෙයක් ම අළුත් හිතවතා ට පෙන්නුවේ ඉහවහා යන සතුටින් යුතුවයි.

විවියන් ස්ට්‍රේන්ජ් මහතා මැරුණ බත්කුරා අල්ලලා බැලුවා.

sinhalaebooks.com



හැබැයි එයා මියා අතගාන්න ලෑස්තිවෙන කොටම මියා එයා ගේ අත හැපුවා. විවියන් මහතා බය වෙලා අත පිටුපසට ගනිද්දි ම මේසය පැත්තක තිබුන මඩ වතුර ජෝගුවේ අත වැදුනා. අවාසනාවක මහත.... මඩ වතුර ජෝගුව හැලිලා කාමරයේ බිමට එලා තිබුන වටිනා කාපට් එකට උරාගත්තා. ඒ වගෙම එයා අළුතින්ම ගෙනා වටිනා සේද කුෂන් කවරයටත් මඩ වතුර උරාගත්තා. හානිය එයින් නතර වුනේ නෑ. විවියන් මහතා ගේ මේසය පුරාමත් මඩ වතුර ගලාගෙන යනවා. ඒ හින්දා එයාගේ තීන්ත උරණ කඩදාසි, පෑන්, පැන්සල්. ලියන කඩදාසි, මුද්දර වගේ හැමදෙයක් ම මඩ වතුර වලින් වැහිලා ගියා. නොසිතූ විදිහට සිද්ධ වුන මේ දෙයින් වඩාත් ම කළබලයට පත්වුන විවියන් මහතා අත් දෙකින් ම ඔලුව බදාගෙන බෙරිහන් දුන්නා.

'දෙයියනේ මේ මොන විනාසයක් ද ?.'

හැබැයි මේ වනවිටත් විලියම් හිටියේ වෙනත් දෙයක් කරමින්. එයා තමන් විසින් රැගෙන විත් තිබුන විවිධාකාරයේ සතුන් නැවතත් අල්ලාගන්නට උත්සාහ කරනවා. මේ කරදරය හින්දා ඒ සතුනුත් විලියම් ගේ ග්‍රහණයෙන් මිදිලා පැනලා ගිහිං. තමන් ගේ සතුන්ට සිද්ධ වුන දේ ගැන හිතපු හින්ද ද කොහෙද විලියම් ගේ මුහුණත් රතු වෙලා. ඒ අතරම එයා විවියන් මහතා ගේ හිත සැනසෙන විදිහේ උත්තරයක් දෙන්නත් අමතක කෙරුවේ නෑ.

'හැම දෙයක් ම හරි. සිද්ධ වුන කිසිම දෙයක් ගැන වැඩිය දුක්වෙන්න එපා මිස්ටර් විවියන්. බලන්නකෝ. මට වුන දේ. මගේ සුරතල්ලු ටික ඔක්කොම පැනලා ගියා. ඒ වුනාට මම නම් ටිකක්වත් දුක්වෙන්නේ නෑ. මොකද මට ඒ අය ඇති තරම් ආයේම හොයාගන්න පුළුවන් හින්දා. මම හෙට තවත් සුරතල් සත්තු ටිකක් අරන් එන්නම්. එතකොට ඔයාට පුළුවන් ඇති තරම් උන්ව සුරතල් කරන්න. ඒ හින්දා දුක් වෙන්නේ නැතිව ඉන්න මිස්ටර් විවියන්.'



තමන් ලියමින් සිටි වටිනා ලිපිය වන 'ස්වභාව ධර්මය සහ දේවත්වය' මඩ වතුර ගොඩක් මැද තිබිලා විවියන් ට හොයාගන්න ලැබුනේ තවත් පැය භාගයක් විතර ගියාට පස්සෙයි. ලිපියේ අකුරු මඩ වතුරට බොඳවෙලා. ඒ විතරක් නෙවෙයි මැරුණ කුරුමිණියෙකුත් ලිපියේ පැත්තක ඇලිලා හිටියා. මේ දේවල් දැක්කට පස්සේ විවියන් ට මොනතරම් කේන්ති ගියා ද කියනවා නම් එයා තමන් ගේ වටිනා ලිපිය ගිනි උදුන ඇතුළට විසිකරලා දැම්මා.

එදින රාත්‍රිය පුරාම විවියන් මහතා නින්දක් නැතිව තමන් ගේ ලේඛන කටයුතු වල නිරත වෙන්න උත්සාහ කෙරුවා. ඒ වුනත් විලියම් ගේ අදිසි පැමිණීමෙන් කළබල වෙලා තිබුන එයාගේ හිතෙන් කිසිම විදිහක කලාත්මක අදහස් ගලාගෙන ආවේ නෑ. ගොඩාක් කල්පනා කරලා ලියන්න ඕනෑ වටිනා ලිපි කිහිපයක් ම විවියන් මහතා ඉදිරියේ තිබුනත් ඒ කිසිම දෙයක් ලියන්න තරම් එයාගේ මනැස නිසල නෑ. විලියම් ගේ නොමනා ක්‍රියාවන් සහ දඟකාරකම් විවියන් මහතාගේ සිතිවිලි හැම එකක් ම මහා භයානක විදිහට අවුල් කරලයි තිබුනේ.

පහුවදා උදෑසනත් විවියන් මහතා වටිනා ලිපියක් ලියන්න සූදානම් වුනා. හැබැයි එයාට ලියන්න හැකිවුනේ ලිපියේ පේලි කිහිපයක් විතරයි. විලියම් ගේ කරදරකාර විසිල් හඬ නිවසේ ඉදිරිපස දොර දෙසින් ඇසුනා. තවත් තත්පර කිහිපයට පසුව විලියම් දුවගෙන ඇවිත් විවියන් මහතා ඉදිරියේ හිටගත්තා.

'හලෝ... මිස්ටර් විවියන්... ඔයා ලියනව ද ?.'

විලියම් ගේ හඬ ප්‍රීති ජනකය. හැබැයි මේ ප්‍රීතිය නිසාම මහා දුකක් බවට පත්වුන විවියන් මහතා නොසතුටෙන් හිස අතගාමින් ම විලියම් ට උත්තරයක් දෙන්න අමතක කෙරුවේ නෑ.

'ඔව්... විලියම්. මම මේ ලියන්න උත්සාහ කරනවා.'

sinhalaebooks.com



'ඔයා තවම ලියන්න උත්සාහ කරනවා වෙන්න ඇති කියලා මට හිතුනා. මොකද මම ඇතින් ම එනකොට ජනේලෙන් ඔයාව දැක්කා. අත් දෙක ඔලුවේ ගහගෙන කල්පනා කරනවා. ඔයා මොනව ලියන්න කල්පනා කර කර හිටියත් මම දැක්කම ගොඩාක් සතුටු වෙනවා කියලා දන්නවා. අන්න ඒ හින්දයි මේ තරම් උදෙන්ම ඇවිත් ඔයාව හම්බ වෙන්න හිතුවේ.'

විලියම් දිගින් දිගටම කියාගෙන යද්දී මහා විශාල හිනාවකුත් එයාගේ මුහුණ දිගේ ගලාගෙන ගියා. ඒ අතර තරුණ කවියා කිසිම දෙයක් නොකියා ම විලියම් දිහා බලාගෙන හිටියා. විලියම් නැවතත් කථා කරන්න වුනේ ඉන්පසුවයි.

'ඔයා දන්නව ද මිස්ටර් විවියන්. මෙහෙම හිටියට මටත් හොඳට ලියන්න පුළුවන්. එක දවසක් මම මුහුදු මංකොල්ලකාරයෝ ගැන හරිම ලස්සන කථාවක් ලිව්වා. ඒ අයගෙ නැව කුනාටුවකට අහුවෙලා පුංචි දූපතකට ගහගෙන යනවා. ඒ දූපතේ ඉන්නේ මිනී කන ගෝත්‍රිකයො වගයක්. ඒ ගෝත්‍රිකයෝ මේ මුහුදු මංකොල්ලකාරයින් ව පණ පිටින් කන්න සූදානම් වෙද්දී ගෝත්‍රික නායකයා ගේ දුව ඇවිත් ඒ අයව බේරාගන්නවා. එයා ඒ වගේ දෙයක් කරන්නේ ඇයි කියලා ඔයාට හිතාගන්න පුළුවන් ද ?. ඒ ගැහැණු කෙනා මිනී මස් කන්න කැමති නෑ. මේ සිද්ධියෙන් පස්සේ මුහුදු මංකොල්ල කාරයෙක් ඒ ගෝත්‍රික ගැහැණු කෙනාව කසාද බඳිනවා. ඊට පස්සේ ඒ කාන්තාව මුහුදු මංකොල්ල කාරයින් ගේ රැජින වෙනවා. මිනිහා තමයි රජු විදිහට සළකන්නේ. මිස්ටර් විවියන්. ඔයා ලියන්නෙත් මේ වගේ කථාවක් ද ?.'

'නෑ....'

විවියන් මහතා කෝපයෙන් ගොරවද්දී විලියම් අසල තිබුන ඇඳි පුටුවක් උඩ බොහෝම පහසුවට වාඩිවෙලා නැවතත් කථාව පටන්ගත්තා.



'හොඳයි... ඔන්න මම ලියපු කථාව ගැන ඔයාට කිව්වා. ඒ හින්දා දැන් ඔයා ලියපු කථාව ගැන කියන්න. ඒක නෙවෙයි. ඔයා ඊයේ මට දුන්න කේක් වලින් පොඩි කෑල්ලක් හරි ඉතිරිවෙලා තියෙන්න පුළුවන්. අන්න ඒක මට දෙන්නකෝ. කේක් කෑල්ලක් කන ගමන් ම කථාව අහන්න තියනවා නම් හරිම අපූරුයි.'

විලියම් එහෙම කියද්දී තරුණ කවියා හීනෙන් ඇවිදිනවා වගේ කබඩ් එක ළඟට ගියා. ඊට පස්සේ විශාල ප්ලම්ස් කේක් පළුවක් විලියම් ගේ අතට ලැබුනා. විලියම් ඒකත් අරන් ආයේමත් පුටුව උඩ වාඩිවෙලා කථාව පටන්ගත්තා.

'මේ වෙලාවට මම හැමදාම මොනව හරි දෙයක් කනවාමයි. බලන්නකෝ මිස්ටර් විවියන්. මම ගොඩාක් වෙලාවට කෑම කනවා. හැබැයි මම කෑම කෑවා කියලා දැනෙන්නේ එහෙමත් වෙලාවක තමයි. හරි... ඒකෙන් කමක් නෑ. මට ඔයාගේ කථාව කියන්නකෝ. සමහර විට ඔයාට මොනව හරි උදව්වක් කරන්නත් මට පුළුවන් වෙයි.'

'ඔයාගේ උදව් නම් මට ඕනෑවෙන්නේ නෑ විලියම්. ඒක සහතිකයි.'

'එහෙමද ?. කමක් නෑ. ඒ ගැන වැඩිය කල්පනා කරන්න එපා. හැබැයි මට ඕනෑ වුනේ ඔයාට උදව් වෙන්න. අනික ඔයා අද මට ලොකුම ලොකු කේක් කෑල්ලක් දුන්නනේ. හෙටත් ඒ විදිහෙම කේක් පළුවක් ලැබෙනවා කියලත් මම දන්නවා. අන්න ඒ නිසයි මම ඔයාට උදව් කරන්න හැදුවේ. මම ත් කථා ලියන කෙනෙක් නේ. මොනව වුනත් මගේ සුරතල් සත්තු ටික ඔයාට කරපු විනාසේ ගැන වැඩිය කල්පනා කරන්න එපා. ඔයා ඒ අයට කැමැති නම් කියන්න. මම ආයේමත් ඒ වගේ සත්තු ටිකක් අල්ලගෙන ඔයාට ගෙනැත් දෙන්නම්. ඇත්තමයි... ඔයා ළඟ තියෙන්නේ හරිම රසවත් කේක් වගයක් නේ.'

sinhalaebooks.com



විලියම් දිගින් දිගටම එහෙම කියද්දී තරුණයා ඉක්මනින් ම කබඩ් එක ට අත දමලා තවත් කේක් පළුවක් විලියම් ට දුන්නා.

'ආ... ඔයාට ස්තූතියි. හැබැයි ආයේ නම් මට කේක් දෙන්න මහන්සි වෙන්න එපා. ඇත්තටම මේ කේක් එක හරිම රසවත්. අපි ඒ කථාව පැත්තකින් තියමුකෝ. දැන් ඔයා ලියන කථාව ගැන මට කියන්නකෝ. මටත් උදව් කරන්න පුළුවන් වෙයි. ඔයා මේ කථාව ලියන්නේ මොකක් ගැන ද ?.'

විලියම් එහෙම කියද්දී විවියන් හරිම අකමැත්තෙන් වගේ කථා කරන්න වුනා.

'මම ලියන කථාව මිනිහෙක් ගැන.'

'මොන වගේ මිනිහෙක් ගැන ද මිස්ටර් විවියන් ?.'

විලියම් ගේ කට පුරාම කේක් පිරිලා තිබුනා. ඒ හින්දා එයා ගේ කටහඬත් හරිම අපහැදිලියි.

'එයා සාමාන්‍ය මිනිහෙක්. එක දවසක් රෑ එයා ගෙදර එමින් හිටියා.'

'ඒ මිනිහා ගෙදර එනවා. ඇත්තටම කොහේ ඉඳල ද එයා ගෙදර එන්නේ ?.'

විලියම් ගෙන් තවත් බාධා කිරීමක්.

'එහෙම දෙයක් ගැන මම කථාවේ ලිව්වේ නෑ. ඇත්තටම ඒ මිනිහා කොහේ හරි ඉඳලා ගෙදර එනවා කියලා හිතමුකෝ.'

තරුණයා නැවතත් නොකැමැත්තෙන් බෙරිහන් දෙද්දී විලියම් කිව්වේ මේ වගේ දෙයක්.

'අන්න ඒක නම් කථාවට ගැළපෙන්නේ නෑ මිස්ටර් විවියන්. මොකද ඒ මිනිහා ගෙදර එනවා කියලා ලියනවා නම්. එයා කොහේ



හරි තැනක ඉඳලා එනවා වෙන්න ඕනෑ නේ. කථාව සාර්ථක වෙන්න නම් මිනිහා කොහේ ඉඳලා එනව ද කියලත් කථාවේ ලියන්න ඕනෑ.'

'හරි...අපි මෙහෙම කියමුකෝ. ඒ මිනිහා ගෙදර එන්නේ ගැහැණු ළමයෙකුගේ පණිවුඩයක් ලැබිලා කියලා කියලා කියමුකෝ.'

විලියම් ගේ කරදරය දරාගන්න බැරිම තැන විවියන් ඒ වගේ උත්තරයක් දුන්නා. හැබැයි ඒ පිළිතුරෙන් වත් විලියම් ගේ ප්‍රශ්න කිරීම නතර වුනේ නෑ.

'මිස්ටර් විවියන්...අන්න ඒක නම් කථාවේ සිදුවීම් වලට හොඳට ගැළපෙනවා. හැබැයි ඒ ගැහැණු ළමයා කවුද කියලත් කියන්න ඕනෑ. ඇත්තටම මිස්ටර් විවියන්... ඒ ගැහැණු ළමයා මේ කියන කෙනා ගේ පෙම්වතිය ද ?'

'ඔව්.. අපි එහෙම හිතමුකෝ. දවසක් හදිසියේ ම ඒ ගැහැණු ළමයාගෙන් පණිවුඩයක් ලැබෙනවා. තමන් දරුණු අවස්ථාවක ට මුහුණ දීලා ඉන්නවා. ඉක්මනට ඇවිත් එයාව බේරාගන්න කියලයි ඒ පණිවුඩයෙන් කියවෙන්නේ. ඉතින් ඒ තරුණයා ගැහැණු ළමයා හම්බ වෙන්න යද්දී මිනිහෙක් ඔහු පස්සෙන් එනවා. මම කියන දේ ඔයාට තේරෙනවා නේද ?.'

විවියන් මහතා එහෙම කියද්දී විලියම් ගෙන් තවත් පැනයක්.

'ඇත්තටම කොයි කෙනා, කොයි කෙනා පස්සෙන් ද එන්නේ ?. ඔයා කියන විදිහට මට කිසිම දෙයක් තේරෙන්නේ නෑ.'

'මම මුලින් ම කියපු මිනිහා තමයි තරුණයා ගේ පස්සෙන් එන්නේ.'

'හරි... මට දැන් තේරුනා. අර ඔයා ගෙදර එනවා කියලා කියපු කෙනා නේ.'

sinhalaebooks.com



'ඔව්... ඉතින් ඒ මිනිහා තරුණයා පස්සෙන් ඇවිත් එයාගේ පෙම්වතිය දරුණු අවස්ථාවක මුහුණ දීලා ඉන්නවා කියලා තරුණයාට කියනවා.'

විවියන් මහතා නොසැලකිලිමත් විදිහට එහෙම කියද්දී විලියම් තව තවත් හාර හාරා ප්‍රශ්න අහන්න වුනා.

'මිස්ටර් විවියන්... ඔයා මේ චරිත වලට නම් යොදන්නේ නැද්ද ?. මම නම් කියන්නේ අපි ඒ චරිත වලට හොඳ නම් දෙකක් දමමු. මම කියන්න ද ?. ගෙදර එන්නේ කොහේ ඉඳලද කියලා දන්නේ නැති මිනිහට අපි ඇල්බර්ටෝ කියලා කියමු. එයාට පණිවුඩය කියන්න එන කෙනාට රුඩෙල්පෝ කියලා කියමු. (විලියම් මේ නම් දෙක හොයාගත්තේ එයා කියවපු පොතක තිබිලයි.). දැන් අපිට කථාව ගොඩාක් ලස්සන විදිහට ගොතන්න පුළුවන්. රුඩොල්පෝ ඇවිත් අතර මගදී ඇල්බර්ටෝ හම්බවෙනවා. ඊට පස්සේ එයා කියන්නේ ඇල්බර්ටෝ ගේ පෙම්වතිය දරුණු අවස්ථාවක ට මුහුණ දීලා ඉන්නවා කියලයි. මෙන්න මේ විදිහට කථාව ගොතනකොට ඕනෑම කෙනෙකුට ඒ කථාව තේරුම් ගන්න පුළුවන්. ඔයාට එහෙම හිතෙන්නේ නැද්ද මිස්ටර් විවියන් ?.'

විලියම් දිගින් දිගටම එහෙම කියාගෙන යද්දී විවියන් ස්ට්‍රේන්ජ් පුදුමයෙන් වගේ එයා දිහා බලාගෙන හිටියා. හැබැයි මේ වෙලාවේ නම් පළමුවැනි වතාවට විවියන්, විලියම් ට පරාජය වෙලයි හිටියේ. විලියම් කථාව ගොතපු අපූරු ආකාරයට තමන් ට මේ කථාව ගොතා ගන්න බැරිවුන එක ගැන විවියන් මහතා ගේ හිතට මහා මදිපුංචි කමක් දැනෙන්නත් පටන් ගත්තා. එයා විලියම් දිහාට හැරිලා සිහින් හඬකින් මෙහෙම ඇහුවෙත් ඒ නිසා ම වෙන්න ඇති.

'ඇත්තටම විලියම්... ඔයා කියන විදිහට දෙවැනි මිනිහා රහස් සංගමයක නියෝජිතයෙක් කියලා අපිට කියන්න බැරි ද ?.'



'එහෙම කියන්න බෑ...'

විලියම් ඒ අදහස අනුමත නොකරන විදිහේ හඬකින් කිව්වා.

'එයා හරිම දක්ෂ පොලිස් නිළධාරියෙක් විදිහටයි අපි හඳුන්වන්න ඕනෑ. මම යෝජනා කරන්නේ එහෙමයි. එහෙම නැතිනම් එයා මුහුදු මංකොල්ල කාරයෙක් විදිහට හඳුන්වන්න වුනත් පුළුවන්. රතු ඉන්දියානුවෙක් විදිහට හැඳින්වුවත් වරදක් නෑ කියලා මට හිතෙනවා. ඒ ගැන වැඩිය හිතන්න ඕනෑ නෑ මිස්ටර් විවියන්... මම කියපු විදිහට ඔයා දැන් කථාවේ ඉතිරි ටික ගොතන්න බලන්නකෝ.'

'හොඳයි... මේ කියන කෙනා ඇල්බර්ටෝ ළඟ තියන රහසිගත වැදගත් ලියුමක් ගන්නයි උත්සාහ කරන්නේ කියලා අපිට කියන්න පුළුවන්. ඊටපස්සේ එයා ඇල්බර්ටෝ ව කොහේ හරි තැනක හිර කරන්නත් හිතාගෙන ඉන්නවා. එහෙම නැතිනම් මේ මිනිහා ඇල්බර්ටෝව තැනක හිර කරලා එයා ළඟ තියෙන ලියුම දෙනකම් නිදහස් කරන්නේ නෑ කියලා එයාට තර්ජනය කරනවා. '

'අන්න නියමයි මිස්ටර් විවියන්... ඒ වගේ තමයි කථාවක් ගොතන්න ඕනෑ. හරි ඊට පස්සේ මොනව වෙනව කියල ද ඔයා ලියන්න හිතාගෙන ඉන්නේ ?.'

විලියම් සතුටින් බෙරිහන් දීලා එහෙම අහද්දී විවියන් මහතා ගේ මුහුණ නැවතත් මැළවුනා. එයා සිහින් හඬකින් මේ වගේ උත්තරයක් දුන්නෙත් ඉතාම සිහින් හඬකිනුයි.

'මට ඒ ගැන තවම හිතාගන්න බැරිවුනා විලියම්. මොකද මම කලින් හිතාගෙන හිතපු විදිහට නෙවෙයි දැන් කථාව ලියැවෙන්නේ. ඒ හින්දා මින් ඉදිරියට තියෙන චරිත හැඩ ගැහෙන්න ඕනෑ කොහොමද කියලා මට හරියටම හිතාගන්න අමාරුයි.'

විලියම් ටික වෙලාවක් හරිම ගැඹුරු විදිහට කල්පනා කෙරුවා. එයා කථාවේ ඉතිරි කොටස ගැන විස්තර කරන්න වුනේ

sinhalaebooks.com



ඉන්පසුවයි.

'ඇල්බර්ටෝ මේ විදිහට කියනවා කියලා අපිට කියන්න පුළුවන්. 'ඒයි තක්කඩියා... ඔයාගේ තර්ජනවලට මාව බය කරන්න නම් ලැබෙන්නේ නෑ.' එහෙම නැතිනම් ඒ වගේ වචන ටිකක් අපිට දෙබස් විදිහට යොදාගන්න පුළුවන් නේද ?.'

'ඒ වුනත් විලියම්... සාමාන්‍ය ජීවිතේ දි මිනිස්සු ඔය තරම් දරුණු විදිහට කථා කරන්නේ නෑ නේද ?.'

විවියන් මහතා ගොඩාක් කල්පනාකාරි විදිහට අහද්දී විලියම් ටික වෙලාවක් කල්පනා කෙරුවා. එයා මේ විදිහේ පිළිතුරක් දුන්නේ ඉන්පසුවයි.

'සාමාන්‍ය ජීවිතේ දි නම් එහෙම වෙන්නේ නෑ තමයි. හැබැයි අපි මේ කථා කරන්නේ පොතක තියෙන කථාවක් ගැන කියලා ඔයාට අමතක වුනා ද මිස්ටර් විවියන් ?.'

'ඒකනම් ඇත්ත තමයි විලියම්. හැබැයි අපි මේ තරම් දරුණු වචන පොත් වල වුනත් ලියන එක හරි නෑ. හරි... මම අහන දේට උත්තරයක් දෙන්නකෝ. මේ වගේ දරුණු විදිහට යාළුවෝ එයාට බනිනවට කැමැති ද ?.'

විවියන් මහතා ඇසූ පැනයට නම් දෙන්න හොඳ උත්තරයක් විලියම් ළඟ තිබුනේ නෑ. එයා ඉක්මනින් ම නැගිටලා කබායේ රැ දිලා තිබුන කේක් කැබැලි ටික පිසදමා ගත්තේ මෙහෙම කියමින්.

'මම දැන් ආපහු ගෙදර ගියොත් හොඳයි. ඒ වුනත් අපි ආයේම හම්බ වුනාම මේ ගැන තව ටිකක් කල්පනා කරමුකෝ. කොහොම වුනත් මේ පොතට තවත් චරිත ටිකක් එකතු කරගත්තොත් හොඳයි කියලයි මම නම් කියන්නේ. අපිට මෙහෙම කරන්න බැරිද ඇල්බර්ටෝ ගේ අත්වැරැද්දක් හින්දා රුඩොල්පෝ හුදකලා දූපතක



අතරමං වෙනවා. ඊට පස්සේ එයා මිනී කන ගෝත්‍රිකයින් ගේ ගොදුරක් බවට පත්වෙනවා. ඒ වගේ සිදුවීමක් ගත්තම අපිට ගොඩාක් හොඳට මේ කථාව ගොතන්න පුළුවන්. කොහොම වුනත් මේ හැමදෙයක් ම සිද්ධ වෙන්න ඕනෑ ඔයා කැමැති විදිහටයි මිස්ටර් විවියන්. මම ලියපු පොත් දෙක තුනක් අනිත් දවසේ එනකොට අරන් එන්නම්කෝ. ඒවායිනුත් ඔයාට අදහස් ගන්න පුළුවන් වෙයි. ඔයා දන්නව ද ?. බත්කූරෝ සමහර වෙලාවට බත් කූරෝම කෑමට ගන්නවා. හරියට මිනී කන ගෝත්‍රිකයෝ වගේ. ආ... මේ දුණු පිහිය හරිම අපූරු එකක් කියලා මට හිතෙනවා. ෂා... ඒක හරිම ලස්සනයි නේ.'

විලියම් කපටි සිතින් එහෙම කියද්දී විවියන් ස්ට්‍රේන්ජ් ට කර කියාගන්න දෙයක් නැතිවුනා. එයා මේසය උඩ තිබුන අපූරු දුණු පිහිය විලියම් ට දුන්නේ වෙන කරන්න දෙයක් ඉතිරිවෙලා තිබුනේ නැති නිසාමයි.

'විලියම්... ආ. මේක ගන්න. අරන් කරුණාකරලා දැන්ම ම මෙතැනින් යන්න.'

විලියම් දුණු පිහිය අතටවත් ගත්තෙ නැතිව හිතවත් විදිහේ හඬකින් මේ වගේ දෙයක් කිව්වා.

'එහෙම හොඳ නෑ මිස්ටර් විවියන්. මේ වගේ ලස්සන දුණු පිහියක් මම ගන්න එක හොඳ දෙයක් නෙවෙයි. මොකද ඔයාට මේක ඕනෑ වෙන්න පුළුවන් නේ. එහෙම නෙවෙයි.. මම මේක ටික දවසකට ඔයාගෙන් ඉල්ල ගන්නම්. ඊට පස්සේ ආපහු ගෙනැත් දෙන්නම්. මම කියන්නද ?. ඔයාට බත්කූරෝ අල්ලගෙන එන දවසට මම මේ පිහිය ආපහු ගෙනැත් දෙන්නම්. ඔයා හරිම හොඳ කෙනෙක් මිස්ටර් විවියන්. එහෙමනම් මම ගිහිං එන්නම් ගුඩ් බායි.'

එහෙම කියපු විලියම් දොරත් වසාගෙන ම විවියන් මහතා

sinhalaebooks.com



ගේ නිවසින් පිටවුනා. දැන් නිවස පුරාම තිබෙන්නේ ප්‍රදුමාකාර නිහඬ බවක් දිගු සුසුමක් හෙලා පපුව සැහැල්ලු කරගත් විවියන් මහතා මේ නිහඬ බව අතරේ තමන් ගේ ලේඛන කටයුතු ආරම්භ කරන්න හිතුවා විතරයි. මහා හයියෙන් දොර විවෘත වෙලා විලියම් ගේ හිස ආයේමත් නිවස තුළට එබුනා.

'මට ඔයාගේ කථාව ගැන අළුත් අදහසක් ආවා මිස්ටර් විවියන්. අපි හොරෙකුයි පොලිස් නිළධාරියෙකුයි ප්‍රධාන චරිත විදිහට ගත්තොත් මොකද ?. එහෙම වුනොත් මේ කථාව තවත් ලස්සනට ගොතන්න පුළුවන්. ඒ වුනත් මේක ඔයාගේ කථාවනේ. ඒ හින්දා ඔයා කැමැති දෙයක් කරන්න. මම පස්සේ ඇවිත් ඔයාව හම්බ වෙන්නම් කෝ. ගුඩ් බායි...'

එහෙම කියපු විලියම් ආයේමත් ඉස්සරහා දොර වසාගෙන පිටවෙලා ගියා. විලියම් ගෙවත්ත දිගේ ඇවිදගෙන ගොසින් ගේට්ටුවෙන් පිටවෙන තුරු විවියන් ස්ට්‍රේන්ජ් මහතා බලාගෙන හිටියත් ඒ දේ සිද්ධ වුනේ නෑ. තවත් විනාඩියක් ගතවෙන්න ඉස්සර වෙලා විලියම් ගේ අවුල් වුන හිස කෙස් ඇති හිස නැවතත් කාමරය තුළට එබුනා.

'මිස්ටර් විවියන්... මම යන්න ගිහිල්ලත් කල්පනා කෙරුවෙ අද මම කේක් කෑලි කීයක් කෑව ද කියලයි. ඇත්තටම මම කේක් කෑලි තුනක් කෑවද එහෙම නැතිනම් දෙක යි ද ?. ඔයා මොනතරම් හොඳ කෙනෙක් ද කියලා කියන්න මම ළඟ වචන නෑ.'

'ආ... මෙතැන තියෙන කේක් කෑලි ටිකත් ඔක්කොම අරන් ඉක්මනට මෙතැනින් යන්න විලියම්.'

විවියන් ස්ට්‍රේන්ජ් මහතා කෝපයෙන් එහෙම කිව්වත් විලියම් නම් ඒ අදහසට කැමැති වුනේ නෑ. හැබැයි එයා කබඩ් එකේ දොර නම් දැනටමත් විවෘත කරලයි තියෙන්නේ.



'එපා... එපා... මිස්ටර් විවියන්. කේක් කෑලි ටික ඔක්කොම ගන්නා එක හොඳ නැහැනේ. දැනට මම එක කේක් කෑල්ලක් ගන්නම්. පස්සේ ආපු වෙලාවක ඉතිරි කේක් ටික කන්න බැරියැ. එහෙමනම් මම යන්නම්. ගුඩ් බායි...'

නිවසේ ඉදිරිපස දොර නැවතත් වැසිලා විලියම් ගේ රූපය නොපෙනී ගියා. ආයේත් පාරක් නිවස පුරා නිහඬතාවයක් පැතිරුනා. විවියන් ස්ට්‍රේන්ජ් මහතා දිගු සුසුමක් හෙලලා පෑන අතට ගත්තා. හැබැයි එයාට වැඩි වෙලාවක් මේ නිහඬතාවයෙන් ගත කරන්න ලැබුනේ නෑ. එයාට හොඳට හුරු පුරුදු අඩි සටහන් හඬක් නිවසේ සාලය දෙසින් නැවතත් ඇසෙන්න වුනා. තවත් තත්පර කිහිපයකින් දොර විවෘත වෙලා විලියම් රුව එතුලින් කාමරය තුළට එබුනා.

'බලන්නකෝ මිස්ටර් විවියන්. මම යන්න ගියාට පස්සේ තමයි මතක් වුනේ. මගේ අළුත් විසිල් එක ඔයාට පෙන්වන්න බැරිවුනා නේ. ඔයාට කියන්න මම මේ විසිල් එක පිඹින්න සෑහෙන්න පුරුදු වුනා. ඇත්තම කියනවා නම් මම අද මෙහාට ආවේත් ඔයාට මගේ විස්ල් එක පෙන්වන්නයි. බලන්නකෝ... මට ඒක අමතක වුන හැටි.'

එහෙම කියපු විලියම් ඇඟිලි දෙකක් කටට දමලා අමුතු හඬකින් විසිල් කරන්න වුනා. ඇත්තටම ඒක හරිම ගොරෝසු කටහඬක්. විලියම් ගේ විසිල් හඬ මොනතරම් ගොරෝසුද කියනවා නම් විවියන් මහතා අත් දෙකින් ම කන් වසාගත්තා. ඒ අතර විලියම් ආඩම්බරයෙන් සහ හිනවන් විදිහට හිනාවෙමින් මෙහෙම කිව්වා.

'මගේ විසිල් එකට ඔයා හරිම කැමැතියි කියලා මම දන්නවා මිස්ටර් විවියන්. ඔයා දන්නව ද ?. මගේ ගෙදර අය මේ විසිල් එකට ටිකක්වත් කැමැති නෑ. ඒ අය සංගීතය ගැන මෙලෝ දෙයක් දන්නේ නැති හින්දයි එහෙම වෙලා තියෙන්නේ. හැබැයි ඔයාට නම් සංගීතය ගැන හොඳ වැටහීමක් තියෙනවා. ඒ නිසයි ඔයා මගේ විසිල් එකට

මෙ තරම් කැමැති. හොඳයි... මම දැන් යන්නම් මිස්ටර් විවියන්. ගුඩ් බායි.'

ඒ පාර නම් විලියම් සිහින් හඬින් ගීතයක් මුමුණමින් පාර දිගේ ඇවිදගෙන යන්න වුනා. ඇත්තම කියනවා නම් එයාගේ සිහින් ගීත හඬ, විසිල් හඬ වගේම ගොරහැඩියි. විලියම් මේ විදිහට ගොරහැඩි හඬින් මුමුණන්නේ කිසියම් සතුටක් දැනුන විටයි.

අද දවස පුරාම විලියම් හිටියේ හරිම සතුටින්. තමන් ගේ අළුත් යාළුවා ගේ කරුණාවන්තකම ගැන... එයාගේ කථාබහ... රසවත් කේක්...ලස්සන දුණු පිහිය...වගේ ගොඩාක් දේවල් නිසා විලියම් ගේ හිත පුරාම තිබෙන්නේ පුදුමාකාර උද්දාමයක්. ඒ අතරම එයා සාක්කුවට අත දමලා ලස්සන දුණු පිහිය අතට අරන් හැඩ වැඩ බලන්න වුනා. මේ වගේ ලස්සන පිහියක් තෑගි දෙන්න තරම් විවියන් මහතාගේ හිත කාරුණික වීම ගැන විලියම් ට හරිම පුදුමයි. මේ ලෝකයේ ඉන්න කිසිම මිනිහෙක් මේ තරම් වටිනා තෑග්ගක් තමන් ට දෙන්නේ නෑ කියලත් විලියම් දන්නවා.

විලියම් දිගින් දිගටම කල්පනා කෙරුවා. තමන් ට මෙ තරම හොඳින් සළකන විවියන් මහතා ට විශේෂ දෙයක් තෑග්ගක් විදිහට දෙන්න ඕනෑ කියන අදහස එයාගේ හිතට ආවේ ඉන්පසුවයි. ආයේමත් ඔහු බලන්න යද්දි බත් කූරන් දෙකුත් දෙනෙකු රැගෙන යන්නට විලියම් දැනටමත් තීරණය කරගෙනයි ඉන්නේ. හැබැයි එයටත් වඩා හොඳ තෑග්ගත් ඔහුට දෙන්න ඕනෑ කියලා විලියම් කල්පනා කෙරුවා. ඔන්න එතකොට තමයි විලියම් ගේ හිතට අපූරු අදහසක් ආවේ. විවියන් මහතා ගේ පොතේ තිබෙන ඇල්බර්ටෝ කියන චරිතය හිමි කෙනා සැබෑ ජීවිතයේදී එවැනි දෙයකට මුහුණ දුන්නොත් එයාගේ ප්‍රතිචාරය කුමක් වෙයිද ?. ඒ ගැන දැනගෙන ගොස් විවියන් මහතා ට දැනුම් දුන්නොත් ඒක ඇත්තටම වටිනා තෑග්ගක් කියලත් විලියම් කල්පනා කෙරුවා.



මේ සිතිවිල්ල ගැන කල්පනා කරමින් ම විලියම් පාර අයිනේ ටික වෙලාවක් නතර වෙලා වටපිට බලන්න වුනා. පෝටර් මහතා නිවසට එමින් සිටියේ එන්න ඔය වෙලාවේදියි. ඇත්තටම පෝටර් මහතා කියන්නේ ගොඩාක් වැදගත් මහත්මයෙක්. හැබැයි එයාට කාර්යාලයේ වැඩ කටයුතු ඇරෙන්න වෙන කිසිම ජීවිතයක් තිබුනේ නෑ කියලා හැමෝම කියනවා. අදත් ඒ වගේ සේවයට ගොසිනුයි මිස්ටර් පෝටර් මේ වෙලාවේ ආපහු ගෙදර යමින් සිටින්නේ. පහුගිය අවුරුදු තිහ පුරාම එයා කාර්යාලයට යනකොට රැගෙන ගිය හම් බෑගය මේ වෙලාවෙත් එයාගේ අතේ තිබුනා.

පෝටර් මහතා හනි හනික නිවසට යන්නේ පුළුවන් තරම් ඉක්මනට ගිනි උදුන ළඟ වාඩිවෙන්න හිතාගෙනයි. ඉන්පසුව එයා වයින් විදුරුවක් පානය කරලා, ඉස්තරම් සුරුට්ටුවකුත් කටේ ගහගෙන හැන්දෑවේ පත්තරය සම්පූර්ණයෙන් ම කියවනවා. ඉන්පසුවයි එයා රසවත් රාත්‍රී ආහාර වේල ගන්නේ. පෝටර් මහතා හැමදාම හැන්දෑවට කරන මේ දින චරියාවත් පහුගිය අවුරුදු තිහ පුරාම වෙනස් නොවුන දෙයක්.

මේ දේවල් ගැන සිහින මවමින් ම හනි හනික නිවස කරා යමින් සිටි පෝටර් මහතා ඉදිරියට විලියම් හනි හනික කඩාගෙන පැන්නා. මේ වෙලාවේ නම් විලියම් ගේ මුහුණේ සිනාවක සේයාවක්වත් තිබුනේ නෑ.

පෝටර් මහතා ළඟට කිට්ටු වුන විලියම් බොහෝම තැවරුම් විදිහට මේ වගේ දෙයක් කිව්වා.

'මහත්මයා... ඔයා ආදරේ කරන ගැහැණු ළමයා පණිවුඩයක් කියන්න කියලා කිව්වා. එයා මේ වෙලාවේ හරිම භයානක අනතුරකට මුහුණ දීලයි ඉන්නේ. ඔයා ඉක්මනට ගිහිං එයාව බේරාගන්න.'

විලියම් කියපු දේ ඇහුන ගමන් ම පෝටර් මහතා ඉක්මනින්

sinhalaebooks.com



ම නතරවුනා. එයාගේ මුහුණේ කිසියම් බියපත් බවක් ද තැවරිලා තියෙන හැටි විලියම් ට හොඳින් ම පෙනෙනවා. ටික වෙලාවක් විලියම් දිහා බලාගෙන හිටපු පෝටර් මහතා ඉන්පසුව මෙහෙම ඇහුවා.

'ළමයා... ඔයා ගැහැණු ළමයෙක් ගැන ද කිව්වේ ?. කරුණාකරලා ඒ කථාව ආයේ පාරක් කියන්න පුළුවන් ද ?.'

විලියම් කිසිම පැකිලීමක් නැතිව එයා මුලින් කියපු කථාවම නැවතත් පෝටර් මහතා ට කිව්වා.

'ඔයා ආදරේ කරන ගැහැණු ළමයා පණිවුඩයක් කියන්න කියලා කිව්වා. එයා මේ වෙලාවේ හරිම භයානක අනතුරකට මුහුණ දීලයි ඉන්නේ. ඉක්මනට ගිහිං එයාව බේරාගන්න.'

'මොකක් ද ළමයා කිව්වේ ?. කාන්තාවක් අනතුරකට මුහුණ දීලා ඉන්නවා. ඔයා කියන්නේ මගේ බිරිඳ ගැන ද ?.'

'මම හිතන්නේ එහෙම තමයි මහත්මයා.'

'ආ... එතකොට මගේ බිරිඳ ද ඔයාට මේ පණිවුඩය කිව්වේ?.'

'ඔව්...'

'ඔයාට මේ පණිවුඩය කිව්වේ උස කාන්තාවක් ද ?'

'ඔව්...'

'එයාගේ දකුණු කම්මුලේ ලපයක් තිබුන ද ?.'

'ඔව්...'

'අළුපාට කොණ්ඩයක් ද තිබුනේ ?.'

'ඔව්...'

'එහෙමනම් හරියටම හරි. ඔයා කියන්නේ මගේ බිරිඳ ගැන



තමයි. එයා මොකක් කිව්වා කියලද ඔයා කිව්වේ ?.'

'ඔයා ආදරේ කරන ගැහැණු ළමයා පණිවුඩයක් කියන්න කියලා කිව්වා. එයා මේ වෙලාවේ හරිම භයානක අනතුරකට මුහුණ දීලයි ඉන්නේ. ඉක්මනට ගිහිං එයාව බේරාගන්න.'

'ඉතින් එයා කොහෙද ඉන්නේ ?.'

'දන්නේ නෑ. හැබැයි ඔයා මම පස්සෙන් එනවා කියලා නම් කිව්වා.'

'දෙයියනේ හරිම විනාසයක් නේ. මම ඉක්මනට ගියොත් හොඳයි කියලා හිතෙනවා. එයා ඉන්න තැන ගොඩාක් ඈත ද ?.'

පෝටර් මහතා ගේ පිළිතුර ඇහුන ගමන් විලියම් ගේ දෑස දීප්තියෙන් බැබලෙන්න වුනා. එයා හිත යටින් හිනාවෙවී මේ වගේ දෙයක් කිව්වෙත් ඒ නිසාමයි.

'නෑ... මම හිතන විදිහට එච්චර ඈත නෙවෙයි.'

මේ වනවිටත් පෝටර් මහතාගේ ලස්සන සිහින ලෝකය කඩා වැටිලා අවසන්. උණුසුම් ගිනි උදුන, රසවත් වයින්, අපූරු රාත්‍රී කෑම මේසය, සුවපහසු නිවහන, හොඳම සුරුට්ටු, හැන්දෑවේ පත්තරය වගේ එයාගේ හිතේ තිබුන හැම සිහිනයක් ම අල්ලා ගන්න බැරි තරම් දුරකට පාවෙලා ගිහිං කියලා එයාට හිතුනා. ටික වෙලාවක් විලියම් දිහා බලාගෙන හිටපු පෝටර් මහතා පුදුමාකාර හඬිසියකින් මෙහෙම කිව්වා.

'ළමයා... පුළුවන් තරම් ඉක්මනට ඔය කියන තැනට මාව එක්ක යන්න. අපි පරක්කු වුනොත් මේ සීතලට මැරෙන්නත් පුළුවන්. දෙයියනේ... මේ වගේ දෙයක් වෙයි කියලා මම නිකමටවත් හිතුවේ නෑ. ඉක්මන් කරන්න ළමයා... ඉක්මන් කරන්න.'

විලියම් සතුටින් සහ කිසිම සද්දයක් නැතිව ඉදිරියෙන් ඇවිද

sinhalaebooks.com



යද්දී පෝටර් මහතා ද නිහඬව සහ කම්පනය වුන සිතින් වුතුව ඔහු පසුපසින් ඇවිදගෙන එන්න වුනා. තමන් ගේ සුපුරුදු දින චරියාව වෙනස් වෙන විදිහේ දෙයක් සිද්ධ වුන එක ගැන පෝටර් මහතා හිටියේ පුදුමාකාර හිතේ අමාරුවකින්. තමන් ගේ බිරිඳ මේ විදිහේ අදිසි පණිවුඩයක් එව්වේ ඇයි ?. මේ නන්නාදුනන කොළු ගැටයා කවුද ? මේ වගේ ගොඩාක් දේවල් පෝටර් මහතා ගේ හිතේ තිබුනා. එයා ඉදිරියට ඇවිද යන ගමනුත් කල්පනා කෙරුවේ මේ දේවල් ගැනමයි. ඒ අතර විලියම් සහ පෝටර් මහතා පාර දිගේ සෑහෙන දුරක් ඇවිදගෙන ගිහිං වංගුවක් ළඟට ආවා. ඉන්පසුව ඔවුන් ගෙවත්ත වටෙන් ඇවිදගෙන විත් පසුපස ගේට්ටුව ළඟටත් ආවා. තවත් ටික වෙලාවකින් ගෙවත්තේ කෙළවර තියෙන පරණ ගබඩා කාමරයක් වැනි තැනකට පැමිණියාට පසුව විලියම් ගොඩාක් සැහැල්ලු හඬකින් මෙහෙම කිව්වා.

'මහත්මයා... මෙතැන ඉඳලා ඔයා තනියම ඉස්සරහට ගියොත් හොඳයි. මොකද ඒ ගෑණු කෙනා කිව්වෙත් එහෙම තමයි.'

'මොකක් ද ළමයා ඔයා කිව්වේ... තව සැරයක් කිව්වොත් මට හොඳටම තේරුම් ගන්න පුළුවන් වෙයි.'

පෝටර් මහතා වික්ෂිප්ත හඬකින් කියද්දී විලියම් මුලින් කිව්ව දේ නැවතත් කිව්වා.

'මහත්මයා... මෙතැන ඉඳලා ඔයා තනියම ඉස්සරහට ගියොත් හොඳයි. මොකද ඒ ගෑණු කෙනා කිව්වෙත් එහෙම තමයි.'

'මේ පරණ ගබඩා කාමරේට ?... තනියම යන්න. දෙයියනේ මේ තරම් අපිරිසිදු ගල් අඟුරු කාමරේකට මම කොහොමද තනියම යන්නේ ?.'

පෝටර් මහතා අදිමදි කරමින් කිව්වා. ඒ වුනත් එයාට කරන්න වෙන දෙයක් තිබුනේ නෑ. ඒ හින්දා එයා විදුලි පන්දමත් දල්වාගෙන



ම පරණ ගල් අඟුරු ගබඩාවට ඇතුළු වුනා. එයා විදුලි පන්දම දල්වාගෙන ගබඩා කාමරය පුරාම විමසිලිමත් බැලුවත් කිසිම කෙනෙක් පෙනෙන්න හිටියේ නෑ. ඔන්න එතකොටම ගබඩා කාමරයේ දොර එක්වරම වැහිලා යතුරු වැටෙන සද්දේ එයාට ඇහුනා.

'ඒයි... මොකද ඔය කරන්නේ ?...'

පෝටර් මහතා කෝපයෙන් ගොත ගසමින් බෙරිහන් දුන්නත් කිසිම විදිහක පිළිතුරක් නම් ඔහුට ලැබුනේ නෑ. ඒ නිසාම එයා දොරට මහා හයියෙන් ගසමින් ම නැවතත් බෙරිහන් දෙන්න වුනා.

'මේ දොර අරිනවා පුංචි තක්කඩියෝ...'

ඒ බෙරිහන් දීමටවත් උත්තරයක් ලැබුනේ නෑ.

නොසිතූ විදිහට ගල් අඟුරු කාමරයේ හිරවුන පෝටර් මහතා දොර විවෘත කරගන්න හිතාගෙන නොකළ දෙයක් නෑ. එයා දොරට ගැහුවා. හෙලෙව්වා. සීරුවා.ඒ මොන දේ කළත් දොර නම් විවෘත වුනේ නෑ. දැන් එයාගේ අතේ තිබෙන්නේ විදුලි පන්දම විතරයි. ඒ හින්දා එයා විදුලි පන්දම දල්වාගෙන කාමරයෙන් පිටවෙන මඟක් සෙව්වා. කාමරයේ පිටුපසට වෙන්නට සෑහෙන උසකින් තිබෙන කුඩා ජනේලයක් ඔහුට පෙනුනේ එතකොටයි. කාමරයෙන් පිටවෙන්නට නම් ගල් අඟුරු ගොඩ දිගේ උඩට නැග මේ ජනේලයෙන් පිටවිය යුතුය. එසේ කල්පනා කළ පෝටර් මහතා ගල් අඟුරු ගොඩ දිගේ බඩගාමින්, ලිස්සමින්, ගල් අගුරු කුඩු ආඝ්‍රාණය කරමින් ජනේලය ළඟට සමීප වෙන්නට උත්සාහ කෙරුවා. සෑහෙන වෙලාවක් උත්සාහ කෙරුවත් පෝටර් මහතා ගේ උත්සාහය නම් සාර්ථක වුනේ නෑ. මේ වනවිට එයාගේ කමිසයේ කොලරයත් ඉරී ගොසින්.

මේ වනවිට පෝටර් මහතා ගේ මුවෙන් මහා දරුණු වදන් වැලක් නොකඩවාම ගලාගෙන එනවා. එයා හිරගත වෙලා දැන්

sinhalaebooks.com



සැහෙන වෙලාවක් ගතවුනත් මේ නපුරු වචන වලට නම් කිසිම නිමාවක් තිබුනේ නෑ. එයා දැන් ගල් අඟුරු නිසා සම්පූර්ණයෙන් ම කලු පැහැයට හැරිලා. ඒ විතරක් නෙවෙයි කමිස කොලරයත් ඉරිලා. කබාය වැරහැලි වෙලා. මේ දේවල් සහ තමන් ගේ සුපුරුදු දින චරියාව වෙනස් වීමෙන් උපන් කෝපය නිසා පෝටර් මහතා තෝරතෝංචියක් නැතිව තමන් ම හිර කරපු නැහැදිච්චි කොළුවාට බනිනවා. හැබැයි මේ කිසිම දේකින් හෝ ගල් අඟුරු කාමරයෙන් පිටවෙන මඟක් හොයාගන්න නම් පෝටර් මහතා ට පුළුවන් වුනේ නෑ.

..............................................................

මේ වනවිටත් විවියන් ස්ට්‍රේන්ජ් මහතා තමන් ගේ ලිපිය ලියන්න පුදුමාකාර විදිහට මහන්සි වෙනවා. හැබැයි විලියම් ගේ විකාර හැසිරීම හින්දා එයාගේ කලාකාමී සිතිවිලි හැම එකක් ම මොට්ට වෙලයි තියෙන්නේ. එයා ප්‍රසිද්ධ ලේඛකයෙකුගේ කවි පොතක් සම්පූර්ණයෙන් ම කියෙව්වෙත් මොට්ට වෙලා තියෙන කලාකාමී සිතිවිලි නැවතත් උළුප්පා ගන්න හිතාගෙනයි. විවියන් මහතා ගේ ඒ උත්සාහය නම් සාර්ථකයි වගේ. එයා නැවතත් සන්සුන් මනසකින් ලිපිය ලියන්න සූදානම් වෙද්දී ම හුරු පුරුදු හඬවල් ගෙවත්ත දෙසින් ඇසෙන්න වුනා. වේගවත් අඩි සටහන් හඬ, බෙරිහන් දෙන හඬ... ඇත්තටම ඒ කාගේ පැමිණීම ද කියලා විවියන් මහතා ට කිසිම සැකයක් තිබුනේ නෑ. අමාරුවෙන් පුබුදාගත් කලාකාමී සිතිවිලි නැවතත් ගරා වැටෙද්දී විලියම් ගේ ගොරහැඩි විසිල් හඬත් ඇසෙන්න වුනා. විවියන් මහතා දිගු සුසුමක් හෙලලා පෑන සහ පොත පැත්තකින් තියද්දී ම ඉදිරිපස දොර ඇරී විලියම් ගේ අවුල් වුන හිසකෙස් සහිත හිස කාමරයට එබුනා. ඇත්තටම ඒ වෙලාවේ නම් විලියම් ගේ මුහුණේ තිබුනේ ජයග්‍රාහී හැඟීම් සමුදායක්.

'මිස්ටර් විවියන්... මේ දැන්ම ම මාත් එක්ක පොඩි ගමනක්



යන්න එන්න. එතකොට තරහා ගිය මිනිහෙක් ඇත්ත ජීවිතයේදී කියන නපුරු කථා අඩුවක් නැතිව ඔයාට අහගන්න පුළුවන් වෙයි. මම කියන කෙනා ගල් අඟුරු ගබඩාවක හිරවලයි ඉන්නේ. එයා කියන දේවල් මම නම් ඇති තරම් ඇහුවා. ඔයත් ඇවිත් අහන්න. ඒවා ඔයාගේ කථාවට ගොඩාක් ප්‍රයෝජනවත් වෙයි කියලා මට සහතිකයි.'

විලියම් හති හලමින් එහෙම කියද්දී විවියන් මහතා පුදුමයෙන් මහත් කරගත් දෙනෙත් වලින් යුතුව පුටුවෙන් නැගිට්ටා. ඉන්පසුව ඔහු කිව්වේ වචන දෙකක් විතරයි.

'ඒ වුනත්.... කොහෙද ?.'

'ටිකක් ඈත තියෙන ගල් අඟුරු ගබඩාවක. හැබැයි ඉක්මන් කරන්න ඕනෑ. මොකද එයාට මහන්සි වුනොත් බනින එක නවත්වයි. එහෙම වුනොත් ඔයාට කිසිම දෙයක් අහගන්න ලැබෙන්නේ නෑ. මතක් කරලම ලියන කොල ටිකක් ගන්න. මොකද එයා කියන දේවල් ලියාගන්නත් එපා යැ.'

විලියම් සහ විවියන් මහතා ගල් අඟුරු ගබඩාව ළඟට පැමිණෙද්දී හැම දෙයක් ම සිද්ධ වෙලා අවසන්. ගල් අඟුරු ගබඩාවේ දොර අසලින් මැත් වෙන කළු පාට රුවක් පමණයි ඔවුන් ට දකින්නට ලැබුනේ. ඒ පෝටර් මහතා බව විලියම් ට කිසිම සැකයක් නෑ. ඒ අඳුරු රුව කිසියම් නරක වචන කිහිපයක් සෙමින් මුමුණමින් හනි හනික පාර දෙසට යන හැටි විලියම් සහ විවියන් මහතා දැක්කා. පෝටර් මහතා කියූ වචන වලින් විලියම් ට මතක තිබුනේ 'පොලීසියට කියනවා,' 'මේ කරපු දේට හොඳ පාඩමක් උගන්වනවා' වගේ දේවල් විතරයි. තමන් ගේ උත්සාහය අසාර්ථක වුන නිසාම විලියම්, විවියන් මහතා දිහාට හැරිලා දුකෙන් වගේ මේ වගේ දෙයක් කිව්වා.

'මිස්ටර් විවියන්... අපි පරක්කුයි. එයා දොර කඩාගෙන එළියට

sinhalaebooks.com



ඇවිත්. කොහොම වුනත් එයා ඇත්ත ජීවිතයේ දි හැසිරෙන්නේ මොන වගේද කියලා ඔයාට යාන්තමට හරි වැටහෙන්න ඇති නේ. තරහා වැඩිවුනාම මිනිහා දොරවල් කඩනවා. හැබැයි මම ගොඩාක් වෙලාවක් අහගෙන හිටපු හින්දා එයා කියපු දේවල් මට හොඳට මතකයි. මම ඒවා ඔයාට පස්සේ කියන්නම් කෝ. ඒක නෙවෙයි... ඔයා අකමැති නැතිනම් මම ඇවිත් තවත් කේක් කෑල්ලක් අරන් යන්නම්. මොකද ඔයා වෙනුවෙන් මේ දේවල් කරන්න මට සෑහෙන්න මහන්සි වෙන්න වුනා. අනික ඔයාගේ මේ දුණු පිහිය මම තව දවසක් තියාගෙන ඉඳලා ආපහු දෙන්නම්. ඒක මගේ යාළුවන් ට පෙන්වන්න තියෙනවා. තව එකක්... තරහා ගිය මිනිහෙක් ඇත්ත ජීවිතේ දී කරන දේවල් මොනවද කියලා ඔයාට තවත් දැනගන්න ඕනෑ නම් මට කියන්න. ඔයා වෙනුවෙන් මම ඒ දේවලුත් කරනවා. මේ අත්දැකීම් එක්ක ඔයාට හොඳ රසවත් කථාවක් ගොතන්න පුළුවන් වෙන එක ගැන නම් මට කිසිම සැකයක් නෑ.'

විලියම් දිගින් දිගටම කියාගෙන ගියත් එයා ගේ කථාව අහන්න විවියන් මහතා එතැන හිටියේ නෑ. එයා මේ වනවිටත් තවාතැනට ගිහිං විදුලි පණිවුඩයක් ලියනවා.

'මෙහෙන් පිටවෙන බෝට්ටුවක හොඳම ආසනයක් වහාම වෙන්කරන්න.'

විවියන් මහතා ලියූ විදුලි පණිවුඩයේ සඳහන් වෙලා තිබුනේ ඒ වගේ දෙයක්.

'මම ත් දැන් ගියොත් හොඳයි කියලා හිතෙනවා. මොකද මේ වෙනකොටත් මගේ රෑ කෑම වෙලාව පරක්කු වෙලා. මම ගියාට ඔයා අකමැත්තක් නැහැනේ මිස්ටර් විවියන් ?.'

විලියම් උනන්දුවෙන් වගේ අහද්දී විවියන් මහතා දුන්නේ නොසැලකිමත් උත්තරයක්.



'අනේ මගේ කිසිම අකමැත්තක් නෑ. කොහොම වුනත් මම ත් හෙට උදෙත් ම මෙහෙන් යනවා. ඊට ඉස්සර වෙලා වුනත් යන්න තියෙනවා නම් මම හරිම කැමැතියි.'

විවියන් මහතා ගේ කථාවට පසුව විලියම් කථා කරන්න වුනේ මවාගත් දුකක් ද හිතේ තදකරගෙනයි.

'ඔයා කියන්නේ ඇත්ත ද ?. ඔයා මෙහෙන් යනව ද ?. ඇත්තමයි මිස්ටර් විවියන්. ඔයා ගියාම මට හරිම පාළුවක් දැනෙයි. මම හිතන්නේ ඔයාටත් මම නැති පාළුව ගොඩාක් දැනෙයි නේද ?.'

'ඇයි නැත්තේ විලියම්. මටත් ඔයා නැතිවෙනවා. හැබැයි ඔයා ගෙන් ඉක්මනට ඈත් වෙන්න ලැබුන එක ගැන මම ගොඩාක් සතුටු වෙනවා.'

විවියන් මහතා දුක සහ කෝපය මිශ්‍ර වුන හඬකින් පිළිතුරු දුන්නා. විලියම් වුනත් නිකං හිටියේ නෑ. එයා තමන් ගේ හිතේ තියෙන මවාගත් දුක තවත් තීව්‍ර කරමින් කිව්වේ මේ වගේ දෙයක්.

'කමක් නෑ.. ඔයා ඒ කිසිම දෙයක් ගැන දුක්වෙන්න එපා. ඔයා පුළුවන් තරම් ඉක්මනින් ම ආපහු එනව නම් මම හරිම කැමැතියි. එහෙමනම් ඔයාට ආයුබෝවන්... දැන් ඉතින් ඔයාට කථාව හොඳට ලියාගන්න පුළුවන් නේ. අනික ඔයාගේ කථා නායකයා ට තරහා ගියාම කියන්නේ මොනවද කියලත් ඔයා දැන් හොඳටම දන්නවා නේ. එහෙමනම් ගුඩ් බායි මිස්ටර් විවියන්.'

එහෙම කියපු විලියම් සෙමෙන් සෙමෙන් ඉදිරිපස දොර ළඟට ඇවිදගෙන ගියා. විවියන් මහතා සැනසුම් සුසුමක් හෙලලා ලය සැහැල්ලු කරගත්තේ එවිටයි. හැබැයි එයාගේ හිතේ ඒ සහනය වැඩි වෙලාවක් නම් තිබුනේ නෑ. කාමරයේ ජනේලය තුළින් එයාට පෙනුනේ ගල් අඟුරු වලින් කළු පාට වුන මිස්ටර් පෝටර් පාර දිගේ ඇවිදගෙන යන අන්දමයි. ඔහුත් සමඟ සටහන් පොතක් ගත් තවත්

sinhalaebooks.com



අයෙක් ද ඇවිදගෙන යනවා. සමහර විට ඒ පොලිස් නිළධාරියෙක් වෙන්න ඇති කියලා විවියන් මහතා ට හිතුනා.

පෝටර් මහතා දෙස බලා සිටි විවියන් මහතා ගේ දෑස් මායිමට ඉන්පසුව ආවේ ඔහු හිතෙකින්වත් බලාපොරොත්තු නොවෙන කෙනෙක් ගේ රුවක්. ඒ රුව දුකපු ගමන් මෙතෙක් වෙලාවක් විවියන් මහතා ගේ හිතේ තිබුන සැනසිල්ල සම්පූර්ණයෙන් ම කඩාගෙන වැටුනා. ඇත්තටම ඒ ඇවිත් හිටියේ විලියම් ය.

ජනේලය ළඟට දුවගෙන ආ විලියම් නැවතත් කථාව පටන්ගත්තා.

'මිස්ටර් විවියන්... මට ඔයාට දෙයක් කියන්න අමතක වුනානේ. ඔයා දුන්න දුණු පිහිය මට ම තියාගන්න කියලා ඔයා කිව්වා නේද ?.'

විලියම් එහෙම අහද්දී විවියන් මහතා කිසිම කථාවක් බහක් නොමැතිව හීනෙන් වගේ හිස සෙලෙව්වා. විලියම් ගේ මුහුණේ ලොකු හිනාවක් සිත්තම් වුනේ ඒ සමගමයි.

'ඔයාට ගොඩාක් ස්තුතියි මිස්ටර් විවියන්. එහෙම නම් ඔයාට ආයේම සැරයක් ආයුබෝවන්.'

..........................................................................

විලියම් හනි හනික පාර දිගේ නිවස පැත්තට දුවන්න වුනා. තමන් ගේ අලුත් යාළුවා වෙන්ව් යාම ගැන එයාගේ හිතේ සියුම් දුකක් ද තියෙනවා. දැන් ඉතින් බත්කූරෝ අල්ලාගෙන ගිහිං එයාට දෙන්න විදිහක් නෑ නේද කියත් විලියම් ට හිතුනා. ඒ වුනත් විවියන් මහතා සමග ගත කරපු පැය කිහිපය මොනතරම් අපූරු ද කියලා ඔහු කල්පනා කෙරුවා. හරිම රසවත් කේක්, අපූරු දුණු පිහිය වගේ දේවල් ගැන සිහිපත් වෙද්දී විලියම් ගේ හිත සතුටින් විකසිත වෙනවා. ඒ විතරක් ද ?. පෝටර් මහතා ගල් අඟුරු ගබඩාවේ සිර කෙරුවාට



පසුව ඔහු කියූ දේවල් වලින් අළුත් වචන කියක් නම් විලියම් ට ඉගෙන ගන්න ලැබුනා ද ?.

sinhalaebooks.com

# 8.
# පරිච්ඡේදය

## විලියම්ගේ නව නවත් දඟ වැඩ

දවසක් විලියම් ට රොබින්සන් කෘසෝ කියන පොත කියවන්න අවස්ථාවක් ලැබුනා. මේ පොතේ එන චරිත විලියම් ගේ හිතට මොනතරම් තදින් කා වැදුන ද කියනවා නම් එයා පැත්තකට වෙලා පැය ගාණක් ම ඒ ගැන කල්පනා කෙරුවා. නැවකින් මුහුදු ගිහිං කුනාටුවකට අහුවෙලා පාළු දූපතකට ගසාගෙන යන්න තියෙනවා නම් මොනතරම් හොඳ ද කියලා විලියම් ට හිතුනේ අන්න ඒ වෙලාවේදියි. එහෙම වුනා නම් කාගෙන්වත් කරදරයක් නැතිව ඒ පාළු දූපතට වෙලා නිවිහැනහිල්ලේ ඉන්න පුළුවන් නේද කියලත් විලියම් කල්පනා කෙරුවා.

විලියම් එදා තේ බොන්නවත් නැගිට්ටේ නැතිව තමන් ගේ හිතට ආපු අළුත් සිතිවිල්ල ගැන කල්පනා කෙරුවා. තමනුත් මේ වගේ වීර ක්‍රියාවක් කරන්න ඕනෑ කියන ස්ථිර සිතිවිල්ලත් එක්කයි විලියම් වාඩිවෙලා හිටපු තැනින් නැගිට්ටේ. ඇත්තටම



විලියම් දැන් සූදානම් වෙන්නේ නැවකින් මුහුදු ගොස් කුනාටුවකට අහුවෙලා මුහුදේ තියෙන හුදකලා දූපතට ගොඩ බසින්නයි. මේ ගමන යන්න ඉස්සර වෙලා එයා කලිසමේ සාක්කු දෙකම බිස්කට් වලින් පුරවා ගත්තා. මුහුදු මැද දී බඩගිනි වුනොත් කෑමට ගන්නයි එයා බිස්කට් සාක්කුවට දමාගත්තේ. ඊට අමතරව හයිය නූලකුත් පරිස්සමට අරන් තියාගත්තා. හදිසි කරදරයක දී නූලක් වුනත් ප්‍රයෝජනවත් වෙන බව දන්නා නිසයි විලියම් විශේෂයෙන් ම නූලක් සාක්කුවට දමාගත්තේ.

ගමනට සූදානම් වුන විලියම් නිවසේ විසිත්ත කාමරය දිහාට ඉක්මන් ගමනින් ඇවිදගෙන ගියා. අම්මා සහ අක්කා කාමරයේ වාඩිවෙලා කුමක් දෝ කථාබහක නිරත වෙලා ඉන්න හැටි විලියම් දුර තියාම දැක්කා. නැවියන් මුහුදු යද්දී ගෙදර අයගෙන් සමු අරන් යන බව විලියම් පොත්පත් වලින් කියවලා තිබුනා. දැන් එයත් සූදානම් වෙන්නේ මුහුදු ගමන යන්න ඉස්සර වෙලා ගෙදර අයගෙන් සමු ගන්නයි.

විසිත්ත කාමරයට ගිය විලියම් ගොඩාක් ගැඹුරු හඬකින් මෙහෙම කිව්වා.

'ඔන්න එහෙමනම් හැමෝටම ආයුබෝවන්. මොකද මම ආපහු ගෙදර එන්නේ නෑ.'

විලියම් එහෙම දෙයක් කිව්වට අම්මා සහ අක්කා චුට්ටක්වත් පුදුම වුනේ නෑ. විලියම් නිතරම මේ විදිහේ විහිළු කරනවා කියලා ඒ අය දන්නවා. හැබැයි ටික වෙලාවකට පසුව අම්මා නම් මෙහෙම දෙයක් කිව්වා.

'කොහේ ගියත් කමක් නෑ විලියම්. හැබැයි ඔයා ගෙදර එන ගමන් සපත්තු දෙක හොඳට පිහදාගෙන එන්න නම් අමතක කරන්න එපා.'

sinhalaebooks.com



අම්මා ගේ කථාව අවසන් වෙනවාත් සමඟම අක්කා එතල් ගේ සමච්චල් සහගත කටහඬත් විලියම් ට ඇහුනා.

'අනේ අනේ විලියම්... ඔයා කොහේ ගියත් තේ වෙලාවට ගෙදර එනවා කියලා අපි දන්නවා.'

තමන් වැනි වීරෝදාර නාවිකයෙකුට ගෙදර අයගේ සැළකිල්ල හොඳටම මදි කියලා විලියම් ට ඒ වෙලාවේ හිතුනා. එයාට ගොඩාක් දේවල් කියන්න හිතුනත් මේ වෙලාවේ නම් ඒ කිසිම දෙයක් කියන්න උත්සාහ කෙරුවේ නෑ. හැබැයි අන්තිම වතාවටත් ගෙදර අයට තමන් ගේ ගමන ගැන කියන්න විලියම් ට සිදුවුනා.

'එහෙමනම් කමක් නෑ. හැබැයි මම ගෙදර එන්න ගොඩාක් පරක්කු වෙන්න පුළුවන්. ඔන්න මට බනින්න නම් එපා. මොකද මම හරිම වැදගත් ගමනක් මේ යන්න හදන්නේ.'

කිසියම් අනතුරක් හඟවන්නාක් වැනි හඬකින් එහෙම කියපු විලියම් නිවසින් එළියට බැස්සා. දැන් ඔහු සුදානම් වෙන්නේ තමන් ගේ මුහුදු ගමන ආරම්භ කරන්නයි. සූර වීර නාවිකයෙක් ගැන හිතින් මවාගෙනම විලියම් ගමන ආරම්භ කෙරුවා. එයා නාවිකයෙක් විදිහට ඇවිදින්න උත්සාහ කෙරුවත් දකින අයට නම් හිතෙන්නේ කමකට නැති පොඩි එකෙක් පාර දිගේ ඇවිදගෙන යනවා කියලයි. අත් දෙකත් සාක්කුවට දමාගෙන පාර දිගේ ටික දුරක් ඇවිදගෙන යද්දී කවුදෝ කෙනෙක් කථා කරන හඬ එයාට ඇහුනා.

'හලෝ විලියම්....'

අල්ලපු ගෙදර ඉන්න ගැහැණු ළමයා ජොවෑන් සිනාසී ගෙන විලියම් ඉදිරියට එනවා. එයා දැකපු ගමන් විලියම් ගේ හිත ටිකක් සලිත වුනා. ඒත් එක්කම වෙනත් අදහසකුත් විලියම් ට ආවා. පාළු මුහුදක තනියම නැවක් පදවාගෙන යනවට වඩා ජොවෑනුත් ඒ



ගමනට එක් කරගන්න තියෙනවා නම් මොනතරම් හොඳ ද කියන එකයි ඒ අළුත් සිතිවිල්ල. ඒ ගැනත් හිතේ තියාගෙන විලියම්, ජොවෑන් ට මෙහෙම කිව්වා.

'ආ... ජොවෑන්... මම මේ මුහුදු ගවේශනයක් කරන්න යනවා. ඇත්තම කියනවා නම් කවුරුවත් හොයාගත්තේ නැති අළුත් රටක් හොයාගන්නයි මම හිතාගෙන ඉන්නේ.'

විලියම් ගේ කථාව ඇහුන ගමන් ජොවෑන් ගේ දෑස සතුටින් දිලිසෙන්න වුනා. එයා පුදුමාකාර විදිහේ නොඉවසිල්ලකින් මෙහෙම ඇහුවා.

'අනේ හරි ෂෝක් විලියම්... මම ත් ඔයා එක්ක එන්න ද ?.'

තමන් කියන්නත් ඉස්සර වෙලා ජොවෑන් ගමනට කැමැත්ත දුන්න එක ගැන විලියම් ට හරිම සතුටුයි. එයා එකපයින් ම මෙහෙම කිව්වා.

'කිසිම ප්‍රශ්නයක් නෑ ජොවෑන්. ඔයාටත් මම එක්ක එන්න පුළුවන්. ඔයා මගේ නැවේ ම යන්න එනව ද එහෙම නැතිනම් ඔයාගේම නැවක් පදවාගෙන යනව ද ?.'

'මම ත් ඔයාගේ නැවේම යන්න එන්නම් විලියම්. කරුණාකරලා මට ඒකට ඉඩදෙන්න.'

'හරි... එහෙමනම් ඔයත් ඇවිත් මගේ නැවට නගින්නකෝ.'

එහෙම කියපු විලියම් ආයේමත් ගමන ආරම්භ කෙරුවා. ජොවෑනුත් දැන් ඔහු සමග පාර දිගේ ඉදිරියට ඇවිදගෙන යනවා. මේ අපූරු ගමන ගැන ගොඩාක් කල්පනා කළ නිසාදෝ ජොවෑන් විලියම්ගෙන් වැඩිය ප්‍රශ්න ඇහුවෙත් නෑ.

'ඔයා දන්නව ද ජොවෑන්... අපි දැන් ගොඩාක් දුර නැව පදවාගෙන ආවා. වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා අපිට පාළු

sinhalaebooks.com



දූපතකට ගොඩ බහින්න පුළුවන් වෙයි. අපි ගොඩ බහින දූපත වටේටම අයිස් කඳු එහෙම තියෙන්න පුළුවන්. සමහර විට දරුණු කුනාටු හමන්නත් පුළුවන්. හැබැයි ඔයා ඒ කිසිම දෙයක් ගැන බයවෙන්න එපා. මොකද මම ඉන්නවා නේ.'

විලියම් ආඩම්බර විදිහට එහෙම කියද්දී ජොවැන් එක්වරම මේ වගේ දෙයක් කිව්වා.

'හොඳයි විලියම්. ඔයා ඉන්න හින්දා මම යකෙකුටවත් බයවෙන්නේ නෑ.'

'ජොවැන්... ඔයා තමයි අපේ ගමනේ දී වටපිට විපරම කරන කෙනා. මම තමයි නැවේ කපිතාන්. අන්න ඒක අමතක කරන්න එපා හොඳ ද ?.'

විලියම් එහෙම කියද්දී ජොවැන් පාර දිගේ ගොඩාක් දුරට විපරම් කෙරුවා. දැන් ඔවුන් සිටින්නේ පඳුරු වලින් ආවරණය වුන ප්‍රදේශයකයි. පාර අයිනේ තියෙන පඳුරු වලට උඩින් එළදෙනකගේ හිසකුත් ජොවැන් ට පෙනුනා. ඔන්න එතකොට තමයි ගමේ පල්ලියේ දේවගැති තුමා පාර කෙලවරින් මතුවෙලා ඔවුන් සිටින දිහාට ඇවිදගෙන එන්න පටන්ගත්තේ.

'අනේ විලියම්... මම නැවේ කපිතාන් විදිහට වැඩ කරන්න ද ?. ඔයාට පුළුවන් නේ වටපිට විපරම් කරන කෙනා වෙන්න.'

ජොවැන් එහෙම කියද්දී විලියම් නොසතුටු බැල්මකින් ඇය දිහා බැලුවා. ජොවැන් තමන් ගේ අණට පිටින් වැඩ කරන්න සූදානම් වෙන එක ගැන විලියම් ගේ හිතේ එතරම් කැමැත්තක් නම් තිබුනේ නෑ. ඒ අතර ඔවුන් දෙදෙනා කිසිම කථාවක් නොමැතිව තව ටිකක් දුර පාර දිගේම ඇවිදගෙන ගියා. ඔවුනතර වූ නිහඬතාවය බිඳ දමමින් මුලින් ම කථා කරන්න වුනේ විලියම් ය.



'ජොවැන්... කුනාටුව හින්දා අපේ නැවේ කුඹ ගහත් කැඩිලා ගිහිං. කිසිම සැකයක් නෑ. තව ටික වෙලාවක් යද්දී අපේ නැව මුහුදේ ගිලෙයි.'

'ඔයා කියන එක හරි විලියම්. ඒ වුනත් නැවේ කපිතාන් විදිහට වැඩ කරන්න තියෙනවා තමයි මම වැඩියම කැමැති.'

ජොවැන් නැවතත් තමන් ගේ ඉල්ලීම විලියම් ට ඉදිරිපත් කරද්දී ඔහු ආයේම පාරක් නිහඬ වුනා. ඔන්න ඔය වෙලාවේ තමයි දේවගැති තුමා ඔවුන් සිටින තැනට ඇවිදගෙන ආවේ. එතුමා ජොවැන් දිහාට හැරිලා කට පුරා හිනාවුනත් විලියම් දිහාට නම් හෙලුවේ නොකැමැති බැල්මක්.

'අද ඇවිදින්න හොඳ දවසක් නේද ළමයෝ ?.'

දේවගැති තුමා ගොඩාක් සතුටෙන් එහෙම ඇහුවත් විලියම් ගෙන් එතුමාට ලැබුනේ සතුටුදායක උත්තරයක් නෙවෙයි.

'මොන පිස්සුද ?. අද කාලගුණය හරිම දරුණුයි. පෙනෙන්නේ නැද්ද ?. මහා විශාල කුනාටුවක් හමලා හැමදෙයක් ම විනාශ වෙනවා. ඉක්මන් කරන්න ජොවැන්.'

එහෙම කියපු විලියම් ජොවැන් ගේ අතකිනුත් අල්ලාගෙන හැකි ඉක්මනින් එතැනින් ඉවත් වුනා. දේවගැති තුමා ඔවුන් දෙස බලාගෙන සිටියේ පුදුමයෙන්. විලියම් කියපු කථාව එතුමාට තවමත් විශ්වාස කරන්න අමාරුයි.

'මට නම් හිතෙන්නේ ඒ කොල්ලගේ මොලේ අමාරුවක් තියෙනවා. එහෙම නැතිනම් ඒ වගේ කථාවක් කියයි ද ?.'

දරාගන්න බැරි තරම් පුදුමයෙන් එහෙම කියාගත්තු දේවගැති තුමා විලියම් සහ ජොවැන් නොපෙනී යනතෙක් ම බලා සිටියා.

විලියම් දැන් රඟ පාන්නේ තමන් ගේ නැව ගිලාබත් වීමෙන්

sinhalaebooks.com



පසුව හුදකලා දිවයිනක් කරා මුහුදේ පිහිනා යන ආකාරයයි. ඒ අතරම ඔහු, ජොවෑන් දිහාට හැරිලා කථා කරන්න වුනා.

'බලන්නකෝ ජොවෑන්.. කුනාටුව හරිම සැරයි. අපි පැදගෙන යන මේ පුංචි බෝට්ටුව කුනාටුවට ඔරොත්තු දෙන්නෙත් නෑ. පුළුවන් තරම් ඉක්මනින් ගොඩබිමකට යාගන්න බැරිවුනොත් අපි දෙන්නට මුහුදේ ගිලිලා මැරෙන්නයි වෙන්නේ. බලන්නකෝ... මම ඇඳගෙන ඉන්න කබායත් හිල්වෙලා. ඒ මදිවට හොඳටම බඩගිනියි. ඔයාටත් බඩගිනි ද ජොවෑන් ?.'

විලියම් එහෙම අහද්දී ජොවෑනුත් ඉක්මන් උත්තරයක් දුන්නා.

'ඔව්... මටත් බඩගිනියි. ඒ වුනත් මම තවමත් කල්පනා කරන්නේ නැවේ කපිතාන් විදිහට සේවය කෙරුවේ මම නේද කියලයි.'

විලියම් ඒ පාරත් කිසිම උත්තරයක් දෙන්නේ නැතිව නිහඬ වුනා. ඒ හින්දා ජොවෑනුත් වැඩි පුර කථා කරන්න උත්සාහ කෙරුවේ නෑ.

මේ වනවිටත් ගඟ අයිනෙන් විහිදිලා තිබුන පාර මදක් ගොඩබිමට දෙසට හැරිලයි ගමන් ගන්නේ. ඇත්තටම විලියම් සහ ජොවෑන් දුන් ඇවිද යන්නේ විශාල නිවසක පසුපස ගෙවත්ත හරහා වැටිලා තියෙන පාරක් දිගෙයි. මේ විශාල නිවස දැකපු ගමන් ම විලියම් මහා හයියෙන් බෙරිහන් දෙන්න වුනා.

'මම අනුමාන කෙරුවා හරියට හරි...අර බලන්නකෝ ජොවෑන්. අපිට දූපතක් හම්බ වුනා. තව ටිකකින් මේ බෝට්ටුව අර ගල් පරවල හැපිලා විනාශ වෙයි. ඊට ඉස්සරින් මේ වගේ දූපතක් හරි හම්බ වුන එක ලොකු දෙයක්. අපි ඉක්මන් කරලා ඒ දූපතට පිහිනාගෙන යමු. එහෙම නැතිනම් සිද්ධ වෙන්නේ මේ සීතල වතුරේ ගිලිලා මැරෙන්න.'



එහෙම කියන ගමන් ම විලියම් ගෙවත්තේ මල් පඳුරු අතරින් අපහසුවෙන් වගේ ඉදිරියට ඇවිදගෙන යන්න වුනා. ඇත්තටම ඔහු මේ වෙලාවේ කරන්නේ මුහුදේ දරුණු රළ අතරින් පිහිණාගෙන ඈත තිබෙන දූපත වෙත ළඟාවෙන අන්දම නිරූපනය කරන එකයි. ජොවෑනුත්, විලියම් කරන දේම අනුකරණය කරමින් ඔහු පිටුපසින් ඇවිදගෙන ආවා. ඉදිරියට යන ගමන් ම ජොවෑන් ට අපහසුවක් නොමැතිව ඇවිදගෙන එන්න මල් පඳුරු ඈත් කරදෙන්නට ද විලියම් අමතක කළේ නෑ. එවැනි අවස්ථාවක විලියම් වෙතින් මේ ආකාරයේ කථා නිතරම ඇසුනා.

'එන්න ජොවෑන්... ඔයා නේ මගේ නැවේ නිරීක්ෂකයා. මේ තරම් කුනාටුවකට මුහුණ දීලත් අපි බේරුන එක ගැන සතුටු වෙන්න ඕනෑ. බයවෙන්න එපා. අපි දූන් දූපතකට ඇවිල්ලයි ඉන්නේ. ඔක්කොටම ඉස්සර වෙලා ඔයා ටිකක් මේ වැල්ලට වෙලා ටිකක් ගිමන් හරින්න. මම මුහුදු වෙරලට ගිහිං විනාශ වුන නැවෙන් ගොඩබිමට ගහගෙන එන දේවල් හොයාගන්න උත්සාහ කරන්නම්.'

මේ වනවිටත් විලියම් සහ ජොවෑන් සිටින්නේ විශාල ගෙවත්තේ අයිනකට වෙන්නටයි. ඇත්තටම ඔවුන් සිටින තැන විශාල මන්දිරයේ සිටින කාටවත් පහසුවෙන් දැක බලාගන්න අමාරුයි. ඔවුන් සිටින තැනම ගඟ ආසන්නයේම ගිම්හාන කුටියක් තිබෙනවා. ඒ අසලම තිබෙන රෙදි වැලක විශාල මේස රෙද්දක් වියැලෙන්නට දමා තිබෙන හැටිත් විලියම් දැක්කා.

ජොවෑන් සහ විලියම් ගඟ අසල වාඩිවෙලා මදක් ගිමන් නිවන්න පටන්ගත්තා. ඒ අතර විලියම් මෙහෙම ඇහුවා.

'ජොවෑන්... මෙතැන ගිමන් නිවන්න හරිම අපූරු තැනක් නේද ?. හැබැයි මේ වෙලාවේ සුළඟ හමන හැටියට නම් වැස්සක් අත ළඟම එනවා කියලා මට හිතෙනවා.

sinhalaebooks.com



'ඔයා කියපු දේ ඇත්ත. අනික මම කපිතාන් විදිහට නැවේ සේවය කරා කියලා ඔයාට මතක නැද්ද ?.'

ජොවැන් එහෙම අහද්දී විලියම් හරිම කරුණාවන්ත විදිහට උත්තර දුන්නා.

'ජොවැන්... ඔයා දන් ටිකක් විවේක ගත්තොත් හොඳයි කියලා මට හිතෙනවා. මම ගිහිං නැවෙන් ගොඩබිමට ගසාගෙන එන බඩු මුට්ටු ටිකක් අල්ලා ගන්න බලන්නම්.'

..............................................

එහෙම කියපු විලියම් සෙමෙන් සෙමෙන් විශාල මන්දිරයේ පිටුපස පැත්තට ඇවිදගෙන ගියා. මන්දිරයේ දොරවල් සම්පූර්ණයෙන් ම විවෘත කරලා තිබුනත් කවුරුවත් පෙනෙන්න හිටියේ නෑ. විලියම් මුලින් ම දක්කේ ඉතාම නවීන පන්නයේ මුළුතැන්ගෙයක්. එහෙත් කවුරුවත් පෙනෙන්න හිටියේ නෑ, හැබැයි අළු පාට විශාල පූසෙක් නම් මේසයක් උඩට වෙලා මුහුණ හෝදමින් හිටියා.

විලියම් කුස්සියේ දොර ළඟට ගිහිං බොහෝම සිරුවට ඇතුළ බැලුවා. පුදුමයකට වගේ කුස්සිය ඇතුළෙත් කවුරුවත් පෙනෙන්න හිටියේ නෑ. එයා වඩාත් හොඳින් ම බැලුවේ මේසය මත තිබෙන ගිනි පෙට්ටිය සහ හෝදන බේසම උඩ තිබෙන විශාල සාස්පාන දිහාවෙයි. තවත් ටික වෙලාවක් වටපිට විපරම් කරපු විලියම් බොහෝම සීරුවට කුස්සියට ඇතුළු වුනා. තමන් කරන දේ කාටහරි අසුවුවහොත් සිද්ධවන්නේ කුමක් ද කියලා එයාට අමුතුවෙන් කියන්න දෙයක් නෑ. ඒ හින්දා විලියම් හැමදෙයක් ම කෙරුවේ හරිම පරිස්සමින්.

ඉතාම ප්‍රවේශමෙන් කුස්සිය දිගේ ඇවිදගෙන ගිය විලියම් ගිණි පෙට්ටිය, සාස්පාන සහ කුඩා අඩු කෝප්ප දෙකක් හනි හනික දෑතට තුරුළු කරගෙන කුස්සියෙන් එලියට බැහැලා ගඟ තියෙන



පැත්තට දුවගෙන ගියා.

විලියම් එතැනට යනවිටත් ජොවැන් ගඟ ඉවුරේ තිබෙන තණ පිටිය උඩ වාඩිවෙලා ගිමන් හරිනවා. විලියම් එයාව දකපු ගමන් ආඩම්බරකාරී හඬකින් මෙහෙම කිව්වා.

'ජොවැන්... මේ බලන්නකෝ. අපේ ගිලුන නැවෙන් ගොඩබිමට ගහගෙන ඇවිත් තිබුන දේවල්. අපි ඉක්මනට ගිනි මැලයක් ගහමු. එහෙම නැතිනම් මිනිකන වනචාරියෝ නැතිනම් දරුණු වන සත්තු ඇවිත් අපිව වටකර ගනියි.'

'අනේ විලියම්... ඒ වගේ දේවල් කියන්න එපා. මට බය හිතෙනවා.'

විලියම් ගේ නැවේ මග පෙන්වන්නිය එහෙමත් නැතිනම් ජොවැන් බියපත් හඬකින් එහෙම කියද්දී විලියම් ඇයව සනසන්න උත්සාහ කෙරුවා.

'ඔයා කිසි දේකට බය වෙන්න එපා ජොවැන්. මම ඉන්නකම මොනතරම් දරුණු කෙනෙක් ආවත් ඔයාට අනතුරක් කරන්න මම ඉඩදෙන්නේ නෑ. මොන දේ කරන්නත් ඉස්සර වෙලා අපි කෑමක් හදාගෙන බඩගින්න නිවාගන්න ඕනෑ. මුළු දවස තිස්සෙම මුහුදේ පාවෙලා ඇවිත් හරිම බඩගිනියි.'

එහෙම කියපු විලියම් අහල පහල තිබුන වියලි දරකෝටු ටිකක් එකතු කරගෙන ඇවිත් ගිනි මැලයක් සූදානම් කෙරුවා. ඊට පස්සේ එයා අරන් ඇවිත් තිබුන සාස්පාන අසල ගංගාවේ ජලයෙන් පුරවාගෙන ඇවිත් ගිනි මැලය උඩින් තිබ්බා. බුර බුරා නැගෙන ගිනි දූල් හින්දා වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා සාස්පානේ තිබුන වතුර උතුරන්න වුනා. එතකොටම විලියම් එයා අරන් ආපු කෝප්ප දෙක වතුර භාජනය උඩින් තියලා සාක්කුවේ තිබුන බිස්කට් පැකට් එකෙන් බිස්කට් කිහිපයක් අරන් කෝප්ප වලට දැම්මා. කෝප්ප

sinhalaebooks.com



වලට දමපු බිස්කට් අපූරුවට රත්වෙන්න වැඩිවෙලාවක් ගියේ නෑ. මුහුදේ අතරමං වෙලා විලියම් සහ ඔහුගේ සහායිකාව ඉන්පසුව පාවෙලා ආපු හුදකලා දිවයිනේ දි ගත්තා තමන් ගේ ප්‍රථම ආහාර වේල විදිහට රත් වුන බිස්කට් ආහාරයට ගත්තා.

'මේ කෑම වේල හරිම රසවත් නේද මගේ මග පෙන්වන්නිය?.'

විලියම් බිස්කට් කිහිපයක් ම කටට ඔබාගන්නා ගමන් එහෙම අහද්දී ජොවෑනුත් අමුතු හඬකින් පිළිතුරු දුන්නා.

'අයි...යයි...යා... ඔව්... සර්.'

'හොඳයි... අපි දන් ලී කොට වගේ දේවල් වලින් මෙතැන ගෙයක් හදන්න ඕනෑ. ඒ හින්දා ඔයා ගිහිං ගිලුන නැවෙන් පාවෙලා ආපු දේවල් තියෙනවා ද කියලා බලන්නකෝ.'

'අනේ විලියම්.... නැවේ කපිතාන් මම නේ.'

'ඒ ගැන දැන් වැඩිය හිතන්න ඕනෑ නෑ. අර ගේ පැත්තට ගියොත් මොනව හරි හොයාගන්න බැරිවෙන එකක් නෑ. ඒ ගෙදර නාකි පූසෙක් ඇරෙන්න වෙන කවුරුවත් පෙනෙන්නත් නෑ.'

විලියම් එහෙම කියද්දි ජොවෑන් තමන් ගේ අකමැත්ත පළකරන වචන මහා ගොඩාක් කිව්වා. ඇය නිවස දෙසට ඇවිදගෙන යන්න පටන්ගත්තේ ඉන්පසුවයි.

ජොවෑන් පිටවෙලා ගියාට පස්සේ විලියම් තනිවුනා. ඉන්පසුව එයා වටපිට විපරමින් බලන්න වුනේ තමන් ගේ නිවස හදාගන්න පුළුවන් දෙයක් ඒ අහල පහල තියෙනවා ද කියලා දැනගන්නයි. ඔහු සිටින තැනම තිබෙන පරණ ගිම්හාන කුටිය විලියම් දැක්කා. එයා සෙමෙන් සෙමෙන් මේ කුටිය දිහාට ඇවිදගෙන ගියේ කිසියම් අදහසකුත් හිතේ තියාගෙනයි.



විලියම් ගිම්හාන කුටියේ දොර විවෘත කරනවත් එක්කම වැරහැලි ඇඳගත්, අපිරිසිදු මිනිසෙක් වාඩිවෙලා හිටපු තැනින් නැගිට්ටා. ඔහු අසලම බිම කළු පාට ලොකු ගමන් මල්ලක් ද තිබෙන හැටි විලියම් දැක්කා.

මේ අමුතු මිනිසා දැකපු ගමන් විලියම් කිසිම කථාබහක් නොමැතිව ඔහු දිහා බලාගෙන හිටියා. මිනිසා ද විලියම් දිහා බලාගෙන හිටියේ කිසිම හැලහොල්මනක් නැතිවයි. ටික වෙලාවක් ගියාට පස්සේ විලියම් ගොඩාක් හිතවත් විදිහට මෙහෙම කිව්වා.

'ඔයා ගැනමයි මම මේ හිත හිතා හිටියේ. ඇත්තටම මම බලාගෙන හිටියේ මිනිස්සු කන වනචාරියෙක් ගැන. ඔයා දැකපුවම මම හොයපු දේ හම්බ වුනා කියලා හිතෙනවා.'

'ඇත්තම ද ?. ඔයාට ඕනෑ නම් මට මිනී කන වනචාරියෙක් විදිහට හැසිරෙන්නත් පුළුවන්. හැබැයි ඊට ඉස්සර වෙලා ඔයාට සිද්ධ වෙලා තියෙන්නේ මොකක් ද කියලා දැනගන්න මම කැමැතියි.'

මිනිසා සමච්චල් සහගත විදිහට එහෙම කියද්දි විලියම් ඉක්මනින් ම උත්තරයක් දුන්නා.

'අපි ආපු නැව මුහුදුබත් වුනා. මේ හුදකලා දූපත ළඟ මුහුදේ දී තමයි ඒ දේ සිද්ධ වුනේ. අපිට දැන් මේ දූපතේ ඉන්න වෙන හින්දා ලී වලින් ගෙයක් හදන්නයි ලෑස්ති වෙන්නේ. මගේ අත් උදව්කාරිය ලී දඬු හොයන්න ගියා. ඉතින් ඔයා වනචාරි ගෝත්‍රිකයෙක් විදිහට හිටියොත් හොඳටම ඇති. ඒක නෙවෙයි. අපි ඔයාට සිකුරාදා කියලා නම තියන්න ද ?

'එහෙම නමක් තියන්න ඕනෑ නෑ ළමයෝ. මොකද මට ඊට වඩා හොඳ නමක් තියෙනවා. ඇත්තටම මගේ නම ඊබට් ආර්මොන්ඩ්. හැබැයි ඔයා කැමැති නම් මට සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා වගේ ඕනෑම නමකින් කථා කෙරුවට කමක් නෑ. (මෙහෙම කියන ගමන්

sinhalaebooks.com



ම ආගන්තුකයා විලියම් දිහා විමසිලිමත් විදිහට බලන්නත් අමතක කෙරුවේ නෑ.) ඒ වුනත් ළමයා... ඔයා ඇඳගෙන ඉන්න ඇඳුම් දිහා බැලුවම නැවකින් මුහුදුබත් වෙලා ගොඩ ට පිහිණාගෙන ආපු කෙනෙක් කියලා හිතන්න අමාරුයි නේ. මොකද නැවක් මුහුදු බත්වෙලා ගොඩට ගහගෙන එන අය ඔය තරම් ලස්සනට, පිළිවෙලකට ඇඳුම් අඳින්නේ නෑ. මම කියන්නේ ඒ අයගේ ඇඳුම් ඉරිලා වැරැහැලි වෙලයි තියෙන්න ඕනෑ.'

'ඔව්... ඔයා කියන දේ හරියටම හරි.'

විලියම් ගොඩාක් උනන්දුවෙන් පිළිතුරු දෙද්දී ආගන්තුක මිනිසා නැවතත් කථා කරන්න වුනා.

'නැවක් ගිලිලා ගොඩට එන මිනිස්සුන් ගේ ඇඳුම් වැරැහැලි වෙනවා. ඊට පස්සේ ඒ අය ඇඳුම් විදිහට අඳින්නේ ඉරුණ රෑවලක් වගේ දේවල්.'

එහෙම කියන ගමන් ම මිනිසා අසල තිබුන වැරහැලි වුන මේස රෙද්දක් දිහාට අත දිගු කරලා මෙහෙම කිව්වා.

'මේ තියෙන්නේ හොඳ ඇඳුමක්. ඇත්තටම නැවේ රෑවලකට වඩා මේක හරිම අපූරුයි.'

මිනිසා ගේ කථාවට උනන්දුවෙන් සවන් දිගෙන හිටපු විලියම් ගේ දෑස ප්‍රීතියෙන් බබලන්න වුනා.

'ඒක නම් ඇත්ත තමයි. මේ මේස රෙද්ද රෑවලකට වඩා මොනතරම් අපූරු ද ?.'

ආගන්තුක මිනිසා වැලේ තිබුන පරණ මේස රෙද්ද අතට ගන්නා ගමන් ම නැවතත් කථා කරන්න වුනා.

'බැරි වෙලාවත් ඔයාට සිද්ධ වුන අනතුර මට වුනානම් මම අඳින්නේ මෙන්න මේ මේස රෙද්ද. ඒ හින්දා ඔයත් මේක ඇඳගන්න.



එහෙම වුනා ම ඔයා ඇත්තටම මුහුදු අනතුරකට මුහුණ දුන්නා කියන හැඟීම හිතට දැනෙයි.'

එහෙම කියපු මිනිසා මේස රෙද්ද ගිම්හාන කුටිය ඇතුළට විසිකෙරුවා. විලියම් ඉක්මන් ගමනින් ගිම්හාන කුටියට ගියේ මේස රෙද්ද ඇඳගන්න හිතාගෙනයි. ඒ අතර ඔවුන් ගේ අළුත් හිතවතා 'සිකුරාදා' ගං ඉවුරේ ඇණ තියාගෙන විශාල දුම් පයිප්පයක් කටේ ගසාගෙන ඈතින් පෙනෙන කඳු යාය දිහා අරමුණක් නැතිව බලාගෙන ඉන්න පටන්ගත්තා.

තවත් ටික වෙලාවකින් විලියම් මේස රෙද්දත් ඇඳගෙන ම ගිම්හාන කුටියෙන් එළියට ආවා. දැන් එයා ගේ පෙනුම පරණ රෝම සොල්දාදුවෙක් ගේ වගේ. ඔහු දිහා සිනාසෙමින් බලාගෙන හිටපු මිනිසා මෙහෙම කිව්වා.

'ආ... දැන් නම් ඔයාගේ පෙනුම නියමයි. ඇත්තටම මේ සිද්ධියට මුහුණ දුන්නේ මම නම් කරන්නේ මොකක් ද දන්නව ද ?. මේ අපූරු ඇඳුම ඇඳගෙන මුහුදු වෙරලට ගිහිං ගිලුන නැව දිහා ටිකක් වෙලාවක් බලාගෙන ඉන්නවා. ඉතින් ඔයත් මුහුදු වෙරල පැත්තේ ටිකක් ඇවිදලා එන්නකෝ. බයවෙන්න දෙයක් නෑ. මම මෙතැන ඉඳන් ඔයාගේ ඇඳුම් ටික බලාගෙන ඉන්නම්.'

මිනිසා කියපු දේ ගැන ටික වෙලාවක් කල්පනා කරපු විලියම් නැවතත් ගිම්හාන කුටිය දිහාවට ඇවිදගෙන ගියා. ඒ අතර ආගන්තුක මිනිසාත් නැගිටලා ගඟ දිහා ටික වෙලාවක් බලාගෙන සිට ගිම්හාන කුටිය දිහාට යන්න පටන්ගත්තා.

මේ වනවිටත් ජොවැන් ආපහු ඇවිත් ගිම්හාන කුටියේ පඩිපෙළ උඩ වාඩිවෙලයි හිටියේ. විශාල නිවසේ කුස්සියේ හිටපු වයසක බළල් තඩියා ඇගේ උකුල මත සතිපෙට නිදාගෙන ඉන්න හැටිත් විලියම් දැක්කා. විලියම් දකපු ගමන් ම ජොවැන් බෙරිහන් දීලා මෙහෙම කිව්වා.

sinhalaebooks.com



'විලියම්... මම තමයි නැවේ කපිතාන්. ඔයා ඒක අමතක කරන්න එපා. මේ බලන්නකෝ... මට හරිම ලස්සන පූසෙක් හම්බ වුනා. ඒත් විලියම්... ඔයාට මොකද මේ වෙලා තියෙන්නේ ?.'

ජොවැන් පුදුමයෙන් බෙරිහන් දෙද්දි විලියම් ඉක්මනින් ම එයා ළඟට දුවගෙන ගියා. මේ වනවිටත් විලියම් ඇඳගෙන හිටපු මේස රෙද්දේ කොනක් පොළව දිගේ ඇතිල්ලෙනවා. ජොවැන් ළඟට ගිය විලියම් පුදුමාකාර ආඩම්බරයකින් මෙහෙම කිව්වා.

'ඔයා දන්නව ද ජොවැන්. මම මේ ඇඳගෙන ඉන්නේ නැවෙන් ගැලවෙලා ආපු රුවලක්. මොකද කුනාටුවට අහුවෙලා මගේ ඇඳුම් ඔක්කොම ඉරුනා. ඒ නිසයි මම මේ රුවල ඇඳගත්තේ. මේක හරිම අපූරුයි නේද ජොවැන් ?.'

ජොවැන් පුදුමයෙන් අත්පොඩි ගසද්දි විලියම් නැවතත් කථා කරන්න වුනා.

'ඔයා දන්නව ද ?. මට මිනී කන වනචාරියෙකුත් හම්බ වුනානේ. මම එයාට සිකුරාදා කියලා නමකුත් තිබ්බා. ඒ නමින් කථා කරනවට එයාගේ අකමැත්තක් නෑ.'

'අනේ හරිම ෂෝක් විලියම්. මම මේ අරන් ආපු පූසා මේ දූපතේ ජීවත් වෙන කැලෑ පූසෙක් වෙන්න ඇති. ඇත්තටම අපිට ඕනෑ කරන හැමදෙයක් ම හම්බ වෙනවා නේද ?.'

මේ කථාබහ සමඟම විලියම් සහ ජොවැන් ගඟ පැත්තට ඇවිදගෙන ගියා. ඔවුන් ආපහු ආවේ තවත් සෑහෙන වෙලාවකට පසුවයි. මේ වනවිටත් තමන් ට මුහුණ දෙන්න සිදුවෙන පළමු වැනි ඇබැද්දියට පෙර මඟ සකස් වෙලා කියලා විලියම් නිකමටවත් හිතුවේ නෑ. ඔවුන් ගිම්හාන කුටිය ළඟට එන විටත් වනචාරි ගෝත්‍රිකයා විදිහට හිටපු ආගන්තුක මිනිසා අතුරුදහන් වෙලා. එයා විතරක් නෙවෙයි. විලියම් ගේ ඇඳුම් කට්ටලයත් එයා එක්කම



අතුරුදහන් වෙලා.

සිද්ධ වෙලා තියෙන දේ දැකපු ගමන් විලියම් ගේ කට පුදුමාකාර විදිහට මහත් වුනා. එයා හයියෙන් කෑගැහුවෙත් එතකොටමයි.

'දෙයියනේ... ඒ මිනිහා මගේ ඇඳුම් ටික හොරකම් කරලා.'

විලියම් ගේ බෙරිහන් දීමත් එක්කම ජොවැනුත් පුදුමයෙන් කෑගැසුවා. ඇත්තටම මේ සිද්ධ වෙලා තියෙන දේ ඔවුන් දෙදෙනාටම පොදු දෙයක් හින්දයි එහෙම වුනේ.

'විලියම්... ඔයා කොහොමද දැන් ගෙදර යන්නේ ?.'

විලියම් ජොවැන් ට උත්තරයක් නොදීම කිව්වේ මේ වගේ දෙයක්.

'ඒකා නම් පුදුම හොරෙක්. මාව රවට්ටලා ඇඳුම් ටික හොරකම් කෙරුවා.'

'විලියම්... දැන් ඔයාගේ අම්මා මොනව කියයි ද ?.'

විලියම් කිසිම දෙයක් නොකියාම ජොවැන් දිහා බලාගෙන හිටියා. ඒ අතරම එයා මේස රෙද්ද තව තවත් හොඳින් සිරුරේ ඔතාගන්නත් අමතක කෙරුවේ නෑ. ඔන්න එතකොටම තමයි මන්දිරය පැත්තෙන් මහා විශාල කෝපාන්විත හඬක් ඇහෙන්න වුනේ. ඒ හඬ ඇහුන ගමන් ම ජොවැන් සහ විලියම් ඉක්මනින් ම ගිම්හාන කුටිය ඇතුළට දුවගෙන ගියා.

'කිසිම කමකට නැති කෙල්ල. කඩේ ළඟට ගියොත් ඕපාදූප කථා කරනවා. ඒ අතරේ කවුරුහරි කෙනෙක් ගෙට රිංගලා තියෙනවා. මොනව හොරකම් කෙරුව ද කියලා දන්නේ දෙයියෝ තමයි.'

මේ හඬත් එක්කම මන්දිරයේ පිටුපස දොරට හයියෙන්

sinhalaebooks.com



තඩිබාන හඬකුත් විලියම් ට සහ ජොවෑන් ඇහුනා. දැන් නම් ඔවුන් දෙදෙනා ගේ හිත් වලට පුදුමාකාර විදිහේ බියක් දැනෙනවා. ඇත්තටම මේ වෙනකොටත් ඔවුන් ගේ මුහුදු සංචාරය අවසන් වෙලයි තිබුනේ. ඒ අය සිහින දැකපු හුදකලා දිවයින වගේ දේවල් හැම එකක් ම අමතක වෙලා දැන් ඔවුන් පියවි සිහියට ඇවිල්ලයි හිටියේ.

මේ වනවිටත් හිරු අවරට යන්න පටන් ගෙන. දැන් හවස තේ වෙලාවත් ළංවෙලා කියලා විලියම් ට හිතුනා. සාමාන්‍ය තත්ත්වයක් යටතේ නම් ඔවුන් ට මේ ගෙවත්තෙන් හෙමිහිට පිටවෙලා කිසිම අපහසුවක් නැතිව නිවසට යන්නට තිබුනා. ඒ වුනත් දැන් තිබෙන්නේ සාමාන්‍ය තත්ත්වයක් නොවේ. විලියම් ගේ සම්පූර්ණ ඇඳුම් කට්ටලයම අතුරුදහන් වී තිබේ. ඒ වෙනුවට දැන් එයා සිරුරේ පටලවා ගෙන සිටින්නේ වැහැලි වුන මේස රෙද්දක් පමණි. මෙවැනි අසාමාන්‍ය තත්ත්වයක් යටතේ හනි හනික නිවසට යන්නේ කොහොමද කියලයි විලියම් කල්පනා කරන්නේ. ඇත්තටම එයා මේ වගේ ඇබැද්දියකට මුහුණ දුන්න මුල්ම අවස්ථාව තමයි මේ. මෙහෙම කල්පනා කරමින් සිටින අතරේම ජොවෑන් ගේ බියපත්, දුක්බර කටහඬ ත් විලියම් ට ඇහුනා. ඇයගේ දෑස් වල ලොකු කඳුළු බිංදු දෙකක් ද හිරවෙලා තිබෙනවා.

'අනේ විලියම්... අපි ඉක්මනට ගෙදර යමු කෝ.'

විලියම් ජොවෑන් දිහා බැලුවේ හරිම අසරණ විදිහට. ඉන්පසුව පුදුමාකාර අන්දමේ දුක්බර හඬකින් පිළිතුරක් දුන්නා.

'මට මේ විදිහට ආපහු ගෙදර යන්න බෑ ජොවෑන්. මේ පරණ මේස රෙද්දක් පටලවාගෙන මම කොහොමද ගම මැදින් ඇවිදගෙන යන්නේ ?. හැමෝම මට හිනාවෙයි. මීට ඉස්සර වෙන කිසිම කෙනෙක් මේස රෙද්දක් ඇඳගෙන ගම මැදින් ගිහිං නැතිව ඇති. ඇත්තමයි...මේක තමයි මගේ ජීවිතේට ම සිද්ධ වුන හොඳම ඇබැද්දිය.'



එහෙම කියපු විලියම් නැවතත් බිම වාඩිවෙලා කල්පනා කරන්න වුනා. ජොවෑන් ගේ කටහඬ නැවතත් ඇසුනේ ටික වෙලාවකට පසුවයි.

'ඉතින්... අපි කොහොමද ගෙදර යන්නේ විලියම් ?.'

'මම කියන්න ද වැඩක් ජොවෑන්. මම ටිකක් රෑ වෙනකම් මෙතැනම ඉන්නම්. රෑ වුනාම හැමෝම නිදාගන්නවා නේ. එතකොට මට පුළුවන් ගෙදර යන්න. ඒ හින්දා ඔයා දැන්ම ම ආපහු ගෙදර යන්න ජොවෑන්.'

'අනේ විලියම්.... ඒක නම් කරන්න බෑ. මම කොහොමද තනියෙන් ගෙදර යන්නේ ?. හරි... මම කියන්න ද වැඩක්. මම දැන්ම ම ගෙදර ගිහිං තාත්තා ගේ ඇඳුම් කට්ටලයක් අරන් එන්නම්.'

ජොවෑන් එහෙම කියද්දී විලියම් ගේ හිතට දැනුනේ පුදුමාකාර සතුටක්. එයා කථා කෙරුවෙත් ඒ ආකාරයේම සතුටකින් යුතුවයි.

'ඔයාට ගොඩාක් ස්තුතියි ජොවෑන්. ඔයාගේ තාත්තා මට වඩා ගොඩාක් ලොකුයි නේද ?. ඒ වුනත් මොනවා කරන්න ද ?. මේ වෙලාවේ හැටියට අපිට වෙන කරන්න දෙයක් නෑ.'

ජොවෑන් සෙමෙත් සෙමෙත් ගිම්හාන කුටියෙන් පිටවෙලා පාර පැත්තට ඇවිදගෙන ගියා. කුටියේ පුංචි ජනේලයෙන් ඇය යන දිහා බලාගෙන හිටපු විලියම් එයා නොපෙනී ගියාට පසුව ආයේමත් බිම වාඩිවෙලා කල්පනා කරන්න පටන්ගත්තා. ජොවෑන් ආපහු පැමිණෙන තෙක් කල්පනා කරනවා ඇරෙන්න විලියම් ට වෙන කරන්න දෙයක් තිබුනේ නෑ.

විලියම් ගේ කල්පනා ව වැඩි වෙලාවක් තිබුනේ නෑ. මෙයට ටික වෙලාවකට පෙර ඇහුන තපුරු, ගොරහැඩි කටහඬ ආයේමත් ඇහෙන්න වුනා. මේ වෙලාවේ ඒ තැනත්තා තවත් කවුදෝ කෙනෙක් සමඟ ගෙවත්තේ ඇවිදිමින් කථා කරන බවයි විලියම් ට දැනුනේ.

sinhalaebooks.com



'ඔයාට කියන්න අපේ ගෙදර වැඩට ඉන්න කෙල්ල කිසිම කමකට නෑ. බඩු ගේන්න කඩේට ගියොත් මුළු හැන්දෑ වරුවම එතැන. මොකද කඩේ ඉන්නේ තරුණ කොල්ලෙක් නේ. අපේ කෙල්ලට කඩේ යනවා කිව්වොත් මෙලෝ සිහියක් නෑ. අද කුස්සියේ දොර වහන්නත් අමතක වෙලා. ඒ නිසයි හොරා මේ තරම් ලේසියෙන් ගෙට ඇතුල් වෙලා තියෙන්නේ. ගෙදර සාලයේ තිබුන රිදී බඩු හැම එකක් ම නැතිවෙලා. මම දැනටමත් පොලිසියට ටෙලිෆෝන් කරලයි තියෙන්නේ. දෙයියනේ... මේ හොරා නම් මහ එපාම කරපු එකෙක්. අර බලන්නකෝ... පිටුපස්සේ වැලේ වේලෙන්න දමලා තිබුන මේස රෙද්දක් හොරකම් කරගෙන ගිහිං.'

ගෙහිමියාගේ කථාවට පසුව ඇසුනේ ඔහු සමඟ සිටි අනිත් කෙනා ගේ කටහඬයි.

'අපි මේ පරණ ගිම්හාන කුටියේ ටිකක් බලමු ද ?. සමහර විට හොරා මේක අස්සේ හැංගිලා ඉන්නව ද දන්නේ නැහැනේ ?.'

ඒ කටහඬ ඇහුන ගමන් විලියම් ගේ මුළු ඇඟම අමුතු සීතලකින් වෙලෙන්න වුනා. එයා ඉක්මනින් ම දොර මුල්ලට රිංගා ගත්තේ ඒ නිසයි.

'අපි එහෙම දෙයක් කරන්න යන එක ඇඟට ගුණ නෑ කියලයි මට හිතෙන්නේ. මොකද හොරා ළඟ පිස්තෝලයක් තියෙන්න පුළුවන්. අපි කෙලින්ම මිනිහට මුහුණ දෙන්න ගියොත් එයාගේ පිස්තෝලෙට හොඳ ඉලක්කයක් වෙනවා. මොකටද දැන දැනම ඒ වගේ අමාරුවක වැටෙන්නේ ?.'

'ඒ අදහසත් හොඳයි. හැබැයි අපි ඉක්මනට ගිහිං පෝකර් මහත්මයාටයි, ඩෑෂ් ටයි එන්න කියමු. එහෙම වුනාම හොරා ඉන්නවා නම් අල්ල ගන්න අමාරුවෙන එකක් නැහැනේ.'

ඒ අදහසත් විලියම් ගේ හිත තව තවත් බියට පත් කරවන්නක්



වුනා. එයා දොර රෙද්ද ඇගේ හොඳට පටලවා ගනිමින් දොර මුල්ලට වුනේ ඒ නිසයි. එයාගේ හිත ඇතුළේ තියෙන්නේ වචනයෙන් විස්තර කරන්න බැරි තරම් අමාරු හැඟීම් සමුදායක්. හොරා ඇල්ලීම සඳහා තව තවත් මිනිසුන් කැඳවන්නයි මොවුන් සූදානම් වන්නේ. ඒ අතර ගෙහිමියා නැවතත් කථා කරන හඬ විලියම්ට ඇහුනා.

'අපි කී දෙනෙක් එක්ක ආවත් හොරා ළඟ පිස්තෝලයක් තිබුනොත් වැඩක් වෙන්නේ නෑ. මිනිහා අපි ඔක්කොම මරලා දමයි.'

'එහෙමනම් මම කියන්නම් වැඩක්. අපි කොහොම හරි මේ ගිම්හාන කුටියේ දොර හොඳට වහමු. එහෙම වුනාම පොලිසිය එනකම් මිනිහට කුටිය ඇතුළේ හිරවෙලා තමයි ඉන්න වෙන්නේ.'

නැවතත් පුදුමාකාර සීතලක් විලියම් ගේ හිත අතගාමින් සිරුර පුරාම පැතිරුනා.

'ඒකත් වැඩක් වෙන්නේ නැතිවෙයි. මොකද මේ ගිම්හාන කුටියේ අගුල කැඩිලා. මම නම් කියන්නේ අපි ඉක්මනින් ම මෙතැනින් ගිහිං ගේ ඇතුළට යමු කියලයි.'

ඉන්පසුව ඔවුන් ගේ කථාබහ මදින් මද ඈත් වෙමින් ඇසෙන බව විලියම් ට දැනුනා. නිසැක වශයෙන් ම ඔවුන් නිවස දෙසට ඇවිද යනවා විය යුතුය. ඒ සමඟම විලියම් ගේ හිතේ තිබුන පුදුමාකාර බිය සහ බර අඩුවෙන්න වුනා. එයා ඇඟිලි තුඩුවලින් හිස කෙස් පිරිමැද ගන්න වුනෙත් හරිම සැහැල්ලුවෙන්.

'ඇති යාන්තම්...'

සිහින් හඬින් මිමිණූ විලියම් නැවතත් ගිම්හාන කුටියේ වාඩිවෙලා නොඉවසිලිමත් ව බලා සිටින්නට වුනා. හැබැයි ජොවැන් නැවතත් ආවේ බොහෝ වෙලාවකට පසුවයි. එයාගේ අතේ රෙදි පාර්සලයකුත් තිබුනා.

sinhalaebooks.com



'ඉක්මන් කරන්න විලියම්. මේ ඇඳුම් ඇඳගෙන අපි දුන්ම ම මෙතැනින් යමු. හොඳ වෙලාවට මම එනවා කවුරුවත් දැක්කේ නෑ. මේ ඇඳුම් ටිකක් විතර ලොකු ඇති. ඒ වුනත් අපිට මේවා කොහොම හරි ඇඳගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා විලියම්.'

ජොවෑන් ගේ තාත්තා තමයි ජේම්ස් ක්ලයිව්. ඇත්තටම එයා අඩි හයක් විතර උස කෙනෙක්. ඉතින් ඒ වගේ කෙනෙක් අඳින කබායක් විලියම් ට කොහොමටවත් ගැළපෙන්නේ නෑ. එයා කබාය ඇන්දම බිම ගෑවෙනවා. කලිසමත් එහෙමයි. විලියම් මේ දුවැන්ත කලිසම ඇඳලා. කකුල් දෙක ගොඩාක් උඩට නැමුවා. විලියම් තමන් ගේ තාත්තා ගේ ඇඳුම් අඳින දිහා උනන්දුවෙන් බලා සිටි ජොවෑන් අවසානයේදි සතුටින් බෙරිහන් දුන්නා.

'අපූරුයි විලියම්... මේ ඇඳුම් ටිකක් විතර ලොකුයි තමයි. ඒ වුනාට ඔයා ඒවා අපූරුවට ඇන්දනේ.'

ඇත්තටම දැන් විලියම් පෙනෙන්නේ විකට ඇඳුම් තරඟයකට සූදානම් වුන තළුවෙක් වගෙයි. කොහොම වුනත් මේ උගුලෙන් ඉක්මනින් ම ගැළවෙලා යන්නයි විලියම් ට ඕනෑවෙලා තියෙන්නේ. මොන විදිහේ ඇඳුමක් වුනත් මේ වෙලාවේ ජොවෑන් ගේ තාත්තා ගේ ඇඳුම් කට්ටලය තමන් ට පිහිට වුනා කියලා විලියම් ඒ වෙලාවේ කල්පනා කෙරුවා. ඒ අතර එයා මෙතෙක් වෙලාවක් ඇගේ පටලවා ගෙන හිටපු පරණ මේස රෙද්ද කුඩාවට රෝල් කරලා කිහිල්ලේ ගසාගත්තා.

'අපි මේ රෙද්ද අරන් යමු ජොවෑන්. මොකද මේක මෙතැන තියලා ගියොත් අපිව අල්ලගන්න හෝඩුවාවක් වෙයි. අනික හොරෙක් ඇවිත් මගේ ඇඳුම් ටික හොරකම් කරගෙන ගියා. ඉතින් මම ත් මේ මේස රෙද්ද අරන් යනවා.'

ටික වෙලාවකට පමණ පසුව විලියම් සහ ජොවෑන් නිවෙස බලා යන්න පාරට පැමිණියා. විශාල ඇඳුම් කට්ටලයත් හැඳගෙන



විලියම් ඇවිදගෙන යන්නේ අමාරුවෙන්. හැබැයි ඒ ඇඳුම් කට්ටලය විලියම් ට හොඳටම ගැළපෙනවා කියලයි ජොවෑන් නම් හිතන්නේ. මෙතෙක් වෙලාවක් පාර දිගේ ඇවිදගෙන ආවත් ඔවුන් ට ගෙවල් හමුවුනේ නෑ. ඒ නිසා කිසිම විදිහක කරදරයක් සිද්ධ වුනෙත් නෑ. හැබැයි දැන් නම් ඔවුන් දෙදෙනා ඇවිදගෙන යන්නේ ගෙවල් කිහිපයක් අසලින්.

තවත් මොහොතකින් අසල තිබුන නිවසකින් මිනිසෙක් පිටතට ආවා. එයා විලියම් දිහා බලාගෙන හිටියේ කටත් ඇරගෙනයි. ඊට පස්සේ එයා බිත්තියට හේත්තු වෙලා අත් දෙකත් ඉණේ තියාගෙන පුදුමයෙන් වගේ විලියම් දිහා බලාගෙන හිටියා. විලියම් මේ මිනිහා දිහාට පුදුමාකාර අන්දමේ නපුරු බැල්මක් හෙලලා ආයේමත් පාර දිගේ ඉදිරියට ඇවිදගෙන යන්න වුනා. හැබැයි විශාල කලිසම නිසා ඔහුට හිතන තරම් ඉක්මනින් ඉදිරියට ඇවිදගෙන යන්න අමාරුයි.

'පිස්සෙක්.... ද '

මිනිසා තමන් ගේ දෑස අතින් පිසදමා ගනිමින් එහෙම කියද්දි කාන්තාවක් ද නිවසින් පිටතට ආවා. විලියම් දැකපු ගමන් ම කාන්තාව මහා හයියෙන් බෙරිහන් දෙන්නත් අමතක කෙරුවේ නෑ. හැබැයි ඉන්පසුව පිටතට පැමිණි ළමුන් දෙදෙනා නම් මහා හයියෙන් හිනාවෙමිනුයි විලියම් දිහා බලාගෙන හිටියේ. මේ හැම සිදුවීමකින් ම වුනේ විලියම් ගේ හිත තවත් තවත් කඩාගෙන වැටෙන එක විතරයි. එයා ඉක්මනින් ම එතැනින් යන්න උත්සාහ කෙරුවත් දිග කලිසම නිසා ඒ වැඩේ පහසු වුනේ නෑ. කිහිල්ලේ ගසාගෙන සිටින මේස රෙද්ද හින්දා විලියම් ට අතින් කලිසම ඔසවාගන්නත් අමාරුයි. ඔය වෙලාවේදී තමයි ජොවෑන් නැවතත් විලියම් ගේ පිහිටට ආවේ. එයා විලියම් ළඟට ඇවිත් කලිසම් කකුල් අතින් අල්ලාගෙන විලියම් ට ඇවිදගෙන යන්නට උදව් කෙරුවා.

ඊළඟට ඔවුන් ට පසුකරන්නට තිබෙන්නේ ජොවෑන් ගේ

sinhalaebooks.com



නිවසයි. තමන් ගේ නිවස අසලට සමීප වෙද්දී ම ජොවෑන් දැක්කේ බලාපොරොත්තු නොවුන කෙනෙක් ගේට්ටුව අසල සිටගෙන සිටින අන්දමයි. කළු පාට ඇඳුම් කට්ටලයක් හැඳගෙන සුදු පැහැති ඒප්‍රනයක් දමාගෙන සිටින්නේ කවුද කියලා ඇය එක පාරටම හඳුනාගත්තත් ඒ කෙනාව මඟ හැර යන්නට තරම් වෙලාවක් ඔවුන් ට තිබුනේ නෑ.

'මිස් ජොවෑන්... ඔයා ගෙදර එන්න පරක්කු වුනා කියලා අම්මා හොඳටම බයවෙලයි ඉන්නේ. ඇත්තටම ඔයා කොහෙද ගියේ?.'

ගේට්ටුව ළඟ හිටගෙන හිටියේ ජොවෑන් ගේ ගෙදර සේවිකාවයි.

'මම විලියම් ව ගෙදර ඇරලවලා ඉක්මනින් එන්නම්.'

ජොවෑන් නොඉවසිලිමත් හඬකින් එහෙම කිව්වත් සේවිකාවගෙන් නම් ඊට ඉඩක් ලැබුනේ නෑ. ඇය ඉක්මනින් ම ජොවෑන් ගේ අතින් අල්ලාගත්තේ දැඩි හඬකින් මෙහෙම කියමින්.

'ඒකනම් කරන්න දෙන්න බෑ මිස් ජොවෑන්. ඔයාව හම්බ වුනොත් ඉක්මනින් ම ගෙදර එක්ක එන්න කියලා ඔයාගේ අම්මා කිව්වා. හැබැයි අද හැන්දෑවේ තේ එක නම් ඔයාට හම්බ වෙන්නේ නෑ.'

එහෙම කියන ගමන් ම සේවිකාව විලියම් දෙසටත් හැරුනා.

'ඔයා මොකද මේ විකට ඇඳුම් තරඟයකට යන්න ද ?. ඇත්තටම ඔයා දකපුවම මට හිනායන්නේ නෑ. ඇතිවෙන්නේ ලැජ්ජාවක්.'

සේවිකාව ජොවෑන් ගේ අතින් අල්ලාගෙන නිවස පැත්තට ඇවිදගෙන යද්දී විලියම් තනියම ඉදිරියට ගමන් කරන්න පටන්ගත්තා. හැබැයි එයා ඇවිදගෙන යන්නේ හරිම සෙමින්. විශාල ඇඳුම කට්ටලය සහ ගම්මානයේ මිනිසුන් මඟ හරිමින් ඇවිද යෑම කියන කාරණා



නිසයි විලියම් ගේ ගමන මේ තරම් සෙමින් සිදුවන්නේ. මේ වනවිටත් අවට කළුවර පැතිරෙන්න පටන් අරන්. ඒ ගැන නම් විලියම් ගේ හිතේ තිබෙන්නේ සතුටක්. කොහොම වුනත් තවත් ටික දුර යද්දී උස මහත අයෙකුගේ රුවක් පාරේ අනිත් පැත්තේ ඉඳන් ඉදිරියට පැමිණෙන හැටි විලියම් දැක්කා. එයා දකපු ගමන් විලියම් ඉක්මනින් ම පඳුරක් අස්සට රිංගා ගත්තා. ඒ කෙනාට තමන් ව නොපෙනෙන්නට ඇතැයි විලියම් සිතාගෙන සිටියත් උස මිනිසා විලියම් සැඟවිලා හිටපු පඳුර ළඟට ඇවිත් නතර වුනා. ඇත්තටම ඔහු කවුද කියලා විලියම් හොඳින් ම දැක්කේ එතකොටයි. ඔහුව හඳුනාගත්තට පස්සේ විලියම් ගේ හිත මොනතරම් බියට පත්වුනා ද කියන්න වචන නෑ. ඒ කෙනා තමයි ජොවෑන් ගේ තාත්තා. ටික වෙලාවක් විලියම් දිහා බලාගෙන හිටපු ජොවෑන් ගේ තාත්තා සමච්චල් සහගත හඬකින් කථා කරන්න වුනා.

'මේ තරුණ මහත්මයා කවුද කියලයි මම මේ බැලුවේ. ඇත්තටම ඔයයි මමයි හරිම සමාන අදහස් තියෙන අයද කියලත් මට හිතෙනවා. අපි දෙන්නගෙම ඇඳුම් මහන්නේ එකම ටේලර් කෙනෙක් වෙන්න ඇති. අනික දෙන්නගෙම ඇඳුම් වල විලාසිතාවත් එකයි.'

එහෙම කියන ගමන් ම ජොවෑන් ගේ තාත්තා එයාගේ ශක්තිමත් අත දිගු කරලා විලියම් ගේ බෙල්ලෙන් අල්ලාගත්තා.

'එහෙමත් නැතිනම්. ඔයා මගේ අල්මාරියෙන් ඇඳුම් කට්ටලයක් හොරකම් කරලා තියෙනවා. කොහොම වුනත් දැන්ම ම මාත් එක්ක ගෙදර යන්න එනවා. ඊට පස්සේ හොඳ හිතින් ඔය ඇඳුම් කට්ටලය ගලවලා දෙනවා.'

එහෙම කියපු ක්ලයිව් මහතා නැතිනම් ජොවෑන් ගේ තාත්තා විලියම්වත් තල්ලු කරගෙනම එයාගේ ගේ පැත්තට ඇවිදගෙන යන්න වුනා. කරකියා ගන්න දෙයක් නැති තැන විලියම් සිහින්

sinhalaebooks.com



හඬින් මෙහෙම කියන්නත් උත්සාහ කෙරුවා.

'ඔයා මට කථා කරන්න ඉඩක් දෙනවා නම් සිද්ධවුනේ මොකක් ද කියලා විස්තර කරන්න පුළුවන්.'

හැබැයි ජොවෑන් ගේ තාත්තා විලියම් ට වචනයක්වත් කථා කරන්න ඉඩ දුන්නේ නෑ. එයා තවත් හයියෙන් විලියම් ගේ බෙල්ලෙන් අල්ලාගෙන ඉදිරියට යනවා. ඒ අතරම එයා සමච්චල් හඬින් විලියම් ට බනින්නත් අමතක කෙරුවේ නෑ.

'ඔයාගේ නිදහසට කාරණා මට වැඩක් නෑ. මොකද ඔයා නිතරම කරන්නේ කිසිම කමකට නැති දේවල් නේ. ඒ දේවල් ගැන අහන එකේ කිසිම තේරුමක් නෑ. ඒ හින්දා සද්ද නැතිව මාත් එක්ක යන්න එනවා. ඊට පස්සේ ඔය ඇඳුම් ටික මට දීලා ආපහු යන්න පුළුවන්.'

මේ නපුරු මිනිසා නිසා විලියම් ඉන්පසුව වචනයක් වත් කථා කරන්න ගියේ නෑ. දැන් නම් එයාගේ හිතේ තිබුන හැම සිතිවිල්ලක් ම හෝදාපාළු වෙලා අවසන්. කොහොම වුනත් තවත් සෑහෙන වෙලාවකට පසුව විලියම් වත් රැගෙන ජොවෑන් ගේ තාත්තා එයාගේ නිවසේ පුස්තකාල කාමරයට ගියා. ජොවෑන් කොහේ හෝ සිට මේ දේවල් බලාගෙන සිටින බව විලියම් දන්නවා. ඒ ගැන සිහිපත් වෙද්දී විලියම් ගේ මුහුණ ලැජ්ජාවෙන් සුදුමැලි වුනා. කොහොම වුනත් කරකියාගන්න දෙයක් නැතිව සිටිද්දී විලියම් සිහින් හඬින් මේ වගේ දෙයක් කියන්නත් අමතක කෙරුවේ නෑ.

'ඇත්තම කියනවා නම් ඔයාගේ ඇඳුම් අඳින්න මම හීනෙකින්වත් හිතුවේ නෑ. හැබැයි නොහිතපු විදිහට ඒවා අඳින්න සිද්ධ වුනා. එහෙම වුනේ නැතිනම් මට කිසිම ඇඳුමක් නැතිවයි ගෙදර යන්න වෙන්නේ.'

විලියම් එහෙම කියද්දී ක්ලයිව් මහතා පුදුමයෙන් ඔහු දිහා



බැලුවා. ඔහු මෙවැනි දෙයක් ඇසුවේ ඉන්පසුවයි.

'මොකක් ද කිව්වේ ?. එහෙමනම් මගේ ඇඳුම් අඳින්න ඉස්සර වෙලා මොනවද ඇඳගෙන හිටියේ ?.'

'මම ඇඳගෙන හිටියේ මේස රෙද්දක්. ඒ වුනත්.....'

'බොරු කියන්නේ නැතිව ඉන්නවා ළමයා. මේස රෙද්දක් ඇඳගෙන ඔයා කොහොමද මේ ගමන යන්නේ ?.'

'මම මොකටද බොරු කියන්නේ ?. ඇත්තටම ඔයා දැන් ලැස්ති වෙන්නෙත් ඒ මේස රෙද්දම අන්දවලා මාව ගෙදර යවන්නනේ.'

'ඔයා මේස රෙද්දක් බැරිනම් අත් ලේන්සුවක් ඇඳගෙන හරි ගෙදර ගියාට මට මොකද ?. දන්නව ද ?. මම මේ සූට් අළුතින්ම හේදුවේ ගිය සතියේ. මම මේකට ගිනේස් දොලහක් ම දුන්නා. ඒ වගේ ඇඳුමක් නිකරුනේ නාස්ති වෙනවා දකින්න නම් මම කොහොමටවත් කැමැති නෑ. ඔයා දන්නව ද ?. මම දැනට අවුරුදු හයක් ම මේ සූට් එක හොඳ හෝදා ඇඳලා තියෙනවා. හැබැයි ඔයා අද මොනවගේ නාඩගමක් නැටුව ද කියලා කියන්න මම දන්නේ නෑ. ඒ වුනත් මේ සූට් එක ඔයාට දුන්නේ කවුද කියලා මම හොඳට දන්නවා. ඒ ගැන මම වචන කිහිපයක් ජොවෑන් එක්ක පස්සේ කථා කරන්නම්.'

ජොවෑන් ගේ තාත්තා එහෙම කියද්දී විලියම් ඔහුව දවා අළු කරන තරමේ කෝපාන්විත බැල්මකින් සංග්‍රහ කරමින් මෙහෙම කිව්වා.

'මේ ඇඳුම මට දුන්නේ ජොවෑන් නෙවෙයි. මම තමයි ඒක ගත්තේ.'

එහෙම කියන ගමන් ම විලියම් මෙතෙක් වෙලාවක් එයා

sinhalaebooks.com



ඇඳගෙන හිටපු විශාල ඇඳුම් කට්ටලය ගලවලා පැත්තකට දැම්මා. ඉන්පසුව කිහිල්ලේ ගසාගෙන හිටපු පරණ දොර රෙද්ද අරන් ආයේමත් ඇගේ පටවලා ගත්තා. ඔහු ක්ලයිව් මහතා දිහාට හැරිලා කෝපයෙන් බෙරිහන් දුන්නේ ඉන්පසුවයි.

'මම මේ විදිහට ගම හරහා ඇවිදගෙන යනව දකින්න නේ ඔයාට ඕනෑ වුනේ. ඔන්න දැන් හරි. ඔයා ඒ ගැන හිතන්නේ නැතිනම්....'

'මම ඒ ගැන ටිකක්වත් හිතන්නේ නෑ. මම මොකටද ඔයා ගැන හිතන්නේ ?. මේ කථාව අපි දැන් නතර කරමු විලියම්. ඔයාට සුබ රාත්‍රියක් කියලා කියන්නයි මම මේ සූදානම් වෙන්නේ.'

එහෙම කියපු ක්ලයිව් මහතා පුස්තකාලයේ දොර වසා දැම්මා. දැන් ඔහුට ජනේලය තුළින් පෙනෙන්නේ සුදු පාට මේස රෙද්ද පොරවා ගත් විලියම් සෙමෙන් සෙමෙන් පාර දිගේ ඉදිරියට ඇවිදගෙන යන ආකාරයයි. ඒ දෙස සිනාසෙමින් බලා සිටි ක්ලයිව් මහතා තමන්ටම මෙසේ කියාගත්තා.

'මේ කොළු ගැටයා ගම හරහා මේ විදිහට යද්දි බලාගෙන ඉන්න අයට මොනවා හිතෙයිද දන්නේ නෑ.'

දොර රෙද්ද පොරවා ගත් විලියම් ආයේමත් තමන් ගේ ගමන ආරම්භ කෙරුවා. ගම්මානයේ ගෙවල් අසලින් යද්දි විලියම් ගේ කකුල් බොහෝම සීරු මාරුවට තමයි ක්‍රියාත්මක වුනේ. මේස රෙද්දක් පොරවාගත් ඔහු කිසිවෙකුට නොපෙනී නිවසට යාගන්නයි මේ තරම් උත්සාහ කරන්නේ. මේ විදිහට ටික දුරක් ඇවිද ගියාට පසුව පල්ලියේ වත්ත මැදින් ගොස් නිවසට යා ගත හැකි කෙටි පාරක් ගැන විලියම් ට සිහිපත් වුනා. මිනිසුන් ගැවසෙන පාරවල් දිගේ ඇවිදගෙන යනවාට වඩා මේ කෙටි පාරෙන් ගියොත් වඩාත් හොඳයි කියලා හිතුන නිසාම විලියම් දෙපාරක් හිතන්නේ නැතිව පල්ලිය වත්ත පැත්තට හැරුනා.



වත්ත කෙළවරේ තියෙන වැට උඩින් පැනගත් විලියම් ඉක්මනින් ම පල්ලියේ වත්තට ඇතුළු වුනා. දැන් හැමතැනම ගණාන්ධකාරය පැතිරිලයි තිබෙන්නේ. ඒ නිසාම තමන් අසල සිටින වෙන කිසිවෙකුත් හෝ පැහැදිලිව දකගැනීමේ හැකියාවක් විලියම් ට නෑ. මේ විදිහට ටික දුරක් ඇවිදගෙන යද්දි සොහොන් පිටියේ සොහොන් කොතක් අසල සිටගෙන සිටින ගැහැණු කෙනෙක් විලියම් ට හමුවුනා. සොහොන් කොත දිහා බලාගෙන හිටපු ගැහැණු කෙනා එක්වරම හැරිලා විලියම් දිහා බැලුවා විතරයි. පුදුමාකාර අන්දමේ මර විලාපයක් නැගුවා. ඒ හඬින් විලියම් මොනතරම් බය වුනාද කියනවා නම් ඉක්මනින් ම අසල තිබුන පඳුරක් අස්සේ හැංගුනා. ඒ අවසරයෙන් කාන්තාව මහා භයියෙන් බෙරිහන් දෙමින් දුන්නෙත් මිඳුන ඊතලයක් වගේ ගම්මානය දිහාවට දුවගෙන ගියා. මේ සිදුවුන දේ හින්දා විලියම් ගේ හිතත් පුදුමාකාර විදිහට කළබල වෙලයි තිබුනේ. ඒ හින්දා එයා අසල තිබුන සොහොන් කොතක් අස්සේ සෑහෙන වෙලාවක් සැඟවිලා බලාගෙන හිටියා. මේ වෙලාව අතරතුරේදි මිනිසුන් කිහිප දෙනෙක් ම ඔහු අසලින් ඇවිදගෙන ගියත් විලියම් නම් නිකමටවත් සැඟවිලා ඉන්න තැනින් පිටතට ආවේ නෑ. බැරි වෙලාවත් ඔහු එළියට ආවා නම් ඒ මිනිස්සුත් ඔහුට හොල්මනක් කියලා බයවෙලා දුවන බව විලියම් හොඳින් ම දන්නවා.

මේ විදිහට සෑහෙන වෙලාවක් ගත වුනාට පසුව කිහිප දෙනෙකුගේ ප්‍රීතිමත් කටහඬවල් කිහිපයක් විලියම් ට ඇහුනා. මදක් හිස ඔසවලා බලද්දි විලියම් දැක්කේ අට දෙනෙක් නැතිනම් නම දෙනෙක් පමණ පල්ලියේ ගෙවත්ත දිගේ ඔහු සිටින දෙසට ඇවිදගෙන එන ආකාරයයි. මෙතැන පිරිසක් සිටින නිසා ඔවුන් තමාට බය වෙන්නේ නෑ කියලා විලියම් ට හිතුනා. ඔහු සැඟවිලා හිටපු සොහොන් කොත අස්සෙන් හිමිහිට හිස ඔසවලා බැලුවේ ඒ නිසයි. හැබැයි ඊළගට සිදුවුනේ විලියම් හීනෙකින්වත් හිතපු දෙයක් නෙවෙයි. එතැන හිටපු කණ්ඩායම ම මරහඬ දෙන්න වුනා. ඒ

sinhalaebooks.com



විතරක් නෙවෙයි ඔවුන් එකිනෙකා පෙරලාගෙන පුළුවන් තරම් වේගයෙන් දුවන්නත් වුනා. එහෙම දුවන අතරේ එක කාන්තාවක් පය පැකිලිලා බිම වැටුනා. බය හින්දම එයාට ආයේමත් නැගිට ගන්නත් අමතක වෙලා වගෙයි. ඒ හින්දා ඒ කාන්තාව බිම වැතිරිලා අත් දෙකෙන් මුහුණ වසාගෙන මහා හයියෙන් බෙරිහන් දුන්නා. මේ කන්තාව දිහා ටික වෙලාවක් බලාගෙන හිටපු විලියම් පුදුමාකාර සතුටකින් ඇය සිටින තැනට දුවගෙන ගියා. ඒ සිටින්නේ තම නිවසේ පාලිකාව විදිහට සේවය කරන එලන් කියලා විලියම් එතකොටත් හඳුනාගෙනයි සිටියේ. දැන් ඉතින් තමන් ගේ කරදරය අවසන් කියලත් විලියම් ට හිතුනා.

'එලන්.....'

බෙරිහන් දෙන කාන්තාව ළඟට ගිය විලියම් ඇයට කථා කෙරුවා. හැබැයි එයින් සිදුවුනේ කාන්තාවගේ බෙරිහන් හඬ තවත් වැඩිවෙන එකයි.

'දෙයියනේ... මම ඉවරයි...'

ඊළඟ නිමේශයේදී විලියම් වත් පෙරලා ගෙන නැගිට ගත් එලන් බෙරිහන් දෙමින් ගම්මානය දෙසට මහා හයියෙන් දුවන්න වුනා.

.................................................................

'විලියම් තවම ගෙදර ආවේ නෑ. එයා කොහේ ගිහිල්ල ද කියලයි මම මේ කල්පනා කරන්නේ.'

බ්‍රවුන් මහත්මිය එහෙම කියද්දී විලියම් ගේ තාත්තා ඒ කියන්නේ බ්‍රවුන් මහතා ඇයට දුන්නේ මේ වගේ උත්තරයක්.

'විලියම් ගැන වැඩිය හිතන්න එපා. මිනිහා කරන්නේ මොනවද කියලා අපිට හිතාගන්නත් අමාරුයි. මම අද හැන්දෑවේ



ස්ටේෂන් එකේ ඉඳන් එද්දි විලියම් ගැන දැනගන්න ලැබුනා. මීට පැයකට විතර ඉස්සර වෙලා එයා ලොකු ඇඳුම් කට්ටලයකුත් ඇඳගෙන ගේ පැත්තට ඇවිදගෙන ආවා කියලයි මිනිස්සු කථා වුනේ.'

තම ස්වාමියා ගේ කථාව දිහා උනන්දුවෙන් අසාගෙන සිටි බ්‍රවුන් මහත්මිය පුදුමයෙන් වගේ කථා කරන්න වුනා.

'එයා ඇඳගෙන ගියේ සාමාන්‍ය ඇඳුම් නේ. ඉතින් කොහොමද විලියම් තරමට වඩා ලොකු ඇඳුම් ඇඳගෙන එන්නේ?.'

'මටත් ඒ ගැන කියන්න බෑ. ඒ වුනත් එහෙම දෙයක් සිද්ධ වෙලා තියෙනවා කියලා මිනිස්සු කථා වෙනවා මට ඇහුනා.'

'ඉතින් මේ දේ සිද්ධ වෙලා තියෙන්නේ පැයකට ඉස්සර වෙලානේ. ඇයි විලියම් තවම ගෙදර ආවේ නැත්තේ ?.'

'මට ඒ ගැනත් කියන්න අමාරුයි.'

කිසිම උනන්දුවක් නැති හඬකින් එහෙම කියපු බ්‍රවුන් මහතා තමන් අතේ තිබුන පුවත්පත වෙතට අවධානය යොමුකරගත්තා. මෙන්න මේ වෙලාවේ තමයි නිවසේ තිබුන නිහඬතාවය බිඳ හරිමින් කාගේදෝ බෙරිහන් හඬක් හාත්පසම පැතිරුනේ. ඊළඟ නිමේශයේදී මහා හයියෙන් බෙරිහන් දෙමින් ම එලන් විලියම් ගේ නිවස තුළට කඩාගෙන පැන්නා.

'අනේ දෙයියනේ.... ඒ හොල්මන මගේ පස්සෙන් පන්නනවා. මේ වෙලාවේ ඒක ඉන්නේ පැති දොර ළඟ.සුදු පාට රෙද්දක් පොරාගෙනයි ඉන්නේ. එයා ඇවිත් ඉන්නේ මාව මරා දමන්න වෙන්න ඇති. අනේ දෙයියනේ... මට නම් දැන් ම මැරෙන්න බෑ. මාව බේරාගන්න කවුරුවත් නැද්ද ?.'

එලන් ගේ බෙරිහන් දීම ඇහුන ගමන් බ්‍රවුන් මහතා ඉක්මනින්

sinhalaebooks.com



ම පුවත්පත පැත්තකින් තිබ්බා. ඉන්පසුව ඔහු එලන් ගෙන් මෙහෙම ඇහුවා.

'එලන්... කවුද ඔයා පස්සෙන් පන්නන්නේ ?.'

'හොල්මනක්.... හොල්මනක්... අනේ මාව බේරාගන්න.'

එහෙම කියන ගමන් ම එලන් අසල තිබුන මේසයක් අස්සට රිංගා ගත්තා.

මේ වනවිටත් එලන් කියපු හොල්මන දොර අසලට සමීප වෙලයි හිටියේ. අවුල් වුන හිසකෙසින් යුතුව බියපත් මුහුණක් ද සමඟ සුදු පාට මේස රෙද්දක් ද පොරවාගෙන නිවසේ දොර ළඟ සිටගෙන සිටින රුව කාගේදැයි හඳුනාගන්න බ්‍රවුන් මහත්මියට අපහසු වුනේ නෑ.

'දෙයියනේ... මේ ඉන්නේ විලියම් නේ.'

..................................................

'ඒ මිනිහා මාව රවට්ටලා මගේ ඇඳුම් ටික ඔක්කොම හොරකම් කෙරුවනේ.'

තමන් ට සිද්ධ වුන අකරතැබ්බය ගැන ගෙදර අයට විස්තර කරන ගමන් විලියම් එහෙම කිව්වා. ඔහු ගේ කථාව අසාගෙන සිටි බ්‍රවුන් මහතා මෙවැනි පිලිතුරක් දුන්නා.

'ඔයා කරන දේවල් වල හැටියට තමයි ප්‍රතිඵල වුනත් ලැබෙන්නේ.'

මේ කථාවට සවන් දීගෙන සිටි බ්‍රවුන් මහත්මිය ඉන්පසුව කිව්වේ මෙවැනි දෙයක්.

'විලියම්... ඔයාට දැන් නිදාගන්න වෙලාව හරි. ඉක්මනින් ම නිදාගන්න සූදානම් වෙන්න. ඔය කිසිම කමකට නැති මේස රෙද්ද



පැත්තකට දමන්න දැන්වත් කල්පනා කෙරුවොත් නරක ද ?.'

විලියම් මෙතෙක් වෙලාවක් ඇඟ දවටාගෙන සිටි මේස රෙද්ද පැත්තකට දමලා නිදන කාමරේට ගියා. ඔන්න එතකොට තමයි නිවසේ දුරකථනය නාදවුනේ.

'විලියම්... ඔයාට කවුද කථා කරනවා.'

දුරකථනය අතට ගත්තු අම්මා එහෙම කියද්දි විලියම් දුවගෙන ගිහිං දුරකථනය අතට ගත්තා. දුරකථනයෙන් කථා කරන්නේ ජොවැන් කියලා විලියම් ට අඳුනාගන්න එතරම් වෙලාවක් ගියේ නෑ.

'විලියම්... ඔයාට කථා කරලා සුබ රාත්‍රියක් කියන්න කියලා තාත්තා මට කිව්වා. අනේ... ඔයා එක්ක ගෙදරටම යන්න එන්න බැරිවුන එක ගැන මට හරිම දුකයි. හැබැයි මේ සිද්ධ වුන දේවල් ගැන ඔයා වැඩිපුර හිතයි කියලා මට හිතෙන්නේ නෑ. මොනව වුනත් මේස රෙද්දක් පොරවාගෙන හිටපු ඔයා හරිම ලස්සනයි කියලා මට හිතෙනවා. ඒ විතරක් නෙවෙයි... ඔයා හරිම නිර්භීත කෙනෙක්. හැබැයි අපි කරපු සෙල්ලම හින්දා හිතේ හැටියට සතුටු වෙන්න පුළුවන් වුනා නේද ?. අනේ විලියම්... අපි ආයේ දවසක මේ විදිහේ සෙල්ලමක් කරමු. එහෙමනම් ඔයාට සුබ රාත්‍රියක්...'

'සුබ රාත්‍රියක් ජොවැන්...'

දුරකථනයේ රිසීවරය තැබූ විලියම් තමන් ගේ නිදන කාමරයට ඇවිදගෙන ගියා. මේ සිද්ධ වුන හැමදෙයක් ගැනම එයාට සිහිපත් වෙනවා. මොනතරම් බාධක ඇතිවුනත් තමන් කරපු දේවල් වලින් පුදුමාකාර විදිහට සතුටු වෙන්න පුළුවන් වුනා නේද කියලා විලියම් ට ඒ වෙලාවේ හිතුනා.

sinhalaebooks.com



විලියම් කථා මාලාවේ
තවත් පියවරක් සමග
නැවතත් හමුවෙමු.